


# ත්‍රිපිටක ධර්මය

## 03

## තුන්වෙනි ශ්‍රේණිය

මූලික පිරිවෙන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ප්‍රථම මුද්‍රණය 2017
දෙවන මුද්‍රණය 2018
තෙවන මුද්‍රණය 2019

සියලු හිමිකම් ඇවිරිණි.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ ,අංක, 49, දරණ ස්ථානයේ පිහිටි,
එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් (පුද්.) සමාගමේ හි
මුද්‍රණය කර ප්‍රකාශයට පත්කරන ලදි.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්තී පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා   ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති   අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ   අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ   අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

තිළිණය ලෙසින් රජයෙන් මේ පොත ලදිමි
කියවා එයින් නැණ ගුණ එළි කර ගනිමි
මගෙ රට වෙනුවෙන් ම දෑ සම්පත් රකිමි
මේ පොත එන වසරෙ වෙන කෙනකුට පුදමි

அரசின் வெகுமதியாய் நூலிதனைப் பெற்றேன்
அறிவு பெருகிடவே நூலிதனைக் கற்பேன்
தாய் நாட்டின் வளமெனவும் நூலிதனைக் காப்பேன்
பல மாணவரும் பயின்றிடவே நூலிதையே அளிப்பேன்

From the government, I received this as a gift
I’ll read it, light up my knowledge and practise thrift
On my country’s own behalf, I’ll protect the national resources
And offer this book to another one as a fresh garland of roses



# ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

පිරිවෙන් මගින් ගිහි පැවිදි දෙපක්ෂයට ම භාෂා, ආගමික හා සාරධර්ම අධ්‍යාපනය ලබා දීම චිරාත් කාලයක සිට පැවත ආ බැවින්, පිරිවෙන යනු ශ්‍රී ලාංකික අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත් විය. එය දේශීය ගිහි පැවිදි ශිෂ්‍ය පරම්පරාව පමණක් නොව විදේශීය විද්‍යාර්ථීන් ද ඥානනය කළ විශ්වවිද්‍යාලයක් බඳු ස්ථානයක් විය. එක් එක් යුගයේ අවශ්‍යතා අනුව සකස් වූ විෂයමාලාවක් පිරිවෙන් අධ්‍යාපනය මඟින් සිසුන් වෙත ප්‍රදානය කරනු ලැබිණි. එබැවින් ම එවැනි අධ්‍යාපන මධ්‍යස්ථාන විශ්ව සම්භාවනාවට පත් විය.

විදේශීය ආක්‍රමණ හමුවේ - විශේෂයෙන් ම පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආක්‍රමණ හමුවේ - පිරිවෙන් අධ්‍යාපනය ගුණාත්මක වශයෙන් හීන වී ගිය බව සැබෑ ය.

එහෙත් 1753 දී ශ්‍රී ලංකාවේ මහණ උපසම්පදාව යළි පිහිටුවීමට ක්‍රියාකළ අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ කැපවීම මත පිරිවෙන නැමැති අධ්‍යාපන ආයතනය ශීඝ්‍ර දියුණුවකට පත් ව දෙස් විදෙස් කීර්තියට පත්වීම අප ලැබූ ජයග්‍රහණයකි.

අනෙකුත් අධ්‍යාපන ක්ෂේත්‍රවලට මෙන් ම පිරිවෙන් අධ්‍යාපනයට ද නිදහස් අධ්‍යාපන සංකල්පය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අර්ථවත් කිරීම අපගේ පරම අපේක්ෂාවයි. පිරිවෙන් පෙළපොත් නොමිලයේ සැපයීමෙන් රජය ඉහළ වැයක් දැරුව ද එමගින් සමස්ත ජනතාවගේ විනය, සදාචාරය හා යහපැවැත්ම පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව වෙතින් ඉටු වනු ඇතැයි උදක් ම අපේක්ෂා ඇති ව මෙම පොත ඔබ අතට පත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකන අතර මෙම පොත පරිහරණය කිරීමෙන් ගිහි පැවිදි දෙපාර්ශ්වයට ම අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නැණ ගුණ දියුණු වේවායි ද පතමි.



**අකිල විරාජ් කාරියවසම්**
අධ්‍යාපන අමාත්‍ය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

සම්භාව්‍ය අධ්‍යාපනයේ සුවිශේෂී සලකුණ පිරිවෙන් අධ්‍යාපනයයි. ථෙරවාදී සම්ප්‍රදාය කේන්ද්‍ර කරගත් විෂය මාලාව, පුළුල් විෂය ක්ෂේත්‍ර කරා ව්‍යාප්තව ඇත. ලාංකේය සමාජීය අවශ්‍යතා ඉටුකරනු වස් පිරිවෙන් අධ්‍යාපනය ද නව මාන ඔස්සේ සමාජය ආකර්ෂණය කරගෙන සිටියි. පිරිවෙන් අධ්‍යාපනය මඟින් ඉටු කළ යුත්තේ සමාජ අවශ්‍යතා ය. සමාජ අවශ්‍යතා වෙනස් වන විට පිරිවෙන ද, විෂය මාලාව ද, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම හා ඇගයීම් ඇතුළු පිරිවෙනේ සමස්ත ක්‍රියාවලිය ද අනන්‍යතාව සුරැකෙන අයුරින් වෙනස් විය යුතු ය. එය සමාජයට සම්ප්‍රේෂණය විය යුතු ය.  පිරිවෙන් අධ්‍යාපනයෙහි ශාසනික සම්ප්‍රදායන් රැකගනිමින් සසුනේ චිරස්ථිතිය සඳහා ඇවැසි පදනම ගොඩනැගිය යුතු ය.

වර්තමාන ගෝලීය ප්‍රවණතා හමුවේ හුදකලා වූ තැනක පිරිවෙන තිබිය යුතු නැත. විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ කාර්යයෙන් බැහැරවීමට පිරිවෙන් අධ්‍යාපනයට ද නොහැකි ය. එසේ විය යුතු ද නැත. සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය රැකගනිමින්, පිරිවෙන් අධ්‍යාපනය යාවත්කාලීන කිරීම උදෙසා නව ඉගෙනුම් ක්‍රියාකාරකම්, ක්‍රම ශිල්ප හා තාක්ෂණික ක්‍රමවේද උපයෝගී කරගත යුතු අතර ඒවායින් බැහැර වීම සිදු නොවිය යුතුය.

නිපුණතා පාදක විෂයමාලා ප්‍රතිසංස්කරණය අනුව මෙම පෙළ පොත ද සම්පාදනය කර ඇත. පිරිපුන් සමාජයක් ගොඩනැගීම සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යා පන ක්‍රමවේද මඟින් නූතන ලෝකයේ ශීඝ්‍ර ලෙස ප්‍රසාරණය වන දැනුම යාවත්කාලීන කිරීමට උනන්දු විය යුතු ය. හුදෙක්ම අධ්‍යාපනය යනු ආර්ථික සංවර්ධනය සඳහා ම සීමා වූවක් නොවේ. එය දැනුම් ආර්ථිකයක් පදනම් කරගත් සංකල්ප ඔස්සේ ගමන් කරන ආධ්‍යාත්මික සංවර්ධනයෙන් සතුටු වන පුරවැසියකු නිර්මාණය කිරීමට ද ඉවහල් කොට ගත යුතුය.

ශිෂ්‍ය මිතුරු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අනුව සකස් කර ඇති මෙම පෙළ පොත ඔබට මාර්ගෝපදේශයකි. එය යළි භාවිත කළ හැකි අයුරින් පරිශීලනය කිරීම ඔබගේ යුතුකමක් මෙන් ම වගකීමකි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

# පෙරවදන

ශ්‍රී ලංකාවේ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා බුද්ධිමත් ගුණවත් භික්ෂු භික්ෂුණී පරපුරක් මෙන්ම ධර්මානුධර්ම පටිපන්න උවසු උවැසියන් පිරිසක් ද සිටිය යුතු ය. ඒ සඳහා මැනවින් අධ්‍යාපනය ලබා ශික්ෂණය විය යුතු ය. ශික්ෂිත පුරවැසියා ලෝකයට සම්පතකි. පිරිවෙන් අධ්‍යාපනයෙන් ලබන දැනුම පමණක් නොව භාවනා ක්‍රම පුහුණු වීම ආදියෙන් ලබන මානසික සංවර්ධනය, මිනිස් ජීවිතයේ ලැබිය හැකි ලෞකික හා ලෝකෝත්තර සියලු පුරුෂාර්ථ සාධනය කිරීමෙහිලා පිටිවහලකි.

ත්‍රිවිධ ශාසනයේ ගැඹුර හා එහි අනේකවිධ වටිනාකම් පිළිබඳ ලබන අවබෝධය අතිශය වැදගත් වේ. අප හමුවේ ඇති අනාගත අභියෝග සාර්ථකව ජයග්‍රහණය කරනු වස් ඒ සඳහා අවැසි දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත යුතු ය. ලෝකයේ විශිෂ්ටතම දාර්ශනික වූත් ඓතිහාසික වූත් ජීවන රටාවක හිමිකම අපට ඇත. පිරිපුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙන් අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාර්යක්ෂමව ඵලදායී අයුරින් කටයුතු කළ යුතු ය. විශිෂ්ට පුරවැසියකු ලෙස ඔබගේ උත්සාහය, කැපවීම හා අධිෂ්ඨානශීලීව කටයුතු කිරීම, තිරසර සංවර්ධනයට ද රුකුලකි.

මෙම පොත සම්පාදනය කිරීම සඳහා කටයුතු කළ ලේඛක හා සංස්කාර මණ්ඩලයේ සියලු දෙනාටත් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාව හිමිවේ.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය, බත්තරමුල්ල.

**නියාමනය හා අධීක්ෂණය :**

ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක — අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම :**

විජිත වෙලගෙදර — අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි — අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**උපදේශකත්වය :**

මහාචාර්ය උදිත ගරුසිංහ — පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

**සම්බන්ධීකරණය :**

පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි — විෂය උපදේශක (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

ඩී. එම්. ජේ. පුෂ්පකුමාර — නියෝජ්‍ය කොමසාරිස් (පාලන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සංස්කරණය :**

ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි — සහකාර කොමසාරිස් (විශ්‍රාමික)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ලේඛක මණ්ඩලය :**

පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි (සභාපති) — විෂය උපදේශක (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

| | |
|---|---|
| පූජ්‍ය කොටනෙළුවේ පුඤ්ඤානන්ද හිමි | ගුරු උපදේශක<br>කො/නාලන්දා ධර්මායතන මූලික පිරිවෙණ<br>ගල්කිස්ස |
| පූජ්‍ය උඟුරුගමුවේ අස්සජි හිමි | පරිවේණාචාර්ය<br>කළු/ගංගාතිලක මූලික පිරිවෙණ<br>කෙසෙල්වත්ත, පානදුර |
| පූජ්‍ය දියගම නාරද හිමි | පරිවේණාචාර්ය<br>කො/සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙණ<br>ගංගොඩවිල, නුගේගොඩ |
| පූජ්‍ය ගැමුණුපුර සෝමවංශ හිමි | පරිවේණාචාර්ය<br>කො/විද්‍යාලංකාර මහ පිරිවෙණ, පන්නිපිටිය |
| පූජ්‍ය ගල්කිස්සේ ධම්මිස්සර හිමි | ගුරු උපදේශක<br>කො/වංගීස මූලික පිරිවෙණ<br>කලපලුවාව, මුල්ලේරියාව |
| ඊ. ඒ. ජයසේන එදිරිසිංහ | විශ්‍රාමික විෂය උපදේශක (පිරිවෙන්)<br>498/B, කොස්වත්ත, රදාවාන |
| පී. ඒ. සරත් කුමාර | පරිවේණාචාර්ය<br>කො/තක්ෂිලා මහ පිරිවෙණ<br>කොතලාවල, කඩුවෙල |
| ආර්. එම්. ටී. ටී. රත්නායක | පරිවේණාචාර්ය<br>මහ/විමලධර්ම මූලික පිරිවෙණ<br>දංගොල්ල, මහනුවර |

**සෝදුපත් කියවීම :**

| | |
|---|---|
| සුසිල් ජයසිරි | ව්‍යාපෘති සහකාර<br>බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ග්‍රීන්පාත්, කොළඹ 7 |

**පරිගණක ගත කිරීම, පිටු නිර්මාණය සහ පිට කවරය :**

| | |
|---|---|
| ක්‍රිෂ්නි සමුද්දිකා නවරත්නගේ | පරිගණක අංශය<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

# පටුන


| | | |
|---|---|---|
| 01. | විසිඑක් වන වස සිට බුදු සිරිත | 01 |
| 02. | බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලද්දෝ | 07 |
| 03. | බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණ සමය | 14 |
| 04. | ශ්‍රේෂ්ඨ ශ්‍රාවක චරිත හඳුනා ගනිමු | 20 |
| 05. | ශාසන අභිවෘද්ධියට මුල් වූ බෞද්ධ මහෝපාසක චරිත | 28 |
| 06. | සුනාමියට හසු වූ මුහුදු වෙළෙන්දෝ | 34 |
| 07. | ඉල්ලන්නා පිරිහෙන්නේ ය | 38 |
| 08. | නොඉවසීම විපතට මුල ය | 42 |
| 09. | සේඛියා I | 45 |
| 10. | සේඛියා II | 50 |
| 11. | සේඛියා III | 53 |
| 12. | පින්පල ලබන මළවුන්ගේ ලෝකය | 57 |
| 13. | දුන්දෙය සුවගෙන දේ | 66 |
| 14. | ගිහි දිවියක දුක්බර පුවත | 70 |
| 15. | මිහිරි වදනින් අනුන් සනසමු | 77 |

16. අභිධර්මය I 82
17. අභිධර්මය II 89
18. අභිධර්මය III 99
19. චිත්ත වග්ගය 110
20. පුප්ඵ වග්ගය I 128
21. පුප්ඵ වග්ගය II 135
22. පුප්ඵ වග්ගය III 142
23. දියුණු කළ සිත සලසයි සියලු සෙත 149
24. ආනාපානසතිය වඩමු 154
25. කය නම් නිසරුය 160
26. චතුරාර්ය සත්‍යය 165
27. භාරතීය බ්‍රාහ්මණ සමාජ ධර්ම 175
28. ශාසනික ව්‍යාප්තිය 180
29. සසුන් කෙත වපුරමු 184
30. බුදු දහමයි සුව දිවියයි 196

01
පාඩම

# විසිඑක් වන වස සිට බුදු සිරිත

## විසිඑක් වන වස සිට

එකුන්තිස්වන වියේ දී මහබිනික්මන් කළ අප සිදුහත් බෝසතාණන් වහන්සේ පන්තිස්වන වියේ දී බුදු පදවියට පත් වූ සේක. එතැන් සිට උන්වහන්සේ පුරා අවුරුදු විස්සක් මගධයේ විවිධ ස්ථානවල වැඩවිසූ සේක. බුද්ධත්‍වයෙන් විසිවන වස වැඩ විසුවේ බිම්බිසාර රජතුමා විසින් පූජා කරන ලද වේළුවනාරාමයේ ය. උන්වහන්සේ වස් පවාරණයෙන් පසු කොසොල් රට සැවැත්නුවරට වැඩම කළ හ. එතැන් පටන් සූසාළිස් වන වස දක්වා සූවිසි වසක් ම වැඩසිටියේ සැවැත්නුවර ම ය. එහි දී අනේපිඬු සිටුතුමා විසින් පූජා කරන ලද ජේතවනාරාමයේ අටළොස් වසක් ද විශාඛා උපාසිකාව පූජා කළ පූර්වාරාමයේ සය වසක් ද වැඩ සිටි සේක. වස් සාර මාසයෙහිම එම විහාරස්ථාන දෙක ඇසුරු කරමින් වැඩ සිටින අතර, වසරේ ඉතිරි මාසවල ජනපද චාරිකාවේ වඩිමින් ලෝක සත්ත්වයා සසර දුකින් ගලවා ගැනීමට දහම් දෙසීම උන්වහන්සේගේ සිරිත විය.

## විනය ශික්ෂාපද පැණවීම

**සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා**<br>
**සචිත්ත පරියොදපනං - එතං බුද්ධානසාසනං**<br>
**ඛන්ති පරමං..............**

යනාදී ගාථා ඔබ අසා ඇත. මෙම ගාථා ඕවාද ප්‍රාතිමෝක්ෂය ලෙසින් හැඳින් වේ. බුද්ධත්වයෙන් වසර විස්සක් ගතවන තුරු විනය ශික්ෂාපද කිසිවක් පැනවීමට අවශ්‍ය වූයේ නැත. සසර දුකින් එතෙරවීමේ බලාපොරොත්තුවෙන් සසුන්ගත වූ භික්ෂූන් වහන්සේලාගේ මුඛ්‍ය පරමාර්ථය වූයේ නිවන පසක් කිරීමයි. උන්වහන්සේලා බුදුරදුන් අනුව යමින් පිළිවෙත් සරුව විසූ හ. බුදු සසුන ජනප්‍රිය වී යාමත් සමග සසුනට පිවිසෙන පිරිස ගණනින් විශාල විය. ඒ සමග ම නිවන් දැකීමේ අරමුණට වඩා ලාභ, යස, ඉසුරු වැනි ලෞකික අරමුණුවලට නැඹුරුවීම බහුල වන්නට විය. මෙනිසා විනය ශික්ෂා පද පැනවීමේ අවශ්‍යතාව මතුවිය.

විශාලා මහනුවර කලන්දක නම් ගමෙහි විසූ සුදින්න නැමැති භික්ෂුව විසින් ගිහි කල බිරිඳගේ ඉල්ලීමෙන් වරදෙහි බැඳීම නිසා බුදුරජාණන් වහන්සේ ප්‍රථම විනය ශික්ෂාපදය පණවා වදාළ හ. එතැන් පටන් ප්‍රාතිමෝක්ෂ ශික්ෂාපද පැණවීම සිදුවිය. ප්‍රාතිමෝක්ෂය යනු භික්ෂූන් වහන්සේලාගේ හික්මීම සඳහා පනවන ලද විනය ශික්ෂාපද මාලාවයි. සියලු බුදුරජාණන් වහන්සේලා ප්‍රථම බෝධියේ දී හෙවත් බුදු වූ මුල් අවධියේ දී සංඝයා පාලනය කරන්නේ ඕවාද ප්‍රාතිමෝක්ෂයෙනි. ඉන්පසු අවශ්‍යතාව පරිදි විනය ශික්ෂාපද පැණවීම සිදුවෙයි. එය හඳුන්වන්නේ ආණා ප්‍රාතිමෝක්ෂය නමිනි.

භික්ෂූන් වහන්සේලා අඩ මසකට වරක් පොහොය සීමාවට රැස්ව පොහොය කිරීම නමින් සිදුකරන්නේ මේ ආඥා ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීමයි. බුදුරජාණන් වහන්සේලා සංඝයා සමඟ පොහොය කිරීමේ දී දේශනා කරන්නේ ඕවාද ප්‍රාතිමෝක්ෂය යි. අපේ බුදුරජාණන් වහන්සේත් මුල් විසි වස පුරාම එසේ ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනා කළ හ. පොහොය සීමාවට රැස්වන භික්ෂූන් වහන්සේලා පළමු කොට ඇවැත් දෙසා පිරිසිදු වී සිටීම සිරිතයි. එහෙත් දිනක් බුදුරජාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පොහොය සීමාවට රැස්වූ පිරිස අතර එසේ පිරිසිදු නොවූ දුසිල්වත් භික්ෂුවක් සිටියේ ය. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ පාමොක් නොදෙසා නිහඬව සිටිය හ. කාරණය සොයා බැලූ මුගලන් තෙරණුවෝ එම භික්ෂූන් වහන්සේ සීමාවෙන් නෙරපූ හ. එදා ඕවාද ප්‍රාතිමෝක්ෂ දේශනාව කළ බුදුරජාණන් වහන්සේ නැවත සංඝයා සමඟ පාමොක් දෙසීම නවතා සංඝයාට පමණක් රැස් වී ආඥා ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීමට අනුදැන වදාළ හ.

### අනේපිඬු සිටුතුමා සහ ඥාතීන්

සැවැත් නුවර පළමුව ඉදිවූ ආරාමය ජේතවනාරාමයයි. එය ඉදිකරවූයේ අනේපිඬු සිටුතුමාය. මුලින් සුදත්ත නම් වූ එතුමා දන්දීමෙහි නියැලුණු අසරණයන්ට පිහිටවූ කෙනෙකි. එනිසා ඔහුව අනාථ පිණ්ඩික නමින් හැඳින්විය. සෝවාන් උපාසකයෙකු වූ එතුමා තුළ බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැවති අසීමිත ගෞරවය නිසාම ආරාමයක් තනවන්නට කල්පනා කළේ ය. ඒ සඳහා ජේත නම් රාජකුමාරයාගේ ඉඩමක් කහවණු පනස් හතර කෝටියක් වැයකර මිලදී ගෙන අංග සම්පූර්ණ මහා විහාරයක් ඉදිකරවන ලදී. එය ජේත කුමාරයාගේ නමින් ම ජේතවනාරාමය යැයි හඳුන්වන ලදී. ජේතවනාරාමයේ වැඩවසන බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයේ සියලු සැප පහසුකම් එතුමා සම්පූර්ණ කළේ ය. ඊට අමතරව එතුමාගේ නිවසේ ද නිතිපතා පන්සියයක් මහා සංඝරත්නයට දානය පිළියෙල වී පැවතුණි. මෙසේ එතුමා බුදුසසුනේ ප්‍රධාන දායකයා බවට පත්විය.

### කාල සිටු පුතු

අනාථපිණ්ඩික සිටුතුමාට කාල නම් පුතෙක් සිටියේ ය. ඔහු කිසි දිනෙක පන්සලට ගියේ නැත. පින්දහම් කළේ නැත. විනෝදයෙන් ම කල් ගෙවී ය. සිය පුතු වෙහෙරට යැවීමට උපායක් සිතූ පියතුමා පන්සලට ගොස් බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා ආවොත් කහවණු දහසක් දෙන බව පැවසීය. ඔහු පළමු දින ගොස් බණ අසා පැමිණි නමුත් කිසිවක් මතක තබා ගත්තේ නැත. දෙවන දින බණ පදයක් මතක තබාගෙන පැමිණියහොත් තවත් කහවණු දහසක් දෙන බව කීය. එදින ඔහු ගියේ බණ පදයක් අසා දිවගෙන එමියි සිතාගෙනය. එහෙත් බුදුරජාණන් වහන්සේ ඔහුට අර්ථය විනා බණ පද මතක නොසිටින ලෙසට අධිෂ්ඨාන කර දහම් දෙසූ සේක. එනිසා ඕනෑකමින් බණ ඇසූ හේ සෝවන් විය. මගඵල ලබා අවබෝධ කරගෙන ගෙදර ගිය පුතුට අනේපිඬු සිටුතුමා කහවණු දීමට සැරසුණ විට ඔහුට ලැජ්ජාවක් ඇති විය. බණ අසා මුදල් ලබාගන්නට ගියේ බුදුරජාණන් වහන්සේගේ හා ශ්‍රී සද්ධර්මයේ වටිනාකම නොදන්නාකම නිසා බව ඔහුට ම වැටහිණ.

## චූල සුභද්‍රා

අනේපිඩු සිටුතුමාට චූල සුභද්‍රා, මහා සුභද්‍රා, සුමනා යැයි දියණියන් තිදෙනෙක් වූහ. එයින් චූල සුභද්‍රා උග්ග නම් සිටුවරයාගේ පුතාට විවාහ කරදෙන ලදී. උග්ග සිටුතුමාගේ පවුලේ අය නිගණ්ඨ නාථපුත්තතුමාගේ දායකයෝ වූහ. ගෙදර දානයට පැමිණි නිගණ්ඨයන්ට දානය බෙදීමට තබා ඔවුන් දැකීමට පවා ඇය අකමැති වූවා ය. (එම ගාථා ධම්මපදට්ඨ කථාවේ ප්‍රකීර්ණක වග්ගයේ සඳහන් වේ). එයට හේතු විමසූ ඇය ඉතා මිහිරි ගීයෙන් මහා සංඝරත්නයේ ගුණ වර්ණනාවක් කළා ය. එයින් පැහැදීමට පත් උග්ග සිටුතුමා බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට දානයක් දීමට ඇයට අවස්ථාව ලබාදුන්නේ ය. ඇය බුද්ධ ප්‍රමුඛ පන්සියයක් වූ මහා සංඝරත්නය විෂයෙහි මහා දානයක් පිදුවාය. මෙහි දී බණ ඇසූ උග්ග සිටුතුමා ඇතුළු ගම්වැසි ජනතාව ද තෙරුවන් සරණ ගිය හ. ඇය නිසා බොහෝ දෙනෙකුට ධර්මාවබෝධය ලබාගැනීමට හැකියාව ලැබිණි.

## විශාඛාව පිදූ පූර්වාරාමය

- බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට සැවැත්නුවර මුල් කාලයේ තිබුණේ එක් ආරාමයකි. ඒ අනේපිඩු සිටුතුමා විසින් පූජාකරන ලද ජේතවනාරාමය යි.

- පසු කාලයේ දී පූර්වාරාමය හෙවත් මිගාරමාතු ප්‍රාසාදය නම් තවත් විහාරස්ථානයක් සැවැත්නුවර ඉදිවිය. එහි ආරම්භය රසවත් සිදුවීමකි.

සැවැත්නුවර සිටි මිගාර සිටුතුමාගේ පුත් පූර්ණවර්ධන සිටු පුත්‍රයාට භද්දිය නුවරින් විශාඛා නම් සිටු දියණියක් සරණපාවා ගෙනඑන ලදී. ඇය සත් හැවිරිදි වියේ දී ම බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා සෝවන්ව සිටි නුවණැති කාන්තාවකි. සැවැත්නුවර මිගාර සිටුතුමා ඇතුළු පිරිස බෞද්ධයෝ නොවූ හ. ඔවුන් අනුගමනය කළේ නිගණ්ඨයින්ගේ ජෛන ආගමයි. දිනක් එම නිවසේ නිගණ්ඨයන් සඳහා දානයක් විය. එහි දී තම රහතන් වහන්සේලාට දන් බෙදන්නට විශාඛාවට ද පැමිණෙන ලෙස මිගාර සිටුතුමා දන්වා යැවී ය. රහතන් වහන්සේලා යැයි ඇසූ පමණින් දිව ආ ඇය නිරුවත් නිගණ්ඨයන් දැක ලැජ්ජාවෙන් පලාගොස් තම කුටියේ දොර වසාගෙන සැඟවුණා ය. එයින් කුපිත වූ සිටුතුමා ඒ ගැන විමසූ විට ඕ තොමෝ බුදුන්වහන්සේගේත් සංඝයාවහන්සේගේත් ගුණ ඉතා අපූරුවට වර්ණනා කළා ය. එයින් පැහැදී ඇයගේ ඉල්ලීම පරිදි මිගාර සිටුතුමා බුද්ධ ප්‍රමුඛ සංඝයා වැඩමවා මහ දනක් පිදුවේ ය. එදා බුදුරජාණන් වහන්සේ දෙසූ බණ අසා සිටුතුමා ද සෝවන් විය. එතැන් පටන් සිටුතුමා විශාඛාව සැලකුවේ ලේලියක ලෙස නොව මවක ලෙස ය. එනිසා ඇය මිගාර මාතා නමින් ප්‍රකට වූවා ය.

ඇය සතුව මේල පළඳනාව නම් නව කෝටියක් වටිනා ඉතා බරසාර ආභරණයක් විය. දිනක් විහාරස්ථානයට ගොස් සිය ආභරණය ගලවා තබා බණ ඇසූ ඇයට පිටත්වන විට එය රැගෙන ඒමට අමතක විය. ආනන්ද හිමියන් විසින් එය ආරක්ෂා කොට තබන ලදී. නැවත ඇය එහි ගිය විට අනඳ හිමියෝ එය ඇයට නැවත භාර දුන්හ. පන්සලේ තිබූ දෙයක් ආපසු ගැනීමට ඇය අකැමති වූවා ය. නව කෝටියක් වටිනා එම පළඳනාව විකිණීමට ඇවැසි වුවත් කිසිදු ගැනුම් කරුවෙකු ඉදිරිපත් නො වී ය. මෙනිසා ඇයම එය

මිලට ගෙන එයට සරිලන මුදල වෙන්කොට මහාර්ඝ විහාරස්ථානයක් ඉදිකළා ය. මහල් දෙකකින් සමන්විත වූ මෙහි කාමර දහසක් විය. මෙය පූර්වාරාමය නමින් නම් කළ අතර මිගාර මාතාව කර වූ නිසා මිගාරමාතු ප්‍රාසාදය නමින් ද ප්‍රකට විය.

**කොසොල් මහරජු හා අසදෘශ මහා දානය.**

කොසොල් රජතුමා ද බුදුරදුන් දවස සිටි ශ්‍රද්ධා සම්පන්න රජ කෙනෙකි. එතුමා නිතරම විහාරස්ථානයට යයි. බුදුරජාණන් වහන්සේ සමඟ ධර්ම සාකච්ඡා කරයි. එතුමා සමඟ පැවැති ධර්ම සාකච්ඡා එක්කොට සංග්‍රහ කරන ලද කෝසල සංයුත්තය නමින් වෙනම ම කොටසක් සංයුත්ත නිකායේ ඇත. මෙම රජතුමා බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නය වෙත මහා දානයක් පූජා කළේ ය. මෙය දුටු නගර වැසියෝ ඊටත් වඩා උසස් අන්දමට දානයක් පූජා කළෝ ය. මේ දානය දැකබලා ගැනීමට රජතුමාට ද ආරාධනා කරන ලදී. රජතුමා තමා පරාජයවීමට අකමැති නිසා තවත් දානයක් ඊටත් වඩා උසස් ආකාරයට පූජා කළේ ය. මෙය දුටු නගරවැසියෝ එයටත් වඩා උසස් ආකාරයට දානයක් පිළියෙල කළ හ. මේ ආකාරයට සයවතාවක් ම දෙපිරිස තරගයට මෙසේ දානය පූජා කළ හ. අවසානයේ රජතුමා නගරවැසියන්ට පරාජය වී කණගාටුවෙන් සිටිනු දුටු මල්ලිකා දේවිය අමුතුම ආකාරයේ දානයක් දීමට රජතුමාට උපදෙස් ලබා දුන්නා ය. රජකුමාරියන් විසින් සුවඳ අඹරා සුවඳ ගන්වද්දී, තවත් තරුණ කුමාරිකාවන් පිරිසක් භික්ෂූන් වහන්සේලාට පවන් සැලූහ. ඒ අතර සෑම භික්ෂූන් වහන්සේ නමක් ම පිටුපස හස්තියෙක් වාඩි කරවා එම හස්තීන් ලවා සුදුකුඩ ඇල්ලීමට සැලස් වී ය. ඉතා ප්‍රණීත රාජ භෝජනයෙන් සැකසුණි. එය අසදෘශ මහා දානය නමින් හැඳින්විණ.

මෙය සාමාන්‍ය මහජනතාවට කළ නොහැකි වූයෙන් නගර වැසියෝ පරාජයට පත්වූහ. රජතුමා ජයග්‍රහණය කළේ ය. දානයක් මහත්ඵල මහානිසංස වන්නේ වැඩියෙන් වියදම් කළ විට දැයි, භික්ෂූන් වහන්සේලා අතර කතාවක් ඇතිවිය. මෙයට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ දානය දෙන දායකයාගේ සිතේ ඇති පැහැදීමත් ලබන්නාගේ ගුණ මහත්වයන් තිබේ නම් සුණු සහල් මිටක්, රෙදිකඩක්, තණ පඳුරක්, අරලු ගෙඩියක් වැනි සුළු දෙයක් පිදීම වුවත් මහත්ඵල ගෙනදෙන බව පෙන්වා දුන් සේක. එතැන් පටන් නගරවැසියෝ තමන්ට හැකි පමණින් දන් පූජා කළ හ.

කොසොල් රට යනු එවකට දඹදිව පැවති මහා රාජ්‍ය හතරෙන් එකකි. බුදුරදුන් උපන් ශාක්‍ය රට ඊට යටත් කුඩා රාජ්‍යයකි. කොසොල් රජතුමා තුළ බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැවතියේ ශ්‍රද්ධාවකට වඩා ආදර ගෞරවයකි. උන්වහන්සේ තම රාජ්‍යයේ කෙනෙකු වීම ගැන එතුමා ආඩම්බර විය. මජ්ඣිම නිකායේ ධම්මචේතිය සූත්‍රයේ දී එතුමා සිය ජීවිතයේ අවසාන දිනයෙහි කළ ප්‍රකාශය ඉතා සංවේදී වූවකි.

''ස්වාමීනි, ඔබ වහන්සේත් ක්ෂත්‍රියෙකි. මමත් ක්ෂත්‍රියයෙක් වෙමි. ඔබ වහන්සේත් කොසොල් රට වැසියෙකි. මමත් කෙසොල් රට වැසියෙක්මි. ඔබ වහන්සේත් අසූවියැත්තෙකි. මමත් අසූවියැත්තෙක්මි. එහෙයින් ඔබ වහන්සේට උතුම් ගරු සරු දක්වන්නට මම සුදුස්සෙක්මි.''

එතුමා තුළ පැවති මේ ආදර ගෞරවය නිසාම බුදුරදුන්ගේ ඥාතියෙකුවීමට ද ඔහුට අවශ්‍ය විය. ඒ අනුව ශාක්‍ය දේශයෙන් වාසභඛත්තියා නම් කුමාරිකාවක් සිය මෙහෙසියක් බවට පත්කර ගත්තේ ය.

## බිම්බිසාර හා අජාසත් රජවරු

කොසොල් රට මෙන් ම මගධය ද දඹදිව මහා රාජ්‍යයන් සතරෙන් එකකි. එහි අගරජ වූයේ බිම්බිසාර රජතුමාය. බෝසතාණන් වහන්සේ පැවිදි වූ දිනයේ ම බිම්බිසාර රජතුමා උන්වහන්සේ ව මුණගැසුණේය. එදා ඇතිකරගත් ගිවිසුම පරිදි බුදුවී පළමුවෙන් ම වැඩියේ ද බිම්බිසාර රජතුමා වෙතටය. එදා සෝවාන් ඵලයට පත් එතුමා තම රජ උයන වූ වේළුවනය බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට පූජා කළේ ය. එය බුදු සසුනේ පළමුවන ආරාම පූජාවයි. එතැන් සිට එතුමා බුදු සසුනේ කුළුපග දායකයෙකු බවට පත්විය. අජාසත් කුමාරු එතුමාගේ පුත්‍රයාය. අජාත සත්තු යනු නූපන් සතුරා යන අදහසයි. කුමරු මව්කුස සිටියදීම මවට රජුගේ උරහිස පළා ලේ බීමේ දොළදුකක් හටගත්තේය. රජතුමා එම දොළදුක ඉටුකළේ දැඩි පුත්‍රස්නේහය නිසාමය. අජාත සත්තු යන අන්වර්ථ නාමය ලැබුණේ එබැවිනි. එම සළකුණෙන් මෙම පුත්‍රයා පියාට සතුරෙකු වන බව දෛවඥයන් පැවසීය. දිනක් ආජාසත් කුමරුගේ ඇඟිල්ලෙහි විසර ගෙඩියක් ඇතිවිය. කිරිමව්වරුන්ට පවා නළවාගත නොහැකි විය. දරුවා රාජසභාවට ගෙන්වා ගත් රජතුමා උකුලේ හිඳුවාගෙන එම ඇඟිල්ල සිය මුවෙහි දමාගෙන සිටිය දී එය පුපුරා සැරවවලින් මුව පිරීගියත් එය ගිලදමූවා මිස ඉවත නොදැමීය.

මෙතරම් ස්නේහයෙන් මෙම පුතු හදාවඩාගත් නමුත් පසු කලෙක දෙව්දත් තෙරුන්ගේ පාපමිත්‍ර සේවනය නිසා අජාසත් කුමරු නොමග ගියේ ය. තමන් බුදුරජාණන් වහන්සේ මරා බුදුවන බවත් කුමාරයාට පියා මරා රජවන ලෙසත් දෙව්දත් තෙරුන් කළ යෝජනාව පරිදි අජාසත් කුමරු පියා ඝාතනය කිරීමට කටයුතු කළේ ය. එහෙත් පසුව ඔහු එයින් මහත් සංවේගයට පත්විය. එතුමාගේ ශාසනයට සිදු වූ උසස්ම මෙහෙවර නම් සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ධාතු පූජා පැවැත්වීමත් සිය සම්පූර්ණ අනුග්‍රහය මත ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමත් ය.

## ආනන්ද බෝධීන් වහන්සේ

එකල බුදුරජාණන් වහන්සේ දැකීමේ අදහසින් බොහෝ දෙනා මල් ආදිය රැගෙන ජේතවනාරාමයට පැමිණියහ. සමහර අවස්ථාවල දී එසේ පැමිණෙන විට බුදුරජාණන් වහන්සේ විහාරස්ථානයේ වැඩ නොසිටියහ. උන්වහන්සේ ධර්ම චාරිකාවේ වැඩමකොට තිබිණි. එනිසා ඇතැම්හු නොසතුටට පත්ව රැගෙන ආ මල් ආදිය විහාරස්ථානයේ තැන තැන දමා යන්නට වූහ. ආනන්ද හිමියෝ මේ පිළිබඳව බුදුරජාණන් වහන්සේ දැනුවත් කළ හ. එවිට බුදුරජාණන් වහන්සේ ශාරීරික, පාරිභෝගික, උද්දේසික යනුවෙන් පූජාර්හ වස්තු තුනක් ඇති බව දේශනා කළ සේක. ඒ අනුව පාරිභෝගික වස්තුවක් වූ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් මෙහි ගෙනවිත් රෝපණය කොට බුදුරජාණන් වහන්සේ

විහාරයේ නොමැති අවස්ථාවට වන්දනා කිරීමට යොදාගන්නා ලෙස වදාළහ. ආනන්ද හිමියන්ගේ මූලිකත්වයෙන් අනේපිඬු සිටුතුමා, විසාඛා උපාසිකාව, කොසොල් රජතුමා ආදීන් එකතුව ජය ශ්‍රී මහා බෝධි අංකුරයක් රෝපණය කළ අතර එය ආනන්ද බෝධිය ලෙසින් නම් කෙරිණි. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා පැවැත්වීම පළමුවෙන් ආරම්භ වූයේ මේ අවස්ථාවේ දී යි.



මෙම කාලයේ දී ජීවක වෙද මහතා ද බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ බණ ඇසූ අතර ඔහු සතු වූ රජගහ නුවර අඹ වනය බුදුරජාණන් වහන්සේට පූජා කිරීම ද සිදුවිය.

## සුන්දරී පරිබ්‍රාජිකාවගේ අපහාසය

බුදුරජාණන් වහන්සේට හා ශ්‍රාවකයන්ට බොහෝ ලාභ සත්කාර ලැබෙන්නට විය. මෙය දුටු අන්‍ය තීර්ථකයෝ එයට ඊර්ෂ්‍යා කළ හ. ඔවුහු බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට අපහාස කොට මේ කීර්තිරාවය විනාශකොට නින්දා කිරීමට උපායක් කල්පනා කළ හ. ඒ අනුව සුන්දරී නම් පරිබ්‍රාජිකාවක මේ සඳහා යොදා ගත් හ. ඇය උදේ සවස මෙන් ම රාත්‍රියේ ද ජේතවනාරාමයට යැවූහ. රාත්‍රියේ විහාරස්ථානයේ සිටින බව මිනිසුන්ට හැඟෙන්නට සැලැස් වූහ. ඉන්පසු තීර්ථකයෝ රහසේ ම ඇය විහාරස්ථානයේ දී ම මරා පරමල් දමන තැන වළ දැමූ හ. සුන්දරියගේ මරණය නිසා බුදුරජාණන් වහන්සේට මෙන් ම භික්ෂු සංඝයාටත් බොහෝ නින්දා විඳීමට සිදුවිය. මිනිස්සු දානය පවා නොදී පරුෂ වචනයෙන් බණින්ට වූහ. එහෙත් බුදුරජාණන් වහන්සේ සත්‍යය කවදා හෝ ජයගන්නා තෙක් ඉවසන ලෙස දැන් වූ හ. සතියක් ගතවන විට සත්‍යය හෙළිවිය. මිනිස්සු තීර්ථකයන්ගේ මෙම නොමනා ක්‍රියාව දැන ගත් හ. අවසානයේ නින්දා කළ මිනිස්සු ම දානය රැගෙන එන්නට වූ හ. ගරු කරන්නට වූ හ.

**අභ්‍යාස**

01. ඔබ කැමැති බුද්ධකාලීන උපාසක උපාසිකාවන් දෙදෙනෙකු පිළිබඳ කෙටි සටහනක් ලියන්න.
02. ඕවාද ප්‍රාතිමෝක්ෂයට අයත් ගාථා තුන සොයා ලියන්න.
03. අනේපිඬු සිටුතුමා කාල සිටුපුත්‍රයාව දහමට යොමුකළ ආකාරය පිළිබඳ පන්තිය ඉදිරියේ කථාවක් පවත්වන්න.

# 02 පාඩම බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලද්දෝ

ලෝක සත්ත්වයා කෙරෙහි මහා කරුණාව පතළ කළ අප බුදුරජාණන් වහන්සේ ගෙන් පිහිට ලත් අය අප්‍රමාණ වේ. සසර කතරින් එතරව මාර්ගඵලාවබෝධය ලැබීමට පුණ්‍ය මහිමය තිබූ සමහර අය සොයා වැඩම කළ උන්වහන්සේ ඔවුන්ට පිහිට වූ හ. එසේ පිහිට වූ අයගෙන් කිහිප දෙනෙකු පිළිබඳ අපි විමසා බලමු.

## රජ්ජුමාලා



උරුවෙල් දනව්වේ සිටු ගෙදරක මාලා නමින් දාසියක් වූවා ය. ඇයගේ ස්වාමි දියණිය නපුරු කාන්තාවකි. ඈ දාසියගේ කෙස් වැටියෙන් අල්ලා ඇයට නිතරම පහර දුන්නා ය. ඉවසන්න බැරිම තැන මාලා සිය කෙස්වැටිය කපා දැමුවා ය. ඉක්බිතිව ඇගේ ස්වාමි දියණිය රැහැනක් ගෙන බෙල්ලේ බැඳ එයින් ඇද පහර දෙන්නීය. අගේ ගෙලෙහි බැඳි මේ ලණුව නිසා ඇය රජ්ජුමාලා ලෙසින් ප්‍රකට වූවා ය.

දිනක් තම ස්වාමි දියණියගේ වධ වේදනා ඉවසාගත නොහැකිව සිය දිවි නසාගැනීමේ බලාපොරොත්තුවෙන් ඇය වන රොදකට ගියා ය. මෙය දිවසින් දුටු බුදුරජාණන් වහන්සේ ඇයට අනුකම්පාවෙන් එහි වැඩම කොට දහම් දෙසූ සේක. ඈ බණ අසා සෝවාන් වූවා ය. ගෙදර ගිය ඇය ඉතාම සතුටින් සිටිනු දුටු ස්වාමි දියණිය එයට කරුණු විමසුවා ය. ඇයගෙන් තොරතුරු දැනගත් ස්වාමි දියණිය එතැන් පටන් සොහොයුරියකට මෙන් රජ්ජුමාලාවන්ට ආදරයෙන් සැලකුවා ය. බුදුරජාණන් වහන්සේගේ කරුණාවේ පිහිටින් රජ්ජුමාලා එතැන් පටන් සතුටෙන් කාලය ගත කළා ය.

## අසරණ වූ පියා

දෙමාපියන්ට නොසළකන දරුවෝ අද මෙන් ම බුද්ධ කාලයේත් සිටිය හ. සැවත්නුවර එක් ධනවත් බමුණෙක් සිටියේ ය. ඔහුට දරුවන් සතර දෙනෙකි. ඔහු දරුවන් සතර දෙනා ආවාහ කර දී ඔවුන්ට සියලු දේපල බෙදා දුන්නේ ය. ටික කාලයක් ගතවෙද්දී

දරුවෝ බිරින්දෑවරුන්ගේ බස් අසා පියාට නොසළකා හැරියහ. මේ හේතුවෙන් ඉතා අසරණ වූ පියා මහමගට විත් සිඟමන් යදින්නට විය. බුදුරජාණන් වහන්සේ හමු වූ මේ පියා තම දුක කියා සිටියේ ය. බුදුරජාණන් වහන්සේ ඔහුට තමාගේ දරුවන් නොසළකන සැටි කියවෙන ගාථා පෙළක් ඉගැන් වූ හ.

පියා එම ගාථා පෙළ ඉගෙනගෙන ප්‍රසිද්ධ ස්ථානවල ගායනා කරන්නට විය. එදා හැකියාව තිබිය දී දෙමාපියන්ට නොසළකන දරුවන්ට දඬුවම් පැමිණවීමේ නීතියක් විය. එනිසා දරුවෝ මෙය දැනගෙන මහත් බියට පත් වී පියා රැගෙන ගොස් හොඳින් සත්කාර කරන්නට වූහ. පසු දිනක පියාට ලැබුණු වස්ත්‍රයක් බුදුරජාණන් වහන්සේට පූජා කිරීමට පැමිණියේ ය. එහි දී බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය අසා බමුණු පියා මෙන් ම දරුවෝ ද සෝවාන් ඵලයෙහි පිහිටිය හ.

## ගැරඬියාට පහරදුන් ළමයි

සියලු සත්ත්වයෝ මෙලොව ජීවත් විය යුත්තෝ වෙති. එහෙත් බොහෝ මිනිසුන් සිතන්නේ මිනිසාගේ යහපැවැත්ම උදෙසා අනෙක් සත්ත්වයන් විනාශ කිරීම තමාගේ අයිතිවාසිකමක් වශයෙනි. එසේ සිතන මිනිස්සු තමාට හිරිහැර යැයි සිතෙන විෂ සහිත, කරදරකාරී සත්ත්වයන් මරාදමති. ආහාරය පිණිස බොහෝ සත්ත්ව ජීවිත නැති කරති. බොහෝ සතුන්ට දඬුවම් කරති. එහෙත් බුද්ධ දේශනාව නම් තමා උපමාකොට අන්‍යයන් නොනැසිය යුතු බවයි. දඬුවම් නොකළ යුතු බවයි. සියලු සත්ත්වයින් දඬුවමට මෙන් ම මරණයට බිය බවත්, තමා උපමාකොට සියලු සත්ත්වයන්ට ආදරය කළයුතු බවත් බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක දරුවන් පිරිසකට දේශනා කළ සේක.

සැවැත්නුවර පිඬු පිණිස හැසිරෙන බුදුරජාණන් වහන්සේට ගැරඬියෙකුට පහරදෙන දරුවන් පිරිසක් හමුවිය. බුදුරජාණන් වහන්සේ ඒ අහිංසක සතාට පහරදෙන්නේ ඇයිදැයි විමසූහ. **''බුදුහාමුදුරුවනේ, මේ සතා දෂ්ට කරන නිසා පහර දෙන්නේ යැයි''** ඔවුහු පැවසූහ. බුදුරජාණන් වහන්සේ සත්ත්ව හිංසාවේ ආදීනව දක්වා ධර්ම දේශනා කළ හ. බණ අසා දරුවෝ සෝවාන් වූ හ.

## කිසාගෝතමී



සැවැත්නුවර එක් දුගී පවුලක උපන් කාන්තාවකි, කිසාගෝතමිය. ශරීරය ඉතා කෘශ වූ බැවින් ඇය කිසාගෝතමී නමින් ප්‍රකට වූවා ය. විවාහ වූ ඇයට පුතකු ලැබිණ. කුඩා කාලයේ දී ම හදිසියේ සිය පුතු මිය ගියේ ය. පුතුට ඉතා ආදරයෙන් සිටි ඇය සිය පුතු මියගිය බව පවා අදහාගත නොහැකිව වෛද්‍යවරුන්

සොයා ඒ මේ අත ඇවිද්දාය. සිය දරුවා මියගොස් ඇති බවත්, සුව කළ නොහැකි බවත්, ඇසීමෙන් ඈ උමතු වූවා ය. අවසානයේ බුදුරජාණන් වහන්සේ වෙත ඇය පැමිණියා ය.

උමතුවෙන් සිටි ඇයට බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා නො කළ හ. දරුවා සුව කිරීමට කිසිවෙකු නොමළ ගෙයකින් අබ ස්වල්පයක් ගෙන එන ලෙස දේශනා කළ හ. තම දරුවා සුව කළ හැකි ය යන වචනය ඇසීමෙන් ම ඇය සතුටට පත් වූවා ය. ඇය ගෙයක් ගෙයක් පාසා අබ සොයා ගියේ සිය දරුවා ද කරමත තබාගෙනය. මෙසේ යන විට දරුවාගේ මළ සිරුර ටිකෙන් ටික කුණුවෙන්නට විය. මළ සිරුරෙන් දුගඳ වහනය වන්නට විය. ඒ සමග ම ඇගේ උමතුව ද සුව විය. සෑම ගෙදරකම අබ තිබූ නමුත් කිසිවෙකු නොමළ ගෙයක් සොයාගැනීමට නොහැකි වූ හෙයින් ඇය යථාර්ථය අවබෝධ කරගත්තා ය. දරුවා අමුසොහොනට විසිකොට බුදුරදුන් සොයා පැමිණි ඇය බණ අසා පැහැදී පැවිදි වූවා ය. රහත් බවට ද පත් වූවා ය.

## කුමාර කාශ්‍යප මාතාව

රජගහ නුවරවාසී එක් සිටු දියණියක් වූවා ය. ඇය තරුණ කල පැවිදිවීමට ආශාවෙන් සිටියත් දෙමාපියෝ එයට අකැමති වූහ. ඇය තරුණයෙකුට විවාහ කර දුන්නාය. ටික කලකට පසු ඇය ස්වාමියාගේ ද ආශීර්වාදය ඇතිව පැවිදි වූවා ය. පැවිදි වූයේ දේවදත්ත හිමි යටතේ ය. පැවිදි වී ටික දිනකින් දරුවෙකු ලැබීමට සිටින බව දැනගත් දෙව්දත් තෙරණුවෝ තමාගේ පිරිසට වන මහත් අපවාදය ගැන සිතා ඇයට සිවුරු හැර යන්නට නියම කළ හ.

මහත් අසරණභාවයට පත් වූ ඇය බුදුරජාණන් වහන්සේගේ පිහිට සොයා පැමිණියා ය. බුදුරජාණන් වහන්සේ මේ පිළිබඳ කටයුතු කිරීමට විනයධාරී උපාලි මහරහතන් වහන්සේට පැවරූහ. උපාලි මහරහතන් වහන්සේ මේ පිළිබඳ සොයාබැලීමට විසාකා උපාසිකාවට, කොසොල් රජතුමාට හා අනේපිඬු සිටුතුමාට භාර කළ හ. මේ පරීක්ෂණයේ දී තහවුරු වූයේ ඇය පැවිදිවීමට පෙර කුස තුළ දරුවෙකු පිළිසිඳ ගත් බවයි. ඒ අනුව දරුවා ඉපදුන පසු කොසොල් රජතුමා එම දරුවා හදාගැනීමට එකඟ විය. දරුවා ලැබුණු පසු කාශ්‍යප ලෙස නම් කළේ ය. ඔහු රාජ කුමාරයෙකු ලෙස හදා ගත් නිසා කුමාර කාශ්‍යප නමින් හැඳින් වූ අතර ඔහුගේ මව කුමාර කාශ්‍යප මාතාව ලෙස ප්‍රකට විය.

කුමාර කාශ්‍යප දරුවා පැවිදි වී ටික දිනකින් ම රහත් භාවයට පත්විය. තම පුතු ගැන සිතමින් සිටි කුමාර කාශ්‍යප මාතා භික්ෂුණීන් වහන්සේට වසර දොළහක් යනතුරුම රහත් භාවයට පත්විය නොහැකි විය. එහෙත් දිනක් කුමාර කාශ්‍යප රහතන් වහන්සේ හමු වූ අවස්ථාවේ සිය මවට ඇති සෙනෙහස නිසා ඇය මඟහැර වැඩි සේක. මෙතෙක් දවස් තම පුතු වෙත සෙනෙහසින් ගමන් කළ ඇය එයින් කලකිරීමට පත්ව සිත දිරිමත් කොට නොබෝ දිනකින් බවුන් වඩා රහත් වූවා ය.

## පටාචාරා



සැවත්නුවර එක් සිටු පවුලක පටාචාරා නම් දියණියක විය. ඇය තරුණ වයසේ දී දෙමාපියන්ගේ ආශිර්වාදය නොමැතිව විවාහයක් කරගත්තා ය. ඇගේ ගෙදර ම සේවය කළ සේවකයෙකු සමග හාද වූ ඇය නිවසෙන් රහසේ ම පිටත් වී යුගදිවිය ගත කළා ය. ඒ අතර ඇයට දරුවෙකු ලැබිණ. දෙවන දරුවා ලැබීමට පෙර ඇයට දෙමාපියන් දැකීමේ ආශාවක් ඇතිවිය. ඒ අනුව ස්වාමියාත් තම දරුවාත් සමග දෙමාපියන් බැලීමට එන අතරතුර මහා වර්ෂාවක් ඇති විය. වැස්සෙන් නොතෙමී සිටීමට කොළ අත්තක් කැඩීමට ගිය ස්වාමියා සර්පයෙකු දෂ්ට කිරීමෙන් මිය ගියේ ය. ඒ අතර මහා වැස්සේ කුස තුළ සිටි දරුවා ද බිහිවිය. ඉක්බිති සිය දරු දෙදෙනා සමග දෙමාපියන් වෙත යන ඇයට අතර මග අචිරවතී ගංගාව හමුවිය. එදා මහා වර්ෂාවෙන් ගංගාවේ වතුර වැඩි වී තිබිණ. දරු දෙදෙනා ම වඩාගෙන යා නොහැකි නිසා ඇය අළුත උපන් දරුවා රැගෙන එගොඩින් තැබුවාය. අනෙක් දරුවා රැගෙන ඒමට ආපසු ගංගාව මැදට එන විට විශාල උකුස්සෙකු ඇවිත් එගොඩ සිටි කුඩා දරුවා ඩැහැගෙන ගියේ ය. එය දුටු ඈ උකුස්සා බිය ගැන්වීමට අත්පුඩි ගසන්නට වූවා ය. අම්මා අත්පුඩි ගසනු දුටු මෙගොඩ සිටි දරුවා තමාට කතා කළේ යැයි සිතා දියට බැස්සේ ය. ඔහු මහා ජලකඳට ගසාගෙන ගියේ ය.

දරු දෙදෙනාත් ස්වාමියාත් අහිමි වූ ඇය හඬා වැළපෙමින් දෙමාපියන්ගේ රැකවරණය සොයාගෙන සැවැත්නුවරට ගියා ය. ඈ එහි යන විට පෙර දින රාත්‍රියේ ඇතිවූ මහා වර්ෂාව නිසා නිවස කඩා වැටී තම සහෝදරයාත්, මව්පිය දෙදෙනාත් මිය ගිය බව දැනගත්තා ය. මේ සියලු සිදුවීම් හමුවේ ඇති වූ මානසික වේදනාව විඳ දරාගැනීමට නොහැකිව ඈ උමතු වූවා ය. ශරීරයේ රෙදිකඩක් වත් නොමැතිව බුදුරජාණන් වහන්සේ වෙත දිව ආවාය. අසල සිටි කෙනෙක් ඇයට හැඳීමට වස්ත්‍රයක් දුන්හ. බුදුරජාණන් වහන්සේගේ මහා කාරුණික ගුණය ඇය වෙත යොමුවිය. ඇය බණ අසා පැහැදී පැවිදි වූවා ය. අවසන බුද්ධ ශාසනයේ විනයධර භික්ෂුණීන් වහන්සේලා අතර අගතනතුර ලැබීමට තරම් ඈ පින්වන්ත වූවා ය.

## ඡත්ත මානවක

සේතව්‍ය නුවර ඡත්ත නම් බමුණු තරුණයෙකු විය. උක්කට්ඨා නුවර පොක්ඛරසාති බමුණාගෙන් ශිල්ප හදාළ ඔහු ගුරු පඬුරු පිණිස කහවණු දහසක් රැගෙන නිවසේ සිට යන අතරමග සොරමුලක් හමුවිය. ඔවුන් මේ තරුණයාට පහර දී මේ මුදල් ලබාගන්නා බව දිවසින් දුටු බුදුරජාණන් වහන්සේ අතර මගට වැඩම කොට ගසක් මුල වැඩ සිටියහ. ඡත්ත මානවකගෙන් තොරතුරු විමසා බුදුරජාණන් වහන්සේ ඔහු තිසරණ පන්සිල්හි පිහිටුවා ''**යො වදතං පවරො මනුජේසු**'' යනාදී ගාථා පෙළක් දේශනා කළ හ.

එම ගාථා සිහිකරමින් ගමන්කරන ඔහුට සොර කණ්ඩායමක පහර දී මරා මුදල් පැහැරගත්හ. ඡත්තමානවක මියගොස් දෙව්ලොව උපන්නේය. සිය ඥාති පිරිස අවසන් කටයුතු සිදුකරන සොහොනට පැමිණි දෙව්පුත් තමා දෙව්ලොව උපන් බව සඳහන් කළේ ය. එහි වැඩම කළ බුදුරජාණන් වහන්සේ දහම් දෙසූහ. එම ධර්මය අසා ඡත්තමානවක දෙව්පුත් ඇතුළු බොහෝ දෙනෙක් ධර්මාවබෝධය ලබාගත්හ.

## මට්ඨකුණ්ඩලී

කිසිවෙකුටත් කිසිවක් නොදෙන ඉතා ලෝභ බමුණෙක් සැවැත්නුවර වාසය කළේ ය. ඔහු නමින් අදින්නපුබ්බක නම් විය. දැඩි ලෝභකම නිසා බමුණා, තමන් ම රන් කැල්ලක් තලා සිය පුතුට කුණ්ඩලාභරණයක් සාදා දුන්නේ ය. එය පැළඳ සිටි පුතු මට්ඨකුණ්ඩලී නමින් ප්‍රකට විය. අදින්නපුබ්බක බමුණා සිය බිරිඳට හෝ දරුවාට පෝෂ්‍යදායී ආහාර ලබා නොදුන්නේ ය. මෙනිසා පුතුට පාණ්ඩු රෝගය සෑදිණි. මුදල් වියදම් වන නිසා රෝගයට නිසි බෙහෙත් කිරීමට පවා කටයුතු නො කළේ ය. අවසානයේ පුතු මරණාසන්න විය. පුතා මිය ගියහොත් ඔහු බැලීමට නිවසට එන මිනිසුන් මාගේ ධනය දකිතියි සිතූ බමුණා ඇඳ පිටින් ම පුතා ඔසවාගෙන ගොස් පිලෙහි තැබී ය.

මවගේ පියාගේ පවා පිහිටක් නොමැතිව අසරණව මරණාසන්නව සිටි මට්ඨකුණ්ඩලී දරුවා දිවසින් දුටු බුදුරජාණන් වහන්සේ අනුකම්පාවෙන් ඔහු වෙත වැඩම කළ හ. බුදුරජාණන් වහන්සේ දුටු මට්ඨකුණ්ඩලී ඉතා සතුටට පත් වූ අතර සතුටු සිතින් මියගොස් දෙව්ලොව උපන්නේ ය. ඉන්පසු එම දිව්‍ය පුත්‍රයා මිනිස් ලොවට පැමිණ සිය ලෝභී පියා බුදුරජාණන් වහන්සේ වෙත යොමු කළ අතර පියාගේ ලෝභකම නැති කිරීමට ද කටයුතු කළේ ය. මට්ඨකුණ්ඩලී දිව්‍යපුත්‍රයාගේ ක්‍රියා කලාපය බොහෝ දෙනෙකුට ධර්මාවබෝධය ලැබීමට හේතුවක් විය.

## අංගුලිමාල



කොසොල් රජතුමාගේ පුරෝහිත වූ භාර්ගව බමුණාගේ හා මන්තානි බැමිණියගේ පුතා අහිංසක නම් විය. ඔහු ශිල්ප උගත්තේ තක්සලා නුවර දිසාපාමොක් ඇදුරුතුමාගෙනි. අහිංසක ඉතා දක්ෂ හා ගුරු භක්තියෙන් යුතු සිසුවෙකු විය. මෙනිසා අනෙක් ශිෂ්‍යයෝ එයට ඊර්ෂ්‍යා කළ හ. ඔවුහු ගුරුතුමාට කේලම් කියා අහිංසක කුමරු හා ගුරුතුමා අතර තිබූ විශ්වාසය බිඳවූහ. අහිංසක කුමරු යම් කෙනෙකු අතින් මරුමුවට පත්කරවීමට සිතූ ගුරුතුමා ඇඟිලි දහසක මාලයකින් ගුරු පූජාවක් පවත්වන ලෙස දැන්වීය.

ගුරුතුමාගේ ඉල්ලීම මත මිනිසුන් මරා එක් මිනිසෙකුගෙන් ඇඟිල්ල බැගින් ගෙන බෙල්ලේ එල්ලාගත් බැවින් අහිංසක අංගුලිමාල නමින් ප්‍රකට විය. අවසානයේ සිය මව වුව ද මරා ඇඟිලි දහස සපුරාගනිමියි, සූදානමින් සිටින අංගුලිමාල දිවසින් දුටු බුදුරජාණන් වහන්සේ එහි වැඩමකොට අංගුලිමාල දමනය කර පැවිදි කළ සේක. රහත්වීමට පින තිබූ ඔහු බුදුරජාණන් වහන්සේ නොවැඩියේ නම් මෑණියන් මරා ආනන්තරිය පාප කර්මයක් සිදුකර ගැනීමට ඉඩ තිබිණ. පසුව අංගුලිමාල තෙරුන් ගැබිණි මවක් උදෙසා කරුණාවෙන් දේශනා කළ අංගුලිමාල පිරිත අදත් මව්වරුන්ට මහත් ආශිර්වාදයක් ගෙනදෙයි.

**දෙව්දත් තෙරුන් වහන්සේ**

**ඉඳ ඉඳ එක වෙහෙර - විඳ විඳ දහම් මනහර**
**සිඳබිඳ දුක් සසර - අහෝ දෙව්දත් නොදුටි මොක්පුර**

සුප්පබුද්ධ රජුගේ පුතා වූ දෙව්දත් කුමරු බුදුරජාණන් වහන්සේගේ ඥාතිවරයෙකි. දෙව්දත් කුමරු පැවිදිවූයේ බුදුරජාණන් වහන්සේ පළමුව කිඹුල්වත්පුරයට වැඩම කළ අවස්ථාවේ දී ය. ඔහු සමග භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු, කිම්බිල සහ උපාලි යන කුමාරවරු පැවිදි වූ හ. දෙව්දත් තෙරුන් හැර සෙසු සය දෙනාම රහත් වූ හ. දෙව්දත් තෙරුන් ධ්‍යාන ලබාගත්තේ ය. ඒවා ද උන්වහන්සේ යොදා ගත්තේ අයහපත පිණිසයි. ධ්‍යාන බලය පෙන්වා අජාසත් කුමරු මිතුරු කරගත් දෙව්දත් තෙරුන් ''**මම බුදුන් මරා බුදු වන්නෙමියි ඔබ ද පියා මරා රජවන්නැයි**'' ද කියා බිම්බිසාර රජු මරා දැමීමට උපදෙස් ලබා දුන්නේ ය.



කොසැඹෑ නුවර දී බුදුරජාණන් වහන්සේ සැරියුත් මුගලන් හිමිවරුන්ට අග තනතුරු ලබාදීමේ දී තමාට තනතුරු ලබා නොදුන්නේ යැයි වෛර බැඳගත් දෙව්දත් තෙරුන් බුදුරජාණන් වහන්සේට බොහෝ හිරිහැර කළේ ය. අජාසත් කුමාරයා සැවැත්නුවර ගයාවෙහි කරවා දුන් ආරාමයේ අධිපතිත්වය දරමින් තමන්ට සංඝයා පාලනය කිරීමට පවරන ලෙස ඉල්ලා සිටියේ ය. එහෙත් බුදුරජාණන් වහන්සේ එයට අවසර නොදුන් නිසා තවත් වෛරය වැඩි වූයේ ය.

දෙව්දත් තෙරුන්ටත් බුදුබව ලැබීමට අවශ්‍ය විය. ඔහු සිතුවේ බුදුරජාණන් වහන්සේ ඝාතනය කොට බුදුබව ලැබිය හැකි බවයි. ඒ සඳහා අජාසත් රජුගේ සහාය ඇතිව දුනුවායන් යොදවා බුදුරජාණන් වහන්සේ මැරවීමට උත්සාහ ගත්තේ ය. එහෙත් එය අසාර්ථක විය. මෙයින් නොනැවතුන දෙව්දත් තෙරණුවෝ බුදුරජාණන් වහන්සේ ගිජ්ඣකූට පර්වත පාමුල සක්මන් කරමින් සිටින විට විශාල ගලක් පෙරලූහ. තවත් ගල් දෙකක් එහි ගැටීම නිසා එම ගල නැවතිනි. එහෙත් එහි පතුරක් වැදී බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාදයේ ලේ පිරිණ. ජීවක වෛද්‍යතුමා එයට ප්‍රතිකාර කළේ ය. දෙව්දත් තෙරුන් බුදුරජාණන් වහන්සේගේ ලේ සෙලවීම මගින් ආනන්තරිය පාප කර්මය සිදුකර ගත්තේ ය.

මෙයින් නොනැවතුන දෙව්දත් තෙරණුවෝ බුදුරදුන් ඝාතනය කිරීමේ අදහසින් නාලාගිරි ඇතාට රා කළ සොළසක් පොවා මත් කොට බුදුරදුන් ඉදිරියට එවීය. එහෙත් බුදුරජාණන් වහන්සේගේ මහාකරුණාව හමුවේ ඇතා දමනය විය. දෙව්දත් තෙරුන් පරාජයට පත්විය. මෙවැනි ක්‍රියා පිළිබඳ දැනගත් මහජනයා ද දෙව්දත් තෙරුන්ට අප්‍රසාදය පළකළේ ය. කරුණු අවබෝධ වූ අජාසත් රජතුමාත් දෙව්දත් තෙරුන්ට කළ සත්කාර නතර කළේ ය. මෙයින් දෙව්දත් තෙර අසරණ විය.

අවසානයේ වර පහක් ඉල්ලා බුදුරජාණන් වහන්සේ ඒවාට අවසර නොදුන් බැවින් සඟ පිරිසක් එක්කොටගෙන සංඝභේදයක් ද ඇති කළේ ය. මෙවැනි ක්‍රියා කළ උන්වහන්සේ අවසානයේ ස්වකීය ශිෂ්‍ය කෝකාලික භික්ෂුව විසින් වැලමිටෙන් ඇණීම නිසා ලේ වමනය කොට රෝගාතුර විය. අසනීපයෙන් මාස නවයක් ගත කළ අනතුරුව බුදුරජාණන් වහන්සේ සරණ ගියේ ය. බුදුරජාණන් වහන්සේ දකිනු කැමැතිව ජේතවනාරාමයට එන අතරමග දී ඔහු පණ පිටින් ම අපායට ඇදගෙන ගියේ ය. ඔහු බුදුරදුන්ට හිරහැර කළ ද අවසානයේ බුදුන් සරණ ගොස් මියගිය නිසා අපායේ දුක්විඳ අවසන් වූ දිනක සට්ඨිස්සර නම් පසේ බුදුවරයෙකු වී උපත ලබන බව විශ්වාසය යි.

**අභ්‍යාස**

01. බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලද ඉහත සඳහන් අයට අමතරව තවත් ගුරු හිමියන්ගේ ද උදව් ඇතිව එවැනි චරිත දෙකක් පිළිබඳ විස්තර සොයා ලියන්න.
02. ඉහත සඳහන් කතා වස්තු අතරින් ඔබ කැමති කතා වස්තුවක සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

03 පාඩම

# බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණ සමය

බුදුරජාණන් වහන්සේගේ වයස අවුරුදු හැත්තෑ නවයක් වන විට සැවැත්නුවරින් උළුම්ප නම් ශාක්‍ය ගම්මානයට වැඩම කළ හ. මේ අතරතුර රජකම අහිමි වූ කොසොල් රජතුමා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ වන්දනා කොට සමුගැනීම සිදුවිය. උළුම්ප ගමෙහි ටික කලක් විසූ උන්වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පර්වතය වෙත වැඩම කළ හ. ඒ වන විට විශාලා මහනුවර ඉතා සශ්‍රීක නගරයකි. මෙහි ලිච්ඡවි රජ දරුවන් හත්දාස් හත්සිය හැත්තෑ හත් දෙනෙකු පාලන කටයුතු කළ බව සඳහන් වේ. අජාසත් රජතුමා මෙම නගරය යටත් කරගැනීමේ ආශාවෙන් සිටි බව පෙනේ. ඒ සඳහා ලිච්ඡවි රාජ්‍ය සීමාවේ පාඨලී නම් ගමෙහි සුනීධවස්සකාර යන ඇමැතිවරුන්ට නගරයක් ඉදිකිරීමට භාර කළේ ය. ඔවුහු එහි ගොස් අජාසත් රජු ලිච්ඡවීන් පැරදවීමට අදහස් කරන බව බුදුරදුන්ට දැන්වූ හ. බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ ලිච්ඡවීන් ළඟ ඇති සප්ත අපරිහාණීය ධර්ම පිළිපදින තෙක් ඔවුන් කිසි දිනක පරාජය කළ නො හැකි බව යි.

එසේ ම බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාටත් අපරිහාණීය ධර්ම එක් සාළිසක් දේශනා කළ සේක. ඉක්බිතිව පාඨලී ගමට වැඩම කළ බුදුරජාණන් වහන්සේට සුනීධවස්සකාර ඇමැතිවරු ප්‍රධාන පිරිස දන් පිළිගැන්වූහ. පාඨලී ගම්වැසියෝ ආරාමයක් ද පූජා කළ හ. ඔවුන්ට දුසිල්වත් බවේ ආදීනව හා සිල්වත් බවේ ආනිශංස දේශනා කළ උන්වහන්සේ එයින් පිටත්ව ගංගා නම් නදිය වෙත වැඩම කළ හ. එය ගෝතම තිත්ථ නම් විය. එදා පාඨලී ග්‍රාමයෙන් පිටත් වූ තැන ගෝතම ද්වාර නම් විය. ධර්මාශෝක අධිරාජයාගේ කාලයේ පාඨලීපුත්‍ර නමින් දඹදිව අගනුවර ලෙස ප්‍රසිද්ධියට පත්වූයේ ඒ පාඨලී නගරය යි.

බුදුරජාණන් වහන්සේ ඇතුළු භික්ෂු පිරිස එදා ගංගා නම් නදිය වෙත වැඩම කරන විට ගංගාව උතුරාගොස් තිබිණ. සෙසු ජනයා ගංගාවෙන් එතරවීමට පහුරු බඳිමින් සිටින අතර බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරාගෙන ඍද්ධියෙන් වැඩම කළ හ. එතැනින් කෝටි ග්‍රාමයටත්, ඤාතික ග්‍රාමයටත් වැඩම කොට ස්වල්ප වේලාවක් වැඩ සිට විශාලා මහනුවරට වැඩම කළ හ. විශාලා මහනුවර සිටි ප්‍රසිද්ධ ගණිකාවක් වූ අම්බපාලි නැමැති තැනැත්තිය ඇය සතු වනය බුදුරජාණන් වහන්සේට පූජා කළා ය. එය පිළිගත් බුදුරජාණන් වහන්සේ ඇය ඇතුළු පිරිසට මහා සතිපට්ඨාන සූත්‍රය දේශනා කළ සේක.

### අන්තිම වස සහ ආයු සංස්කාරය අත්හැරීම

සිය ජීවිතයේ අසූවන වියට පත් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට විශාලා මහනුවර අවට වස් වසන ලෙසට උපදෙස් දුන්සේක. උන්වහන්සේ ද බේලුව නම් ගමෙහි වැඩවාසය කළ අතර එහි දී ලෝහිත පක්ඛන්දිකා නම් (ලේ අතීසාරය) රෝගය හටගැනිණි. මෙයින් මහත් වේදනාවක් හටගත් අතර උන්වහන්සේ එය අධිෂ්ඨාන බලයෙන්

ඉවසූ සේක. එසේ ම තව දස මසකින් පිරිනිවන් පාන්නෙමි'යි ඉටාගත් සේක. මේ රෝගය නිසා කම්පාවට පත්ව සිටි ආනන්ද හිමියන් ඇමතූ බුදුරජාණන් වහන්සේ තමන් වහන් සේ ගුරු මුෂ්ටියක් නොමැතිව සියලු ධර්මය දේශනා කොට ඇති බවත්, ධර්මය ම පිහිට කොටගෙන වාසය කරන ලෙසත් උපදෙස් දුන් සේක.

බේලුව ගමින් සැවැත්නුවරට වැඩම කළ බුදුරජාණන් වහන්සේ තවත් සිව් මසකින් තමන් වහන්සේ පිරිනිවන් පානා බව ප්‍රසිද්ධියේ ම ප්‍රකාශ කළ සේක. මෙය අසා රහතන් වහන්සේලා ධර්ම සංවේගය ඇතිකරගත් අතර පෘථග්ජන භික්ෂූහු හඬා වැලපෙන්නට පටන් ගත්හ. සමහරු තැන් තැන්වලට වී කතාබස් කරන්නට වූ හ. ඒ අතර සිටි ධම්මාරාම නම් භික්ෂුව පසෙකට වී භාවනා කරන්නට විය. ''බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන්නට පෙර කෙසේ හෝ මම රහත්වෙමියි'' සිතා එසේ කරන්නට විය. මෙය දුටු අනෙක් භික්ෂූන් වහන්සේලා ධර්මාරාම භික්ෂුවට චෝදනා කරමින් බුදුරජාණන් වහන්සේට මේ බව දැන් වූ හ. තමාට හිතවත් සෑම කෙනෙක් ම ධම්මාරාම භික්ෂුව සේ ක්‍රියාකළ යුතු යැයි ද උන්වහන්සේ ආදර්ශයට ගතයුතුයැයි ද බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් හ.

## අග්‍රශ්‍රාවකයන් වහන්සේලා පිරිනිවන් පාති

අග්‍රශ්‍රාවක සැරියුත් මහරහතන් වහන්සේ ස්වකීය ආයු කාලය අවසන් බව දැනගෙන බුදුරජාණන් වහන්සේ වෙත වැඩම කොට පිරිනිවන් පාන්නට අවසර ගත් හ. ඉක්බිතිව සිය මෑණියන් සොයා වැඩම කළ හ. ඒ වන විටත් මෑණියන් සිටියේ මිථ්‍යාදෘෂ්ටිකව ය. ඇය තිසරණයෙහි පිහිටුවා සිය නිවසේ දී ම උන්වහන්සේ පිරිනිවන් පෑහ. එහි වැඩමකළ බුදුරජාණන් වහන්සේ සැරියුත් හිමියන්ගේ සිරුර ආදාහනය කරවා සෑයක් ද ඉදිකරවූහ. ඉක්බිතිව රජගහනුවරට වැඩම කළ හ.

අග්‍රශ්‍රාවක මුගලන් මහරහතන් වහන්සේගේ ද ආයු කාලය අවසන් විය. ඒ රජගහනුවර කාලසිලා වනයෙහි වාසය කරන අතරතුරය. තීර්ථකයන්ගේ මෙහෙයවීම මත සොරු කණ්ඩායමක් පැමිණ උන්වහන්සේට පහර දී මියගියේ යැයි සිතා පලා ගිය හ. එහෙත් උන්වහන්සේ සෘද්ධියෙන් බුදුරජාණන් වහන්සේ වෙත වැඩමකොට අවසර ගෙන කාලසිලාවේ දී ම පිරිනිවන් පෑහ. බුදුරජාණන් වහන්සේ මුගලන් මහරහතන් වහන්සේගේ සිරුර ද ආදාහනය කරවා සෑයක් ඉදිකරවූහ. අනතුරුව උන්වහන්සේ උක්කචේලා නම් නියම් ගමට ද එතැනින් චාපාල චෛත්‍ය නම් ස්ථානයට ද වැඩම කළ සේක.

සතර සෘද්ධිපාද වැඩූ කෙනෙකුට කල්පයක් හෝ ඊට වැඩි කාලයක් ජීවත්විය හැකිබව බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන්ට සඳහන් කළ හ. එහෙත් මාරාවේශයෙන් සිත අවුල්ව සිටි ආනන්ද හිමියන්ට කතා කර ගැනීමට නොහැකි විය. මේ අවස්ථාවේ වසවර්ති මාරයා පැමිණ පිරිනිවන් පානා ලෙසට බුදුරජාණන් වහන්සේට ආරාධනා කළේ ය. බුදුරජාණන් වහන්සේ එය පිළිගෙන තව තෙමසකින් පිරිනිවන් පානා බව ප්‍රකාශ කරමින් ආයුසංස්කාරය අත් හළ හ. එවිට මහ පොළව කම්පා විය. මහපොළව කම්පාවෙනු දුටු ආනන්ද හිමියෝ එයට හේතු විමසා තවත් කල්පයක් වැඩ සිටීමට ආරාධනා කළහ. එහෙත් එයට කාලය ඉක්මගොස් ඇති බව බුදුරජාණන් වහන්සේ වදාළහ. අනතුරුව

විශාලා මහනුවර කූටාගාර ශාලාවට සියලු සංඝයා රැස්කරවා තමන් වහන්සේ තවත් තුන්මසකින් පිරිනිවන් පානා බවත්, සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බවත්, සත්තිස් බෝධිපාක්ෂික ධර්ම ප්‍රගුණ කරන ලෙසත් දැනුම් දුන් සේක.

**මහා ප්‍රජාපතී ගෝතමී හා යශෝධරා තෙරණිවරු පිරිනිවන් පාති**

බුද්ධමාතා ලෙසින් ප්‍රසිද්ධ වූ මහා ප්‍රජාපතී ගෝතමී තෙරණින් වහන්සේ මෙන් ම යශෝධරා රහත් තෙරණින් වහන්සේ ද බුදුරජාණන් වහන්සේ වැඳ අවසර ගෙන පිරිනිවන් පෑහ. විනය දේශනා කිරීම් ආදී ශාසනික කටයුතු රැසක් සිදු වූ විශාලා මහනුවරින් අවසන්වරට පිටත්වීමට ප්‍රථම බුදුරජාණන් වහන්සේ ඇත් බැල්මෙන් යුතුව ආපසු හැරී නගරය දෙස බලා වැඩම කිරීම ද විශේෂත්වයකි. ඉක්බිතිව භාණ්ඩග්‍රාමය, හස්ති ග්‍රාමය, අම්බග්‍රාමය, ජම්බු ග්‍රාමය යන නගර පසුකරමින් භෝග නගරයට වැඩමකළ උන්වහන්සේ ආනන්ද චේතියෙහි නවාතැන් ගත් හ. එහි සිට භික්ෂූන් වහන්සේලාට සතර මහාපදේශ දේශනා කළ හ.

ඉක්බිති පාවා නුවරට වැඩම කොට චුන්දකම්මාර පුත්‍රයාගේ අඹ වනයෙහි වැඩ සිටි අතර බුදුරජාණන් වහන්සේට අවසන් වරට චුන්දකම්මාර පුත්‍ර විසින් දානයක් පිළිගැන්වීය. සූකරමද්දව නම් වූ මෙම දානය වැළඳීමෙන් උන්වහන්සේගේ යටපත්ව තිබූ ලෝහිත පක්ඛන්දිකා රෝගය යළිත් උත්සන්න විය.



පාවා නුවරින් කුසිනාරා නුවර බලා වැඩම කරන අතර බුදුරදුන්ට දැඩි වතුර පිපාස යක් ඇතිවින. ආනන්ද හිමියන් විසින් කුකුත්ථා නදියට ආසන්නයේ ඇති කුඩා නදියකින් බොර දිය පෙරා ගෙනවිත් දෙන ලදී. මේ අතරතුර පාවා නුවර බලා යන පුක්කුසාති නම් රජකෙනෙක් බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා තෙරුවන් සරණ ගිය අතර ඔහු වටිනා සළු දෙකක් පූජා කළේ ය. අවසන් වරට කුකුත්ථා නදියෙන් පැන් පහසු වූ බුදුරජාණන්

වහන්සේ චුන්ද හිමියන් විසින් සඟල සිවුර සතරට නමා පිළියෙල කර දුන් ආසනයේ මඳවේලාවක් වැඩ සිටියහ. එහි දී සුජාතාව දුන් මුල් ම දානයත් චුන්දකම්මාර පුත්‍ර අවසන් වරට දුන් දානයත් සම ආනිසංස ඇති බව දේශනා කළ සේක.

ඉක්බිතිව බුදුරජාණන් වහන්සේ මල්ල රජදරුවන්ගේ කුසිනාරා නුවර උපවත්තන සල් උයන වෙත වැඩම කොට එහි සල්ගස් දෙකක් අතර සිංහ සෙය්‍යාවෙන් සැතපුණහ. මේ අවස්ථාවේ ආනන්ද හිමියෝ ප්‍රශ්න කිහිපයක් ඇසූහ. ඒවාට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ ශ්‍රද්ධාවන්ත කුල පුත්‍රයන් විසින් දැක පහන් සංවේගය ඇතිකරගත යුතු ස්ථාන සතරක් ඇතිබව දේශනා කළ හ. එනම් බුදුරජාණන් වහන්සේ උපන් ස්ථානය, බුදු වූ ස්ථානය, දම්සක් දෙසූ ස්ථානය හා පිරිනිවන් පෑ ස්ථානය යි. ආදාහනය කිරීම පිළිබඳ විස්තර කළ උන්වහන්සේ සම්මා සම්බුදු, පසේ බුදු, මහරහත්, සක්විති රජ යන සිවුදෙනා ස්තූප තනා පිදිය යුත්තන් බව පෙන්වා දුන් හ. භික්ෂූන් වහන්සේලා කාන්තාවන් කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය පිළිබඳවත් දේශනා කළ හ.

## පරිනිර්වාණය හා අවසන් ශ්‍රාවකයා

පිරිනිවන් පෑමට ආසන්නයේ සිටිය දී සුභද්‍ර නැමති පිරිවැජියෙක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ප්‍රශ්නයක් ඇසීමට උත්සාහ ගත්හ. ආනන්ද හිමියන් එන්නට නොදී වළකනු දුටු බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ වෙත එන්නට ඉඩදෙන ලෙස දැන්වී ය. එහි දී ඔහු පැමිණ බණ අසා සෝවන් වූ අතර බුදුරදුන්ගේ අනුදැනුම මත ආනන්ද හිමියෝ ඔහු පැවිදි කළ හ. පැවිදි වී ටික වේලාවකින් විදසුන් වඩා රහත් වූ සුභද්‍ර භික්ෂූන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ අවසන් ශ්‍රාවකයා වීමේ වරම හිමිකර ගත් හ.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව ධර්මය ගුරු තනතුරෙහිලා තබාගන්නා ලෙසත් තමන් වහන්සේ ද ධර්මය ගුරු තනතුරෙහිලා තබාගත් බවත් දේශනා කළ සේක. එසේ ම අවසාන වශයෙන් භික්ෂූන් වහන්සේලා ඇමතූ බුදුරජාණන් වහන්සේ

**හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො**
**වය ධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ**

යනුවෙන් **''මහණෙනි, කරුණාවෙන් ඔබ අමතමි. සියලු සංස්කාර ධර්මයෝ නැසෙන සුළුය. එබැවින් නොපමාව සසුන්කිස සම්පූර්ණ කරත්වා'යි''** දේශනා කළ සේක.

ඉක්බිතිව උන්වහන්සේ පිළිවෙළින් ප්‍රථමධ්‍යාන ආදී රූප අරූප ධ්‍යානවලටත් එයින් නිරෝධ සමාපත්තියටත් සමවැදී ආපසු චතුර්ථ ධ්‍යානය දක්වා පැමිණියහ. වෙසක් පුර පසළොස්වක පොහෝදා රාත්‍රී අළුයම උදාවන්නට පෙර උපතින් අසූ වයස් සපිරි, බුද්ධත්වයෙන් පන්සාළිස් වසක් සපිරි අප ගෞතම බුදුරජාණන් වහන්සේ සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යතාව ලොවට පසක් කරමින් නිරුපාදිසේස නිර්වාණ ධාතුවෙන්

පිරිනිවන් පා වදාළ සේක. මේ අවස්ථාවේ ආනන්ද හිමියන් ප්‍රධාන පෘථග්ජනයෝ හඬා වැලපෙන්නට පටන් ගත් හ. රහතන් වහන්සේලා ධර්ම සංවේගය ඇතිකර ගත් හ. අනුරුද්ධ මහරහතන් වහන්සේ හඬා වැලපෙන පිරිසට ධර්මාවාද දෙමින් අස්වසන්නට වූ හ.

**ආදාහන පූජාව හා ධාතූන් වහන්සේලා බෙදාදීම.**

ආනන්ද හිමියෝ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ බව මල්ල රජදරුවන්ට දැන් වූ හ. ඔවුහු රැස් වී හඬා වැලපී ආදාහන කටයුතු සංවිධානය කළ හ. බුදු සිරුර දින සතක් ම උපවත්තන සල් උයනේ තබා ගෞරව දැක්වීමට අවස්ථාව සලසා දුන් හ. අටවන දින මල්ල රජදරුවන්ගේ මකුට බන්ධන චෛත්‍ය හෙවත් අභිෂේක කරන තැනට වැඩමවන ලදී. ආනන්ද හිමියන්ගේ උපදෙස් පරිදි ආදාහන කටයුතු සංවිධානය කෙරිණි. බුදු සිරුර අළුත් කසී සළුවකින් හා කපු පුළුන්වලින් වෙලා සුවඳ තෙල් පිරූ දෙනක බහා රන් දෙනකින් වසා සුවඳ දර පිර වූ සෑයක තැන්පත් කළ හ. මල්ල රජකුමාරවරු සතර දෙනෙක් සුවඳ පැනින් හිස්සෝදා නා පිරිසිදු වී අලුත් වස්ත්‍රයෙන් සැරැසී ආදාහන චිතකයට ගිනි දැල් වූ හ. එහෙත් එය ගිනි නොදැල්විණි. අනුරුද්ධ හිමියන්ගෙන් එයට පිළිතුරු ලැබිණ. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ වඩිනතුරු සිටින ලෙස දැන්වීය. මහා කාශ්‍යප හිමියන් වැඩමකොට බුදු සිරුර ප්‍රදක්ෂිණා කොට වැඳ සමුගන්නවාත් සමඟ චිතකය ගිනි දැල්විණ.

බුදුරජාණන් වහන්සේ අධිෂ්ඨාන කොට තිබූ පරිදි සතර දළදාවත්, අකුධාතු දෙක, ලලාට ධාතුව යන සත් ධාතූන් වහන්සේලා හැර ඉතිරි සියළු ධාතූන් වහන්සේලා අබ ඇට, කඩ සහල් සහ මුං පියලි තරමට විසිර ගියේ ය. සෑය නිවී ගිය පසු මල්ල රජදරුවෝ සුවඳ පැන් ඉස ධාතූන් වහන්සේලා එක්රැස් කොට රන්දෙනක බහා ඇතුපිටින් වැඩමවාගෙන ගොස් නුවර සන්ථාගාරය මැද තැන්පත් කොට රාජ්‍ය ගෞරව සහිතව දින සතක් තිස්සේ ධාතු පූජා පැවැත් වූ හ.

බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා තමන්ට ලැබුණ සම්පතක් බවත්, එය කිසි කෙනෙකුට නොදී තබාගතයුතු බවත් මල්ල රජදරුවන්ගේ අදහස විය. එහෙත් බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා අපටත් අයිතියැ'යි, පවසමින් බොහෝ රජවරු කුසිනාරාව වටකොට ගත් හ. ඒ අතර මගධාධිපති අජාසත් රජු, විශාලානුවර ලිච්ඡවීහු, කපිල වස්තුවේ ශාක්‍යයෝ, අල්ලකප්පරට බූලියෝ, රාමග්‍රාමයේ කෝලියෝ, වේඨ දීපවාසී බ්‍රාහ්මණයෝ, පාවා නුවර මල්ලයෝ ද වූ හ. මෙහි දී යුද්ධයක් ඇතිවීමට ඇති හැකියාව ද්‍රෝණ නම් බ්‍රාහ්මණතුමා දුටුවේ ය. කාගේත් පිළිගැනීමට පාත්‍රව සිටි එතුමා සියලු දෙනාට කාරණා පැහැදිලිකොට දුන්නේ ය. සියලු පිරිස් සමගිකොට ධාතු කොටස් අටකට බෙදා ධාතු බෙදූ නැලිය පූජා වස්තුවක් ලෙස තෙමේම තබා ගත්තේ ය. පිප්ඵලි වනයේ මෝරිය රජවරු පැමිණෙන විට ධාතූන් වහන්සේලා බෙදා අවසන් නිසා ඔවුහු දර සෑයේ අඟුරු ගෙය ගිය හ. සෑම දෙනා ම ධාතූන් වහන්සේලා ගෙන ගොස් ස්තූප තැනූහ. ඒ අනුව ධාතු කොටස් අට, ධාතූන් බෙදූ නැලිය සහ සෑයේ අඟුරු යනුවෙන් බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ධාතු තැන්පත් කොට තැනූ ස්තූප ගණන දහයකි.

## අභ්‍යාස

01. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට පෙර පිරිනිවන් පෑ මහරහතන් වහන්සේලා සිව්නමකගේ නම් ලියන්න. ඉන් එක් අයකු පිළිබඳ කෙටි සටහනක් ලියන්න.
02. බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා තැන්පත් කොට ස්තූප ඉදිකළ පිරිස් සඳහන් කරන්න.
03. බුදුරජාණන් වහන්සේගේ අවසන් බුද්ධ වචනය මතකයෙන් කියන්න.

04 පාඩම

# ශ්‍රේෂ්ඨ ශ්‍රාවක චරිත හඳුනා ගනිමු.

## (01). අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ පොසොන් පුර පසළොස්වක පොහොය දිනෙක ශ්‍රී ලංකාද්වීපයට වැඩම කළ හ. ඒ තෙවෙනි ධර්ම සංගායනාවෙන් පසු ලෝකයේ රටවල් නවයකට උතුම් වූ ශ්‍රී සද්ධර්මයේ පණිවුඩය පතුරුවා හැරීමේ තීරණයෙහි මාහැඟි ප්‍රතිඵලයක් ලෙසයි. මිහිඳු මහරහතන් වහන්සේ සමග ඉත්ථිය, උත්තිය, සම්භල, භද්දසාල යන රහතන් වහන්සේලා සිව්නමත් ෂඩ් අභිඥාලාභී සුමන සාමණේරයන් වහන්සේත් අනාගාමීව සිටි භණ්ඩුක උපාසකතුමාත් යන පිරිස සැපත් වූ හ.

මිහිඳු මහරහතන් වහන්සේ වැඩසිටි ගල්තලාව පා මුලින් තිස්ස රජතුමා මුවෙකු පසුපස හඹා ගියේ ය. එය දුටු මිහිඳු මහරහතන් වහන්සේ ''තිස්ස'' ''තිස්ස'' නමින් හඬ ගැසූ හ. මාගේ නමින් හඬ ගසන්නේ කවරෙක් ද යි, රජතුමා හැරී බැලී ය. මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ ආර්යයන් වහන්සේලා දුටු රජු නුඹ වහන්සේලා කවරහු ද යි, ඇසී ය. එයට පිළිතුරු දුන් මිහිඳු මහරහතන් වහන්සේ

| | | |
|---|---|---|
| සමණා මයං මහාරාජ | - | ධම්මරාජස්ස සාවකා |
| තවෙව අනුකම්පාය | - | ජම්බුදීපා ඉධාගතා |

මහරජ, අපි ධර්මරාජයන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙමු. නුඹලා කෙරෙහි අනුකම්පාවෙන් දඹදිව සිට මෙහි පැමිණියෙමු යි, ප්‍රකාශ කළ හ. රජතුමාට ක්ෂණයකින් සිහියට ආවේ පෙර ධර්මාශෝක අධිරාජයා එවූ පණිවුඩයෙහි සඳහන්ව තිබූ තුණුරුවන පිළිබඳවය. දෙදෙනාම පිළිසඳරෙහි යෙදුණහ.

ඉහත දැක්වූයේ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ අප ශ්‍රී ලංකාද්වීපයට බුදු දහම හඳුන්වා දීම පිළිබඳ අප කා අතරත් ප්‍රකටව ඇති ඓතිහාසික සිදුවීමෙහි සමාරම්භක අවස්ථාව යි. අප රටට බුදු දහම පැමිණීම පිළිබඳ කතා කිරීමේ දී මිහිඳු මහරහතන් වහන්සේගේ නාමය නිතැතින් ම අපගේ සිහියට නැගෙයි. එසේම ලංකාවේ සිරිත් විරිත්, අක්ෂර කලාව, ගෘහ නිර්මාණ ශිල්පය යනාදී කවර අංශයක් ගැන කතා කළ ද එය මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනය හා සම්බන්ධ වෙයි. ලංකාවේ මුලු සංස්කෘතිය ම මිහිඳු මාහිමි ආගමනයෙන් පසුව සකස්ව සංවර්ධනය වී ඇති බව පැහැදිලි ය. මිහිඳු මාහිමි බුදුරදුන් ජීවමානව නොදුටුව ද, අසූමහා ශ්‍රාවකයෙකු නොවුණ ද අප උන් වහන්සේ දෙවෙනි කොට සලකනුයේ බුදුරජාණන් වහන්සේට පමණෙකි. අනුබුදු යන උත්තම

අභිධානයක් මිහිඳු මහරහතන් වහන්සේට යොදා ඇත්තේ එබැවිනි. එය ශ්‍රී ලාංකික අප උන් වහන්සේට ලබා දුන් ඉතා උසස්ම ගෞරව නාමයකි.

දඹදිව ධර්මාශෝක අධිරාජයා ගේත් වේදිසා දේවියගේත් පුතුණුවන් වූයේ මිහිඳු මාහිමි ය. සිය පියා වූ බින්දුසාර රජුගේ ඇවැමෙන් රාජ්‍යත්වයට පත් වූ අශෝක කුමරු ස්වකීය පිය රජුගේත් මුත්තණුවන් වූ චන්ද්‍රගුප්ත රජුගේත් රාජ්‍ය ප්‍රතිපත්තිය වූ දිග්විජය රට තුළ ක්‍රියාත්මක කර වීය. එනම් තම රාජ්‍ය සීමාවෙන් පිට පැවති දිශාවන් ද ස්වකීය අණසකට ගැනීම යි. අශෝක රජු ක්‍රියාත්මක කළ දිග්විජය ව්‍යාපාරයේ බිහිසුණුම අවස්ථාව කාලිංග දේශය යටත් කරගැනීම සඳහා කළ යුද්ධය යි. එම සටනින් ජයගත් හෙතෙම මුළු මහත් දඹදිවට ම අධිරාජයා බවට පත්විය. ඉතිහාසයේ බොහෝ පාලකයෝ යුධ ජයග්‍රහණය ලැබූ හ. එහෙත් යුද්ධයේ දී සිදු කළ අපරාධයන්ගේ බිහිසුණු බවක් ඔවුහු නො දුටුව හ. අශෝක චරිතය එයට වඩා හාත්පසින් ම වෙනස් වූවකි. යුද්ධයෙන් ජයග්‍රහණය ලැබුව ද එතුමා බලවත් පසුතැවිල්ලකට පත්ව මානසික පීඩාවෙන් කල් ගෙවීය. මිනිසුන්ට විපත් ගෙන දෙමින් සිදුකළ මෙම පීඩාකාරී පාලන රටාව හමුවේ අශෝක රජුට චණ්ඩාශෝක යන නමක් ද පටබැඳී තිබුණේ ය.

ස්වකීය බලවත් චිත්ත පීඩාව සමනය කර ගැනීම පිණිස රජු විවිධ ආගම්වල පිළිසරණ පැතී ය. එහෙත් ඒ එක ද ඉගැන්වීමකින් වත් පලක් නො වී ය. අවසානයේ දී එතුමාට සැනසිල්ල ගෙනදුන්නේ නිග්‍රෝධ නම් සාමණේරයන් වහන්සේගේ සන්සුන් ගමනයි. එය දැක පැහැදී රජ මාළිගයට වැඩමවා ''**අප්පමාදො අමතපදං......**'' යනාදී ධම්මපදයේ අප්පමාද වග්ගයේ ගාථාවෙන් බණ අසා සිත පහන් කර ගත්තේ ය. එදා තෙරුවන් සරණ ගොස් සැදැහැති බෞද්ධයෙකු වූ එතුමා මහජනතාව කෙරෙහි කරුණාව, දයාව, මෛත්‍රිය පතුරුවන්නට විය. සත්ත්ව ඝාතනය තහනම් කළ එතුමා මිනිසුන් සුව කිරීම පිණිස පමණක් නොව සතුන් සුවපත් කිරීම පිණිස ද, ආරෝග්‍ය ශාලා කරවී ය. බුදු දහමේ එන ඉගැන්වීම් ඉතා සරල බසින් ලියා සෙල් ලිපි මගින් රටපුරා ප්‍රචලිත කර වී ය. ධර්ම මහාමාත්‍යවරුන් පත් කළේ ය. අසූහාර දහසක් වෙහෙර විහාර ද ඉදි කළ එතුමා තමාගේ නමින් ම පාටලී පුත්‍රයෙහි අශෝකාරාමය ද කරවීය. මේ අනුව දිග් විජය සපුරාම අත්හැරි එතුමා ඒ වෙනුවට ධර්මවිජය ස්වකීය රාජ්‍ය පාලන ක්‍රමවේදය බවට පත් කර ගත්තේ ය. ඒ අනුව අශෝක රජු ධර්මාශෝක අධිරාජයා බවට පත්විය.

එවකට ශාසනයෙහි ප්‍රධානත්වය දැරුවේ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ ය. උන් වහන්සේ හමුවට ගිය අශෝක අධිරාජයා ''තමා දැන් ශාසනයෙහි උරුමකරුවෙකුවී දැ''යි විමසී ය. එවිට උන් වහන්සේ පැවසූයේ ශාසනයෙහි ඥාතිත්වය ලැබීමට නම් තම දරුවෙකු සසුන්ගත කළ යුතු බව ය. මෙම අදහස රජු වහාම සිය වැඩිමහලු දරු දෙදෙනාට ඉදිරිපත් කළේ ය. එම අදහස ක්‍රියාත්මක කිරීමට ඔවුහු නොපැකිලිව ඉදිරිපත් වූ හ. අශෝක රජුගේ රාජ්‍යත්වයෙන් සයවෙනි වසරේ දී මහින්ද හා සංඝමිත්තා යන දරු දෙදෙනා පැවිදි වූ හ.

මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ මිහිඳු මාහිමිගේ උපාධ්‍යායයන් වහන්සේ වූ අතර මහාදේව මහරහතන් වහන්සේ ආචාර්ය වූහ. උපතින් විසි වෙනි වියේ දී ප්‍රව්‍රජ්‍යාභාවයට පත් මිහිඳු මාහිමියෝ නොබෝ කලෙකින් ම සිව්පිළිසිඹියා පත් රහතන්

වහන්සේ නමක් බවට පත් වූ හ. අශෝක රජු බුදු දහම වැළඳ ගැනීමෙන් පසු අන්‍ය තීර්ථකයෝ ලාභසත්කාරවලින් පිරිහී ගියහ. සිතැඟි පරිදි ඔවුහු ම සිවුරු පොරවාගෙන සඟ මැද විසූහ. ඔවුහු සසුන සේ ම ධර්මය ද කෙලෙසන්නටත් විකෘති කරන්නටත් වූහ. මෙම තත්ත්වය දැනගත් ධර්මාශෝක අධිරාජයා මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ ගේ අනුශාසනා පරිදි සසුන සුරක්ෂිත කරවීම සඳහා තෙවෙනි ධර්ම සංගායනාව පැවැත් වී ය. සංගායනාවෙන් පසුව බුදු දහම ජගද්ව්‍යාප්ත තත්ත්වයට පත් කරවීම සඳහා රටවල් නවයකට ප්‍රචාරය කරන ලද්දේ ධර්ම දූතයන් වහන්සේලා මාර්ගයෙනි.

| රට | ප්‍රධාන ධර්ම දූතයන් වහන්සේ |
|---|---|
| කාශ්මීර ගන්ධාර දේශය | මජ්ඣන්තික තෙරුන් |
| මහිස මණ්ඩලය | මහාදේව තෙරුන් |
| වනවාසී දේශය | රක්ඛිත තෙරුන් |
| අපරන්ත දේශය | යෝනක ධම්මරක්ඛිත තෙරුන් |
| මහා රාෂ්ට්‍ර දේශය | මහා ධම්මරක්ඛිත තෙරුන් |
| යෝනක දේශය | මහා රක්ඛිත තෙරුන් |
| හිමවන්ත දේශය | මජ්ඣිම තෙරුන් |
| සුවණ්ණ භූමිය | සෝණ හා උත්තර හිමිවරුන් |
| තම්බපණ්ණි දීපය | මහින්ද තෙරුන් |

ශ්‍රී ලංකාද්වීපය කෙරෙහි සුවිශේෂී සැලකිල්ලක් දැක් වූ ධර්මාශෝක අධිරාජයා ස්වකීය පුත්‍රයා වූ මිහිඳු මහරහතන් වහන්සේ ම මෙරටට පිටත් කොට එවීය. මිහිඳු මා හිමියෝ ද ලක්දිවට වැඩමවීමට සුදුසු කාලය බලමින් වැඩ සිටියහ. එවකට ලංකාවේ රාජ්‍යත්වය දැරූ මුටසීව රජු පසුවූයේ ඉතා වයෝවෘද්ධ තත්ත්වයේ ය. එබැවින් එතුමාට ධර්මය අවබෝධ කරවීම හා රට තුළ රාජ්‍ය අනුග්‍රහයෙන් ධර්මය ප්‍රචාරය කරවීම පහසු නොවන බව උන් වහන්සේ මනාව දැන සිටිය හ. එබැවින් ගමනට සුදුසු කාලය එළඹෙන තෙක් විදිසාවෙහි ගත කළ හ. ඉක්බිති මාස සතකට පසු මුටසීව රජු මිය ගියේ ය. ඔහුගේ ඇවෑමෙන් දේවානම්පියතිස්ස රජු ලක්දිව රජවිය. ලක්දිවට වැඩමවීමට සුදුසු කාලය මෙය බව වටහා ගත් මිහිඳු මාහිමියෝ බුද්ධ වර්ෂ 237දී හෙවත් ක්‍රි. පූ. 307 වැන්නෙහි පොසොන් පුර පසළොස්වක පොහෝදා ශ්‍රී ලංකාද්වීපයට වැඩම කළ හ.

දේවානම්පියතිස්ස රජු හමුවෙන් පසු මිහිඳු මාහිමි පළමුවෙන් ම සිදු කළේ රජුගේ බුද්ධිය පරීක්ෂා කිරීමයි. රජුට කෙබඳු ධර්ම දේශනාවක් පැවැත්විය යුතුදැයි තීරණයකට බැසීම එම බුද්ධි පරීක්ෂණයේ අරමුණ විය. අඹ පැනයෙන් හා නෑයන් පිළිබඳ ඇසූ පැනයෙන් රජතුමා බුද්ධිමතෙකු බව පිළිගත් මිහිඳු මහරහතන් වහන්සේ චූල්ලහත්ථිපදෝපම සූත්‍රයෙන් ධර්ම දේශනා කළ හ. එහි භික්ෂු ජීවිතයත් භික්ෂුවකගේ ගතිගුණත් රහත්බව හා චතුරාර්ය සත්‍යයත් විස්තර වෙයි. බණ ඇසූ රජතුමා බෙහෙවින් ප්‍රසාදයට පත්ව තෙරුවන සරණ ගියේ ය.

මිහිඳු මාහිමි ලක්දිවට වැඩම කළ දිනයෙහි ම භණ්ඩුක උපාසකතුමා පැවිදිකොට උපසම්පදාව ද ලබා දුන්නේ ය. අනාගාමීව සිටි එතුමා එකෙණෙහි රහත් භාවයට ද පත් වූයේ ය. පසුදා උදෑසන මිහිඳු මාහිමියෝ දූත පිරිස ද සමග අනුරාධපුරයට වැඩම කළ හ. උන්වහන්සේගේ වැඩමවීමෙන් පසුව වූ වැදගත් සිදුවීම් රැසකි.

- ⋆ අනුලා දේවිය ප්‍රමුඛ රජගෙදර කාන්තාවන්ට පේතවත්ථු, විමානවත්ථු ඇසුරෙන් දහම් දෙසීම. ඒ අසා ඔවුන් සෝවාන් ඵලයෙහි පිහිටීම.

- ⋆ ධර්ම දූතයන් වහන්සේලා ගේ වැඩමවීම පිළිබඳ පණිවුඩය ලැබී රජගෙදරට රැස් වූ දහස් ගණන් ජනයාට දේවදූත සූත්‍රය දේශනා කිරීම.

- ⋆ රජගෙදර ඉඩකඩ මද වූයෙන් ඇත්ගාල පිළියෙල කර දීමත් ඉක්බිතිව තවතවත් මහජනයා ගේ පැමිණීම වැඩිවූයෙන් දකුණු වාසල් දොරටුව අසළ නන්දන උයන පිළියෙල කරදීමත් සිදු වුණි. එහි දී මිහිඳු මාහිමියෝ බාල පණ්ඩිත සූත්‍රය දේශනා කළ හ.

- ⋆ පැන් කෙණ්ඩියෙන් අත පැන් වත් කොට මහමෙව්නා උයන සඟසතු කොට පිදීම.

- ⋆ පොහොය සීමාවක් සම්මත කිරීම හා මහා බෝධිය සහ මහා චෛතිය පිහිටන තැන් දේවානම්පිය තිස්ස රජතුමා ලවා සලකුණු කර තැබීම.

- ⋆ දෙවනපෑතිස් රජුගේ බෑණා වූ මහා අරිට්ඨ අමාත්‍යවරයා සහ තවත් 55 දෙනෙකු පැවිදි වීම.

- ⋆ සංඝමිත්තා මහරහත් තෙරණිය හා ශ්‍රී මහා බෝධීන් වහන්සේ ගේ ශාඛාවක් වැඩමවා ගෙන එනු පිණිස අරිට්ඨ නම් ඇමතියෙකු ප්‍රධාන දූත පිරිසක් දඹදිව ධර්මාශෝක රජු වෙත යැවීම.

- ⋆ සඟමිත් තෙරණිය බෝධි ශාඛාව ද රැගෙන සිරිලකට වැඩමවීම හා පැවිද්ද අපේක්ෂාවෙන් සිටි අනුලා දේවිය ඇතුලු කාන්තා පිරිස පැවිදි කිරීමෙන් සිරිලක මෙහෙණි සසුන ආරම්භ කරවීම.

මිහිඳු මහරහතන් වහන්සේ ගේ මග පෙන්වීම මත සිය ජීවිතය ශාසනයේ උන්නතිය වෙනුවෙන් කැප කළ ශ්‍රේෂ්ඨ බෞද්ධ මහෝපාසකයෙකු වූ දේවානම්පියතිස්ස රජු වසර 40ක ඉතා සාර්ථක රාජ්‍ය කාලයක් නිමවා මිය පරලොව ගියේ ය. එතුමාගේ ඇවෑමෙන් උත්තිය කුමරු මෙරට රජ විය. උත්තිය රජුගේ 8 වන රාජ්‍ය වර්ෂයෙහි අසූවිය සපුරා සිටි අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ සෑගිරියේ දී පිරිනිවන් පා වදාළ සේක. උත්තිය රජු උන් වහන්සේ ගේ ධාතු නිධන් කොට අනුරාධපුර චෛතියගිරියෙහි හා ලක්දිව තවත් ස්ථාන කිහිපයක ම ස්තූප ඉදි කරවීය.

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට ථේරවාදී බුදු දහම හඳුන්වා දුන්පසු බුද්ධාගම ලංකාවෙහි රාජ්‍ය ආගම බවට පත්විණි. උන්වහන්සේ ලක්දිව දී ධර්ම දේශනා කළේ සිංහල භාෂාවෙනි. මිහින්තලයේ අවටින් හමු වූ සෙල්ලිපි මිහිඳු මාහිමි වැඩ සිටි සමයේ ලියැ වී ඇති ඒවාය. ඒ අනුව නිසි අක්ෂර කලාවක් ලක්දිව ව්‍යාප්ත වූයේ ද එම යුගයේ ය. එදා සිංහල සාහිත්‍යය හා බෞද්ධ සාහිත්‍යය දෙකක් නොවීය. සියලු දේ බුදු දහම මුල්කරගනිමින් රචනා විය. අධ්‍යාපනය පැවැතියේ ගමේ විහාරස්ථානය මුල් කරගෙනයි. වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන මනා සංස්කෘතිය සබැඳියාව ඇති වූයේ මෙම පසුබිම තුළ ය. ශ්‍රී ලාංකේය ජනතාව සංස්කෘතික හා සාරධර්ම අතින් වඩාත් බුද්ධිමත්, විචාරශීලී හා ගෞරවාන්විත ජාතියක් බවට පත් වූයේ මෙලෙස අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට බුදු දහම හඳුන්වා දීමත් සමග ය.

## (02). සියලු වියතුනට සිළුමිණක් හා සම වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමිපාණෝ



සිංහල පද්‍ය සාහිත්‍ය වංශයෙහි ස්වර්ණමය යුගය කෝට්ටේ යුගය යි. සම්භාව්‍ය සිංහල කාව්‍ය නිර්මාණයෙහිලා නෛසර්ගික සමත් කමකින් හෙබි විශිෂ්ටතම යතිවරයන් වහනන්සේ නමක් වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි පහළ වූයේ මෙම යුගයේ දී ය. වර්ෂ 1408 මැයි 08 වන දින ජන්මලාභය ලැබූ ශ්‍රී රාහුල හිමියන් ගේ මව වූයේ ස්වර්ණවතී නොහොත් සීලවතී දේවියයි. පියා වූයේ එකල දකුණුලක භාරව සිටි වීරබාහු නම් කුමරු ය. ජයබාහු කුමරු ලෙස ගිහි කල නම් ලැබූ ශ්‍රී රාහුල හිමි ඉතා කලාතුරකින් එළඹෙන ග්‍රහ යෝගයක් සමග ජන්ම ලාභය ලබා ඇත. සිය පියා වූ වීරබාහු කුමරුගේ අකල් වියෝවෙන් පසු මෙම කුමරු හදා වඩා ගත්තේ කෝට්ටේ හයවන පරාක්‍රමාහු රජු ය.

එදා සත් හැවිරිදි දරුවෙකුව සිටිය දී ජයබාහු කුමරු මව සමග හයවන පරාක්‍රමබාහු රජු මුණ ගැසීමට ගිය විට රජු දුක් සැප විමසුවේ ය. එවිට කුඩා කුමරු මෙවන් කවියක් ප්‍රකාශ කොට ඇත.

| | |
|---|---|
| මා වැනි | බිළින්දා |
| වර වර ළඟට | කැන්දා |
| දුක් සැප | කුමන්දා |
| අසන නිරිඳෝ වෙන | කොයින්දා |

සත් හැවිරිදි දරුවෙකු ගෙන් රජු මෙවන් හපන්කමක් කිසිසේත් ම බලාපොරොත්තු නොවී ය. මවිතයට පත් රජු මෙම දරුවා ස්වකීය පුත්‍ර ස්ථානයෙහි හදා වඩා ගැනීමට දෙන මෙන් ස්වර්ණවතී මැණියන් ගෙන් ඉල්ලා සිටියේ ය. පිය සෙනෙහස අහිමිව සිටි දරුවාට ද මෙවන් පිය සෙනෙහසක් හා රැකවරණයක් අවශ්‍යව පැවති හෙයින් මව ඊට කැමති

වූවා ය. රජුට ද පිරිමි දරුවන් නොසිටි අතර සිටියේ දියණියන් දෙදෙනෙකි. එදා සිට රජු ජයබාහු කුමරු හදාවඩා ගත්තේ අප්‍රමාණ පුත්‍ර ස්නේහයකිනි.

ජයබාහු කුමරු ස්වකීය මවගේ ද කැමැත්ත ඇතිව ක්‍රි. ව.1425දී උතුම් වූ ප්‍රව්‍රජ්‍යා භාවයට පත්වූයේ කැරගල වනරතන සංඝරාජ හිමියන්ගේ ආචාර්යත්වයෙනි. පැවිදි වන විට වයස අවුරුදු 17කි. පැවිදි නාමය වූයේ දෙමටානගම වාචිස්සර යන්නයි. වර්ෂ 1438දී උපසම්පදාව ලත් වාචිස්සර හිමියන් ගේ මුල් පන්සල වූයේ ප්‍රතිරාජ පිරිවෙණ බද ගණේගොඩැල්ල විහාරස්ථානය යි. එය දේවපතිරාජ ඇමතිවරයා ඉදිකළ ස්වකීය මුත්තණුවන් වූ උත්තරමූල රාහුල හිමියන්ගේ ද මුල් විහාරස්ථානයයි. වාචිස්සර හිමි ද මෙම විහාරස්ථානයට පැමිණ තත් ප්‍රතිරාජ පිරිවෙණින් අධ්‍යාපනය ලැබී ය. සයවන පරාක්‍රමබාහු රජු වාචිස්සර හිමියන්ට උපකාර වන පිණිස මෙම ප්‍රදේශයේ තිබූ සශ්‍රීක කුඹුරක් වූ මහවෙල හා ගොඩපිටිය යන ගම ද උත්තරමූල රාහුල හිමියන්ට පූජා කළේ ය. උත්තරමූල හිමියන් ගේ ඇවැමෙන් තොටගමු පිරිවෙණ හා විහාරයේ අධිපතීන් වහන්සේ ලෙස රජතුමා පත් කළේ එවකට ගණේගොඩැල්ල පන්සලේ වැඩසිටි වාචිස්සර හිමියන් ය. මෙය රටේ කීර්තිමත් අධ්‍යාපන ආයතනයක් වන්නේ එයින් පසුව යි. තෙල්වත්තේ රක්පත් වෙහෙර නමින් ද එකල විජයබාහු පිරිවෙණ හැඳින්විණ.

උත්තරමූල රාහුල හිමියන් ගේ අපවත්වීමෙන් පසු වාචිස්සර හිමි ස්වකීය මුත්තණුවන් වූ ශ්‍රී රාහුල හිමියන් ගේ නාමය භාවිතයට ගත්තේ ය. තොටගමුවේ පිරිවෙණෙහි වැඩසිටි නිසා උන්වහන්සේ ''තොටගමුවේ ශ්‍රී රාහුල හිමි'' නම් විය. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සතු ස්මරණ ශක්තිය විශ්මයජනක එකක් ම විය. ඒ පිළිබඳ සඳහන් වන ජනප්‍රවාද රැසක් පවතියි. දිනක් වීදාගම හිමි ධර්ම දේශනයකට වැඩමවීමට පෙර බලගතු සරස්වතී තෙල් බඳුනකට අශ්ව කෙන්දක් දමා සත් වරක් ගසා දමා එය දිවේ ගා ගන්නා අයුරු කුඩා රාහුල හිමි බලා සිටියේ ය. ගුරු හිමියන් පන්සලෙන් පිටත් වූ විගස රාහුල හිමියන් කළේ එම තෙල් බඳුන ගෙන පානය කිරීම යි. එය බලවත් ඖෂධයක් වූ නිසා රහල් හිමි සිහිමූර්ජා වී ඇද වැටුණි. වහාම මේ බව ගුරුහිමියන්ට දන්වන ලදුව උන්වහන්සේ සැණෙකින් ආපසු පැමිණ බෙහෙත් ඔරුවක දමා රාහුල හිමි සුවපත් කළ හ. මෙම ඖෂධයේ බලගතුකම නිසා රාහුල හිමි මතක ශක්තියෙන් අගතැන්පත් වූ බව මෙම ජනප්‍රවාදයෙන් කිය වේ.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ගෞරව සම්මානයට පාත්‍ර වූයේ ''ෂඩ්භාෂා පරමේශ්වර'' යන නාමයෙනි. එයට හේතුව සංස්කෘත, ප්‍රාකෘත, මාගධී, පෛශාචි, සෞරසේනි හා අපභ්‍රංශ යන භාෂා සය පිළිබඳ පෘථුල දැනුමක් උන් වහන්සේ සතු වීම යි. එසේම ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය (තෙවලා වදනිසුරු) යන ගෞරව නාමය ද උන්වහන්සේට හිමි විය. ශ්‍රී රාහුල හිමි ස්වකීය පාණ්ඩිත්‍යය කාව්‍යශේඛරයේ දී දක්වන්නේ මහත් අභිමානයෙන් යුක්තව යි.

| | |
|---|---|
| **සච්සත කෙළ** | **පැමිණි** |
| **ගුරුවන් දෙරණ** | **සපැමිණි** |
| **පිරිසිදු සිල්** | **ගිහිණි** |
| **සියල් ලෝ වියතුන්ට** | **සිළුමිණි** |

තමා සියලු ශිල්ප ශාස්ත්‍රයන් හි පාරප්‍රාප්ත කෙනෙකි. ඒ නිසා පොළොවට බැසගත් බ්‍රහස්පතී හා සමාන ය. එසේම පිරිසිදු සීලයෙන් යුක්ත ය. ලොව සියලු පඬිවරුන්ට සිළුමිණක් හා සමාන ය.

කෙනෙකුට මෙය ආත්ම වර්ණනාවක් සේ පෙණුන ද රාහුල හිමි තමා ගැන කරන මෙම අභිමානාත්මක වර්ණනාව ව්‍යාජයක් නොවේ. සත්‍යයකි. එනිසා මෙය බහුශ්‍රැත පඬිවරයෙකු තම පාණ්ඩිත්‍යය අභිමානයෙන් පළ කළ අවස්ථාවකි. මෙයට අභියෝග කිරීමට සමතෙක් මෙදියත නො වූ හ.

ශ්‍රී රාහුල හිමි විජයබා පිරිවෙණහි වැඩවසමින් සිදු කළ ශාස්ත්‍රීය සේවාව මෙරට පමණක් නොව නොයෙක් ශාස්ත්‍රයන්හි දැනුමැති විදේශිකයන් අතර පවා බෙහෙවින් ප්‍රචලිත විය. උන්වහන්සේගේ දැනීම් සම්භාරයට සම කළ හැකි කිසිවෙකු එකල මෙරට නොවූ බව ගිරා සංදේශයෙහි මෙම කව තුළින් ද පැහැදිලි වෙයි.

| | |
|---|---|
| **ගැඹුරු විජම් පෙළ කිරි සයුර** | **ඇමවිට** |
| **සොඳුරු නුවන් වෙර පහරින් සකොබ** | **කොට** |
| **මියුරු පද අරුත් අම ගෙනදෙන** | **ලොවට** |
| **කවුරු සදිසි වෙති මෙකලට** | **එයතිඳුට** |

ශ්‍රී රාහුල හිමියන් රචනා කළ ග්‍රන්ථ රාශියකි. එමගින් භාෂාවට හා සාහිත්‍යට සිදු වූ සේවාව ඉමහත් ය. උන් වහන්සේ විසින් රචනා කරන ලද

| | |
|---|---|
| **පරෙවි සංදේශය** | **කාව්‍යශේඛරය** |
| **සැලළිහිණි සංදේශය** | **පංචිකාප්‍රදීපය** |
| **බුද්ධිප්පසාදනිය** | **වුත්තමාලාව** |
| **යෝගරත්නාකරය** | |

යන ග්‍රන්ථ එයට සාක්ෂි දරයි.

භාෂා සාහිත්‍යය පමණක් නොව ජ්‍යොතිෂ්‍යය සම්බන්ධයෙන් එකල මූලස්ථානය වූයේ තොටගමුව හා වීදාගම යි. ශ්‍රී රාහුල හිමියන් ගෙන් සේ ම තත් ශිෂ්‍ය වෑත්තෑවේ හිමියන්ගෙන් ද සිංහල සාහිත්‍යයට සිදු වී ඇති සේවය ඉතා විශිෂ්ට මට්ටමක පවතී. වෑත්තෑවේ හිමි ලියූ ගුත්තිල කාව්‍යයට සිංහල කාව්‍ය ග්‍රන්ථාවලියේ වැදගත් තැනක් හිමි වෙයි. මෙම කාලය තුළ ගිරා සංදේශය ලියා ඇත්තේ ද උන්වහන්සේ බව ද කිය වේ.

ශ්‍රී රාහුල හිමියන්ගේ අවසාන කාලය අම්බන ඉඳුරුගිරි ලෙන් විහාරය ආශ්‍රිතව වැඩ සිටියේ ය. අපවත් වීමෙන් පසු ශ්‍රී දේහය ලෙනෙහි තබා ප්‍රදේශයේ ජනතාව නිති වැඳුම් පිදුම් කිරීමට සලස්වා ඇත. ජීවත්ව සිටිය දී ''**සිද්ධායුලෝක රසායනය**'' නමැති

තෙලක් භාවිත කළ හෙයින් ශ්‍රී දේහය ඉතා දීර්ඝ කාලයක් නරක් නොවී තිබෙන බවට විශ්වාසයක් ඇත. ශ්‍රී රාහුල හිමිගේ දේහය ගෝවට රැගෙන ගිය පසු අම්බන ප්‍රදේශය ම පාලු වී ජනශූන්‍ය වූ බව කියැ වේ. එම දේහය අදත් සුරක්ෂිතව පවතියි.

**අභ්‍යාස**

01. "මිහිඳු මා හිමි මෙහි නොවැඩියා නම්......." යන මාතෘකාවෙන් රචනයක් ලියන්න.
02. මහින්දාගමනයෙන් අප රටට උරුම වූ දායාද පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කරන්න.
03. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි පිළිබඳ ජනප්‍රවාද හැකිතාක් එක් කොට කුඩා පොතක් සකස් කරන්න.
04. ශ්‍රී රාහුල හිමිගේ සාහිත්‍ය සේවය මැයෙන් රචනයක් ලියන්න.

05
පාඩම

# ශ්‍රී ලංකාවේ ශාසන අභිවෘද්ධියට මුල් වූ බෞද්ධ මහෝපාසක චරිත

## දුටුගැමුණු රජතුමා

ලංකා ඉතිහාසයේ අද්විතීය ශ්‍රී නාමයක් තැබූ ශ්‍රේෂ්ඨ නරවීරුවෙකු වන දුටුගැමුණු මහරජතුමා පිළිබඳ ලංකාවාසීන් අතර ඇත්තේ අපමණ ගෞරවාදරයකි. රුහුණු, මායා, පිහිටි යන ත්‍රිසිංහලය එක්සේසත් කිරීමත් බුදු දහමේ චිරස්ථිතිය පිණිස ක්‍රියා කිරීමත්, දුටුගැමුණු මහරජුගේ අද්විතීය සේවාවන් අතර ප්‍රමුඛස්ථානයට ගැනෙයි.

**''පාරගංගං ගමිස්සාමි ජෝතේතුං සාසනං අහං''**

**''මාගේ මෙම ව්‍යායාමය රජසැප පිණිස නොව සම්බුදු සසුන බැබලවීම පිණිස යි''** යන උදාර සංකල්පය පෙරදැරිව ක්‍රියා කළ එතුමා වටා මුලු රටවාසීහු ම එක්සිත්ව එක් වූ හ.

ලක්දිවට බුදුසමය පැමිණි අවධිය වන විට රජකම් කළේ දේවානම්පියතිස්ස රජු ය. එතුමා ගේ සොහොයුරු මහානාග කුමරු රුහුණට ගොස් එහි රාජධානියක් පිහිටුවා යුවරජු ලෙස කටයුතු කළේ ය. ඉක්බිතිව ඔහු පුත් යටාලතිස්ස ද ඔහුගේ පුත් ගෝඨාභය ද ඔහුගේ පුත් කාවන්තිස්ස ද පිළිවෙළින් රුහුණේ රජකම් කළ හ. කාවන්තිස්ස රජු විවාහ වූයේ මායා රටේ කැලණිතිස්ස රජුගේ දියණිය වූ දේවී කුමරිය සමග යි. පසුව විහාර මහාදේවිය ලෙස ලක්වැසියන්ගේ අපමණ ගෞරවාදරයට පත් වූ ඇයගේත් කාවන්තිස්ස රජුගේත් දරු දෙදෙනා වූයේ ගැමුණු හා තිස්ස යන කුමාරවරුන් ය.

ගැමුණු හා තිස්ස කුමාරවරු ක්‍රමයෙන් තරුණවියට පත් වෙත් ම ඔවුහු එඩිතරකම් හා නිර්භීතකම් මැනවින් ප්‍රදර්ශනය කළ හ. වෙසෙසින් ලංකාවේ උතුරේ හා උතුරුමැද පළාතේ සිදුවන ජාතික හා ශාසනික විනාශයන් ගැන බලවත් වේදනාවට පත්ව සිටියහ. පිය රජතුමා ද මෙම තොරතුරු හොඳින් දැන සිටියේ ය. කුමාරවරුන් දෙදෙනා කෙරෙහි තිබුණු පුත්‍ර ප්‍රේමය නිසා රට එක්සේසත් කිරීමට ගොස් විනාශයක් කරගනීයි යන බියක් ද පියරජු තුළ පැවතිණ, එහෙත් කුමාරවරුන් සටනට යාම නොවැළැක්විය හැකි දෙයක් බව ද පිය රජු වටහාගෙන සිටියේ ය. එබැවින් දස මහායෝධයන් සොයා සටනට පුහුණු කරවීම් සිදු කළ පියමහ රජු ජනතාවගේ සමගිය ද රටේ පැවතිය යුතුම දෙයක් බව ද මැනවින් දත්තේ ය. ජනතාවගේ සමගියට හොඳම දෙය වෙහෙර විහාර ඉදිකරවීමත් ධර්මය පතුරුවා හැරීමත් බව ඉතා බුද්ධිමත්ව වටහා ගත් එතුමා වෙහෙර විහාර හැට හතරක් ම ඉදි කරවී ය.

කාවන්තිස්ස රජු දිනක් ස්වකීය පුත් කුමරුවන් දෙදෙනාගේ ශූර වීර බලපරාක්‍රමයන් පිළිබඳ පරීක්ෂණයක් කිරීමට සිතීය. සංඝරත්නය රජගෙදරට වැඩමකරවා දන් පිරිනමා

කුමාරවරුන් දෙදෙනා කැඳවා කුලදෙව් භික්ෂූන් වහන්සේ කෙරෙහි ද්‍රෝහී නොවන බවට, පොරොන්දු වෙමින් මෙයින් කිරිබත් පිඬක් කන්නැ යි, කීය. දෙසොහොයුරෝ ඉතා සතුටින් කිරිබත් කෑහ. දෙසොයුරන් භේදවන්නේ නැතිබවට පොරොන්දු වෙමින් බත් පිඬක් කන්නැයි කීය. ඔවුහු ඉතා සතුටින් එම බත් පිඬ ද කෑහ. එළාර සමග යුද්ධ නොකරන බවට පොරොන්දුවෙමින් තවත් කිරිබත් පිඬක් කන ලෙස ඉල්ලීය. දෙදෙනාම කිරිබත් පිඬු ගසා දමා යන්නට ගියහ. සොළොස් වෙනි වියෙහි පසු වූ ගැමුණු කුමරු පියා කෙරෙහි කළකිරුණු සිතැතිව පියාට පිරිමි ගති නැත තිබෙනුයේ ගැහැණු ගතියැ'යි, කියා ස්ත්‍රී පළඳනාවන් යැවී ය. එයින් ගැමුණු කුමරු දුට්ඨගාමිණී හෙවත් දුටුගැමුණු වූ බව කිය වේ.

කාවන්තිස්ස මහරජු හැටහතර වන වියේ දී අභාවයට පත් වූයේ ය. ඒ වනවිට දුටුගැමුණු කුමරු කොත්මලේ ද තිස්ස කුමරු දීඝවාපියේ හෙවත් දිගාමඩුල්ලේ ද වාසය කළ හ. පියමහරජු මියගිය පුවත පළමුවෙන් ම ලැබුණේ තිස්ස කුමරුට ය. ඔහු වහා පැමිණ පිය රජුගේ ආදාහන කටයුතු නිමවා මෑණියන් වූ විහාරමහාදේවියත් කඩොල් ඇතාත් සමඟ දිගාමඩුල්ලට ම ගියහ. මේ සියලු පුවත් එවකට කොත්මලේ විසූ ගැමුණු කුමරුට සැලවිය. ඔහු වහා මාගමට පැමිණ බුද්ධ වර්ෂ 383දී හෙවත් ක්‍රි. පූ.161දී රුහුණේ රජබවට පත් විය. රාජ්‍යත්වයෙන් පසු සතුරු බල මර්ධනය කොට ලක්දිව එක්සේසත් කිරීමේ උදාර කර්තව්‍යය මුදුන්පත් කර ගැනීමට සැලසුම් සකස් කෙරිණි. රට එක්සේසත් කිරීමේ මෙම කාර්යයේ දී විහාර මහාදේවියගේ ආශිර්වාදයත් උපදේශයත් අත්‍යාවශ්‍ය ම කරුණක් බව ගැමුණු කුමරු දැන සිටියේ ය. එසේ ම මහ සටනට කඩොල් ඇතාගේ අවශ්‍යතාව ද දැඩිව පැවතිණ. එබැවින් විහාර මහාදේවිය ද කඩොල් ඇතා ද මාගමට එවන ලෙස තිස්ස කුමරුට හසුන්පත් යැවී ය. තෙවරක් ම හසුන්පත් යැවූ නමුත් තිස්ස කුමරුගෙන් ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. සටන් කොට හෝ මෑණියන් සහ කඩොල් ඇතා ගෙන්වා ගත යුතු බව සිතූ දුටුගැමුණු රජු සුළු පිරිසක් පිරිවරාගෙන දිගාමඩුල්ල බලා පිටත් වූ හ. මෙය සැල වූ තිස්ස කුමරු ද පිරිසක් පිරිවරාගෙන ඌව වෙල්ලස්සේ බුත්තල යුදඟනා පිටියට පැමිණ එහි කඳවුරු බැඳගෙන සිටිය හ. තම සොහොයුරා කල් ඇතිව සටනට සැරසුණු බව නොදත් දුටුගැමුණු රජුට අනපේක්ෂිත දරුණු සටනකට මුහුණ දීමට සිදු විය. යුදඟනා පිටිය අසල සිදු වූ මෙම පළමු සටනේ දී දුටුගැමුණු රජු පැරදී පලා ගියේ ය. දෙවන වර සටනෙන් රජු ජය ගත්තේ ය. පසුව මහා සංඝරත්නයේ මැදිහත්වීමෙන් දෙසොහොයුරන් සමගි කරවීම සිදුවිණි. පසුව සද්ධාතිස්ස කුමරු දිගාමඩුල්ලට යැවූ දුටුගැමුණු රජු එහි පාලනයත් කෘෂි කර්මාන්තය දියුණු කිරීමත් ඔහුට භාර කළේ ය. දුටුගැමුණු රජු මාගම තම රාජධානිය පිහිටුවා ගනිමින් විදේශික ආක්‍රමණිකයන් පලවා හැර ලක්දිව එක්සේසත් කිරීම පිළිබඳ තමා ළමා කාලයේ පටන් ම පැවති අපේක්ෂාව ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීමෙහි නිරත විය.

පළමුව තිස්ස මහාවිහාරයට ගිය දුටුගැමුණු රජු ලක්දිව සතුරන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා යන ගමනට ආශිර්වාද පතා මහ සඟරුවන ඉල්ලා සිටියේ ය. ඒ සඳහා භික්ෂූන් වහන්සේලා පන්සිය නමක් ලැබුණු අතර උන් වහන්සේලා පෙරමුණේ ම වැඩම කළ හ. සෑමවිටෙකම මෑණියන්ගේ උපදෙස් පැතූ එතුමා විහාරමහා දේවිය ද ඉදිරියෙන් ම කැඳවා ගෙන ගියේ ය. දුටුගැමුණු රජු රුහුණු, මායා, පිහිටි යන ත්‍රිසිංහලයේ ම අසහාය

නරපතියා ලෙස මෙහි දී අභිෂේක ලැබුවේ එළාර ආදී ආක්‍රමණිකයන්ගෙන් රටේ සමස්ත ජනතාවට ම එල්ල වූ අභියෝග සියල්ල මුලිනුපුටා දමමිනි. අගමෙහෙසියක් නොමැතිව අභිෂේක ලැබීම ද දුටුගැමුණු චරිතයෙහි විශේෂත්වයකි.

සමස්ත ලංකාවාසීන්ට ම උදා වූ මෙම ජයග්‍රහණයේ සාර්ථකත්වය පිටුපස මහසඟරුවනේ ආශිර්වාදයත් පිය රජතුමාගේ දූරදර්ශී ක්‍රියා පිළිවෙතත් මෑණියන්ගේ උපදේශකත්වයත් දස මහා යෝධයන්ගේ හා කඩොල් ඇතාගේ සහායත් ප්‍රමුඛස්ථානයෙහිලා පැවැති අතර රටවාසීන්ගෙන් ද මහත් වූ සහයෝගයක් ලැබුණි.

මෙහි දී තමා හා එරෙහිව පැමිණි සතුරෙකුටවත් කිසිදු වෛරයක් නොකළ දුටුගැමුණු රජු මියගිය එළාරයන්ගේ සිරුර රාජ්‍ය ගෞරව සහිතව ආදාහනය කරවා ස්තූපයක් ද කර වීය. එසේම එම ස්ථානය පසු කොට යන සැමට වාහනයෙන් හා දෝලාවෙන් යන්නවුන් එයින් බැස යා යුතු බවටත් පෙරහැරෙන් ගමන් කරන්නේ නම් එයින් නිකුත්වන තූර්යවාදන නවත්වා ආචාර කොට යා යුතු බවටත් විශේෂ රාජ ආඥාවක් නිකුත් කළේ ය.

භික්ෂූන් වහන්සේලාට සැලකීම ස්වකීය ජීවිතයේ ප්‍රමුඛ අංගයක් බවට පත් කරගත් දුටුගැමුණු රජුගේ ශාසනික සේවාව මෙසේ කෙටියෙන් ගොණු කොට දැක්විය හැකි ය.

* සිය ජයකුන්තය පිහිටුවා මිරිසවැටි දාගැබ ඉදිකරවීම. එතුමා සටන් පැවති සමයේ අමතකවීමකින් භික්ෂූන් වහන්සේට නොදී මිරිස් මාලුවක් ආහාරයට ගත්තේ ය. එයින් සිත් තැවුලට පත් රජු ඊට පිළියමක් ලෙස මෙම මිරිසවැටි දාගැබ ඉදිකළේ ය.
* අනුරාධපුර මහමෙව්නා උයන මැද ලෝවාමහාපාය නමින් නවමහල් පොහොය සීමාවක් ඉදි කරවීම.
* අනුරාධපුර රත්නමාලි මහාසෑය ඉදි කරවීම.
* ලක්දිව වෙසක් උත්සව විසි හතරක් පැවැත්වීම.
* ලංකාවේ සියලුම භික්ෂූන් වහන්සේලාට තෙවරක් තුන් සිවුරු පිදීම.
* සොළොස් මහා ස්ථානවල දිනපතා ගිතෙල් පහන් දැල්වීමට කටයුතු යෙදීම.
* ආරෝග්‍ය ශාලා 18ක් පිහිටුවීම.

රත්නමාලි මහා සෑය තැනවීම එතුමාගේ ප්‍රධානතම ශාසනික සේවාව ලෙස ඓතිහාසික ග්‍රන්ථවල විස්තර කෙරේ. ඒ පිළිබඳවත් දුටුගැමුණු රජුගේ ශාසනික සේවාව පිළිබඳවත් මහාවංසය ඉතා දීර්ඝ ලෙස වර්ණනාකොට තිබේ. සිංහල ථූපවංසය රචනා කොට ඇත්තේ ද රත්නමාලි මහා සෑයෙහි කර්මාන්තය වර්ණනා කිරීම පිණිස ය.

සූවිසි වසරක් රාජ්‍ය පාලනය කරමින් ලංකා ඉතිහාසයේ අන් එක ද රජෙකුට හෝ නොදෙවෙනි කීර්තිමත් නාමයක් තැබූ දුටුගැමුණු රජු ස්වකීය මෙහෙවර නොපිරිහෙලා පවත්වාගෙන යාමට තිස්ස කුමරුට පවරා සිය අවසන් ගමනට සැරසුනි. ඒවන විට මහා සෑයේ වැඩ සතරැස් කොටුව දක්වා නිමවා තිබුණි. ඉතිරිය තිස්ස කුමරු විසින් රෙදිවලින් තාවකාලිකව සකස් කරන ලදී. ලෝවාමහාපායත් මහාසෑයත් අතර ස්ථානයක දෝලාවක

සැතපී හුන් දුටුගැමුණු රජු ඒ දෙස බලා අපමණ බුද්ධාලම්බන ප්‍රීතියක් උපදවා ගත්තේ ය. පින්කිරියවත් ලියන්නෝ පින්පොත කිය වූ හ. භික්ෂූන් වහන්සේලාගේ පිරිත් දේශනාව ද ශ්‍රවණය කරමින් මහා සෑයට වැඳගෙන සිටිය දී ම රජු පරලොව සැපත් විය. පසුව රජකමට පත් සද්ධාතිස්ස රජු මහසෑයෙහි ඉතිරි කටයුතු නිමකරවීය.

දුටුගැමුණු රජුගේ ශරීරය කමටහන් ශාලාව අසල ආදාහනය කෙරිණි. එසේ සිදු කළේ එතුමාගේ ම ඉල්ලීමකට අනුව භික්ෂූන් වහන්සේලාට භාවනාවට උපකාර වනු පිණිස ය.

### මහා පරාක්‍රමබාහු රජතුමා

ලංකාවේ පළමුවෙනි රාජධානිය අනුරාධපුරය යි. එය විජය රජුගෙන් ඇරඹෙන ඉතිහාසයේ පටන් වසර 1500ක් පමණ කාලයක් පැවැති ක්‍රමයෙන් අභාවයට ගියේ ය. එතැන් සිට ලංකාවේ රාජධානිය පොළොන්නරුවට සංක්‍රමණය විය. පොළොන්නරුව ලංකාවේ ප්‍රධාන නගරය බවට පත් කරන ලද්දේ ලක්දිව එක්සේසත් කළ මහා විජයබාහු රජු විසිනි. පළමුවන විජයබාහු රජතුමාට හා කාලිංග කුමරියක වූ තිලෝකසුන්දරී බිසවට දියණියන් පස්දෙනෙක් සිටිය හ. එයින් එක් දියණියක් වූයේ රත්නාවලී ය. එසේ ම මහ විජයබාහු රජුගේ සොහොයුරිය වූ මිත්තා කුමරියට පුතුන් තිදෙනෙක් සිටියහ. එයින් එක් පුතණු කෙනෙක් වූයේ මානාභරණ කුමරුය. රත්නාවලී කුමරිය ආවාහ කරගත් මානාභරණ කුමරු දක්ෂිණ දේශයේ පාලකයා ලෙස කටයුතු කළේ ය. මෙම දක්ෂිණ දේශය යනු සබරගමු පළාත ලෙස සැලකේ. මානාභරණ යුවරජුටත් රත්නාවලී බිසවටත් මිත්තා සහ පභාවතී නමින් දියණියන් දෙදෙනෙකු සිටි අතර පුතෙකු නොවීය. එහෙයින් ඔවුහු කැලණියේ විභීෂණ දෙවිඳුන්ට භාරයක් විය. ඒ බව සැළලිහිණි සන්දේශයෙහි සඳහන් වන්නේ මෙසේ ය.

> **බිසොවට පළමු රත්නාවලි නම් — සොඳුරු**
> **සතුටට දෙවු හිමි දිවැසින් කුලුණු — පිරූ**
> **මෙලකට ඉසුරු වී පැරකුම් රජ — කුමරු**
> **පළකොට කිමෙක ඔබ සොඳ තෙද බල — මහරු**

අනතුරුව ඔවුනට පුත් රුවනක් ලැබිණ. ඒ පරාක්‍රමබාහු කුමරුය. ඔහු ඉපදී වැඩිකල් යෑමට පෙර සිය පියා මිය ගියේ ය. පසුව රත්නාවලී බිසව සිය දූ දරුවන් රැගෙන රුහුණට ගොස් සිරිවල්ලභ රජුගේ රැකවරණය යටතේ මහානාග පුර වාසය කළා ය. මේ අතර දක්ෂිණ දේශයේ පාලකයා බවට පත්වූයේ මානාභරණ රජුගේ ම සොහොයුරෙකු වූ කිත්සිරිමේඝ ය. හෙතෙම රුහුණේ සිටි පරාක්‍රමබාහු කුමරා ලාබාල වියේ දී ම සිය රාජ සභාවට කැඳවා ගත්තේ ය. එසේ ම කිත්සිරිමේඝ රජුට පුතුන් නොසිටි නිසා තමාගෙන් පසු යුවරජකම දෙන අදහසින් පරාක්‍රමබාහු කුමරු සිය පුතකු මෙන් හදාවඩා ගත්තේ ය. කිත්සිරිමේඝ රජු පරාක්‍රමබාහු කුමරුට භාෂා ශාස්ත්‍ර ඉතිහාසය සේ ම රජකුට අවශ්‍ය ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීය. එතුමාගේ ඇවෑමෙන් දක්ෂිණ දේශයේ පාලකයා වූයේ පරාක්‍රමබාහු කුමරුය. එය ඔහුගේ දේශපාලන ගමනේ පළමු කඩඉම ලෙස දැක්විය හැකි ය.

අප ශ්‍රී ලංකාද්වීපයේ පරාක්‍රමබාහු නමින් රජවරුන් නවදෙනෙක් ම රජකම් කර ඇත. මේ අතුරෙන් වැඩි වශයෙන් ම කතාබහට ලක් වී ඇත්තේ පොළොන්නරුව අගනුවර කොටගෙන ක්‍රි. ව. 1153 සිට 1186 තෙක් එනම් වසර 33ක් රාජ්‍ය තන්ත්‍රය මෙහෙය වූ පළමුවන පරාක්‍රමබාහු නොහොත් මහා පරාක්‍රමබාහු රජු ගැන ය. මෙතුමා ලංකා රාජාවලියෙහි එකසිය හතළිස් දෙවෙනි (142) රජු ය.

තරුණ වියෙහි සිටම උදාර චරිතයකින් යුතු කෙනෙකු වූ පරාක්‍රමබාහු කුමරු ඉතා ඉක්මනින් මැති ඇමැති ආදී රාජකීයන්ගේ පමණක් නොව රට වැසියන්ගේ ද සිත් දිනා ගැනීමට සමත් විය. ක්‍රි. ව.1153දී ශ්‍රී ලංකාද්වීපයට අගරජු වශයෙන් රජ වූ පසු එක්සත් ලංකාවක් තුළ සම්බුද්ධ ශාසනය නගා සිටුවීම ස්වකීය අභිලාෂය බව පරාක්‍රමබාහු රජු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කෙළේ ය. දඹදිව ධර්මාශෝක අධිරාජයා ද දුටුගැමුණු මහරජු ද ආදර්ශයට ගනිමින් ක්‍රියා කළ එතුමා සම්බුද්ධ ශාසනයේ අභිවෘද්ධියට ඉමහත් සේවාවක් ඉටු කළේ ය. මෙහි දී එතුමාගේ චරිතය මෙසේ අප කතාබහට ලක්වන්නේ එතුමා ජාතික වශයෙන් මෙන් ම ශාසනික වශයෙන් ද දුටුගැමුණු රජුට පමණක් දෙවෙනි වන නිසා ය.

භික්ෂු සමාජයේ එවකට පැවැති පරිහාණිකර තත්ත්වයට පිළියම් යෙදීමට ක්‍රියා කිරීම පරාක්‍රමබාහු රජු ගත් ඉතා දූරදර්ශී තීරණයක් සේ අගය කළ හැකි ය. එවකට දිඹුලාගල අරණ්‍ය සේනාසනයේ වැඩසිටි ධර්මවිනයධර මහා කාශ්‍යප මාහිමි සහ උන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය ශාරිපුත්‍ර මාහිමි ප්‍රමුඛ මහතෙරුන් වහන්සේලාගෙන් සමන්විත ධර්මාධිකරණ මණ්ඩලයක් හමුවට දිවයින පුරා විසිරී සිටි සියලුම භික්ෂූන් වහන්සේලා කැඳ වූ හ. මෙහි මුලසුන දරුවේ ශාරිපුත්‍ර මාහිමි ය. පොළොන්නරුවේ ලතා මණ්ඩපයේ රැස් වූ ධර්මාධිකරණ සභාව හමුවේ පෙනී සිටි එතුමා භික්ෂූන් වහන්සේලා සමගි කරවීම මෙහි ස්වකීය අරමුණ බව සැලකර සිටියේ ය. මෙ මගින් සිදු වූ ප්‍රතිඵල සංක්ෂිප්තව මෙසේ ගොනු කළ හැකි ය.

- ★ දුස්සීල භික්ෂූන් උපැවිදි කරවා ඔවුනට රජයේ තනතුරු පිරිනැමීම.
- ★ විධිමත් සේ උපසම්පදාව නොලද භික්ෂූන් සාමණේර භාවයට පත් කරවීම.
- ★ ලක්දිව පුරා සිටි සියලුම භික්ෂූන් වහන්සේලා එකම භික්ෂු සමාජයක් බවට පත්කරවීම හෙවත් සංඝ සාමග්‍රිය ඇති කරවීම.
- ★ එක්සත් කළ භික්ෂූන් වහන්සේ වෙනුවෙන් පොළොන්නරු කතිකාවත නමින් නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම.
- ★ නව කතිකාවතට අනුව භික්ෂූන් වහන්සේලා හික්මීම හා වාර්ෂිකව උපසම්පදා විනය කර්මය උත්සවාකාරයෙන් පවත්වා සංඝ සමාජය විධිමත් කිරීම.

මහසෙන් රජ සමයේ සිට මහා විහාරික, ජේතවන හා අභයගිරි වශයෙන් නිකාය තුනක නායකත්වය යටතේ බෙදී සිටි ලක්දිව සියලුම භික්ෂූන් වහන්සේලා ශත වර්ෂ 08කට පසු මහා පරාක්‍රමබාහු රජුගේ අනුග්‍රහයෙන් පළමුවරට සිදු කළ මෙම නිකාය සාමග්‍රියෙන් පසු එක් නායකත්වයක් යටතේ පෙළගැසුණහ. ඒ ශාරිපුත්‍ර මාහිමියන් ගේ නායකත්වය යි. මෙම ශාසන ශෝධනය මහමෙර ඔසවන තරම් බැරෑරුම් කාර්යයක් වූ බව සඳහන් ය.

ස්වකීය රාජ්‍ය පාලන සමය තුළ භික්ෂූන් වහන්සේලා ගේ අධ්‍යාපනය, විනය හා සුබ විහරණය සඳහා විවිධ පහසුකම් සැලසීමත් පුරාණ වෙහෙර විහාර සියල්ලක් ම පාහේ ප්‍රතිසංස්කරණය කරවීමත් නව විහාරාරාම ගොඩනැගීමත්, වැනි අපමණ ලෝක ශාසනික සේවාවන් රැසක් මහාපරාක්‍රමබාහු රජු සිදු කෙළේ ය. ඒ අතර කිහිපයක් මෙසේ ය.

- ★ ජේතවනාරාමය කේන්ද්‍රකරගෙන දළදා මාලිගය, පිළිම ගෙවල්, ධර්ම ශාලා, දාන ශාලා, ගිනිහල් ගෙවල්, සක්මන් මළු, නාන පොකුණු, වැසිකිළි කැසිකිළි ආදී වශයෙන් 250ක් පමණ වූ ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කරවීම.

- ★ ස්තූප දෙකක් ද පස් මහලින් යුත් ලංකාතිලක පිළිම ගෙය ද සීමා තුනකින් යුත් බද්ධසීමා උපෝසථාගාරය ද ඇතුලුව ආළාහණ පිරිවෙන් සංකීර්ණය කරවීම.

- ★ උත්තරාරාම විහාර සංකීර්ණය ඉදි කරවීම. (දෙමළ මහා සෑය ඉදි කොට ඇත්තේ ඒ ඇසුරු කරගෙන ය.)

- ★ දෙමළ මහා සෑය දකුණින් පිහිටි පර්වතය ඇසුරු කරගෙන ගුහා පිළිම තුනක් කරවීම. (මෙය දැනට හැඳින්වෙන්නේ ගල් විහාරය නමිනි)

- ★ චෝළ ආක්‍රමණ සමයේ විනාශ වූ රුවන්වැලි මහා සෑය, අභයගිරි මහා සෑය, ජේතවන සෑය, මිරිසවැටි සෑය, ලෝවාමහාපාය, ථූපාරාමය සහ මිහින්තලේ සැට සතරක් ලෙන් ද විහාරාරාම ද ප්‍රතිසංස්කරණය කරවීම.

මහාවංසය දක්වන පරිදි මහාපරාක්‍රමබාහු රජු විසින් දියත් කරන ලද වාරි කර්මාන්තය ලොව පුදුම කරවූවකි. පරාක්‍රම සමුද්‍රය ඇතුලු මහවැව්, කුඩා වැව්, ඇලමාර්ග, වශයෙන් විශාල වාරි කර්මාන්ත ප්‍රමාණයක් එතුමා ඉදි කරවී ය. ලක්දිව එකම ධාන්‍යාගාරයක් බවට පත් කළ එතුමා දර්ශනීය වූ මල්ඵල ආදියෙන් යුක්ත උයන් වතු ඉදි කිරීමෙන් ස්වභාව සෞන්දර්යය වඩාත් ඔපවත් කරවී ය. නගර අලංකාරය සඳහා විශාල රජ මාලිගාවක් ද, දෙමහල් තුන්මහල් ප්‍රාසාද සහ අලංකාර චිත්‍රයන් ගෙන් යුත් ''**සරස්වතී මණ්ඩපය**'' නම් නෘත්‍ය ශාලාවක් ද ඉදිකර වූ එතුමා රට පුරාම විසිරී ගිය ජනාවාස රටාවක් ද ඇති කළේ ය.

**අභ්‍යාස**

01. ''දුටුගැමුණු මහරජු සිරිලක මහා වීරයෙකි'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.
02. දුටුගැමුණු රජුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ හැකිතාක් ලියා දක්වන්න.
03. සංඝ සාමග්‍රියෙහිලා මහා පරාක්‍රමබාහු රජතුමා සිදුකළ සේවාව පිළිබඳ ඇගයීමක් කරන්න.
04. මහා පරාක්‍රමබාහු රජුගේ ශාසනික සේවාවන් ලැයිස්තු ගත කරන්න.

# 06 පාඩම සුනාමියට හසු වූ මුහුදු වෙළෙන්දෝ

## සමුද්ද වාණිජ ජාතකය

ලක්දිව කැලණිතිස්ස රාජ්‍ය සමයෙහි සිදු වූ මුහුද ගොඩගැලීමක් ගැන මහාවංසයෙහි සඳහන් ය. වැරදි සැකයක් නිසා රහතන් වහන්සේ නමක උණු තෙල් කටාරමක ගිල්වා මරා මුහුදට දැමූ මහා පාප කර්මයෙන් කුපිත වූ දෙවියන් මුහුද ගොඩගලන්නට සැලැස් වූ බව එම ඉතිහාස කතා පුවතෙන් කියවෙයි.

මෙවැනි ඉතිහාස පුවත් මගින් මුහුද ගොඩගැලීම ගැන අසා තිබුණ ද ශ්‍රී ලංකාවාසී අපට එය ආගන්තුක දෙයක්ව පැවතිණ. එහි බිහිසුණුකම සියැසින් ම දැක ගැන්මට ලැබුණේ 2004 වසරේ උඳුවප් පොහොය දිනෙක ඇති වූ සුනාමි ව්‍යසනය ලංකාවට බලපෑම් එල්ල කළ දිනයේ ය.

මිනිසුන්ගේ විෂම හැසිරීමක් හේතුවෙන් පසළොස්වක පොහෝ දිනෙක සඳ මුදුන් වූ අවස්ථාවක සිදු වූ එවන් සුනාමි ව්‍යසනයක් ගැන සමුද්ද වාණිජ ජාතකයෙන් කියවෙයි.

## වර්තමාන කතාව

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත තෙරුන් නිමිති කොටගෙන මෙම ජාතක කතාව වදාළ සේක. සැරියුත්-මුගලන් මහරහතන් වහන්සේලා දෙනම දෙව්දත් තෙරුන් ළඟ සිටි අනුගාමික පන්සියයක් වූ වැරදි මඟ ගත් භික්ෂූන්ට බණ කියා නිවැරදි මගට ගත් හ.

එයින් කුපිත වූ දේවදත්ත පාක්ෂික කෝකාලික තෙර දෙව්දත් තෙරුන් නිදා සිටින විට ''**තා මර නින්දේ ද?**'' කියා විලුඹෙන් පපුවට ඇන්න විට දෙව්දත් තෙරුන් ලේ වමනය කළේ ය. එයින් රෝගීව ඇඳේ වැතිර සිටින විට දෙව්දත් තෙරුන්ට මෙවැනි අදහසක් පහළ වුණි.

''මම නව මසක් ම කිසි පිහිටක් නැතිව අසරණ වූයෙමි. බුදුරජාණන් වහන්සේ මා කෙරෙහි කළකිරුණු සේක. අසූ මහා සව්වන් වහන්සේත් මාගේ බෑණා වූ රාහුල තෙරුන් වහන්සේත් මා කෙරෙහි කළකිරුණු සේක. මාගේ ශාක්‍ය-කෝලිය වංශික නෑයෝත් මා සමග අමනාප වූහ. කවුරුන් මා කෙරෙහි අමනාප වුවත් මාගේ බුදු රජාණන් වහන්සේ මා හා අමනාප නොවන සේක. මම බුදුන් සරණ යමි. බුදුරදුන් දැක ක්ෂමා කරවා ගනිමි''.

මෙසේ සිතා ළඟ සිටි භික්ෂූන්ට කතා කොට ඇඳ පිටින්ම ඔසවා ගෙන දෙව්රම් වෙහෙරට ගෙන යන්නැයි පැවසීය. දෙව්දත් තෙරුන් ඇතුලු පිරිස දෙව්රම් වෙහෙර බලා පිටත් වූ බව දැනගත් ආනන්ද තෙරණුවෝ බුදුරදුන්ට ඒ බව දැන්වූහ. එවිට බුදුරදුන් වදාළේ දෙව්දත් තෙරුන්ට මා දැකිය නොහැකි ය යනුවෙනි. දෙව්දත් තෙරුන් ක්‍රමයෙන් සැවැත්නුවරට පැමිණියේ ය. ඒ පුවත ද ආනන්ද හිමියෝ බුදුරදුන්ට සැල කළ හ. එහි දී ද බුදුරදුන් වදාළේ දෙව්රම් වෙහෙරට පැමිණියත් තමන් වහන්සේ දැකිය නොහැකි බව යි. දෙව්දත් තෙර දෙව්රම් වෙහෙර දොරටුවට ඔසවාගෙන ආ විට ඇඟෙහි දැවිල්ලක් ඇති වී දහඩිය ගලන්නට විය. ඒ දොරටුව අසල පොකුණක් ඇත. ''ඒ පොකුණෙන් දිය නා ගෙන යමි''යි සිතූ දෙව්දත් තෙර ඇඳ බිමින් තබවාගෙන පය බිම තැබී ය. එවිට පොළොව පැලී නරකයෙන් ගිනි දැල් පැමිණ සිවුරකින් සිවුරක් වසන්නා සේ සිරුර ගින්නෙන් වසා පොළොවෙහි ගිලෙන්නට ගත්තේ ය. බෙල්ල දක්වා ගිලුණු පසු ''මට බුදුරදුන් ගේ පිහිට මිස වෙනත් පිහිටක් නැතැ''යි බුදුන් සරණ ගියේ ය. එසේ බුදු සරණ යමින් අවීචියෙහි වැටුණේ ය. දෙව්දත් තෙරුන්ට පක්ෂපාතීව බුදුරදුන්ට නොයෙක් දොස් නැගූ පන්සියයක් මිනිස්සු ද එවේලෙහි අවීචියට ම ගිය හ. මෙම පුවත දම් සභා මණ්ඩපයට රැස් වූ භික්ෂූන් වහන්සේලා කතා කරමින් හුන් හ. එතැනට වැඩම කළ බුදුරදුන් එම තොරතුරු අසා ''මහණෙනි, දැන් පමණක් නොව පෙරත් තමන් හා එක්ව සිටි අය ද සමග දෙව්දත් නරකයට ගියහ'' යි වදාළ සේක.

## අතීත කතාව

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රාජ්‍ය සමයෙහි එක් ගමක වඩු ශිල්පීහු දහසක් සිටිය හ. එම වඩුවෝ ඒ ගමේ මිනිසුන්ට ඇඳ, පුටු, ගෙවල්, දොරවල් සාදා දෙමු යි, කියා අවශ්‍ය භාණ්ඩ හා මුදල් ඔවුන්ගෙන් ලබා ගත් හ. එහෙත් එම කාර්යයන් කර නොදුන් හ. වඩුවන් තමන්ට වුවමනා දේ සාදා නොදෙන හෙයින් මිනිස්සු ''අපගෙන් ගත් මුදල් දෙව''යි කී හ. එහෙත් වඩුවන්ට එම මුදල් ගෙවාගන්නට නොහැකි විය. ඔවුහු වඩු කර්මාන්ත ද නොකරන්නාහු ය. මෙසේ කිසිත් කර ගන්නට නොහැකි වූ ඔවුහු කණගාටුවට පත්ව වනාන්තරයට ගොස් මහා යාත්‍රාවක් සෑදූ හ. එය ගඟ දිගේ ගෙනවුත් තමන්ගේ අඹු දරුවන් ද එම යාත්‍රාවට නංවා ගත් වඩුවන් දහසක් දෙනා ගඟ දිගේ යාත්‍රා කොට මුහුදට පැමිණියාහු ය. මුහුදේ යාත්‍රා කරන ඔවුහු මිහිරි අඹ, කෙසෙල්, උක් දඬු, වැළ වරකා, ස්වයංජාත හැල් ආදී මිහිරි රසවත් පළතුරුවලින් පිරුණු දූපතක් දුටුවහ. එම දූපත මිනිසුන් වසන දූපතක් දැයි, විමසා බැලීමට ශක්තිමත් පුරුෂයන් සත් දෙනෙකු ආයුධ ද සහිතව එහි යැවූ හ.

එම දූපතට ඔවුන්ට පෙර එක්තරා මිනිසෙකු ගොඩබැස සුවසේ කැමති පරිදි ඇල් හාලේ බත් කා, උක් පැණි බී රිදී පටක් වැනි වූ වැල්ලේ වැතිරී මෙසේ කල්පනා කොට ඇත. ''මට ඇති මෙම සැප ඇත්තේ වෙන කවුරුන්ට ද? අඩුවකට ඇත්තේ වස්ත්‍ර නැති බව පමණකි. දඹදිව බොහෝ මිනිස්සු ජීවත්වීමට සී සෑම්, වැපිරීම් ආදිය කොට දුක් විඳින්නා හ. මට එවැනි වූ වෙහෙසක් නැත'' සිතමින් එහිම නතර විය. දූපත පරීක්ෂා කිරීමට පැමිණි පුරුෂයන් සත් දෙන ඔහු වැතිර සිටි තැනට ගොස් යකෙක් වේ යැයි, සිතා විදින්නට සූදානම් වූහ. එවිට එම

මිනිසා, ''මට විදින්න එපා. මම යක්ෂයෙක් නො වෙමි.''යි කීය. එවිට පුරුෂයෝ සත් දෙනා ''මිනිසෙකු වූයේ නම් නිරුවත්ව හිඳී ද? කෙස් රැවුල් වවාගෙන මෙසේ සිටින්නේ ඇයි ද'යි, කීහ. එවිට මිනිසා ''යාත්‍රාවක නැගී ආ මම මෙතැන නතර වුණෙමි.'', යි කීවේ ය. පුරුෂයන් සත්දෙනා ඔහුගෙන් ''මෙතැන ඇති සැප පහසුකම් මොනවා ද''යි විචාළහ. එවිට එම මිනිසා මෙසේ කීවේ ය.

''මෙතැනට වඩා පළතුරු ආදිය ඇති තැනක් ද සිත් ඇදගන්නා තැනක් ද, යක් රකුසු බිය නැති තැනක් ද වෙනත් නැත. තොප සැමදෙනා ම කළ යුත්තක් ඇත. මෙතැන ඉතා සිත් අලවන තැනක් හෙයින් දේවතාවෝ මෙතැනට ඇලෙන්නා හ. ඒ නිසා එළියෙහි මලමුත්‍ර පහ නොකොට වළක් හාරා, එහි මළමුත්‍ර පහ කරව. එය පමණක් කරගත හැකි වුවහොත් මීට වඩා සැප පහසු ඇති වෙයි. වෙනත් තැනක් නැත.''

මෙය ඇසූ එම පුරුෂයෝ සත්දෙනා නැවට නැගී වඩුවන් දහසත් තමන්ගේ අඹු දරුවනුත් නැවෙන් ගොඩ බස්සවා ඒ දූපතේ ගෙවල් ඉදිකර වූහ. සැප සේ ස්වයංජාත හැල් ද මිහිරි පළතුරු ද කා වාසය කළ හ.

මේ පිරිස අතර එම වඩුවන් දහසට නායක වූ දෙදෙනෙකු ඇත. එක් වඩු නායකයෙක් හා පන්සියයක් වඩුවෝත් ලද පමණින් සතුටුවන ගුණයෙන් යුක්තය හ. එක් වඩු නායකයෙක් හා පන්සියයක් වඩුවෝ තෘෂ්ණාවෙන් යුක්තය හ. වීථිය ද ඒ අයුරින් ම දෙකට බෙදාගෙන වාසය කරන්නට පටන් ගෙන ''බොහෝ දවස් අපි රා නොබී සිටියෙමු'' යි කියා උක් පැණියෙන් රා පෙරා බී මත් වී නොයෙක් තැන මළමුත්‍ර පහ කොට අපවිත්‍ර කළ හ.

ඉක්බිති දේවතාවෝ මෙසේ සිතූහ. ''අපගේ මෙම සිත් ඇදගන්නා වූ ස්ථානයෙහි මොවුහු මළමුත්‍ර කළහ. සමුද්‍රයෙන් ජලය නගාලමු''. පසුව දේවතාවෝ ''පසළොස්වක පොහොය දා පුන් සඳ මුදුන් වූ විට ජලය නංවමු'' යි කතා කරගත් හ. ඒ අතර සිටි එක්තරා දෙවියෙක් මා වැනි කෙනෙකු සිටිය දී මේ මිනිසුන් නොනසත්වා යි, සිතා සියලු ආභරණයෙන් සැරසී උතුරු දිසාවේ සිට ආලෝකය විහිදුවා මෙසේ කීහ.

''එම්බා පුරුෂයෙනි, මේ දූපත මළමුත්‍ර කොට අපිරිසිදු කොට ඇති බැවින් මුහුද ගලා දූපත යට කරන්නට දේවතාවෝ එකතුව කතා කළ හ. ඒ නිසා තෙපි සැමදෙනම වෙන තැනකට යවු''

ඊට පසු තවත් දේවතාවෙක් සියලු ආභරණයෙන් සැරසී දකුණු දිසාවේ සිට,

''තොප හැම ළඟට දේවතාවෙක් පැමිණ කීවේ බොරු ය. තෙපි හැම මෙහිම සිත් අලවා වාසය කරව. මුහුදු ජලය ගලා කවදා මේ දූපත ගිලෙන්නේ ද? ඒ බොරු ය. මෙහි ම වාසය කරව'' යි, කියා ගිය හ. එම දේවතාවා ගිය පසු දූපත කෙලෙසූ වඩු නායකයා ''පළමු දේවතාවා අප මෙහි වසනවාට නොකැමති ය. පසුව ආ දේවතාවා කී දෙය ඇත්ත ය. ඒ නිසා අපිත්. තෙපිත් නොගොස් මෙහිම ඉඳිමු'' යි කීය.

නුවණැති වඩු නායකයා තම පිරිස කැඳවා මෙසේ උපදෙස් දුන්නේ ය. ''එක් දේවතාවෙක් යන්නට කීහ. එක් දේවතාවෙක් නවතින්නට කීහ. මේ දෙදෙනා කී දෙයින් කුමක් ඇත්ත ද යි, කුමක් බොරු ද යි, නො දනෙයි. අප නැසෙන්නේ කුමකට ද? යාත්‍රාවක් සාදා තබා මුහුදු දිය මෙතැනට ගලා ඒ නම් යාත්‍රාවට නැගී යමු. නොගලන්නේ නම් මෙතැනම හිඳිමු. ඒ නිසා යාත්‍රාවක් සාදා තබමු යි, යාත්‍රා සාදවා ඒවාට රිටි ආදිය ද සකස් කොට තබා ගත් හ.

අනෙක් වඩු නායකයා තම පිරිසට කතා කොට ''තලියේ කිඹුලන් ඇතැ යි, බිය වන්නේ කුමට ද'' යි කීය. පසළොස්වක පොහොය දිනය උදා වී සඳ පෑයූ විට මුහුදු රළ දූපතට ගලාගෙන ඇවිත් දණක් පමණ උසට දිය පිරී ගියේ ය. එවිට නුවණැති වඩුවාණෝ තමන්ගේ පන්සියයක් වඩුවනුත් සමග යාත්‍රාවලට නැගී පිටත්ව ගිය හ. අනෙක් නායක වඩුවා ''දැන් එන රළ ගණන් නොගෙන මෙතන ඉඳිමු. කුණු සෝදාගෙන ගලා ගියේ යැ''යි කියා නතර වී සිටියේ ය. ඊළඟට උකුළක් පමණ, පපුව පමණ, කරවටක් පමණ මුහුදු දියෙන් පිරී, පන්සියයක් වඩුවෝත් අඹු දරුවෝත් මුහුදු දියෙන් ම යට වී මළා හ. නුවණැති වඩුවා ද පන්සියයක් වඩුවෝ ද සුව සේ නැව් නැගී ගොස් ගැලවුණාහ.

එදා දූපත හැර නොයන ලෙස බොරු කී දේවතාවා කෝකාලික භික්ෂුව ය. දූපත හැර වෙන තැනෙකට යන්නට කී දේවතාවා සැරියුත් මහ තෙරණුවෝ ය. එදා අනුවණ වඩුවා දෙව්දත් තෙර ය. යාත්‍රාවට නැගී දූපතෙන් පිටත්ව ගිය වඩුවෝ පන්සියය බුදු පිරිස ය. එදා පණ්ඩිත වඩුවාණෝ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ම වූ සේක.

**අභ්‍යාස**

01. දෙව්දත් තෙර අවීචි මහා නරකයට ඇද ගෙන යන අවස්ථාවේ ඔබ සිටියේ යැයි, සිතා ''දෙව්දත් තෙර දෙව්රමෙන් අවීචියට...'' යන ශීර්ෂ පාඨයෙන් පුවත්පත් වාර්තාවක් ලියන්න.
02. සමුද්‍ර වාණිජ ජාතකය පන්තිය ඉදිරියේ ප්‍රකාශ කරන්න.
03. මිනිසුන් නොමග යැවූ දේවතාවා වැනි අසත්‍යය සමාජය තුළ පතුරුවන්නන් ගෙන් වන හානිය උග්‍ර සමාජ ව්‍යසනයක් වී තිබේ. මේ ගැන ඔබේ අදහස් දක්වන්න.

**භාවිතයට**

ඉමෙහි අට්ඨහි තමග්ග පුග්ගලං
දෙවාති දෙවං නරදම්ම සාරථිං
සමන්ත චක්ඛුං සත පුඤ්ඤ ලක්ඛණං
පාණෙහි බුද්ධං සරණං උපෙමි

07
පාඩම

# ඉල්ලන්නා පිරිහෙන්නේ ය.

## බ්‍රහ්මදත්ත ජාතකය

භික්ෂූන් වහන්සේලා යැපෙනුයේ ගිහි සැදැහැවතුන් පූජා කරන සිව්පසයෙනි. එම කරුණ ''පරපටිබද්ධා මෙ ජීවිකා.....'' යනාදී වශයෙන් නිතර සිහිපත් කළ යුතු බව දසධම්ම සූත්‍රයෙහි ඉගැන්වේ. නමුත් ඉල්ලීම නම් නුසුදුසු ය. අනුන්ගෙන් යම් යම් දේවල් ඉල්ලීම ආත්ම ගෞරවයට බරපතල හානියකි. අධිකව යාචනයෙන් ඉල්ලන්නා අප්‍රිය වේ, තරහ සිත් ඇති වේ. එය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසත්, පැහැදුනවුන්ගේ වැඩි පැහැදීම පිණිසත් හේතු නොවන්නේ ය. බඹරා මලටත්, මලේ රොන්වලටත්, සුවඳට මෙන් ම පැහැයටත් හානි නොවන සේ රොන් ගන්නාක් මෙන් භික්ෂූන් වහන්සේ ද ගිහි සැදැහැවතුන්ට හිරිහැර නොවන පරිදි යැපිය යුතු බව ධම්මපදයේ පුප්ඵ වග්ගයෙහි ''**යථාපි භමරො පුප්ඵං.....**'' යනාදී ගාථාවෙන් ඉගැන්වෙයි. මේ සම්බන්ධව ම මනාව ඉගැන්වෙන ජාතක කතාවක් ලෙස බ්‍රහ්මදත්ත ජාතකය හැඳින්විය හැකි ය.

## වර්තමාන කතාව

බුදු රජාණන් වහන්සේ අලව් නුවර අග්ගාළව නම් චෛත්‍යය පිහිටි ස්ථානයෙහි වාසය කරන සමයෙහි භික්ෂූන් වහන්සේලා ආවාස තැනීම සඳහා යම් යම් උපකරණ ආදිය ඉල්ලා මහජනයා වෙහෙසට පත් කිරීමේ සිද්ධියක් අරභයා මෙම ජාතකය වදාළ සේක.

අලව් නුවරවාසී බොහෝ භික්ෂූන් වහන්සේලා ආවාස සාදා ගැනීමට කැති, පොරෝ ආදී ආයුධ දෙන්නැ යි, කියා නිතර මිනිසුන්ට කරදර කරති. එබැවින් මිනිස්සු භික්ෂූන් දැකීමට පවා මැලි වෙති. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ එ නුවර පිඬු සිඟා වැඩි අවස්ථාවක පෙර උන් වහන්සේ වඩින පෙර මග බලා සිට දන් පිළිගැන් වූ සැදැහැවත්හු පවා සැඟවෙන්නට වූ හ. මේ බව උන් වහන්සේ බුදු රදුන්ට සැලකර සිටිය හ. බුදුරජාණන් වහන්සේ අලව් නුවර සියලු භික්ෂූන් කැඳවා මේ පිළිබඳ විමසූ හ. උන් වහන්සේලා එය සැබෑවැ'' යි, පිළිගත් හ. එවිට බුදුරජාණන් වහන්සේ,

''මහණෙනි, භික්ෂූන් නම් දැහැමෙන් සෙමෙන් ලත් දෙයක් විනා සැදැහැවතුන්ගෙන් කිසිවක් ඉල්ලා නොසිටිය යුතු ය. එසේ ඉල්ලූ කල සැදැහැවතුනට පැවිද්දන් කෙරෙහි කළ කිරීම් ඇති වෙයි. ඉල්ලීම කිසිවකුටත් මිහිරි දෙයක් නොවේ. බොහෝ සම්පත් ඇත්තෝ පවා ඉල්ලීම නිසා කණස්සලු වෙති. පෙර උතුමෝ එක් කඩයක් හා පාවහන් යුවලක් පවා ඉල්වා ගත නොහැකිව දොළොස් අවුරුද්දක් ම ලජ්ජාවෙන් කල් ගෙවූ හ'' යි, අතීත පුවත වදාළ සේක.

## අතීත කතාව

යටගිය දවස දඹදිව උත්තර පංචාල රට කම්පිල්ල නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රාජ්‍යය කරන සමයෙහි අප මහ බෝසතාණන් වහන්සේ එක්තරා බ්‍රාහ්මණ කුලයක උපන් හ. රූපාදී පංච කාමයෙහි ආදීනව දැක සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූ බෝසතාණෝ හිමාල වනයෙහි වැඩ විසූ හ. ලුණු ඇඹුල් සේවනය සඳහා කම්පිල්ල නුවරට පැමිණි බෝසත් තාපසතුමා රජුගේ මඟුල් උයනෙහි නවාතැන්ගෙන සිටියේ ය. ඒ බව ඇසූ බ්‍රහ්මදත්ත රජු තාපසතුමා බැහැදැක පැහැදී ඉදිරි වස් සාරමස උයනෙහි වාසය කරන ලෙස ආරාධනා කළේ ය.

තාපසතුමා වස් අවසානයේ දී පෙරළා හිමාල වනයට යනු කැමතිව ගමනට අවශ්‍ය පාවහන් යුගලක් හා පත් කඩයක් රජුගෙන් ඉල්ලා ගැනීමට සිතුවේ ය. එහෙත් ඒ කෙරෙහි ලජ්ජාවෙන් මෙසේ ද සිතී ය.

''යම් කෙනෙකුගෙන් මට මේ දෙය නැතැයි, කියා යමක් ඉල්ලීම යනු එක් හැඬීමකි. දෙන තැනැත්තා එම ඉල්ලීමට ''නැතැයි'' යි, කීවේ නම් එය දෙවැනි හැඬීමය. මේ අප දෙදෙනාගේ අඬන හැඬීම බොහෝ දෙනා මැද කිරීම සුදුසු නොවේ. කිසිවෙකු නැති තැනක දී රහසිගතව ඉල්ලා ගන්නෙමි ''

එසේ සිතූ තාපසතුමා රජතුමා අමතා ''රජතුමනි, රහස් කටයුත්තක් ඇත. තනිව කීමට කැමැත්ත ඇත්තේ වෙමි'' යි, කීය. ඒ ඇසූ රජතුමා ළඟ සිටින්නන් ඉවත් කරවීය. ඉක්බිති තාපසතුමා යම් හෙයකින් මා යමක් ඉල්ලූ කල රජතුමාට දෙනු නොහැකිව නැතැයි, කිවහොත් එයින් රජතුමා තුළ කණස්සල්ලක් ද ඇති වන්නේ ය. අප කෙරෙහි මෛත්‍රිය ද හීන වන්නේ ය.

එනිසා කිසිවක් නො ඉල්වමි'' යි, තීරණය කොට ''මහරජතුමනි, මම එය පසුව කියන්නෙමි' යි, කියා රජු පිටත්කොට හැරියේ ය. නැවත අන් දිනක රජු පැමිණි විට ද එය කියන්නට සිතුවත් තාපසතුමාට ලජ්ජාව නිසා කියාගත නොහැකි විය. මෙසේ මෙම ඉල්ලීම කරගත නොහැකිව දොළොස් අවුරුද්දක් ම ගත විය.

දොළොස් අවුරුද්දක් ම ඉක්ම ගිය කල රජු මෙසේ සිතීය. ''තාපසතුමා මාගෙන් යමක් ඉල්ලීමට සිතන්නේ දොළොස් අවුරුද්දක සිට ය. අද මම උයනට ගොසින් ඒ ගැන විමසමි. තාපසතුමාට ගිහිගෙය ගැන ඇල්ම ඇතිව මා වෙතින් රාජ්‍යය ඉල්ලා සිටින අභිප්‍රායෙන් සිටිනු විය හැකි ය. රජදරුවන්ගෙන් රාජ්‍යය ඉල්ලා සිටීම නම් සුදුසු නොවෙයි. රජදරුවෝ නම් රාජ්‍ය ලෝභය ඇත්තෝ යැයි, කියා මගෙන් රාජ්‍යය නොඉල්ලා සිටිනවා විය හැකි ය. එහෙත් අද මම රාජ්‍යය ඉල්ලුවත් දෙමි. රාජ්‍යයෙන් අඩක් ඉල්ලුවත් දෙමි''

අනතුරුව රජු උයනට පිවිස තාපසතුමාට වැඳ ''ස්වාමීනි, ඔබ වහන්සේ මා වෙතින් යම් දෙයක් ඉල්ලීමට අදහස් කොට ලතවෙන්නේ දොළොස් අවුරුද්දක සිට ය. අද නුඹ වහන්සේ මාගේ රාජ්‍යය ද ඇතුලුව කැමති ඕනෑම දෙයක් ඉල්ලුව මැනවි. එය දෙමි'' යි, කීය.

එවිට තාපසයාණෝ ''රජතුමනි, මා ඉල්ලූ දෙයක් දෙන්නේ වේ දැයි'' ඇසූ හ. එයට පිළිතුරු දුන් රජු '' රාජ්‍යය දෙමි යි, කියන්නා වූ මට වෙනත් කිනම් වස්තුවක් නොදෙන්නෙමි යි, කිව හැකි ද? එවිට තාපසයාණෝ ''මහ රජතුමනි, මම හිමාලයට යාමට කැමැත්ත ඇතිව සිටිමි. පාවහන් සඟලක් හා පත් කඩයක් ලබාගනු කැමැත්තෙමි'' යි, කීය.

ඒ ඇසූ රජු මෙපමණ සුලු දෙයක් මට මෙතෙක් කල් නොකීවේ මන්දැයි, විමසීය. එයට පිළිතුරු දුන් තාපසතුමා, ''පංචාලයාධිපතිතුමනි, ඉල්ලන්නෙකුට ලාභය හෝ අලාභය යන දෙකෙන් එකකට පත්වීමට සිදු වේ. ඉල්ලීම යනු එබඳු දෙයකි. ඉල්ලීම හැඬීමකැයි, කියයි. එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම පෙරළා හැඬීමකි. පංචාල වැසියෝ මාගේ හැඬීමත්, ඔබගේ පෙරළා හැඬීමත්, නො දකිත්වා යි යන හැඟීමෙන් මම එය රහසිගතව කීමට තීරණය කළෙමි'' යි, පැවසී ය. එබස් ඇසූ රජතුමා තාපසතුමා කෙරෙහි වඩාත් පැහැදුනේ ය. පැහැදී රාජ්‍යයම දෙන්නට සැරසුණේ ය. එවිට තාපසතුමා ''මහරජ මම පංචකාමයෙහි ආදීනව දැක ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූ කෙනෙක් වෙමි. එහෙයින් මට මෙම වස්තුවෙන් කිසි ප්‍රයෝජනයක් නැත. මට මේ පත් කඩයත්, පාවහන් සඟලත් පමණක් ඇතැයි කියා ඒ දෙක පමණක් ගෙන මහ රජතුමනි, අප්‍රමාදීව කටයුතු කරනු මැනවි. දන්දෙනු මැනවි, සිල් රකිනු මැනවි, පෙහෙවස් සමාදන් වනු මැනවැ'' යි, රජුට ඔවදන් දී තව දුරටත් උයනෙහි වැඩ සිටින ලෙස රජු පෙරැත්ත කරද්දී හිමාලය බලා වැඩම කළේ ය. එහි දී පංච අභිඥා, අෂ්ට සමාපත්ති උපදවා මිය පරලොව ගොස් බඹලොව උපන්නේ යැයි මේ ජාතක කතාව ගෙන හැර දක්වා වදාළ සේක. එදා බ්‍රහ්මදත්ත රජු නම් ආනන්ද තෙරණුවෝ ය. තාපසතුමා වූ කලී බුදු වූ මම් ම වේ යැයි, තමන් වහන්සේ දක්වා වදාළ සේක.

**අභ්‍යාස**

01. ''යමෙකුගෙන් යමක් ඉල්ලීම එක් හැඬීමකි. දෙන තැනැත්තා එම ඉල්ලීමට නැතැ යි, කීවේ නම් එය දෙවන හැඬීම ය'' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
02. බ්‍රහ්මදත්ත ජාතකය මූලාශ්‍ර කරගෙන ''යාචනය ආත්ම ගෞරවයට හානියකි '' මැයෙන් බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.

## භාවිතයට

යථාපි භමරො පුප්ඵං - වණ්ණ ගන්ධං අහෙඨයං
ඵලෙති රසමාදාය - එවං ගාමෙ මුනී චරෙ
(ධම්මපදය - පුප්ඵ වග්ගය)

බඹරා මල පැහැය හා සුවඳ නොපෙළමින් පැණිගෙන යන්නාක් මෙන් මහණහු ගම හැසිරෙති.

දෙහීති වචනං කෂටං
නාසතීති වචනං තථා
දෙහී නාසතීති වා වාක්‍යං
මාභූද් ජනමනි ජනමනි
(ව්‍යාසකාරය)

දෙන්නැයි යන වචනය කටුක ය, නැතැයි, යන්න ද එසේ ම ය. දෙන්නය, නැතය යන වචන දෙක උපනුපන් ජාතියෙහි අසන්නට නොලැබේවා!

08 පාඩම

# නොඉවසීම විපතට මුල ය.

## ක්ෂාන්තිවාදී ජාතකය

ඉවසීම සෑම පුද්ගලයෙකු ම මැනවින් ප්‍රගුණ කළ යුතු ඉතා උසස් ගුණ ධර්මයකි. ඉවසීමේ සීමාව ඉක්මවා යාම නිසා ඇති වන අධික කෝපය හා ක්ෂණික කෝපය නිසා සමාජ ගැටලු බොහොමයක් හට ගනියි. මනුෂ්‍ය ඝාතන, සියදිවි නසා ගැනීම, පොදු දේපොල විනාශ කිරීම, කලකෝලාහාල හා රථවාහන අනතුරු යනාදී ව්‍යසනයන් බොහොමයකට ප්‍රධාන හේතුවක් වන්නේ ඒ ඒ පුද්ගලයන්ගේ ඉවසීමේ පවත්නා දුර්වලතාවන් ය.

අප මහා බෝසතාණන් වහන්සේ පිරූ දසපාරමිතා අතර ''ඛන්ති'' යනුවෙන් සඳහන් වන්නේ මෙම ඉවසීමේ ගුණාංගය යි. අප ජන සමාජය අතර ''ඉවසීමෙන් සැනසීම ලැබේ'' යන අගනා ප්‍රස්තා පිරුළක් ද ප්‍රකටව පවත්නේ එය බෙහෙවින් ම මිනිස් සමාජයේ යහපැවැත්ම සඳහා හේතුවන බැවිනි.

අප මහා බෝසතාණන් වහන්සේ ඉවසීම මැනවින් ප්‍රගුණ කළ ආකාරය දැක්වෙන ජාතක කතාවක් ලෙස ''ක්ෂාන්තිවාදී ජාතකය'' හඳුන්වා දිය හැකි ය.

## වර්තමාන කතාව

එකල බුදුරජාණන් වහන්සේ වැඩසිටියේ සැවැත්නුවර ජේතවනාරාමයේ ය. නිතර කෝප සහගතව හැසිරෙන භික්ෂූන් වහන්සේ නමක් පිළිබඳ එහි දී බුදුරදුන්ට දැන ගැනුමට ලැබුණි. එම භික්ෂුව කැඳවූ උන් වහන්සේ භික්ෂුවට අවවාද කරමින් ''පෙර උත්තමයෝ අත් පා කන් නාසා කැපීම ආදී ඉතා දරුණු වධ හිංසා කරද්දීත් කෝප නොවී සිටියාහු'' වේ යැයි වදාළ හ. පසුව භික්ෂූන් වහන්සේලා ගේ ආරාධනයෙන් ඉකුත් වත් ගෙනහැර දක්වා වදාළ සේක.

## අතීත කතාව

යටගිය දවස කසී රට කලාබු නම් රජ කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි අප මහා බෝසතාණන් වහන්සේ බමුණු කුලයක උපන්නා හ. උන්වහන්සේ නමින් ''කුරුණ්ඩක කුමරු'' යැයි ප්‍රකට විය. නිසි කල ශිල්ප ශාස්ත්‍ර මැනවින් හදාරා දෙමව්පියන්ගේ ඇවෑමෙන් ඔවුනගේ සියලු සම්පත්වලට උරුමකරු වූ කුරුණ්ඩක කුමරු පංච කාමයෙහි ආදීනව දැක එකී සියලු සම්පත් දාන විෂයෙහි විසුරුවා හැරියේ ය. පසුව ඍෂි ප්‍රව්‍රජ්‍යාව ලබා හිමාලය වනයෙහි වාසයට ගියේ ය. වරෙක ලුණු ඇඹුල් සේවනය සඳහා බරණැස් නුවරට පැමිණ රජ උයනෙහි නවාතැන් ගත්තේ ය. පසුදින තවුස්තුමා පිඬු පිණිස හැසිරෙණු

රජුගේ මහසෙනෙවි තෙමේ දුටුවේ ය. ඔහු ස්වකීය නිවසට තවුස්තුමා කැඳවාගෙන ගොස් දානමානාදිය පිරිනමා සංග්‍රහ කොට එම රාජ උයනෙහි ම වැඩ සිටීමට අවස්ථාව සලසා දුන්නේ ය.

මේ අතර එක් දිනක් කලාබු රජු දහසක් නාටක ස්ත්‍රීන් පිරිවරා උයන් කෙළියට ගිය හ. ඔවුනගේ නැටුම් ගැයුම් බලමින් ගිමන් වෙහෙස හරිමින් සිටින අතර බීමත්ව සිටි රජතුමා එක් කාන්තාවකගේ උකුලේ නින්දට වැටුණේ ය. ඒ දුටු සෙසු නාටක ස්ත්‍රීහු අප ගේ ස්වාමීන් නිදන කල අපි කාහට නැටුම්, ගැයුම්, වැයුම් කරමු දැයි, කතිකා කොට තූර්ය භාණ්ඩ එතැනම දමා උයන්සිරි නරඹන්නට වූ හ. එසේ ගමන් කරන අතර එක්තරා ගසක් මුල වැඩසිටින තාපසතුමා දුට හ. තාපසතුමා වටා රැස් වූ ඔවුහු බණක් දේශනා කරන ලෙස ඉල්ලා සිටිය හ. තවුසාණෝ බණ දෙසූ හ. තමා තනිකර ගොස් සෙසු පිරිස තවුස්තුමා සමීපයෙහි බණ අසනු දුටු ස්ත්‍රිය රජු අවදි කරවූවා ය. අවදි වී බලන විට සෙසු ස්ත්‍රී පිරිස නොදුටු රජු ඔවුන් කොහි ගියා දැයි, ඇයගෙන් විමසී ය. අසවල් තැන ගසක් යට තාපසතුමෙකු සමීපයෙහි ඔවුහු බණ අසති යි, ඇය පිළිතුරු දුන්නා ය.

එයින් රජු මහත් සේ කෝපයට පත් වී සැණෙකින් නැගී සිට කඩුව අමෝරා ගෙන තාපසතුමා මැරීමට වහා දිව ගියේ ය. නාටක ස්ත්‍රීහු වහා පැන කඩුව උදුරාගත් හ. ඉක්බිති රජු තාපසතුමාගෙන් ''තොප කිනම් වාදී ද''යි ප්‍රශ්න කළේ ය. තාපසතුමාගේ පිළිතුර වූයේ ''මම ක්ෂාන්තිවාදී වෙමි'' යි යන්න ය. ක්ෂාන්තිය යනු කුමක් දැයි රජු විමසී ය. තමාට කෙනෙකු දොස් නගද්දී හිරිහැර කරද්දී නොකිපේ නම් එය ක්ෂාන්තිය බව තාපසතුමා කියා සිටියේ ය. තොප ළඟ ක්ෂාන්තියක් තිබේ දැයි බලන්නෙමි කියා රජු වධකයෙකු ගෙන්වා මෙම සොර තවුසා බිම හොවා කස පහර දෙව'යි අණ කළේ ය. වධකයාගේ කස පහරින් තුවාල ලත් තාපසතුමාගේ ඇඟෙන් ලේ ගලන්නට විය. රජු නැවතත් ''දැන් තොප කිනම් වාදී ද''යි ඇසී ය. ''මහරජ, මම ක්ෂාන්තිවාදී වෙමි. මගේ ඉවසීම හද තුළ පවත්නා දෙයක් මිස ඇඟෙහි හෝ සමෙහි ඇති දෙයක් නොවේ'' යැයි, තාපසතුමා පිළිතුරු දුන්නේ ය. එයින් රජුගේ කෝපය තවත් දැඩිවිය.

ඉක්බිති රජු ''එසේ නම් ඔබගේ එම ක්ෂාන්තිය තවදුරටත් බලමි''යි, කියා තාපසතුමා ගේ දෙඅත්, දෙපා කැප්පවීය. දැන් තොප කිනම් වාදී දැයි රජු ඇසී ය. තාපසතුමාගේ පිළිතුර පෙරසේ ම විය. අනතුරුව රජු උන්වහන්සේගේ කන් නාසා කැපීමට නියම කළේ ය. එහි දී ද තාපසතුමා කියා සිටියේ රජු තමාට කෙතෙක් වධහිංසා කළත් ''මාගේ ක්ෂාන්තිය අත පය හෝ කන් නාසාවල පවත්නා දෙයක් නොව, එය මාගේ හද තුළ පවත්නා දෙයක්'' ය යනුවෙනි. වඩ වඩාත් කෝපයට පත් රජු ''එම්බල සොර තවුස, තොපගේ ක්ෂාන්තිය තොපගේ හද තුළ ම තබා ගනු යැ''යි, කියා විලුඹෙන් තාපතුමාගේ ළයට ඇන එතැනින් පිටත්ව ගියේ ය.

ඉක්බිති මහත් බියෙන් තැතිගත් සෙනෙවිතුමා තවුසා සමීපයට එළඹ ඇඟ ලේ පිසදමා කපා දැමූ අත්පාදිය නැවත එක්කොට වෙළුම්පටි දමා බැඳ පිළියම් කරවීය. අනතුරුව වැඳ වැටී ''මේ කළ අපරාධය රජු කළ දෙයක් මිස, තමාවත් රටවැසියන්වත් කළ දෙයක් නොවන හෙයින් අප කෙරෙහි නොකිපෙනු මැනවැ''යි, කියා සිටියේ ය. එය ඇසූ තාපසතුමා,

යො මෙ හත්‍ථෙ ච පාදෙ ච - කණ්ණ නාසං ච ඡෙදයී
චිරං ජීවතු සො රාජා - න හි කුජ්ඣන්තිමාදිසා

"සෙනෙවිතුමනි, යම් රජ කෙනෙක් මාගේ අත් පා කණ් නාසා ද සිඳ වූයේ ද ඒ රජු බොහෝ කල් ජීවත් වේවා. ඔහු වැන්නෝ අනවබෝධයෙන් මට වධහිංසා කළත් මා සිත ඔහු කෙරෙහි කිසිදු වෛරයක් නොමැත. මා වැන්නෝ එබඳු වරදටත් නොකිපෙති' යි, වදාළහ. අනතුරුව උන්වහන්සේ සැමට මෙත් වඩා සුලු වේලාවකට පසු මිය පරලොව ගියේ ය. සෙනෙවිතුමා නුවරවැසියන් සමඟ එක්ව තාපසතුමාගේ ආදාහන කටයුතු කළේ ය. කලාබු රජුට එම අපරාධය කොට උයනින් පිටවන්නටවත් ඉඩක් නොලැබිණ. හෙතෙම පොළව පලාගෙන අවීචියට ගියේ ය.

එසමයෙහි කලාබු රජු නම් දැන් දේවදත්ත තෙරුන් ය. සෙනෙවිතුමා නම් සැරියුත් මහ රහතන් වහන්සේ ය. ක්ෂාන්තිවාදී තාපස වූයෙම් තිලෝගුරු බුදු වූ මම් ම වේ යැයි, ක්ෂාන්තිවාදී ජාතකය නිම කළ සේක.

**අභ්‍යාස**

01. "ඉවසීම බෝසත් ගුණයකි" ක්ෂාන්තිවාදී ජාතක කතාව ඇසුරෙන් මෙම අදහස පැහැදිලි කරන්න.
02. ඉවසීම නොමැතිකමින් සිදු වන පුද්ගල හා සමාජ ගැටලු 10 ක් ලියන්න.
03. "ඉවසීමෙන් සැනසීම ලැබේ" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

**භාවිතයට**

අමිත ගුණ නුවණ යුතු උතුමෝ පබඳ
අනත වෙහෙස ලදුවත් නොම වෙති දුහද
දිගත පතළ සුවඳැති සොඳ සඳුන් කඳ
සිඳින මඩින එක ලෙස පැතිරෙයි සුවඳ
(සුභාෂිතය)

09
පාඩම

# සේඛියා - I

## සේඛියා දහමින් හුරු පුරුදු වෙමු සුසිරිත් - 01

ඒ අධිරජ ධර්මාශෝක ය. කුරිරු යුද්ධය නිසා හේ චණ්ඩාශෝක නම් විය. සිදු වූ මහා යුද අපරාධවලින් සිත වාවාගත නොහැකිව හේ සී මැදුරු කවළුවෙන් බලාගත් වන ම සිටී. එක් වරම ඔහු නෙත ගැටුනේ සත් හැවිරිදි දරුවෙකි. කුඩා පැවිදි රුවකි. උන්වහන්සේ වඩාත් දුර ද ළඟ ද නොබලති. වටපිට ද නොබලති. වියදඬු පමණ යොමාගත් නෙත් ඇතිව සන්සුන්ව පියමන් කරති. දුටුවන්ගේ නෙත් සිත් පැහැර ගන්නේ ය. ප්‍රසන්න ය. ඒ නිග්‍රෝධ නම් සාමණේරයන් වහන්සේ ය. උන්වහන්සේගේ මේ ඉරියව් චණ්ඩාශෝකගේ සිත පැහැර ගත්තේ ය. උන්වහන්සේ රජමැදුරට කැඳවන ලදී. සුදුසු අසුනක හිඳිනා ලෙස ඇරයුම් ලැබ සිහසුනේ වැඩ හුන්හ. දහමක් දෙසන ලෙස අයදුමෙන් **"අප්පමාදො අමතපදං"**..... ආදී දහම් දේශනාව වදාළහ. චණ්ඩාශෝක ධර්මාශෝක විය. **"යො හවෙ දහරො භික්ඛු"**..... කුඩා භික්ෂු නමක් වුව ද සසුනෙහි සංවරව විනීතව සසුන් කිසෙහි මැනවින් යෙදෙත් නම් උන්වහන්සේ වළාකුලෙන් මිදුන සඳ සේ මෙලොව බබලවන්නේ ය. එදා ඒ කුඩා සාමණේරයන් වහන්සේ කළ මෙහෙවර නොවන්නට අද ලක්දිව පමණක් නොව මුළු ලොව ම බුදුදහම නොතිබෙන්නට ඉඩ තිබුණි. සන්සුන් හිමිනමකට පෑ හැකි ප්‍රාතිහාර්ය කෙතරම් ද? සේඛියා යනු ඒ කුඩා සාමණේර නමකගේ හික්මීමේ පිළිවෙතයි.

විනය යනු හික්මීම හෙවත් සංවරකමයි. හීලෑකමයි. හැදිච්චකමයි. සීලය යනු ද විනයමයි. එයින් කය වචනය සංවර වෙයි. කෙලෙස් ධර්මයන් යටපත් වී සිත ද හික්මෙයි. එනිසා නිවන් මගට ද අනිවාර්යයෙන් උපකාර වන ධර්මයකි. එමනිසා සංවරය ගිහි පැවිදි හැමදෙනාට ම අත්‍යවශ්‍ය වූවෙකි. බුදුරජාණන් වහන්සේ විසින් ශික්ෂා පද පනවන ලද්දේ, මේ සියලු කරුණු හේතු කොට ගෙන ය. ඕනෑම සමාජයක යහ පැවැත්ම සඳහා විනය නීති (ව්‍යවස්ථා) මාලාවක් තිබිය යුතු වෙයි. ඒ ඒ සමාජයට ආවේණික වූ විනය නීති මාලාවක් වෙන් වෙන්ව ඇත. එම විනය නීතිවලට අනුව කටයුතු කරන තාක් කල් එම සමාජය පිරිහීමට පත් නොවෙයි. බුදුරජාණන් වහන්සේ විසින් සංඝ සමාජය සඳහා ද විනය නීතිමාලාවක් පනවන ලදී. ඒවා පාරාජිකා පාලි, පාචිත්තිය පාලි, පරිවාර පාලි, චුල්ලවග්ග පාලි සහ මහ වග්ග පාලි යන විනය ග්‍රන්ථවල ඇතුළත් වෙයි. භික්ෂූන් වහන්සේලා හැමවිට ම එම විනය නීති මාලාවට ගරු කළ යුතු බව උන්වහන්සේ දේශනා කළහ. භික්ෂූන් වහන්සේ හැමවිටම විනයානුකූලව කටයුතු කරත් නම් විනය නීති උල්ලංඝණය නොකරත් නම් ඒ තාක් කල් භික්ෂූන් වහන්සේත් භික්ෂු සමාජයත් පරිහාණියට පත් නොවේ.

**"අප්පසන්නානං වා පසාදාය පසන්නානංවා භීයොභාවාය"**

යන බුදු වදනට අනුව අප නො පැහැදුණු අයගේ පැහැදීම පිණිස ද පැහැදුණු අයගේ වඩාත් පැහැදීම පිණිස ද ක්‍රියා කළ යුතු ය. අප අහර වළඳන අඳින-පොරවන ගමන්-බිමන් කරන යන එන හැමවිටකම හැමතැනකම ආචාර සම්පන්න වීම අවශ්‍ය ය. සේඛියා යනු එසේ එදිනෙදා ප්‍රායෝගික ජීවිතයේ දී ලොකු කුඩා සැම භික්ෂුවක් විසින් ම අනුගමනය කළයුතු ආචාරධර්ම පද්ධතියයි. ඒවා ගණනින් පන් සැත්තෑව (75) කි. මෙම ආචාර ධර්ම ඕනෑම ශිෂ්ට සමාජයක තිබිය යුතු වැදගත් පිළිවෙත් ය. මේවායින් හික්මුණු පුද්ගලයා රජ සබයට වුව ද සුදුසු ය. සමාජයේ උසස් යැයි සම්මත ඇතැම් අය පවා මේ ආචාර ධර්ම නොසලකා හැරීම නිසා සමාජ පිළිකුලට පාත්‍රවනු අප දැක තිබේ. එසේ ම එවැනි ශක්තියක් බලයක් නොමැති වුව ද මේ ආචාර ධර්ම ආරක්ෂා කරන ඇතැම් පුද්ගලයින් සමාජයේ ප්‍රශංසාවට ලක්වන අයුරු ද අප නෙත ගැටී තිබේ.

### සේඛියා පැනවීමට මුල් වූවන් (හේතු)

බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ මේ ආචාර ධර්ම ගරු නොකළ ඇතැම් පෘථග්ජන භික්ෂූන් වහන්සේලා වාසය කොට තිබේ. ඒ අතරින් අස්සජි, පුනබ්බසුක, පණ්ඩුක, ලෝහිතක, මෙත්තිය සහ භුම්මජක නමින් හැඳින්වෙන ඡබ්බග්ගිය (හයේ කණ්ඩායම) භික්ෂූන් ප්‍රධාන වෙති. මේ සේඛියා සිකපදවලින් බොහෝමයක් පනවන ලද්දේ උන්වහන්සේලාගේ විෂමාචාරයන් නිසා ය. ඔවුන්ගේ විෂමාචාර අසංවර චර්යා සේඛියා හැත්තෑ තුනකට ම නිදානය වී තිබේ. කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ දී භික්ෂූන් වහන්සේලා සුරු සුරු හඬ නගමින් අහර වැළඳීම නිසා පනස් එක් වැනි සේඛියාව (න සුරු සුරු කාරකං.....) පනවනු ලැබී ය. පනස් පස් වැනි සේඛියාව වූ ඉඳුල් අතින් පැන් තලිය නොගත යුතු ය යන ශික්ෂාව (න සාමිසෙන හත්‍ථෙන....) පනවන ලද්දේ භග්ග ජනපදයේ සුංසුමාර ගිරියෙහි භේසකලා වනයෙහි දී භික්ෂූන් වහන්සේලා ඉඳුල් අතින් පැන් භාජනය ගැනීම නිසා ය. මේ අනුව අනෙකුත් විනය නීති සේම සේඛියා ද පනවනු ලැබුවේ හේතුවක් පදනම් කරගෙන ම ය.

### සේඛියා වර්ගීකරණය

ප්‍රාතිමෝක්ෂයෙහි සේඛියා හැත්තෑ පහ කොටස් හතකට බෙදා දක්වා ඇත. හැඳීම් පෙරවීම් ගමෙහි හැසිරීම් ආදී විවිධ තේමා අනුව මෙම බෙදා දැක්වීම සිදු වී ඇත. එය පෙළ පාඩම් කර ගැනීම සඳහා ද පහසුවකි. ඒ මෙසේ ය.

| | |
|---|---|
| 1. **පරිමණ්ඩල වග්ග** | 10 |
| 2. **උජ්ජග්ඝික වග්ග** | 10 |
| 3. **ඛම්භකත වග්ග** | 10 |
| 4. **සක්කච්ච වග්ග** | 10 |
| 5. **කබල වග්ග** | 10 |
| 6. **සුරු සුරු වග්ග** | 10 |
| 7. **පාදුකා වග්ග** | 15 |

යනුවෙනි. මෙහි දී අප සාකච්ඡා කරනුයේ දෙවැනි ශ්‍රේණියේ දී සාකච්ඡා නොකළ කොටස් ය.

## උජ්ජග්ඝික වග්ගය - 10

### (ගමෙහි හැසිරීම හා වැඩහිඳීම)

මිනිසා යනු සමාජ සත්ත්වයෙකි. ඔහු නිරන්තරයෙන් චර්යාවන් ප්‍රදර්ශනය කරන අවස්ථා දෙකකි. එනම්, කය සහ වචනය යි. කායික වාචසික සංවරය සීලාචාරකම යි. ඒවායෙහි අසංවර බව අසීලාචාරකම යි. සීලාචාරකමට සමාජයේ වැදගත්කමක් ඇති අතර අසීලාචාරකමට ඇත්තේ, පිළිකුලකි. එමනිසා ගිහි-පැවිදි භේදයකින් තොරව සීලාචාරකමෙහි වැදගත්කම ඉස්මතු වන්නේ ය. දෙවන ''උජ්ජග්ඝික වග්ගයේ'' දී අපේක්ෂා කරන්නේ ගමෙහි හැසිරෙන භික්ෂුව විසින් ප්‍රදර්ශනය කළයුතු සීලාචාරකමයි.

''**උජ්ජග්ඝික**'' වග්ගයෙහි භික්ෂූන් වහන්සේ නමක් ගමෙහි හැසිරීම හා වැඩහිඳීම පිළිබඳ ව ශික්ෂා පද දහයක් ඇතුළත් වේ. ''**උජ්ජග්ඝික**'' යනු මහ හඬින් සිනාසීමයි. මහ හඬින් සිනා ඇතිව ඇතුලු ගමෙහි හෝ නගරයෙහි වැඩමවීම හෝ වැඩහිඳීම නො කළ යුතු ය. විශේෂයෙන් සිනහ මුසු මුවින් සිටීම භික්ෂුවකගේ අනන්‍යතාවකි. අනතිමානී බවෙහි සංකේතයකි. එහෙත් එය අනෙකාගේ ප්‍රසාදය දැනවෙන ආකාරයෙන් සිදු විය යුතු ය. තවෙකකු අපහාසයට හෝ උපහාසයට ලක්වන ආකාරයෙන් සිදු නොවිය යුතු ය. තවද අනෙකාගේ අප්‍රසාදයට හේතු නො විය යුතුවේ. ''**කොමාරකමිදං භික්ඛවෙ අරියස්ස විනයෙ යදිදං අතිවෙලං දන්තවිදංසකං හසිතං**'' යනුවෙන් බොහෝ වේලා දත් විදහා සිනහාසීම බොළඳ ක්‍රියාවකැයි, දේශනා කොට තිබේ. එසේ ම ''**අලං වො ධම්මපපමොදිතානං සිතං සිතමත්තං**'' යනුවෙන් භික්ෂුවකට දත් නොපෙනෙන සේ කරන මදසිනහව සුදුසු යැයි දක්වා තිබේ. උස් හඬින් සිනාසෙමින් මහජනයා අතර හැසිරීම භික්ෂුවකට කිසිසේත් ම නොගැලපෙයි.

මීළඟට ගමෙහි මහජනයා අතර හැසිරීමේ දී සැළකිලිමත් වියයුතු හැසිරීම් හතරක් මෙම වග්ගයේ දී දැක්වේ. ''අප්පසද්දො'' යන්නෙන් භික්ෂුවක් ගමෙහි හැසිරෙන විට දී කතාබහ කරන විට හැකිතරම් මද හඬින් කතා කළයුතු බව කියවෙයි. මෙයින් ධර්ම දේශනා හෝ පිරිත් දේශනා අදහස් නොකෙරේ. සාමාන්‍යයෙන් මිනිසුන්ගේ ගමනබිමනේ දීත් ඉඳගෙන සිටින විට ද කතාබස් කරන විට ද අතපය විසිකිරීම් පැද්දීම් සෙළවීම් නිතර දක්නට ලැබේ. එබඳු යම්යම් අවිනීත හැසිරීම් බොහෝ අයට ඇබ්බැහි වී තිබෙනු පෙනේ. එය අනෙකාගේ උපහාසයට හෝ හාස්‍යයට ලක්වන බව ඇතැම් විට ඔවුන්ට දැනෙන්නේ නැත. ''කායප්පචාලකං'' යනු කය ඒ මේ අත සොළවමින් යමක් කිරීම හෝ හිඳගෙන සිටීමයි. ''බාහුප්පචාලකං'' යනු දෑත එහෙ මෙහෙ අත සොළවමින් ගමන් කිරීම හිඳීම හෝ දම් දෙසන විට අනවශ්‍ය පරිදි දෑත් සෙළවීම නොකළ යුතු බවයි. එයින් යම් යම් කරුණු පැහැදිලි කිරීම සඳහා යොමු කරන හස්ත මුද්‍රා අදහස් නොකෙරේ. ''සීසප්පචාලකං'' යනු හිස එහේ මෙහේ සෙළවීමයි.

කුඩා කල සිට ම භික්ෂුවක් මේ සේඛියාවලට පුහුණු කරවන්නේ එබඳු ඇබ්බැහිවීම් ඇති නොවන්නට ය. භික්ෂූන් වහන්සේ නමක් ළඟ අනුන්ගේ උපහාසයට ලක්වන එබඳු හැසිරීම් කිසිවක් නොතිබිය යුතු ය. භික්ෂුවක් කාගේත් ප්‍රසාදයට ලක්වන කෙනෙක් වන්නේ මේ හැසිරීම්වලින් තොර වූ විටයි.

උජ්ජග්ඝික වග්ගය - පෙළ සහ තේරුම

01. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගමිස්සාමී'ති සික්ඛා කරණීයා.
හඬ නගා සිනාසෙමින් ඇතුළු ගමෙහි නොයන්නෙමි'යි හික්මිය යුතු ය.

02. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදිස්සාමී'ති සික්ඛා කරණීයා.
හඬ නගා සිනාසෙමින් ඇතුළු ගමෙහි නොහිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

03. අප්පසද්දො අන්තරඝරෙ ගමිස්සාමී'ති සික්ඛා කරණීයා.
වැඩි ශබ්දයකින් තොරව ඇතුළු ගමෙහි යන්නෙමි'යි හික්මිය යුතු ය.

04. අප්පසද්දො අන්තරඝරෙ නිසීදිස්සාමී'ති සික්ඛා කරණීයා.
වැඩි ශබ්දයකින් තොරව ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

05. න කායප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමී'ති සික්ඛා කරණීයා.
ඇඟපත සොලවමින් ඇතුළු ගමෙහි නො යන්නෙමි'යි හික්මිය යුතු ය.

06. න කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති' සික්ඛා කරණීයා.
ඇඟපත සොලවමින් ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

07. න බාහුප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමී'ති සික්ඛා කරණීයා.
අත් සොළවමින් ඇතුළු ගමෙහි නො යන්නෙමි'යි හික්මිය යුතු ය.

08. න බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමී'ති සික්ඛා කරණීයා.
අත් සොළවමින් ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

09. න සීසප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමී'ති සික්ඛා කරණීයා.
හිස වනමින් ඇතුළු ගමෙහි නො යන්නෙමි'යි හික්මිය යුතු ය.

10. කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමී'ති සික්ඛා කරණීයා.
හිස වනමින් ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

**අභ්‍යාස**

01. විනය යන්නෙහි වචනාර්ථය පැහැදිලි කරන්න.
02. ''සේඛියාවන්හි මා දකින වැදගත්කම'' යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.
03. සේඛියා අර්ථ සහිතව වනපොත් කරන්න.

''මේ ශාසනය කෛරාටිකයන්ගේ වත් දුෂ්ටයන්ගේ වත් නොව
මහා කාරුණික බුදුරජාණන් වහන්සේගේ ය. එහෙයින්
උන්වහන්සේ වෙනුවෙන් ජීවත් වෙනු.
සිවුරු හරින්නට එපා.........

- හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි -

සන්තින්ද්‍රියා සන්තමානසා
සන්තං තෙසං ගතං ඨිතං
ඔක්ඛිත්ත චක්ඛු මිතභාණී
තාදිසා සමණා මම

ඉන්ද්‍රිය සංවරය. මනස සන්සුන්ය.යන එන සිටින විට බිමට හරවාගත් ඇස් වෙති. පමණට කතා කරති. මාගේ ශ්‍රමණයන් වහන්සේලා එබඳුය.

කායකම්මං සුචී තෙසං
වාචාකම්මං අනාවිලං
මනො කම්මං සුවිසුද්ධං
තාදිසා සමණා මම

මාගේ ශ්‍රමණයන් වහන්සේලා කයෙන් පිරිසිදුය. වචනයෙන් පිරිසිදුය. නොකැළැල් ය. මනස පිරිසිදුය. මාගේ ශ්‍රමණයන් වහන්සේලා එබඳුය.

- ධම්මපදට්ඨ කථා - චූළ සුභද්දා වත්ථු-

10 පාඩම

# සේඛියා - II

## සේඛියා දහමින් හුරු පුරුදු වෙමු සුසිරිත් - 2

**ඛමහකත වගගය**
**(ගමෙහි හැසිරීම හා පිණ්ඩපාතය පිළිගැනීම)**

''**ඛමභකත**'' යනු ඉණෙහි දැත් තබාගෙන වැඹක් සේ කෙලින් හිඳීම හෝ සිටීමයි. ඕගුණ්ඨිතෝ හිසෙහි සිට පෙරවාගෙන හිඳීම හෝ සිටීමයි. මෙය ගිලන් අවස්ථාවක නම් වරදක් නොවේ. ''**උකකුටිකාය**'' යනු උක්කුටිකයෙන් හෙවත් ඇණ තියාගෙන හිඳීමයි. මෙය ද ඇවත් දෙසීම් ආදී සංඝ කර්ම අවස්ථා ආදියේ දී හා වන්දනාමානාදියේ දී වරදක් නොවේ. මෙහි වරදක් සේ දක්වා ඇත්තේ නිකරුණේ තැන් තැන්වල එසේ හිඳීමයි.

''**පලලතථිකාය**'' යනු බූරු ඇඳ වැනි ආසනයකට කියන නමකි. ඒ ආකාරයෙන් දණිස් උඩට එසවෙන පරිදි හා දෙපා එකට ගැටෙන පරිදි හිඳින අශෝභන ඉරියව්ව මෙහි පල්ලත්ථිකා නමින් ගැනේ. සාමාන්‍යයෙන් භික්ෂූන් වහන්සේ නමක් බද්ධ පර්යංකයෙන් හිඳින විට දෙපා එකට බැඳ හෝ එකක් මත එකක් තිබෙන සේ තබා දණහිස් බිම ගැටෙන තරමට පහත් වී සිටීමට පුරුදු වී සිටිය යුතු යි. එය නුපුරුදු ගිහි-පැවිදි බොහෝ දෙනා ඉඳගන්නේ යට කී පරිදි පල්ලත්ථිකාවෙනි. පල්ලත්ථිකා වර්ග දෙකකි.

**01. හතථපලලතථිකා හෙවත් දෑතින් දණහිස් බැඳගෙන හිඳ ගැනීමයි.**
**02. දුසසපලලතථිකා හෙවත් සිවුරෙන් හෝ ඇඳිවතින් දණහිස් පටලවා මුහුණතෙක් ඔසවාගෙන හිඳ ගැනීමයි.**

මෙය විශේෂයෙන් භික්ෂූන් වහන්සේලාට ඉතා අශෝභන නොහික්මුණු ආසනයකි.

## පිණ්ඩපාතය පිළිගැනීම පිළිබඳ ශික්ෂා පද

පිණ්ඩපාතය පිළිගැනීම පිළිබඳ ශික්ෂා පද හතරක් ද මෙම වර්ගයට ඇතුළත් වේ. '**සකකචචං**' යනු සිහි නුවණින් පිළිවෙළකට ප්‍රමාණයකට පිළිගන්නේ යන අදහසයි. සාමාන්‍යයෙන් සැදැහැතියෝ පෙරැත්ත කරමින් දන් බෙදති. එහෙත් ඒ බෙදන තරමට ඉවත දැමීමට තරම් නොපිළිගත යුතු ය. තමා වළඳන පමණ දැන පිළිගත යුතුයි. එසේ ම සකස්ව සංවරව හිඳගත යුතු බව ද මෙහි කිය වේ.

'**පතතසඤ්ඤී**' යනු පාත්‍රය වෙත ම අවධානය යොමු කරගෙන දන් පිළිගත යුතු බවයි. දන් පිළිගන්නා විට බෙදන්නා දෙස හෝ වටපිට නොබලා පාත්‍රය වෙත ඇස මෙන් ම හිත ද යොමු කරගෙගන පිළිගත යුතු ය. ඒ අවස්ථාවේ කිසිවෙකු සමග කතාබහ නොකළ යුතු ය. '**සමසූපකං**' යනාදියෙන් කියවෙන්නේ බතට සෑහෙන පමණට ව්‍යඤ්ජන පිළිගත

යුතු බවයි. මෙයින් නිකරුණේ අහර පිළිගෙන ඉවත දැමීමත් යම් යම් ආහාර කෑදරකමට පිළිගැනීමටත් පනවන ලද සික පදයකි. එසේ කිරීම සැදැහැතියන්ගේ කළකිරීමට ද හේතු වන්නේ ය. '**සමතිත්තිකං**' මෙය තමාගේ වැළඳීම සඳහා පිළිගන්නා ආහාර නොව පොදුවේ පිණ්ඩපාත චාරිකාවේ දී පිළිපැදිය යුතු ශික්ෂා පදයකි. පිණ්ඩපාතය යෑමේ දී සමහර විට පාත්‍රය පිරෙන්නට ආහාර ලැබේ. එහෙත් කිසි විටෙකත් පාත්‍රයේ ගැට්ටෙන් පිටතට කොතක් මෙන් මතුවන තරමට ආහාර නොපිළිගත යුතු ය. නිතරම පාත්‍ර ගැටියෙන් පහළට සිටින තරමින් සෑහීමකට පත් විය යුතු ය.

**ඛම්භකත වග්ගය - පෙළ සහ තේරුම**

**01. න ඛම්භකතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.**
ඉනෙහි අත් ගසාගෙන ඇතුළු ගමෙහි නො යන්නෙමි'යි හික්මිය යුතු ය.

**02. න ඛම්භකතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.**
ඉනෙහි අත් ගසාගෙන ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

**03. න ඔගුණ්ඨිතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.**
හිසේ සිට පොරවාගෙන ඇතුළු ගමෙහි නො යන්නෙමි'යි හික්මිය යුතු ය.

**04. න ඔගුණ්ඨිතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.**
හිසේ සිට පොරවාගෙන ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

**05. න උක්කුටිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.**
පා ඇඟිලිවලින් ඇතුළු ගමෙහි නො යමි'යි හික්මිය යුතු ය.

**06. න පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.**
පා ඇඟිලිවලින් ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

**07. සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.**
හොඳ සිහි කල්පනාවෙන් අහර පිළිගනිමි'යි හික්මිය යුතු ය.

**08. පත්තසඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.**
පාත්‍රය වෙත යොමු කළ සිතින් අහර පිළිගන්නෙමි'යි හික්මිය යුතු ය.

**09. සමසූපකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.**
බතට සෑහෙන තරමට පමණක් ව්‍යඤ්ජන සහිතව අහර පිළිගන්නෙමි'යි හික්මිය යුතු ය.

**10. සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.**
පාත්‍රා ගැටියෙන් පහතට සිටින පමණට අහර පිළිගන්නෙමි'යි හික්මිය යුතු ය

### අභ්‍යාස

01. ''පිරිසිදුකමෙහි ඇති වැදගත්කම'' යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.
02. ගමෙහි හැසිරීමේ දී බැහැර කළයුතු අශෝභන චර්යා පහක් නම් කරන්න.
03. සේඛියා අර්ථ සහිතව වනපොත් කරන්න.

පුහුණුවට

මුසාවන් නොපවසන
කිසිවකුට නොබණින
අර්ථය ධර්මය දැන
මිහිරිව දම් දෙසන

(භික්ඛු වගය - 03 ගාථා)

''පුද්ගලයෙකු ශ්‍රේෂ්ඨත්වය තැකෙන්නේ ඔහුගේ ක්‍රියා අනුව ය.
වැඩ නොකර නිකම් සිටීමෙන් මනුෂ්‍යයෙක් ශ්‍රේෂ්ඨත්වයට නො නගී.
වැඩ ද ලෝකයාට හිත සාදක නොවුවොත් මනුෂ්‍යයෙකුගේ තත්ත්වය
උසස් කිරීමෙහි හේතු නොවේ''

- වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමි -

11 පාඩම

# සේඛියා - III

## සේඛියා දහමින් හුරු පුරුදු වෙමු සුසිරිත් - 3

### සුරු සුරු වර්ගය

සුරු සුරු වර්ගයේ දී පළමුවන ශික්ෂාපද හයේ සඳහන් වන්නේ දානය වැළඳීම පිළිබඳ ව යි. ඒවා ඔබ දෙවැනි පන්තියේ දී හදාරා ඇත. ඉතිරි ශික්ෂා පද හතර මෙහි දැක් වේ. ඒ ධර්ම දේශනා කිරීම සම්බන්ධව ය.

### දහම් දෙසීම පිළිබඳ ශික්ෂා පද

දහම් දෙසීමේ දී දේශකයන් වහන්සේ මෙන් ම ශ්‍රාවක ගිහියන් ද දැනගතයුතු කාරණා රාශියක් මෙහි ශික්ෂා පද දහයකින් දක්වා තිබේ. ධර්ම දේශනා කිරීමේ දී ශ්‍රාවකයා ශාස්තෘවරයාට, ධර්මයට, දේශකයාට, ගරු සරු නොකරයි ද දහම් නොදෙසිය යුතු ය. එසේ ම අවිආයුධ වැනි දෑ ගෙන සිටින අයට දහම් දෙසන්නට යෑම අවදානම් සහගත ය. මේ ශික්ෂා පදවලින් දැක්වෙන්නේ දේශකයන් මෙන් ම ශ්‍රාවකයන් ඒ පිළිබඳ ව දැනුවත් විය යුතු බව යි.

### සුරු සුරු වගගය - පෙළ සහ තේරුම

07. **න ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා**
කුඩයක් අතින් ගෙන සිටින නොගිලන් තැනැත්තාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

08. **න දණ්ඩපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා**
දණ්ඩක් අතින් ගෙන සිටින නොගිලන් තැනැත්තාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

09. **න සත්ථපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා**
කඩුවක් අතින් ගෙන සිටින නොගිලන් තැනැත්තාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

10. **න ආවුධපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා**
ආයුධ අතින් ගෙන සිටින නොගිලන් තැනැත්තාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**පාදුකා වග්ගය**
**(ධර්මදේශනා ප්‍රතිසංයුක්ත හා මළමුත්‍රා කිරීම පිළිබඳ)**

සත්වැනි වර්ගය පාදුකා වර්ගය යි. 'පාදුකා' යනු පාවහන් ය. සම්වලින් හෝ ලීවලින් පාදුකා සාදනු ලැබේ. මෙහි සේඛියා දොළසක් ම ධර්මදේශනා ප්‍රතිසංයුක්ත සේඛියාවෝ ය. ලෙඩෙක් නොවන්නා වූ මිරිවැඩි පයලා සිටින්නකුට, රියක නැගී සිටින්නකුට, බිම වුව ද වැතිර සිටින්නාට (පල්ලත්ථිකායෙන) සිටින්නකුට, කේශාන්තය නොපෙනන සේ ජටා බැඳ සිටින්නකුහට ද යනාදී වශයෙන් නොගැලපෙන චර්යාවන් ප්‍රදර්ශනය කරන්නවුන්ට දහම් නොදෙසිය යුතු ය. ඉහත සඳහන් පුද්ගලයන් ගිලන් පුද්ගලයන් නම් එම ඉරියව්වෙන් සිටිද්දී ධර්ම දේශනා කිරීමේ වරදක් නැත. සදාචාරාත්මක බව, ධර්ම ගෞරවය, අවධානය ආදී කරුණු මෙහි දී සලකා ඇති බව පෙනේ.

තණබිම හා ජලය උසස්ම පාරිසරික සම්පත් දෙකකි. තණකොළ පසේ ආරක්ෂාව සපයයි. පරිසරය අලංකාර කරයි. පිරිසිදු වාතාශ්‍රය සපයයි. සතුන්ට ආහාරයක් වෙයි. මිනිසුන්ට හිඳ ගැනීමට, විවේක ගැනීමට ආසනයක් සේ ද භාවිත වේ. එහි මළ මුත්‍රා හෝ කෙළ ගැසීමෙන් ඒවා අපවිත්‍ර වෙයි. දුගඳ වෙයි. මේ නිසා එහි මළ මුත්‍රා කිරීම කෙළ ගැසීම නොකළ යුතු ය. බුදුරජාණන් වහන්සේ තණ බිමක ඉඳුල් බත් නොතබන ලෙස කසීභාරද්වාජ සූත්‍රයේ දක්වා තිබේ. ජලය, බීමට, නෑමට සහ තවත් කොතරම් දේට ප්‍රයෝජනවත් වේ ද යන්න අමුතුවෙන් කිව යුතු නැත. එහි මළමුත්‍රා කිරීම කෙළ ගැසීම කිසිසේත් නොකළ යුතු ය. එසේ කිරීම මිත්‍රද්‍රෝහී ක්‍රියාවක් වන්නේ ය.

**පාදුකා වග්ගය - පෙළ සහ තේරුම**

**01. න පාදුකාරුළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
මිරිවැඩි පය ලා සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**02. න උපාහනාරුළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
පාවහන් පය ලා සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**03. න යානගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
රියක නැගී සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**04. න සයනගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
වැතිරී සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**05. න පල්ලත්ථිකාය නිසින්නස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
දණහිස් පල්ලත්ථිකාවෙන් බැඳ හිඳින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**06. න වේඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
ජටාවෙන් හිස වෙලාගෙන සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**07. න ඔගුණ්ඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
හිස වසා පොරවා සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**08. න ඡමායං නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
තමා බිම ඉඳගෙන අසුනක හිඳින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**09. න නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
තමා පහත් අසුනක හිඳ උස් අසුනක හිඳින සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**10. න ඨිතො නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
තමා සිටගෙන සිටිමින් හිඳගෙන ඉන්නා නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**11. න පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
පිටුපසින් යමින් තමාට ඉදිරියෙන් යන නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**12. න උප්පථෙන ගච්ඡන්තො පථෙන ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා**
තමා මගට පිටින් යමින් මග යන නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**13. න ඨිතො අගිලානො උච්චාරං වා පස්සාවං වා කරිස්සාමීති සික්ඛා කරණීයා**
නොගිලන් තැනැත්තා විසින් ජලයෙහි මළ මුත්‍ර කිරීම හා කෙළ ගැසීම නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

**14. න හරිතෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙලං වා කරිස්සාමීති සික්ඛා කරණීයා**
නොගිලන් තැනැත්තා විසින් සිටගෙන මළ මුත්‍ර හා කෙළ ගැසීම නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

**15. න උදකෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙලං වා කරිස්සාමීති සික්ඛා කරණීයා**
නොගිලන් තැනැත්තා විසින් තණකොළ ආදිය ඇති බිම මළ මුත්‍ර හා කෙළ ගැසීම නො කරමියි හික්මිය යුතු ය. නොගිලන් තැනැත්තා විසින් ජලයෙහි මළ මුත්‍ර කිරීම හා කෙළ ගැසීම නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

### අභ්‍යාස

01. භික්ෂු සංස්ථාවෙහි පැවැත්මෙහි ලා සේඛියාවන්හි වැදගත්කම අගයන්න.
02. ධර්ම දේශනාවක දී අනුගමනය කළයුතු සිරිත්-විරිත් පෙන්වා දෙන්න.
03. සේඛියා අර්ථ සහිතව වනපොත් කරන්න.

**පුහුණුවට**

**සමත විදසුන් ධර්මයෙහි වෙසුනේ**
**නොනැවතී ඉන් මතු ද සිහි කෙරුනේ**
**දහම් බෝපැකි සිත් පුරා පිරුනේ**
**ඒ මහණ තෙම නොමැත පිරිහුනේ**

**(භික්ඛු වග්ගය-05 ගාථා)**

12
පාඩම

# පින්පල ලබන මළවුන්ගේ ලෝකය

**(තිරොකුඩ්ඩ සූත්‍රය)**

මෙයින් කල්ප අනූ දෙකකට පෙර ඵුස්ස බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූහ. උන්වහන්සේගේ පියා වූයේ කසී නම් නුවර රජකළ ජයසේන රජුය. සිරිමා දේවිය මව වූවා ය. ජයසේන රජු ද "මගේ පුතණුවෝ අබිනික්මන් කොට බුදුවූ හ. එහෙයින් බුදුන් මගේ ම ය, ධර්මය ද මගේ ම ය, සංඝයා ද මගේ ම ය" කියා තෙරුවන්ගේ උපස්ථාන සියල්ල ම තමන් ම කළේ ය. අන් කිසිකෙනෙකුට ඉඩ නොදුන්නේ ය.

ජයසේන රජුට වෙනත් බිසවකගෙන් ලැබුණු දරුවන් තිදෙනෙක් වූහ. (විශේෂයෙන් බුදු කෙනෙක් බිහි වූ මව් කුසින් වෙනත් දරුවෝ නූපදිති) මේ සොහොයුරන් තිදෙනා මෙසේ සිතූහ. "බුදුවරු ලොව පහළවන්නේ සියලු ලෝවැසියන්ගේ යහපත පිණිස ය. එක් අයෙකු සඳහා නොවේ. එහෙත් අපේ පියා රත්නත්‍රයේ උපස්ථානයට අන් කිසිකෙනෙකුට ඉඩ නොදෙයි. අපි කෙසේ නම් ඒ අවස්ථාව ලබා ගන්නෙමු ද? " මෙසේ සිතූ ඔවුන්ට ඒ සඳහා එක්තරා උපායක් කල්පනා විය. ඒ අනුව ඔවුහු ඈත පිටිසර ප්‍රදේශයක කැරැල්ලක් ඇති කළහ. ඒ කැරැල්ල ගැන සැළ වූ මහ රජු එය මැඩ පවත්වන්නට කුමාරවරුන් තිදෙනා පිටත් කර යැවීය. තමන් ම ඇති කළ කැරැල්ලක් වූ බැවින් ඔවුහු එය පහසුවෙන් ම සංසිඳුවා පෙරළා ආවෝ ය. එයින් මහත් සතුටට පත් පිය රජතුමා තමන් කැමැති වරයක් ඉල්ලන්නැයි පුතුන්ට කීය. ඔවුහු එසැණින් බුද්ධෝපස්ථානය සඳහා අවසර ඉල්ලා සිටියෝ ය. එය නම් කළ නොහැකි බවත් වෙනත් වරයක් ඉල්ලන ලෙසත් පිය රජතුමා කීය. එය හැර වෙන කිසිවක් තමාහට අවශ්‍ය නැතැයි කුමාරවරු එක හෙළා ම කියා සිටියෝ ය. රජතුමා එසේ නම් ටික කලකට පමණක් ගන්නැයි කීය. ඔවුහු සත් අවුරුද්දකට අවසර ඉල්ලූහ. රජතුමා ඊට කිසිසේත් කැමැති නොවීය. අනතුරුව ඔවුහු අවුරුද්දෙන් අවුරුද්ද කාලය අඩු කරමින් ගොස් එක් අවුරුද්දකට අවසර ඉල්ලූහ. එයට ද අකමැති වූ පියරජු මාස ගණනින් අඩු කරමින් ගොස් අන්තිමේ දී කුමාරවරුන්ට බුද්ධෝපස්ථානය සඳහා තුන් මාසයකට අවසර දුන්නේ ය.

ඉමහත් ප්‍රීතියෙන් ඉපිළීගිය කුමාරවරු වහා බුදුරජාණන් වහන්සේ බැහැ දැක තුන් මාසයකට වස් විසීමට ආරාධනා කර සිටියෝ ය. බුදුරජාණන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් එය ඉවසා වදාළහ. අනතුරුව කුමාරවරු බුද්ධප්‍රමුඛ සංඝයාට තුන් මාසයක් වැඩ වසන්නට විහාර ආරාම දානමාන ආදී සියලු පහසුකම් සපයා තබන්නැයි ඔවුන් පාළනය කළ ජනපදයේ අධිපතිවරයාට පණිවිඩයක් යැවූ හ. ඒ ජනපදාධිපතිවරයා ද ඒ සියලු කටයුතු වහ වහා සම්පාදනය කොට නිමවා කුමාරවරුන්ට දන්වා එවීය.

බුද්ධ ප්‍රමුඛ සංඝයාට වතාවත් කරන්නට තවත් පුරුෂයන් දහසක් කැඳවාගත් කුමාරවරු තිදෙන තමනුත් කහවත් හැඳ පොරවා ගත්හ. මහසඟන පිරිවරාගත් බුදුරජාණන් වහන්සේට සියලු සත්කාර කරමින් මහපෙරහැරින් තමන්ගේ ජනපදයට වැඩමවාගෙන ගියහ. විහාරාරාම පිළිගන්වා එහි වස් වැසවූහ. ජනපදාධිපතිවරයා ද එකොළොස් දහසක් වූ ජනපද වැසියන් ද සහභාගී කරගෙන තුන් මසක් පුරා මහදන් වැටක් පවත්වා ගෙන ගියේ ය.

මේ අතර මෙම පින්දහම් කටයුතුවලට එරෙහි වූ පිරිසක් ද එම ජනපදයෙහි සිටියහ. ඔවුහු දෙන දන් වැළැක්වූහ. දානෝපකරණ පැහැරගෙන තම තමන් කෑහ. දන්හල්වලට ගිනි තැබූහ. එහෙත් මේ සියලු කරදර මැද රජ කුමාරවරුත් ජනපදාධිපතිවරයාත් සෙසු ජනපද වැසියෝත් බුද්ධ ප්‍රමුඛ සංඝයාගේ සියලු ඇප උපස්ථාන කටයුතු නොපිරිහෙළා ඉටු කරගෙන ගියෝ ය. වස් පවාරණයෙන් පසුව කුමාරවරු බුදුරදුන් පෙරටුකරගෙන මහ පෙරහැරින් නුවරට පැමිණ බුදුරදුන් පියරජුට ම භාර කළහ.

කාලයාගේ ඇවෑමෙන් ඵුස්ස බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පෑහ. රජතුමාත් රාජපුත්‍රයන් තිදෙනාත් ජනපදාධිපතිවරයාත් බුද්ධෝපස්ථානයට සහය වූ ජනපද වැසියෝත් මිය පරලොව ගොස් දෙව් ලොව උපන්හ. මෙම මහපින්කමට එරෙහි වී දන් කොල්ලකෑ දන් හල් ගිනි තැබූ පිරිස මියගොස් නිරයේ උපන්නෝ ය. මෙසේ එක් පිරිසක් ස්වර්ගයෙන් ස්වර්ගයටත් අනෙක් පිරිස නිරයෙන් නිරයටත් යමින් කල්ප අනූදෙකක් ගත කළෝ ය.

මේ මහා භද්‍රකල්පයේ කාශ්‍යප බුදුරදුන් දවස එදා කුරිරුකම් කොට අපාගත පිරිස ඒ පාප කර්මය බොහෝ සේ ගෙවී ගොස් නිරයෙන් මිදී ප්‍රේත ලෝකයේ ඉපිද සිටියෝ ය. ප්‍රේත ලෝකය යනු විශේෂ තැනකි. මෙලොව සිටින ඤාතීන් දන් පින්කම් කොට මියගිය ඤාතීන්ට අනුමෝදන් කරන විට ඔවුන් ප්‍රේතලෝකයේ ඉපිද සිටියහොත් එවෙලේ ම ඒ පින් පල ලබා ඔවුන්ට සුවපත් විය හැකි ය. ඵුස්ස බුදුරදුන්ගේ දන් කොල්ලකෑ මෙකී පිරිසට ද ප්‍රේත ලෝකයේ දී ඤාතීන් විසින් අනුමෝදන් කළ පිනෙන් දෙව් සැප වැනි සැප ලබන වෙනත් ප්‍රේතයන් දක්නට ලැබිණ. කාශ්‍යප බුදුරදුන්වෙත ගිය ඔවුහු "ස්වාමීනි අපටත් මේ අයට මෙන් පින් ලබා සැපවත් වන්නට ඉඩක් නැද්ද''යි, ඇසූහ. එවිට උන්වහන්සේ මේ බුද්ධාන්තරයේ නම් ලැබිය නොහැකි ය. මතු බුදුවන ගෞතම බුදුන් දවස බිම්බිසාර නම් ඔබේ ඤාතිවරයෙක් ඔබට පින් අනුමෝදන් කරුනු ඇත. එදාට ඔබටත් මෙසේ සැප සම්පත් ලැබෙනු ඇතැයි වදාළහ. කල්ප අනූදෙකක් අපා දුක් වින්ද ඔවුහු එය ඇසූ කෙණෙහි හෙට සැප ලැබෙනවායි කීවා තරම් ප්‍රීතියෙන් පිනා ගියෝ ය.

මෙසේ බුද්ධාන්තරයක් ගත විය. අපේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. රාජ පුත්‍රයෝ තිදෙන ඔවුන්ගේ පිරිවර දහස් දෙනා ද සමඟ දෙව්ලොවින් චුත වී මගධ රටේ බ්‍රාහ්මණ කුලවල උපන්හ. වැඩිවියටපත් ඔවුහු සියල්ලෝ තවුස් පැවිද්දෙන් පැවිදිව ගයා ශීර්ෂයේ උරුවෙල කස්සප, ගයා කස්සප, නදී කස්සප යන තිදෙනා ප්‍රමුඛකොට ගත් ජටිලන් බවට පත්වූහ. එදා ජනපදාධිපතිවරයා මෙකල බිම්බිසාර මහ රජු විය. සෙසු ජනපදවැසියෝ රජ පිරිවර බවට පත්වූහ.

අපේ භාග්‍යවතුන් වහන්සේ මෙලොව පහළ වී දම්සක් පැවතුම් පවත්වා උරුවෙල් දනවුවට වැඩම කළ හ. එහි දී කාශ්‍යපාදී තුන්බෑ ජටිලයන් දමනය කොට පැවිදි කළ සේක. අනතුරුව උන්වහන්සේලා ද සමග බුදුවීමට පෙර බිම්බිසාර රජුට වූ පොරොන්දුව පරිදි එතුමා වෙත වැඩම කළහ. බණ අසා සෝවාන් ඵලයට පත් රජතුමා පසුදා බුද්ධ ප්‍රමුඛ සංඝයාට දානයට ආරාධනා කළේ ය. මේ අතර බිම්බිසාර රජතුමා දන් පින්කම් කරන තෙක් බලාසිටි යට කී ප්‍රේතයෝ ද රජමැදුර අවට රැස්වී සිටියෝ ය. රජතුමා ද බුද්ධ ප්‍රමුඛ සංඝයාට දන් පිළිගන්වා නිමකළ නමුත් පින් අනුමෝදන් කිරීමක් සිදු නොකළේ ය. ඒ මොහොතේ රජතුමා කල්පනා කළේ බුදුරජාණන් වහන්සේට සහ සංඝයාට වාසය කිරීමට සුදුසු ආරාම ගැන ය. ඒ අනුව අනතුරුව වේළුවනාරාම පූජාව සිදුවිය.

එම ප්‍රේතයන් ද දැන් පින් අනුමෝදන් කරති, දැන් පින් අනුමෝදන් කරති යි සිතා සිටි නමුත් ඔවුන්ගේ බලාපොරොත්තු සුන් වී ගියේ ය. එහෙයින් ඔවුහු එදා රාත්‍රී නොයෙකුත් බිහිසුණු හඬ නගමින් නිදිගෙන සිටි රජතුමා බිය ගැන්වූහ.  බියෙන් තැතිගත් රජතුමා පසුදා උදෑසන ම බුදුරදුන් හමුවී එම පුවත සැළ කළේ ය. එවිට උන්වහන්සේ "මහරජ බිය නොවන්න, ඔබට කිසිදු අනතුරක් නැත. ඒ හඬ නැගුවේ ප්‍රේතලෝකයේ ඉපිද සිටිනා ඔබේ පෙර ඥාති පිරිසකි. බුද්ධාන්තරයක් පුරා ඔබ පින් අනුමෝදන් කරන තුරු බලා සිටි ඔවුහු බලාපොරොත්තු සුන්වීමෙන් එසේ හඬ නැගූහ"යි පැවසූහ. එවිට රජතුමා "ස්වාමීනි, නැවත ඔවුන්ට පින් අනුමෝදන් කිරීමේ ක්‍රමයක් නැද්ද''යි, ඇසූහ. එවිට "මහරජ නැවත දානයක් දී පින් අනුමෝදන් කළ හැකියැ"යි වදාළ සේක. ඒ අනුව එදින ද දානයක් පිළියෙල කොට බුද්ධ ප්‍රමුඛ සංඝයාට පිරිනමන ලදී. එදා ද පෙර කී ප්‍රේත පිරිස අවුත් රජ මැදුරේ බිත්ති අසල පවුරු අසල මං සන්ධිවල තැන තැන රැස්ව සිටියෝ ය. ඒ සියලු දෙනා බුදුරදුන්ගේ අධිෂ්ඨානයෙන් රජතුමාට පමණක් පෙනෙන්නට විය. රජතුමා ද පළමු ව පැන් පිළිගන්වා ඒ පින ඥාතීන්ට ලැබේවා යි පින් දුන්නේ ය. එකෙණෙහි ම ඔවුන්ට පස් පියුමෙන් පිරි පැන් පොකුණු පහළ විය. කල්ප ගණනක් මහා දාහයකින් දැවි දැවී සිටි ඔවුහු එහි පැන ගිලී නා, පැන් බී සියලු දැවිලි නිවාගෙන, රන්වන් සිරුරු ඇත්තෝ වූහ. රජ මීළඟට කැඳ අවුලු පිළිගන්වා ඒ පින ද අනුමෝදන් කළේ ය. එකෙණෙහි ම ඒ ප්‍රේතයන්ට ද දිව්‍යමය කැඳ අවුලු ලැබිණ. ඔවුහු ඒවා අනුභව කොට ප්‍රාණවත් සිරුරු ඇත්තෝ වූහ. අනතුරුව රජතුමා බුද්ධ ප්‍රමුඛ සංඝයාට සිවුරු පිරිකර සහ සෙනසුන්  පූජා කොට එම පින් ද ඔවුන්ට අනුමෝදන් කළේ ය. එසැනින්ම ඒ ප්‍රේත ජනයාට ද දිව්‍ය වස්ත්‍ර දිව්‍ය විමාන දිව්‍ය යාන දිව්‍යමය සයනාසන ආදී සියලු සුඛෝපභෝගී සම්පත් පහළ විය. මේ සියල්ල බුද්ධානුභාවයෙන් රජතුමාට ද පෙනින. ඒ දුටු රජතුමා මහත් සේ සතුටට පත් විය. බුදුරජාණන් වහන්සේ දන් වළඳා අවසානයේ මේ නිමිති කොට බිම්බිසාර රජතුමා ඇතුළු පිරිසට පුණ්‍යානුමෝදනා කරමින් "තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති" ආදී මෙම දේශනාව කළ සේක.

## තිරොකුඩ්ඩ සුත්තං

01. තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති සන්ධි සිංඝාටකෙසු ච
ද්වාරබාහාසු තිට්ඨන්ති ආගන්ත්වාන සකං ඝරං

(ප්‍රේත ලොකයේ උපන් ඥාති ප්‍රේතයෝ) තමන් පෙර විසූ ගෙය (හෝ පින් අනුමෝදන් කරන ඥාති මිත්‍රයාගේ ගෙය තමාගේ ගෙය සේ සලකා ) කරා පැමිණ බිත්තියෙන් පිටත ද ගෘහ සන්ධි බිත්ති සන්ධි සතර මං සන්ධිවල ද දොර උළුවහු අසල ද බලා සිටිති.

02. පහූතෙ අන්නපානම්හි ඛජ්ජභොජ්ජෙ උපට්ඨිතෙ
න තෙසං කොචි සරති සත්තානං කම්මපච්චයා

බොහෝ වූ ආහාර පාන ද කෑ යුතු බිදිය යුතු දේ ද පිළියෙලව ඇති (මංගලාදී භෝජන සංග්‍රහ) අවස්ථාවන් හි පවා ඒ ප්‍රේත ලෝකයේ උපන් සත්වයන්ගේ පෙර කරන ලද අකුසල කර්ම හේතුවෙන් කිසිම නෑ හිත මිතුරෙක් ඔවුන් සිහිපත් නොකරයි.

03. එවං දදන්ති ඤාතීනං යෙ හොන්ති අනුකම්පකා
සුචිං පණීතං කාලෙන කප්පියං පානභොජනං

04. ඉදං වො ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයො
තෙ ච තත්ථ සමාගන්ත්වා ඤාතිපෙතා සමාගතා

05. පහූතෙ අන්නපානම්හි සක්කච්චං අනුමොදරෙ
චිරං ජීවන්තු නො ඤාතී යෙසං හෙතු ලභාමසෙ
අම්හාකං ච කතා පූජා දායකා ච අනිප්ඵලා

නෑදෑයන් අතුරින් ඔවුන්ට අනුකම්පා කරන යම් කෙනෙක් වෙත්නම් ඔවුහු ඒ ප්‍රේතයන් එහි පැමිණ සිටින අවස්ථාවෙහි පිරිසිදු ප්‍රණීත කැප සරුප් ආහාර පාන පිළියෙල කොට "මෙම පින පරලොව ගිය අපේ ඥාතීන්ට ලැබේවා, ඒ ඥාතීහු සුවපත් වෙත්වා" යි කියා දන් දෙති. ඒ ඥාති ප්‍රේතයෝ ද එසේ බොහෝ ආහාර පාන පුද දෙන කල්හි නොයෙක් දෙසින් එතැනට රැස්ව ඒ පින කර්මඵල අදහමින් මැනවින් අනුමෝදන් වෙති. "යම් නෑ හිතවතෙකු නිසා අපට මේ පින ලැබුණේ ද ඔවුන් විසින් (සංසයාට පමණක් නොව පින් දීම් වශයෙන්) අපට ද පූජාවක් කරන ලදී. අපේ ඒ නෑයෝ බොහෝකල් ජීවත් වෙත්වා"යි ඔවුහු (පින් දුන්

නෑයන්ට) ස්තුති කරති. එසේ ම දායකයාගේ දානය ද නිෂ්ඵල නොවන්නේ ය (ඥාතීන්ට පින් ලැබීම හැරුණු කොට දායකයන්ට ද මහ පිනක් අත් පත් වන්නේ ය)

**06. නහි තත්ථ කසී අත්ථි ගොරක්ඛෙත්ථ න විජ්ජති
වණිජ්ජා තාදිසි නත්ථි හිරඤ්ඤෙන කයාක්කයං
ඉතො දින්නෙන යාපෙන්ති පෙතා කාලකතා තහිං**

එ ප්‍රේත ලෝකයෙහි (ජීවිකාවන් වශයෙන්) සී සෑමක් නැත්තේ ය. ගව පාලනයකුත් නැත්තේ ය. රන් රුවනින් කරන ගණුදෙනුවකුත් නැත. එබඳු වෙළඳාමකුත් නැත. මැරී ප්‍රේත ලෝකයට පැමිණියෝ මෙලොව නෑ හිතවතුන් විසින් දෙන ලද පිනකින් යැපෙති.

**07. උන්නමෙ උදකං වට්ඨං යථා නින්නං පවත්තති
එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති**

උස් බිමකට වටුණු වැසි ජලය පහත් බිම් කරා ගලා බසින්නේ යම්සේ ද එසේ ම ඥාතිමිත්‍රයන් විසින් මෙලොවින් දෙන ලද පින ඒ ප්‍රේතයන් කරා පැමිණේ (ලැබේ).

**08. යථා වාරිවහා පූරා පරිපූරෙන්ති සාගරං
එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති**

පිරී ඉතිරී ගලාගෙන යන ගං හෝ දිය සාගරය පුරවාලන්නේ යම්සේ ද එසේ ම ඥාති මිත්‍රයන් විසින් මෙලොවින් දෙන ලද පින ප්‍රේතයන් වෙත පත් වෙයි.

**09. අදාසි මෙ අකාසි මෙ ඤාතිමිත්තා සඛා ච මෙ
පෙතානං දක්ඛිණං දජ්ජා පුබ්බෙ කතමනුස්සරං**

(ඒ මිය පරලොව ගිය ඥාතිවරයා ජීවත්ව සිටිය දී) මට මේ මේ දෙය දුන්නේය මට මේ මේ උපකාර කළේ ය. ඒ මගේ ඥාතියා ය. ඒ මගේ මිත්‍රයා ය. ඒ මගේ යහළුවා යැයි. මෙසේ පෙර කළ උපකාර සිහි කරමින් මිය පරලොව ගිය නෑ හිත මිතුරන් උදෙසා දන් දිය යුත්තේ ය.

> 10. න හි රුණ්ණං ව සොකො වා යා චඤ්ඤා පරිදෙවනා
> න තං පෙතානමත්ථාය එවං තිට්ඨන්ති ඤාතයො

හැඬීමක් හෝ සෝක කිරීමක් හෝ වෙන යම් වැළපීමක් හෝ වේ ද එය පරලොව ගිය ඇත්තන්ගේ ප්‍රයෝජනය පිණිස හේතු නොවේ. ඒ කුමක් කළත් ඒ ඤාතීහු එසේම දුක් විඳිමින් සිටිති.

> 11. අයං ඛො දක්ඛිණා දින්නා සංඝම්හි සුප්පතිට්ඨිතා
> දීඝරත්තං හිතායස්ස ඨානසො උපකප්පති

මහරජ, ඔබ විසින් ඤාතීන්ට පින් පිණිස යම් දානයක් දෙන ලද්දේ ද ඒ මේ දක්ෂිණාව උතුම් පින් කෙත වූ සංඝයා කෙරෙහි මනාව පිහිටියා වන්නේ ය. එය ඒ ප්‍රේත සමූහයාට දීර්ඝ කාලයක් හිත සුව පිණිස වන්නේ ය.

> 12. සො ඤාතිධම්මො ච අයං නිදස්සිතො
> පෙතාන පූජා ච කතා උළාරා
> බලඤ්ච භික්ඛූන මනුප්පදින්නං
> තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පකං

මේ දක්ෂිණාව දීමෙන් ඔබ (නෑයෙකු විසින් නෑයන්ට කළයුතු) ඤාති ධර්මය පෙන්වන ලද්දේ ය. ප්‍රේතයන් හෙවත් මිය පරලොව ගිය ඇත්තන් සඳහා කළ හැකි උසස් ම පූජාව ද කරන ලද්දේ ය. භික්ෂු සංඝයාට ආහාර පානාදියෙන් සැතපීමෙන් මහත් බලයක් ද දෙන ලද්දේ ය. ඔබ විසින් ද මහත් පිනක් රැස්කර ගන්නා ලද්දේ ය.

### ප්‍රේත ලෝකය

සතර අපායෙන් තෙවන අපාය ප්‍රේත ලෝකය යි. දරුණුම පව්කළ අය උපදින අපාය නිරයයි. කළපව් එතරම් දරුණු නොවූ අය තිරිසන් අපායේ උපදිති. ප්‍රේත ලෝකයේ උපදින්නේ ඊටත් වඩා පාපයෙන් අඩු අයයි. බොහෝ විට සත්වයන් ප්‍රේත ලෝකයේ උපදින්නේ අනුන්ගේ සැපතට ඊර්ෂ්‍යා කිරීම, තමනුත් භුක්ති නොවිඳ අනුන්ටත් නොදීම, දෙන අයත් වැළැක්වීම, වැනි මසුරුකම් කිරීම නිසාය. එසේ ප්‍රේත ලෝකයේ ජීවත්වන සත්වයෝ සතරාකාර වෙති.

**01. නිජ්ඣාම තණ්හික**

බඩගින්න හා පිපාසය නිසා කුසේ ඇති වූ ගින්න ගිනි ජලාවක් වී මුවින් නික්මෙයි. ඒ ගින්නෙන් මුළු සිරුරම දැවෙමින් සිටින ප්‍රේත වර්ගයා නිජ්ඣාම තණ්හික නම් වේ. ඔවුන්ගේ ආහාර ගැනීමක් නැත. කර්මයේ දරුණුකම නිසා නොමැරී ජීවත් වෙති.

**02. ඛුප්පිපාසික**

පර්වතයක් වැනි කුසක් ඇති එහෙත් උගුර ඉදි කටු සිදුරක් තරම් වූ මේ ප්‍රේතයන්ට ආහාරයක් පානයක් ලැබුණත් රිසි සේ අනුභව කරන්නට නොහැකිය. ඔවුන් සැමදා බඩගින්නෙන් හා පිපාසයෙන් වෙසෙන හෙයින් ඛුප්පිපාසික යැයි කියනු ලැබේ.

**03 වන්තාස**

සමහර ප්‍රේතයන්ට අනුභව කරන්නට කිසිදු ආහාරයක් නැති හෙයින් ඔවුහු ඔවුනොවුන්ගේ හෝ වෙනත් සත්ත්වයන්ගේ කෙළ සෙම් සොටු හෝ ශරීරවල පිපුරුණු ගඩුවලින් ගලන ලේ, සැරව ආදිය ලැබුණු අමෘතයක් සේ ලෙව කා ජීවත්වෙති. වමනය කරන දේ හෝ ගඩු වණ ආදියෙන් පිටවන දේ අනුභව කරති'යි යන අදහසින් වන්තාස යැයි කියනු ලැබේ.

**04. පරදත්තුපජීවී - අනුන් දුන් පිනෙන් ජීවත් වන්නෝ**

ඉහත කී ආකාරයෙන් පව්කම් කොට ප්‍රේත ලෝකයේ ඉපිද දුක් විඳින ප්‍රේත වර්ග ඇත්තේ තුනකි. යට කී පරිදි පාප කර්ම බලයෙන් හෝ සෙම්සොටු වැනි දෙයින් ඉතා දුක සේ ඔවුහු දිවි ගෙවති. එසේ ප්‍රේත ලෝකයේ වෙසෙන ඔවුන්ගේ කර්මය ගෙවී යන කාලයේ දී කිසියම් නෑදෑ කෙනෙකුට සිහිපත් වී පින් අනුමෝදන් කළ හොත් බිම්බිසාර පුවතේ කියන ලද පරිදි ඔවුහු ඒ ප්‍රේත භවයේ දී ම දෙව් සැප හා සමාන සැප ලබති. ඔවුන්ට දිව්‍ය විමාන වැනි විමාන පහළවන බැවින් විමාන ප්‍රේත නමින් හඳුන්වනු ලැබේ. එතැන්සිට ඔවුන් ප්‍රේත ලෝකයේ ඉතිරි ආයුෂ ගත කරන්නේ ඒ ඤාතීන් අනුමෝදන් කළ පිනේ මහිමයෙනි. එවිට ඔවුහු පරදත්තුපජීවී යනුවෙන් හඳුන්වනු ලබති. එනිසා අංගුත්තර නිකායේ දසක නිපාතයේ ජාණුස්සෝණි සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ ප්‍රේත ලෝකයේ ප්‍රේතයන් යැපෙන ජීවත්වන ක්‍රම දෙකක් ඇතිබව වදාරති. පළමුවැන්න ප්‍රේත ලෝකයට ආවේණික වූ ආහාරයෙන් යැපීමයි. දෙවැන්න නම් නෑ හිත මිතුරෙකු අනුමෝදන් කළ පිනෙන් යැපීමයි.

ප්‍රේත ලෝකය අපාය අතර සුවිශේෂ තැනක් වන්නේ මේ කාරණය නිසාය. අප පින්කම් කොට දෙන පින් ඒ අසල සිටින මිනිසුන් දෙවියන් වැනි කෙනෙකුට අනුමෝදන් විය හැකි ය. එහෙත් ඔවුන්ට එවලේ ම විපාක ලැබිය නොහැකි ය. ඒ පින් පල විඳින්නට ලැබෙන්නේ වෙනත් භවයක දී ය. නිරයෙහි හෝ තිරිසන් භවයේ උපන් සත්වයෙකුට අප දෙන පිනක් කිසිසේත් අනුමෝදන් විය නොහැකි ය. ජාණුස්සෝණි සූත්‍රයේ දී බුදුරජාණන්

වහන්සේ වදාරන්නේ අප දෙන පිනේ මහිමයෙන් ඒ මොහොතේ ම සැප ලැබිය හැකි එකම තැන ප්‍රේත ලෝකය බව යි. එයට ද අවස්ථාව ලැබෙන්නේ ප්‍රේත ලෝකයේ දුක් විඳිමින් සිට කර්මය ගෙවුණු අයට පමණි. බිම්බිසාර රජතුමාගේ ඥාති මිත්‍රයන්ට එසේ දුන් පිනෙන් සැප ලැබිය හැකි වූයේ කල්ප අනූ දෙකක් නිරාගතව සිට ප්‍රේත ලෝකයටත් පැමිණ බුද්ධාන්තරයකුත් ගත වූ පසුව ය. මේ අනුව ප්‍රේත ලෝකයේ පරදත්තූපජීවී වශයෙන් ම උපදින කෙනෙක් නැත. ප්‍රේත කෙනෙක් පරදත්තූපජීවී වන්නේ කර්මය ගෙවා අවසන් වී ගෙනයාමත් පින් අනුමෝදන් කරන කෙනෙකු ඉදිරිපත් වීමත් යන කාරණා දෙක මත ය.

**තිරොකුඩ්ඩෙසු**

තිරෝකුඩ්ඩ යනු බිත්තියෙන් පිටත යන අදහසයි. තිරොරට්ඨං තිරොපාකාරං යන ආදී වශයෙන් මෙවැනි තවත් යෙදුම් පාලියෙහි යෙදී තිබේ.

**සන්ධිසිංඝාටකෙසු**

සන්ධි යනු සතරමං සන්ධිය යි. සිංඝාටක යනු තුන්මන් සන්ධිය යි. එම සන්ධි පමණක් නොව මෙහි සර සන්ධි හෙවත් ගෙවල් අතර සන්ධි, භිත්ති සන්ධි හෙවත් බිත්ති මුළු ද ගැනේ.

**ද්වාරබාහාසු**

යනු දොර මුළු ය.

**කම්මපච්චයා**

තමා කළ, දන් නොදීම, දෙන දන් වැළැකීම වැනි මසුරුකම් හේතු කොටගෙන යන අදහසයි.

**සක්කච්චං අනුමොදරෙ**

මේ දෙන දානයේ පින අපට ලැබෙන්නේ යැයි සිතා කර්මඵල විශ්වාසයෙන් ප්‍රේතයෝ සතුටින් අනුමෝදන් වෙති.

**ඨානසො උපකප්පති**

එකෙණෙහි ම, එතැන දී ම විපාක දෙයි, කල් නොයයි. නැතහොත් ඒ ප්‍රේතයන් නිජ්ඣාම තණ්හික ආදී දුක්විඳිමින් සිටි තැන දී ම ඒ පින්පල ලැබෙයි, යන අදහසයි.

**දීඝමස්සුකෙසවිකාරධරෙ අන්ධකාරමුඛෙ සිථිලබන්ධනවිලම්බමාන කිසඵරුසකාලකඞ්ගපච්චඞ්ගෙ තත්ථ තත්ථ වනදායදඩ්ඪ තාලරුක්ඛසදිසෙ**

විකාර වූ දිගු කෙස් රැවුල් ඇති, අඳුරු මුහුණු ඇති, සන්ධිවලින් ලිහිල්ව එල්ලෙන කෙට්ටු විරූප කලු අඟපසඟ ඇති, දැවීගිය වනයක තැන තැන ඇති පිළිස්සුණු තල් ගස් බඳු.

## අභ්‍යාස

01. මළවුන්ට පින්දීමේ ආරම්භය යන මැයෙන් රචනාවක් කරන්න.
02. තිරෝකුඩ්ඩ සූත්‍රයෙන් අදාළ ගාථා තෝරාගෙන සත් දින දානමය පින්කමක භුක්තානුමෝදනාවක් ශිෂ්‍ය සමිතියේ දී ඉදිරිපත් කරන්න.
03. ප්‍රේත ලෝකයේ සත්ත්වයන්ගේ හැටි යන මැයෙන් සිතුවමක් අඳින්න.

**උපනත් පේතව පව් කොට නොපනත්**
**කලෙකත් නොලැබෙයි සෙම් සොටු පමණක්**
**උගුරත් නොතෙමෙයි සුරගඟ වැටුණත්**
**මදකුත් පින් නොකළැකි මැයි සිතුනත්**

- ලෝවැඩ සඟරාව -

13 පාඩම

# දුන් දෙය සුව ගෙනදේ

**(සප්පුරිසදාන සූත්‍රය)**

මහණෙනි, සප්පුරිස දාන පහකි. ඒ පහ කවරේ ද යත්.

**01. ශ්‍රද්ධාවෙන් දන් දෙයි.**
**02. සකස් කොට දන් දෙයි.**
**03. සුදුසු කාලයෙහි දන් දෙයි.**
**04. දෙන දෙයෙහි ඇල්මක් නැතිව දන් දෙයි.**
**05. තමා හා අනුන් නොගටා දන් දෙයි.**

01. මහණෙනි, ශ්‍රද්ධාවෙන් දන් දී යම් යම් තැනක දී ඒ දානයේ විපාක ලැබේ ද, එහි දී මහත් ධනයෙන් මහත් භවභෝග සම්පතින් ආඪ්‍ය වෙයි. පොහොසත් වෙයි. ඉතා දැකුම්කළු ප්‍රසන්න ඉහළ ම රූප සෞන්දර්යයෙන් යුක්ත රූමත් කෙනෙක් වෙයි.

02. මහණෙනි, සකසා දන් දී යම් යම් තැනක දී ඒ දානයේ විපාක ලැබෙයි ද, එහි දී මහත් ධනයෙන් මහත් භවගෝග සම්පතින් ආඪ්‍ය කෙනෙක් වෙයි. ඔහුගේ දරුවන් හෝ අඹුවන් හෝ දැසි දස් කම්කරුවන් හෝ වෙත්නම් ඔවුහු කීකරු වෙති. කී දේට කන් දෙති. කී දේ පිළිගැනීමට සිත් යොමු කරති.

03. මහණෙනි, සුදුසු කාලයෙහි දන් දී යම් යම් තැනක දී ඒ දානයේ විපාක ලැබේ ද එහි දී මහත් ධනයෙන් මහත් භවභෝග සම්පතින් ආඪ්‍ය වෙයි. අවශ්‍ය වේලාවට ඔහුගේ ධන සම්පත් වැඩි දියුණු වෙයි. (අවශ්‍යතරම් ධන සම්පත් ලැබෙයි)

04. මහණෙනි, දෙන දේ පිළිබඳ බැඳීමක් නැතිව දන් දී යම් යම් තැනක දී ඒ දානයේ විපාක ලැබේ ද එහි දී මහත් ධනයෙන් මහත් භවභෝගයෙන් ආඪ්‍ය වෙයි. ලැබුණු ධන සම්පත් වැය කොට සිතු සේ පස් කම් සැප විඳීමට සිත නැමෙයි.

05. මහණෙනි, තමා හා අනුන් නොගටා දන් දී යම් යම් තැනක දී ඒ විපාක ලැබේ නම් එහි දී මහත් ධනයෙන් මහත් භෝගයෙන් ආඪ්‍ය වෙයි. ඔහුගේ ධනයට ගින්නෙන් දියෙන් රජුන්ගෙන් සොරුන්ගෙන් හෝ අප්‍රිය හිමි කම් කියන්නන්ගෙන් යන කිසිවකින් බාධාවක්, කරදරයක්, විනාශයක් නොවෙයි. මහණෙනි, සත්පුරුෂ දාන යනු මේ දාන පහ යි.

### දන් දීම

නිසිපරිදි දන්දෙන්නා ගේ මූලික ලක්ෂණ හයක් ව්‍යග්ඝපජ්ජ හා පත්තකම්ම යන සූත්‍රවල චාග සම්පදාවේ දී විස්තරකර දී තිබේ. එනම්

01. විගතමලමච්ඡේරෙන චෙතසා අගාරං අජ්ඣාවසති.

මසුරුමලයෙන් තොර සිතින් ගිහි ගේ වාසය කරයි. මසුරුමල යනු තමනුත් භුක්ති නොවිඳින අනුන් භුක්ති විඳිනවාටත් අකමැති, දන් නොදෙන, දුන්නත් ඉවත දමන දෙයක් තෝරා දෙන තරම් මසුරු කමයි.

02. මුත්තචාගො

දුන් දේ සිතින් අත හැර දෙන සුලු, නැවත ඒ ගැන තැකීමක් නැති කෙනෙකු වීම.

03. පයතපාණී

දීමට ම සෝදා ගත් අත් ඇති, ඒ තරමට දීමට ලැදි කෙනෙකු වීම.

04. වොස්සග්ගරතො

තමාසතු දේ අත් හැරීමෙහි යෙදුණ, දෙන්නට කෙනෙකු සොයමින් සිටින්නෙකු වීම.

05. යාචයොගො

යදියන්ට හෝ ආධාර ඉල්ලන්නන්ට ඕනෑම මොහොතක ලංවිය හැකි, ඉල්ලීමට සුදුසු කෙනෙකු වීම.

06. දාන සංවිභාගරතො

දන් දීමට මෙන් ම සොයුරු සොයුරියන් නෑ හිතවතුන් අසල්වැසියන් සමඟ බෙදා හදාගෙන භුක්ති විඳීමට හුරු පුරුදු කෙනෙකු වීම.

මෙසේ චාග සම්පත්තියෙන් යුතු දන් දීමෙහි නියුතු පුද්ගලයකු දන් දීමේ දී කෙසේ පිළිපැදිය යුතු ද යන්න මෙම සප්පුරිසදාන සූත්‍රයෙන් ඉගැන්වේ.

01. ශ්‍රද්ධාවෙන් දන් දීම යනු තුනුරුවන් කෙරෙහි විශ්වාසයෙන් ගෞරවයෙන් යුතුව දන් දීම, මහපිනක් යැයි කර්ම කර්මඵල විශ්වාසයෙන් යුතුව දන් දීමයි. එසේ දන් දීමෙන් කෙනෙක් ලස්සන වී උපදී.

02. සකසා දන් දීම යනු තමන් සිල්වත් වීම, දෙය්‍ය ධර්මය දැහැමින් උපයාගත් දෙයක් වීම, තමා භුක්ති විඳිනවාට වඩා පිරිසිදුව ප්‍රණීතව දානය පිළියෙල කොට සියලු දේ අනුපිළිවෙළට සකස් කොට ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් ප්‍රතිග්‍රාහකයන් වඩා හිඳුවා ඉතා සැලකිල්ලෙන් සිදු කරන දානය යි. එසේ දන් දීමෙන් තමාගේ පිරිවර ජනයා තමාට අවනත වෙයි. කෙනෙකුට ඔහුගේ අඹුදරුවන් හෝ සිසුදරුවන්, සේවක සේවිකාවන් හෝ කීකරු නොවන්නේ අවනත නොවන්නේ ඔවුන්ගේ ම වරදින් නොව මෙසේ

තමන් දන් දුන් ආකාරයේ ද වරදින් බව මෙයින් පෙනේ.

**03. සුදුසු කාලයෙහි දන් දීම**

අංගුත්තර නිකායේ පංචක නිපාතයේ සඳහන්වන පරිදි කාල දාන පහකි.

**01. ආගන්තුකයන්ට දන් දීම.**
**02. මගියන්ට දන් දීම.**
**03. ගිලනුන්ට දන් දීම.**
**04. දුර්භික්ෂයෙහි දන් දීම.**
**05. අලුත් සහල් හෝ අලුතින් හැදුණු ඵලාඵල ආදියෙහි පළමු කොටස සිල්වතුන්ට දන් දීම. යන මේ අවස්ථාවන් හි දන් දීම සුදුසු කල්හි දන් දීම යි.**

මෙසේ සුදුසු කල්හි දන් දීමේ විපාකයෙන් තමාට අවශ්‍ය වූ වේලාවට අවශ්‍ය මිල මුදල හෝ අවශ්‍ය ඇප උපකාර ලැබේ.

04. දෙන දෙයෙහි ඇල්මක් නැතිව දීම - එනම් කලින් මුත්තවාගො යන්නෙන් කී කාරණය ම යි. යමක් දුන් පසු එය සහමුලින් සිතින් අත්හැර දැමිය යුතු ය. ඒ ගැන පසුතැවිලිවීම හෝ පසුවිපරම් කිරීම හෝ නොකළ යුතු ය. ඇතැමුන්ට කෙතරම් ධනය තිබුණත් ඒවා භුක්ති විඳින්නට නොසිතේ. ඔවුහු ධනය තැන්පත් කර ගෙන අසරණ දුගියන් සේ ජීවත් වෙති. මෙසේ සිදුවන්නේ දෙන දෙය සිතින් අත් හැර නොදීම නිසා ය.

05. තමා හා අනුන් නොගටා දන් දීම - දන් දෙන විට තමාගේ ලොකු කම් ධනවත්කම් බලවත්කම් පෙන්වන්නට හෝ තමා දානපතියෙකැයි කැපී පෙනෙන්නට හෝ දීමත් දන් ලබන පුද්ගලයන්ගේ හැඩරුව ගති ගුණ උස්මිටිකම් සලකා අවඥාවෙන් ඔවුන් පහත හෙළා දන් දීමත්, තමා හා අනුන් ගටා දන් දීම නම් වෙයි. එසේ දීමෙන් විපාක ලබන දවසට දන් දීම නිසා සැපසම්පත් ලැබුණත් ඒවා ආරක්ෂාකර ගැනීමට නොහැකි වෙයි. විවිධ විපත්තිවලින් විනාශ වෙයි.

**අභ්‍යාස**

01. දන්දෙන පින්වතෙකුගේ මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.
02. දන් දීමෙන් භවභෝග සම්පත් ලැබෙනවාට වඩා ලැබිය හැකි විශේෂ ප්‍රතිඵල මොනවාද? ඒවා ලැබිය හැක්කේ කෙසේ දන් දීමෙන්ද?
03. මෙම පාඩම ආශ්‍රයෙන් භුක්තානුමෝදනා දේශනාවක් පිළියෙල කරන්න.

## සප්පුරිසදාන සුත්තං

**(සාවත්ථිනිදානං)**

**48. පඤ්චිමානි භික්ඛවෙ සප්පුරිසදානානි. කතමානි පඤ්ච:**

සද්ධාය දානං දෙති, සක්කච්චං දානං දෙති, කාලෙන දානං දෙති, අනග්ගහිතචිත්තො[1] දානං දෙති, අත්තානං ච පරං ච අනුපහච්ච දානං දෙති.

සද්ධාය ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. අභිරූපො ච හොති දස්සනියො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො.

සක්කච්චං ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. යෙපිස්ස තෙ හොන්ති පුත්තාති වා දාරාති වා දාසාති වා පෙස්සාතී වා කම්මකාරාති වා, තෙපි සුස්සූසන්ති, සොතං ඔදහන්ති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති.

කාලෙන ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. කාලාගතා චස්ස අත්ථා පචුරා හොන්ති.

අනග්ගහිතචිත්තො ඛො[1] පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. උළාරෙසු ච පඤ්චසු කාමගුණෙසු භොගාය චිත්තා නමති.

අත්තානඤ්ච පරඤ්ච අනුපහච්ච ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. න චස්ස කුතොචි භොගානං උපඝාතො ආගච්ඡති අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියදායාදතො වා.[2]

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සප්පුරිසදානානීති.

14 පාඩම

# ගිහි දිවියක දුක්බර පුවත

(බහු ධීතු සූත්‍රය)

මා විසින් මෙසේ අසන ලදී, එක් සමයක භාග්‍යවතුන් වහන්සේ කොසොල් රට එක්තරා වන ලැහැබක වැඩ වෙසෙන සේක. මේ අවදියෙහි භාරද්වාජගොත්ත නම් එක්තරා බ්‍රාහ්මණයෙකුගේ ගොනුන් තුදුස් දෙනෙකු අතුරුදහන්ව තිබුණි. ඉක්බිති ඒ භාරද්වාජගොත්ත බ්‍රාහ්මණයා ඒ ගවයන් සොයමින් එම වන ලැහැබට ම පිවිසියේ ය. එසේ පිවිසි හෙතෙම ඒ වන ලැහැබෙහි පළක් බැඳගෙන උඩු කය සෘජුව තබාගෙන තමා වෙත එළවාගත් සිහි ඇතිව වැඩ හිඳින භාග්‍යවතුන් වහන්සේ දුටුවේ ය. දැක, භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ බුදුරජාණන් වහන්සේ ශාන්තව සන්සුන්ව සැනසිල්ලේ වෙසෙන ආකාරය දැක මේ ශ්‍රමණයන් වහන්සේට මට තිබෙන මේ දුක් කිසිවක් නැහැ නොවේ දැයි කියමින්, තමාට විඳින්නට සිදු වී ඇති මහා දුක් කන්දරාව ගාථාවන්ගෙන් මෙසේ ප්‍රකාශ කළේ ය.

> 01. න හි නූනිමස්ස සමණස්ස බලිවද්දා චතුද්දස
> අජ්ජ සට්ඨී න දිස්සන්ති තෙනායං සමණො සුඛී

(මේ ශ්‍රමණයන් වහන්සේට මට මෙන් ගවයන් දාහතර දෙනෙකු සොයාගන්නට නැතිව අදට දින හයක් ගතවීමේ විපතක් නැත. එහෙයින් මේ ශ්‍රමණයන් වහන්සේ සුවසේ වෙසෙන සේක)

මේ බමුණාට සිදුවී ඇති විපත් මෙපමණක් නොවේ. තල වගාවක් විය එය වැපිරූ දවසේ ම මහ වැස්සක් වැටී තල ඇට පස්වලට යට වී ගියේ ය. බොහෝමයක මල් එල ගැනීමක් තබා පැලවීමක්වත් සිදු නොවී ය. වැඩුණු පැලවලට ද පණුවන් බෝ වී විනාශ විය. එක කොලයක් දෙකක් පමණක් ඉතිරි විය. කෙත බලන්නට ගිය බමුණා මේ විපත දැක ‘ආදායමකට මට තිබුණු තල කෙතත් නැසුණේ යැ’යි මහත් දොම්නසින් පෙරළා ආයේ ය. එය සිහි කරමින් ඔහු මෙසේ පවසයි.

**02. න හි නූනිමස්ස සමණස්ස තිලා ඛෙත්තස්මිං පාපකා
එක පණ්ණා දුපණ්ණා ච තෙනායං සමණො සුඛී**

(මට මෙන් නිසරුව කොළ එක දෙකක් පමණක් ඉතිරිව ගිය තල වගාවක් මේ ශ්‍රමණයන් වහන්සේට නැත. එහෙයින් මේ ශ්‍රමණයන් වහන්සේ සුවෙන් වෙසෙන සේක)

භවබෝග සම්පත්වලින් පිරිහී ගිය මේ බමුණාගේ අටුකොටු ක්‍රමයෙන් හිස්ව ගියේ ය. තල කෙත් විනාශවීම නිසා අටුකොටු නැවත පිරීමක් ද සිදු නොවීය. හිස් වූ අටුවලට වැදුණු වටපිටාවේ මීයෝ රාත්‍රියෙහි මහත් සේ නාද කරමින් ඒ මේ අත දුවමින් එහි නටති. දවස පුරා වෙහෙස වී පැමිණෙන ඔහුට ඒ නිසා නින්දක් ද නැත. ඒ සිහි කොට හෙතෙම මෙසේ කියයි.

**03. න හි නූනිමස්ස සමණස්ස තුච්ඡ කොට්ඨස්මිං මූසිකා
උස්සොළ්හිකාය නච්චන්ති තෙනායං සමණො සුඛී**

(මට මෙන් මේ ශ්‍රමණයන් වහන්සේට හිස් වූ අටුවෙහි මීයන් මහත් උද්‍යෝගයෙන් දුව පැන නටන කරදරයක් නැත. එහෙයින් මේ ශ්‍රමණයන් වහන්සේ සුවසේ වෙසෙන සේක)

ඒ බ්‍රාහ්මණයා නිදන පැදුර හත් මාසයකින් අවුවේ දමා වේලා පිරිසිදු කිරීමක් සිදු වී නැත. එහි මකුණන් පිරී ඇත. දවස පුරා වෙහෙස වී අවුත් නින්දට යන ඔහුට මකුණන් නිසා ද නින්දක් නැත. එය සිහි වී හෙතෙම මෙසේ කියයි.

**04. න හි නූනිමස්ස සමණස්ස සන්ථාරො සත්තමාසිකො
උප්පාටකෙහි සඤ්ඡන්නො තෙනායං සමණො සුඛී**

(මට මෙන් මේ ශ්‍රමණයන් වහන්සේට සත් මසක් තිස්සේ මකුණන් පිරුණු පැදුරක් නැත. එහෙයින් මේ ශ්‍රමණයන් වහන්සේ සුවෙන් වෙසෙන සේක)

මේ බමුණාට දූවරු සත් දෙනෙක් වූ හ. සියලු දෙනා දීග දෙන ලදහ. නොබෝ කලකින් ඔවුන්ගේ සැමියන් මිය යාම නිසා හෝ වෙනත් හේතු නිසා ඔවුහු කණවැන්දුම් වූහ. බමුණා ළඟ ධනය තිබෙනතුරු ඒ ඒ නිවෙස්වල ඔවුන්ට කරදරයක් නොවී ය. එහෙත් බමුණා ධනයෙන් පිරිහී ගිය පසු දූවරු සියලු දෙනාට ම දරුවන් එකා දෙන්නා ද රැගෙන

මහගෙදරට ම එන්නට සිදු විය. ඔහුගේ අටුකොටුවල තිබුණ දේත් ඉක්මනින් හිස්ව යාමට මෙය ද හේතුවක් විය. දැන් ඒ සියල්ලන් ම පෝෂණය කරන්නේ මේ බමුණා ය. කුස පුරා ආහාර නොලබන කුඩා දරුවෝ සීයා එනතුරු මඟබලා සිටිති. ඔහු බත් පත අතට ගත් සැණින් ඒ දරුවෝ එහි වට වී උදුරා උදුරා කති. බමුණාට කුසගින්නේ ම නිදන්නට සිදුවෙයි. මේ ගැන සිහි කොට හෙතෙම මෙසේ පවසයි.

**05. න හි නූනිමස්ස සමණස්ස විධවා සත්ත ධීතරො**
**එක පුත්තා ද්වෙ පුත්තා ච තෙනායං සමණො සුඛී**

(මට මෙන් මේ ශ්‍රමණයන් වහන්සේට දරුවන් එක්කෙනා දෙන්නා සහිතව කණවැන්දුම් වී ආ දූවරු හත් දෙනෙක් නැත. එහෙයින් මේ ශ්‍රමණයන් වහන්සේ සුවෙන් වෙසෙන සේක)

මෙම බමුණාගේ බැමිණිය අඳුරු පැහැ ඇත්තියකි. සිරුරේ කබර වැනි ලප කැලැල් ඇත්තියකි. කුසගින්නේ, මීයන්ගේ සහ මකුණන්ගේ කරදර ද මැද මුළු රෑ නින්දක් නැතිව සිටින ඔහුට සුළු හෝ නින්දක් ලැබෙන්නේ එළිවෙන යාමයේ ය. ඔහුගේ ඇස් පියවෙන විට ම "බමුණ කුමක් කරන්නෙහි ද මොවුන්ට කන්න දෙන්නේ නැද්ද? ණය කරුවන්ට ණය ගෙවන්නේ නැද්ද?" යන ආදී වශයෙන් දොස් පවරමින් ඇය පයින් ඇණ ඔහු අවදිකරවයි. මේ දුක සිහිකොට හෙතෙම මෙසේ කියයි.

**06. න හි නූනිමස්ස සමණස්ස පිංගලා තිලකාහතා**
**සොත්තං පාදෙන බොධෙති තෙනායං සමණො සුඛී**

(මට මෙන් මේ ශ්‍රමණයන් වහන්සේට පිඟුවන් ලප කැලැල්වලින් ගැවසුණු සිරුරක් ඇති බිරිඳක් නිදන විට පයින් ඇන අවදිකිරීමක් නැත. එහෙයින් මේ ශ්‍රමණයන් වහන්සේ සුවසේ වෙසෙති)

ඔහුගේ තල කෙත පාළුවී ගොස් ය. ගවයන් දාහතර දෙනෙකු අතුරුදහන් වී ඇත. කිසිදු ආදායමක් නැතිව විසි තිස් දෙනෙකු පෝෂණය කිරීමට ද සිදු වී ඇත. ඒ සඳහා තැන් තැන්වලින් ණය ගනියි. එහෙත් ඒවා ගෙවන ක්‍රමයක් ද නැත. දහවල් වන විට ඔහු හමුනොවන බැවින් ණය හිමියෝ එළිවන විට ම දොරකඩට පැමිණ ණය ඉල්ලති. මේ දුක සිහිකොට හෙතෙම මෙසේ කියයි.

## 07. න හි නූනිමස්ස සමණස්ස පච්චුසම්හි ඉණායිකා
## දෙථ දෙථාති චොදෙන්ති තෙනායං සමණො සුඛී

(මට මෙන් මේ ශ්‍රමණයන් වහන්සේට උදෑසන ම ණය කරුවන් පැමිණ "ණය දෙව පොලී දෙවැ"යි කියා චෝදනා කිරීමක් නැත. එහෙයින් මේ ශ්‍රමණයන් වහන්සේ සුවසේ වෙසෙති)

මෙසේ මේ භාරද්වාජගොත්ත බමුණා තමන්ට ඇති දුක් ගැනවිලි සියල්ල බුදුරදුන් හමුවේ කියාගෙන ගියේ ය. සියල්ල නිහඬව අසා සිටි උන්වහන්සේ අවසානයේ දී බ්‍රාහ්මණය ඔබ ඔබට තිබෙන සියලු දුක් ගැනවිලි කීවෙහි ය. මට මේ කිසිවක් නැතැයි පිළිතුරු ගාථා හතකින් බමුණා කී සියල්ල අනුමත කරමින් ඔහුගේ සිත සනසා වදාළ සේක.

- න හි මය්හං බ්‍රාහ්මණ බලිවද්දා චතුද්දස
  අජ්ජසට්ඨිං න දිස්සන්ති තෙනාහං බ්‍රාහ්මණා සුඛී
- න හි මය්හං බ්‍රාහ්මණ තිලා ඛෙත්තම්හි පාපකා
  එක පණ්ණා දුපණ්ණාච තෙනාහං බ්‍රාහ්මණා සුඛී
- න හි මය්හං බ්‍රාහ්මණ තුච්ඡ කොට්ඨස්මිං මූසිකා
  උස්සොළ්හිකාය නච්චන්ති තෙනාහං බ්‍රාහ්මණා සුඛී
- න හි මය්හං බ්‍රාහ්මණ සන්ථාරො සත්ත මාසිකො
  උප්පාටකෙහි සඤ්ඡන්නො තෙනාහං බ්‍රාහ්මණා සුඛී
- න හි මය්හං බ්‍රාහ්මණ විධවා සත්තධීතරො එක පුත්තා
  දුපුත්තා ච තෙනාහං බ්‍රාහ්මණා සුඛී
- න හි මය්හං බ්‍රාහ්මණ පිංගලා තිලකාහතා
  සොත්තං පාදෙන බොධෙති තෙනාහං බ්‍රාහ්මණා සුඛී
- න හි මය්හං බ්‍රාහ්මණ පච්චුසම්හි ඉණායිකා
  දෙථ දෙථාති චොදෙන්ති තෙනාහං බ්‍රාහ්මණා සුඛී

01. බ්‍රාහ්මණය මට ගවයන් දාහතර දෙනෙකු සොයාගන්නට නැතිව අදට දින හයක් ගතවීමේ විපතක් නැත. එහෙයින් මම සුවසේ වෙසෙමි.)

සැයුඃ- සෙසු ගාථාවල අදහස මේ ආකාරයෙන් යෙදේ.

**එවං වුත්තෙ භාරද්වාජ ගොත්තො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච**

**අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙල පජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති එවමෙවං භොතා ගොතමෙන අනෙක පරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි. ධම්මං ච භික්ඛු සංඝං ච. ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති.**

**අලත්ථ, ඛො භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං, අචිරූපසම්පන්නො ච. පනායස්මා භාරද්වාජො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කත කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.**

**(සංයුත්ත නිකාය - බ්‍රාහ්මණ සංයුත්ත බහුධීතු සුත්තං)**

(මෙසේ වදාළ කල්හි භාරද්වාජගොත්ත බමුණා භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකර සිටියේ ය. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස යම්සේ යටිකුරු වූ දෙයක් උඩුකුරු කරන්නේ ද, වැසී තිබූ දෙයක් විවර කරන්නේ ද, මංමුලා වූවෙකුට මඟ පෙන්වන්නේ ද ඇස් ඇත්තෝ රූප දකිත්වායි කියා අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ ද, එලෙසින් පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් දහම් දෙසන ලදි. මම බුදුන් දහම් සඟුන් සරණ යමි. පින්වත් ගෞතමයන් වහන්සේ සමීපයෙහි පැවිදි උපසම්පදාව ද ලබන්නෙමි යනුවෙනි.

භාරද්වාජගොත්ත බමුණා බුදුරදුන් හමුවේ පැවිදි උපසම්පදාව ලැබීය. උපසපන් වූ නොබෝ කලකින්ම ආයුෂ්මත් භාරද්වාජගොත්ත තෙරණුවෝ තනිව පිරිසෙන් වෙන්ව අප්‍රමාදීව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව නිවනට යොමු කළ සිත් ඇතිව වෙසෙන අතර කිසියම් කුලපුත්‍රයෙක් යමක් පතාගෙන ගිහි ගෙයින් පැවිදි බිමට පිවිසෙන්නේ ද පැවිද්දේ අවසාන පරමාර්ථය වූ ඒ උතුම් වූ රහත් ඵලය මෙලොව දී නොබෝ කලකින් ම තමන් ම අවබෝධකරගෙන එයට පත්වී විසූහ. බ්‍රහ්මචරියාව පිළිපැද නිමවන ලදී. කළ යුතු සියල්ල අවසන් කරන ලදී. මේ රහත් බව සඳහා තවත් කළයුක්තක් නැතැයි වටහා ගත්හ. භාරද්වාජගොත්ත තෙරණුවෝ රහතන් වහන්සේලා අතරින් කෙනෙකු බවට පත්වූහ.

භාරද්වාජගොත්ත තෙරණුවන් රහත් වූයේ යැයි සූත්‍රයේ සැකෙවින් සඳහන් වුවත් උන්වහන්සේට එක්වර ම එසේ රහත් විය හැකි නොවීය. උපසම්පදාවීමට ද නොහැකි විය. මන්ද උන්වහන්සේට ගිහි ජීවිතයේ තිබූ ණය බර ආදිය නිසා ය.

බුදුරජාණන් වහන්සේ පසුදා භාරද්වාජගොත්ත තෙරණුවන් ද සමඟ කොසොල් මහ රජතුමාගේ මාළිගයට වැඩම කළහ. රජතුමා වහ වහා අසුන් පණවා බුදුරදුන් හා තෙරණුවන් වඩා හිඳුවා ප්‍රණීත ආහාරපාන පිළියෙල කොට බුදුරදුන්ට දන් බෙදීමට සැරසුණේ ය. උන්වහන්සේ පාත්‍රය වැසූහ. එවිට රජතුමා "ස්වාමීනි මගෙන් කිසියම් වරදක් සිදුවී ද නැතහොත් ඔබ වහන්සේට කිසියම් කරදරයක් දැයි" විමසීය. බුදුරජාණන් වහන්සේ "මහරජ මට කිසි කරදරයක් නැත. කරදරය ඇත්තේ අර මහළු තෙරුන්ට" යැයි භාරද්වාජගොත්ත තෙරණුවන් පෙන්නූහ. රජතුමා උන්වහන්සේ වෙත ගොස් වැඳ "ස්වාමීනි, ඔබ වහන්සේට ඇති පළිබෝධය කුමක්ද"යි විමසීය. මහරජ ණය බර යැයි තෙරණුවෝ කීහ. කොපමණදැයි විමසූ විට උන්වහන්සේට කියා නිමකරන්නට නොහැකි විය. අන්තිමේ දී රජතුමා බහු ධීතුක බ්‍රාහ්මණයාගේ ණය හිමියෝ පැමිණෙත්වායි නුවර පුරා අඬබෙර යවා ඔවුන් ගෙන්වා ලේඛන අනුව සියලු ණය ගෙවා දැමීමට නියම කළේ ය.

නැවත තවත් පලිබෝධ තිබේදැයි තෙරුන්ගෙන් විමසීය. එවිට උන්වහන්සේ වැන්දඹු දූවරු හත් දෙනාගේ පළිබෝධය ණය බරටත් වැඩි යැයි කීහ. එකෙනෙහි ම රජතුමා ඒ දූවරු හත් දෙනාම දරුවන් සමග ගෙන්වා තමාගේ දූවරුන් ලෙස රජගෙයි වසන්නට සලස්වන ලෙස නියම කළේ ය. තවත් පළිබෝධ ඇද්දැයි විමසූ විට එකක් ඇත ඒ බැමිණිය යැයි කීහ. රජතුමා ඇය සිය මිත්තණි තනතුරේ තබා රජගෙදරට ගෙන්වා වාසය කරවන්නට නියම කළේ ය. තවත් පළිබෝධ ඇද්දැයි විමසූ විට තෙරණුවෝ නැතැයි කීහ. අනතුරුව රජතුමා සිවුරු පිරිකර ගෙන්වා තෙරුන්ට පිරනමා "ස්වාමීනි, මෙතැන් සිට ඔබවහන්සේගේ පැවිදි ජීවිතය මා සතු ය. චීවරාදී සියලු සිව්පසය සැපයීම අප සතු ය. ඔබවහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ සිත් ගෙන මහණ දම් කරනු මැනවැයි" ඉල්ලා සිටියේ ය. ඒ අනුව උපසම්පදාව ලැබූ භාරද්වාජගොත්ත තෙරණුවෝ නොබෝ කලකින් රහත් බවට පත් වූහ.

**අභ්‍යාස**

01. මේ බමුණාගේ දුක්බර පුවත ඔබේ බසින් කියන්න.
02. අද ගෙදර දොරේ දී මිනිසුන්ට විඳින්නට සිදුවන මෙවැනි දුක් ගැහැට ගැන ඔබේ අදහස් දක්වන්න.
03. මහණකම සැහැල්ලු ය (සුවය) යන මාතෘකාවෙන් කෙටි වාක්‍ය රචනයක් ලියන්න.

### පුහුණුවට

සම්බාධොයං ඝරාවාසො රජස්සායතනං ඉති
අබ්භොකාසොව පබ්බජ්ජා ඉති දිස්වාන පබ්බජි

(මේ ගිහිගෙය දුක් කරදර සහිතය. කෙලෙස් දූවිල්ලට ආකරයකි. පැවිද්ද නම් අභ්‍යවකාශය සේ නිදහස් ය. බාධා රහිතය. යන මේ කාරණය දැක පැවිදි වූවෙමි.
(සුත්තනිපාත පබ්බජ්ජා සුත්ත)

15 පාඩම

# මිහිරි වදනින් අනුන් සනසමු

**(සුභාසිත සූත්‍රය)**

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුතුමාගේ ජේතවනාරාමයෙහි වැඩ වෙසෙන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි'යි, භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු ස්වාමීනී යැයි, භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

මහණෙනි, අංග හතරකින් යුත් වචනය සුභාෂිතයක් හෙවත් මැනවින් කියන ලද වචනයක් වන්නේ ය. දුර්භාෂිතයක්, නරක වචනයක් නොවන්නේ ය. එසේ ම නිවැරැදි වචනයක් මෙන් ම නුවණැත්තන්ගේ අපවාදයට ලක් නොවන වචනයක් ද වන්නේ ය. ඒ කවර අංග සතරකින් යුත් වචනයක් ද යත්,

''මහණෙනි, මේ සස්නෙහි භික්ෂුවක් සුභාෂිතයක් ම කියයි. දුර්භාෂිතයක් නොකියයි. දැහැමි වචනයක් ම කියයි. නොදැහැමි වචන නොකියයි. ප්‍රිය වචනයක් ම කිය යි. අප්‍රිය වචන නොකියයි. සත්‍ය වචනයක් ම කියයි. මුසාවක් නොකියයි. මහණෙනි, මෙකී අංග සතරකින් යුක්ත වචනය සුභාෂිතයක් වෙයි. දුර්භාෂිතයක් නොවෙයි. නිවැරදි වචනයක් ද නුවණැත්තන්ගේ ගැරහීමට ලක් නොවන වචනයක් ද වෙයි.

භාග්‍යවතුන් වහන්සේ අනතුරුව මෙසේ ද වදාළ සේක. බුද්ධාදී සත්පුරුෂයෝ සුභාෂිතය උතුම්ම වචනය යැයි පැවසූහ. දැහැමි වචන ම කිවයුතු ය. අදැහැමි වචන නොකිව යුතු ය. එය දෙවැන්නයි. ප්‍රිය වචනම කිව යුතු ය. අප්‍රිය වචන නොකිව යුතු ය. එය තුන් වැන්නයි. සැබෑවක්ම කිව යුතු ය. මුසා බස් නොකිව යුතු ය. ඒ සිවු වැන්න යි.

ඉක්බිති ආයුෂ්මත් වංගීස තෙරණුවෝ හුනස්නෙන් නැඟිට සිවුරු ඒකාංස කරගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳගෙන "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මටත් කරුණක් වැටහේ, මටත් කරුණක් වැටහේ යැයි බුදුරදුන්ට සැලකළ හ. එවිට බුදුරජාණන් වහන්සේ ඔබට වැටහෙන දේ පවසන්නැයි වදාළ සේක. එවිට ආයුෂ්මත් වංගීස තෙරණුවෝ බුදුරදුන් හමුවේ සුදුසු ගාථාවලින් බුදුන්ගේ දේශනාවට මෙසේ ප්‍රසංශා කළ හ.

> **''තමෙව වාචං භාසෙය්‍ය, යායත්තානං න තාපයෙ;**
> **පරෙචන විහිංසෙය්‍ය, සා වෙ වාචා සුභාසිතා''**

යම් වචනයක් කරණකොට ගෙන තමාත් නොතැවෙන්නේ ද අනුනුත් නොවෙහෙසෙන්නේ ද ඒ වචනය ඒකාන්තයෙන් ම සුභාෂිතයකි. එබඳු වචනය ම කිව යුත්තේ ය.

**"පියවාචමෙ භාසෙය්‍ය යා වාචා පතිනන්දිතා**
**යං අනාදාය පාපානි පරෙසං භාසතෙ පියං"**

යම් වචනයක් කවුරුත් ප්‍රිය කරන්නේ ද ඒ ප්‍රිය වචනම කිව යුත්තේ ය. අනුන්ට අප්‍රිය පවිටු වචන නොගෙන ප්‍රිය වචන ම ගෙන කථා කළ යුත්තේ ය.

**"සච්චං වෙ අමතා වාචා, එස ධම්මො සනන්තනො;**
**සච්චෙ අත්ථෙ ච ධම්මෙ ච, ආහු සන්තො පතිට්ඨිතා"**

සත්‍ය වචනය ඒකාන්තයෙන්ම අමා වචනය යි. යන මෙය ඉතා පැරණි සනාතනික ධර්මයකි. වචන කීමෙහි දී සත්පුරුෂයෝ සත්‍යයෙහි ද අර්ථයෙහි ද ධර්මයෙහි ද පිහිටා කතා කරති යි කියති.

**"යං බුද්ධො භාසතී වාචං, ඛෙමං නිබ්බානපත්තියා;**
**දුක්ඛස්සන්තකිරියාය, සා වෙ වාචානමුත්තමා"ති.**

බුදුරජාණන් වහන්සේ නිවනට පැමිණීම පිණිස ද දුක් කෙළවර වීම පිණිස ද හේතුවන යම් උතුම් වචනයක් වදාරණ සේක් ද එය වචන අතුරින් උතුම් ම වචනය වන්නේ ය.

මෙම සූත්‍රයෙන් විස්තර වන්නේ සුභාෂිතය යි. සුභාෂිතයට විරුද්ධ වචනය දුර්භාෂිතය යි. දුර්භාෂිතය අංග හතරකින් යුක්ත ය. එනම් මුසාවාද, පිසුණා වාචා, ඵරුසා-ාවාචා, සම්පප්ඵලාප යන අංග හතරයි. එම අංග සතරින් මිදුණු වචනය සුභාෂිතයක් වෙයි. සුභාෂිත යනු මැනවින් කියන ලද දෙයයි. එනම් යහපත ගෙන දෙන වචනය යි. දුබ්භාසිත යනු නරක ලෙස කියන ලද දෙය යි. ඒ අවැඩ සිදු වන වචන යි.

**අනවජ්ජා** - සුභාෂිතය නිවැරදි වචනයක් වෙයි. එනම් බොරුව, කේලම, ඵරුෂ වචන, නිශ්ඵල වචන යන වැරදිවලින් නිදොස් වචනයක් වෙයි.

**අනනුවජ්ජා ච විඤ්ඤූනං** - ඔබ කතාකරන වචනය බොරුව කේලම ආදී සතර වරදට අයත් එකක් වුවහොත් එය නුවණැත්තන්ගේ නින්දාවට ලක්වන්නේ ය. ඒවායින් තොර ව සුභාෂිතයෙහි යෙදුණ හොත් නුවණැත්තන්ගේ නින්දාවට ලක් නොවන්නේ ය.

මෙම සූත්‍රයේ සුභාෂිතයේ අංග හතරක් දක්වෙයි. එනම් ඔබ කියන දේ සුභාෂිතයක් විය යුතු ය. ධර්මය විය යුතු ය. ප්‍රිය දෙයක් විය යුතු ය. සත්‍යයක් විය යුතු ය. මේ ආකාරයෙන් කියන ලද්දේ ද ඉහත කී වැරදි වචනයේ අංග හතරමයි. එනම් සුභාෂිතයක් විය යුතු ය. දුර්භාෂිතයක් නොවිය යුතුයැයි කීයේ පිසුණා වාචා හෙවත් කේලම් නොවන සමගි කරන වචනයක් විය යුතු ය යන්නයි. ධර්මයක් විය යුතුය අධර්මයක් නොවිය යුතු ය යන්නෙන් කියවෙනුයේ සම්ඵප්පලාපයක් නොවිය යුතුය අර්ථවත් වචනයක් විය යුතුය යන්නයි. ප්‍රිය වචනයක් විය යුතුය අප්‍රිය වචනයක් නොවිය යුතුය යන්නෙන් කියවුණේ ප්‍රිය වචනයක් මිස ඵරුෂ වචනයක් නොවිය යුතු බවයි. හතරවැන්නෙන් කියවුණේ සත්‍යයක් ම විය යුතු ය. බොරුවක් නොවිය යුතු ය යන්නයි. මේ අනුව සුභාසිතයක් නම් මේ අංග හතරෙන් යුක්ත විය යුතු ය.

අංගුත්තර නිකායයේ පංචක නිපාතයේ සුභාසිත වාචා සූත්‍රයේ සුභාසිතයක තිබිය යුතු අංග පහක් දක්වේ.

**01. කාලෙන ච භාසිතා හොති - සුදුසු කල්හි හෝ තැනට සුදුසු පරිදි කියූවක් වෙයි.**
**02. සච්චා ච භාසිතා හොති - සත්‍යයක් කියූයේ වෙයි.**
**03. සණ්හා ච භාසිතා හොති - මට සිලිටුව කියූවක් වෙයි.**
**04. අත්ථ සංහිතා ච භාසිතා හොති - අර්ථවත්ව කියූවක් වෙයි.**
**05. මෙත්ත චිත්තෙන ච භාසිතා හොති - මෙත් සිතින් කියූවක් වෙයි.**

මේ අංගයන්ගෙන් යුතුව කියූ දෙය සුභාෂිතයක් වෙයි. නිවැරදි වචයක් වෙයි. ඥාණවන්තයනගේ නිග්‍රහයට ලක් නොවේ.

## කිවයුතු දේ සහ නොකිව යුතු දේ

අප මෙකෙත් කතාකළේ කිවයුතු දේ සහ නොකිවයුතු දේ ගැන ය. කිවයුතු දේ සුභාෂිතය යි. නොකිවයුතු දේ දුර්භාෂිතය යි. දිනක් අභය රාජ කුමාරයා "ස්වාමීනි, ඔබ වහන්සේ කෙනෙකුට අප්‍රිය අමනාප වචනයක් වදාරණ සේක් දැයි බුදුරදුන්ගෙන් ඇසීය. ඊට පිළිතුරු දෙමින් උන්වහන්සේ තමන් කියන සහ නොකියන දේ පිළිබඳ ව කරුණු හයක් වදාළ සේක.

**01. යම් වචනයක් සිදු නොවූවක් ය. මුසාවක් ය අවැඩ දායක වූවක් ය. එය අනුන්ට අප්‍රිය අමනාප වචනයක් යැයි ද දනී නම් තථාගතයන් වහන්සේ එම වචනය නොපවසති.**

**02. යම් වචනයක් සිදුවූවක් ය. සත්‍යයක් ය. එහෙත් කීම අවැඩදායකය. එය ද අනුන්ට අප්‍රියය අමනාපයැයි දනිත් නම් තථාගතයන් වහන්සේ එම වචනය ද නොපවසති.**

**03. යම් වචනයක් සිදුවූවක් ය. ඇත්තක් ය. වැඩදායක ය. එය ද අනුන්ට අප්‍රියය. අමනාපය යැයි දනිත් නම් එහි දී තථාගතයන් වහන්සේ එයට කාලය දන සුදුසු නම් පමණක් වදාරණ සේක.**

04. යම් වචනයක් සිදුනොවූවක් ය. අසත්‍යක් ය. අවැඩදායක යැයි දනිත්නම් එය අනුන්ට ප්‍රිය මනාප වුවත් තථාගතයන් වහන්සේ නොපවසන සේක.

05. යම් වචනයක් සිදු වූවක් ය. ඇත්තක් ය. එහෙත් අවැඩදායක යැයි දනිත්නම් එය අනුන්ට ප්‍රිය මනාප වුවත් තථාගතයන් වහන්සේ එම වචනය ද නොපවසන සේක.

06. යම් වචනයක් සිදුවූවක් ය. ඇත්තක් ය. වැඩදායක යැයි දනිත්නම් එය අනුන්ට ද ප්‍රිය මනාප වුවත් එහි දී තථාගතයන් වහන්සේ කල් බලා සුදුසු නම් පමණක් වදාරණ සේක. ඒ මන්ද යත් රාජකුමාරය තථාගතයන් වහන්සේට සත්වයන් කෙරෙහි අනුකම්පාවක් ඇති හෙයිනි.

මේ අනුව බුදුරජාණන් වහන්සේ සිදු නොවූ දෙයක්, අසත්‍යවූ දෙයක් හෝ අවැඩ දායකවූ දෙයක් කිසිසේත් නොවදාරති. සිදු වූ සත්‍ය වූ වැඩ දායක වූ යන සියලු යහපත් ලක්ෂණයන්ගෙන් යුත් දෙයක් වුව ද උන්වහන්සේ පවසන්නේ ඒ වෙලාවට ඒ අවස්ථාවට සුදුසු නම් පමණකි. එය අසන්නාට ප්‍රිය ද අප්‍රිය ද යන්න උන්වහන්සේ නොසලකති. උන්වහන්සේ එසේ කරන්නේ සත්වයන් කෙරෙහි අනුකම්පාව ඇති නිසා යැයි පැවසීමෙන් කියවෙන්නේ ඇත්ත වුවත් කීමෙන් මිනිසුන්ට හානියක් සිදු වීමට ඉඩ ඇති බැවිනි.

### අප දැනගත් සියලු දේ කීම සුදුසු ද?

දිනක් වස්සකාර නම් මගධ මහාමාත්‍යවරයා බුදුරදුන් වෙත පැමිණ මෙසේ පැවසී ය. පින්වත් ගෞතමයන් වහන්ස, යම් කිසිවෙක් තමන් දුටු දෙයක් මම මෙය දුටුවෙමියි කියයි නම් එහි වරදක් නැත. ඇසූ දෙයක් ඇසුවෙමි'යි කියයි නම්, නාසයෙන් දිවෙන් කයින් දැන ගත් දෙයක් මම මෙය දැන ගතිමි'යි කියයි නම් හෝ සිතට සිතුණු දෙයක් මට මෙය සිතුණේ යැයි කියයි නම් එසේ කීමෙහි කිසිවරදක් නැත යනු මගේ පිළිගැනීම ය"

වස්සකාර බමුණා මෙසේ පැවසූ විට බුදුරජාණන් වහන්සේ "බ්‍රාහ්මණය මම දුටු සෑම දෙයක් ම කිව යුතු යැයි ද නොකියමි. නොකිය යුතු යැයි ද නොකියමි. ඇසුණු සෑම දෙයක් ම නාසයට දිවට කයට දැනුණු සෑම දෙයක් ම හෝ සිතට සිතුණු සෑම දෙයක් ම කිව යුතු යැයි ද නොකියමි. නොකිව යුතු යැයි ද නොකියමි.

බ්‍රාහ්මණය, දුටු යමක් කීමෙන් අකුසල ධර්ම වැඩෙයි නම් කුසල ධර්ම පිරිහේ නම් එවැනි දුටු දේ නොකිව යුතුයැයි කියමි. යම් කිසි දුටු දෙයක් කීමෙන් අකුසල ධර්ම පිරිහේ නම් කුසල ධර්ම වැඩේ නම් එවැනි දුටු දේ කිවයුතු යැයි කියමි.

ඇසූ යම් දෙයක්, නාසයට, දිවට හෝ කයට දැනුණු යම් දෙයක් නැතහොත් සිතට සිතුණු යම් දෙයක් පැවසීමෙන් අකුසල ධර්ම වැඩේ නම් කුසල ධර්ම පිරිහේ නම් එසේ ඇසුණු දැනුණු සිතුණු දේ නොකිව යුතුයැයි කියමි. ඒවා පැවසීමෙන් අකුසල ධර්ම පිරිහේ නම් කුසල ධර්ම වැඩේ නම් එබඳු ඇසුණු, දැනුණු, සිතුණු දේ කිවයුතු යැයි කියමි"යි වදාළ සේක.

මෙසේ අප කතාබහේ දී බොරු කේළම් පරුෂ වචන සම්පප්ප්‍රලාප යන දුර්වචනවලින් වැළකිය යුතු ය. අසභ්‍යවචන අප්‍රිය වචනවලින් වැළකිය යුතු ය. මට සිළුටු ප්‍රිය වචනයෙන් කතා කළ යුතු ය. දහම් දෙසීමේ දී අසන්නාට ප්‍රිය වෙන්නට යැයි කියා අභූත, අසත්‍ය, අවැඩදායක, ශ්‍රමණයන් වහන්සේට නොගැලපෙන වචන නොපැවසිය යුතු ය. ඇසුණු පමණින් දැනුණු පමණින් සිතුණු පමණින් කටට ආ පමණින් කිසිවක් නොකිව යුතු ය. ප්‍රිය වචන දැහැමි වචන කථා කිරීම භික්ෂූන් වහන්සේ නමකගේ අනිවාර්ය ලක්ෂණයක් බව සිත තබා ගත යුතු ය.

**අභ්‍යාස**

01. වචනයක් සුභාෂිතයක් වීමට සම්පූර්ණ විය යුතු අංග මොනවා ද?
02. බුදුරජාණන් වහන්සේ පවසන දේ සහ නොපවසන දේ පැහැදිලි කරන්න.
03. ප්‍රිය වචන කථාකරන භික්ෂූන් වහන්සේ කාගේත් ප්‍රසාදයට ලක්වේ යන මැයෙන් ශිෂ්‍ය සමිතියට කතාවක් පිළියෙල කරන්න.

16 පාඩම

# අභිධර්මය - I

## හැඳින්වීම

එදා අපේ පිරිවෙනේ ත්‍රිපිටක ධර්ම දිනය යෙදී තිබුණා. ත්‍රිපිටක ධර්ම විෂය භාර පණ්ඩිත හාමුදුරුවන්ගේ ඇරයුම පරිදි විශ්වවිද්‍යාල කථිකාචාර්ය ස්වාමීන් වහන්සේ නමක් විශේෂ දේශනය සඳහා වැඩම කළා. උන්වහන්සේ අභිධර්මයේ චිත්ත පරමාර්ථය අළලා ඉතා සාරගර්භ දේශනයක් පැවැත්වූවා. ඒ පිළිබඳ සංක්ෂිප්ත සටහනකි මේ.

ගරුතර පරිවේණාධිපතීන් වහන්ස, ත්‍රිපිටක ධර්ම විෂයභාර මාගේ කල්‍යාණ මිත්‍ර ස්වාමීන් වහන්ස, පින්වත් ශිෂ්‍ය හිමිවරුනි, පිරිවෙන් ත්‍රිපිටක ධර්ම දිනය වෙනුවෙන් අභිධර්මයේ චිත්ත පරමාර්ථය පිළිබඳ ඔබ සමග සාකච්ඡාවක යෙදීමට ලැබීම මා භාග්‍යයක් කොට සළකනවා. ගරුතර හිමිවරුනි, බුදුරජාණන් වහන්සේ විසින් දෙසන ලද, පණවන ලද ධර්ම විනය පිටක වශයෙන් තුනකට බෙදීයනවා. එයින් අභිධර්මය තුන්වන පිටකයයි. අනෙක් පිටක දෙක නම් සූත්‍ර පිටකය සහ විනය පිටකය යි. සූත්‍ර පිටකයේ ඇත්තේ බුදුරජාණන් වහන්සේ පන්සාළිස් වසරක් මුලුල්ලේ යම් යම් පුද්ගලයන්ට ඒ ඒ පුද්ගලයන්ගේ අදහස් හා චරිතවලට අනුකූලව කළ දේශනාවන් ය. විනය පිටකයේ ඇත්තේ භික්ෂූන් වහන්සේලාට පණවන ලද විනය ශික්ෂාපද සහ ඒවා පිළිබඳ පරිවාර විස්තරයි. මේ පිටක දෙකේ දී ම භාවිත කර ඇත්තේ දෙවි මිනිසුන්, ගිහි පැවිදි, ගහ කොළ දිව්‍යලෝක අපාය ආදී අපට පිටතින් පෙනෙන සම්මත, නම් ගම් භාවිත කරමින් කළ දේශනාවන් ය. එනිසා ඒවා සම්මුති දේශනා නමින් හැඳින්වෙයි.

අභිධර්ම පිටකයේ ඇත්තේ ලෝකයේ යථාර්ථය හෙවත් සැබෑ තත්වය පිළිබඳ කරන දේශනාවන් ය. එනිසා එම අභිධර්ම පිටකයේ භාවිත කෙරෙන වචනත් පරමාර්ථයට අදාළ වචනයි. උදාහරණයක් වශයෙන් එහි කිසි තැනක මිනිසා කියා හෝ කය, ශරීරය යනුවෙන් යෙදී නොමැත. ඒ වෙනුවට යොදන්නේ පංචස්කන්ධය යන්නයි. මෙසේ පරමාර්ථය ම භාවිත කරමින් කළ දේශනාව නිසා එය පරමාර්ථ දේශනා නමින් හැඳින්වේ. මෙම දේශනාව අභිධර්මය නමින් හැඳින්වෙන්නේ ද මෙම විශේෂ තත්ත්වය නිසා ය. **අභි+විසිට්ඨො = ධම්මො අභිධම්මො** යන විග්‍රහය අනුව අභිධර්මය යනු විශේෂිත ධර්මය යි. අභි යන උපසර්ගයෙන් කියවෙන්නේ විශේෂිත බවයි. ඒ විශේෂිත බව නම් සම්මුතියෙන් ඔබ්බට ගිය පරමාර්ථ සත්‍යය එයින් ප්‍රකාශ වීමයි. සම්මුතිය යනු සාමාන්‍ය සත්‍යය යි. පරමාර්ථය යනු විශේෂ සත්‍යය යි. එනම් සැබෑ තත්ත්වය යි.

අභිධර්මයේ මෙසේ පර්මාර්ථ හෙවත් ප්‍රධාන ධර්ම කොට්ඨාස සතරක් ඇත. එනම්

චිත්ත පරමාර්ථය
චෛතසික පරමාර්ථය

රූප පරමාර්ථය සහ
නිර්වාණ පරමාර්ථය යි.

පරමාර්ථය යනු කුමක් ද? මේ ලෝකයේ හැදී වැඩී සකස් වී පවතින මනුෂ්‍ය ශරීරය ඇතුලු සියලූ ම දේ, කතාවන් ක්‍රියාවන් වගේ ම සිතුම් පැතුම්වල සැබෑ තත්වය පරමාර්ථයයි. උදාහරණයක් විදිහට වාහනයක් කියන්නේ හදලා තියෙන දෙයක්. එහි කොටස් වෙන් කළාට පස්සේ වාහනයක් නැහැ. එහි තිබෙන්නේ යකඩ, ප්ලාස්ටික්, රබර් වගේ ද්‍රව්‍ය රාශියක්. ඒවා ක්‍රමානුකූලව නිසි පරිදි එකලස් කළාම වාහනයක් වෙනවා. ඒ අනුව කාරය බසය කියන්නේ පරමාර්ථය නොවන බව අපට පේනවා. මේ ශරීරයත් එසේමයි. සැබැවින් ම ශරීරය කියා එකක් නැහැ. මිනිසා කියා කෙනෙක් නැහැ. තිබෙන්නේ රූප, වේදනා, සඤ්ඤා සංඛාර, විඤ්ඤාණ කියන ස්කන්ධ පහයි. රූපය කියන්නේ කෙස්, ලොම්, නිය, දත් ආදී කොටස් තිස්දෙකක්. එහෙමත් නැත්නම් පඨවි, ආපෝ තේජෝ වායෝ කියන ධාතු හතරක්. ශරීරය හෝ මිනිසා කියන්නේ ඒ සඳහා යෙදෙන සම්මත නම් පමණයි. මේ ආකාරයට ලෝකයේ පවතින සෑම දේක ම සැබෑ තත්වය පරමාර්ථයයි. ඒ අනුව ලෝකයේ සියලු ම දේවල් බෙදාගෙන බෙදාගෙන ගියා ම අවසානයට ඉතිරිවන්නේ පරමාර්ථ සතරයි. ඒ තමයි චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ කියන පරමාර්ථ හතර.

චිත්ත යනු සත්වයාගේ සිතයි. සිතීමයි. චෛතසික යනු ඒ සිතේ පහළවන ලෝභ, ද්වේශ, මෝහ, ශ්‍රද්ධා, වීර්ය, සති වැනි සිතුවිලියි. රූප යනු පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතුන්ගෙන් සෑදී ඇති ශරීරය ගහකොළ ආදී රූපයි. නිබ්බාණ යනු මේ පඤ්චස්කන්ධයෙන් මිදීම හෙවත් නැවත් නූපදින තත්ත්වයයි.

මේ අභිධර්ම දේශනාව අනෙක් පිටක දෙක මෙන් තැන තැන කලින් කල කළ දේශනාවක් නොවේ. මෙය බුදුරජාණන් වහන්සේ විසින් දේශනාකරන ලද්දේ පුරා සිව් මාසයක් තිස්සේ තව්තිසා දෙව්ලොව දී මාතෘ දිව්‍යරාජයාටයි. ඒ අතරින් අප මේ ඉගෙන ගන්නට යන්නේ එහි පළමුවන පරමාර්ථය වන චිත්ත පරමාර්ථය යි.

**තත්ථ වුත්තාභිධම්මත්ථා - චතුධා පරමත්ථතො**
**චිත්තං චෙතසිකං රූපං - නිබ්බාණමිති සබ්බථා**

එම අභිධර්ම පිටකයෙහි වදාළ අභිධර්මාර්ථ පරමාර්ථ වශයෙන් චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ යැයි සමස්තයක් වශයෙන් සතර වැදෑරුම් වේ.

## චිත්ත පරමාර්ථය

**මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා**

(කයින් වචනයෙන් සිදුවන සියලු කුසලාකුසල ධර්මයෝ සිත පෙරටුකොට ඇත්තෝ ය. සිත ප්‍රධානකොට ඇත්තෝ ය. සිතින් නිපදවන්නෝ ය. )

අප නිතරම කරන ක්‍රියාකාරකම් තුනක් තිබෙනවා. එනම් සිතනවා. කියනවා. කරනවා. සිතන්නේ සිතින්. කියන්නේ මුවින්, කරන්නේ කයින්. එසේ වුවත් සිතින් සිතන්නේ නැතිව වචනයෙන් කිසිවක් කියන්නේ නැත. සිතින් සිතන්නේ නැතිව කයින් කිසිවක් කරන්නේ ද නැත. මේ නිසා වචනයෙන් කියන දේටත්, කයින් කරන දේටත් මුල්වන්නේ සිතයි. එසේ නම් ලෝකයේ සත්වයාගේ පැවැත්මේ ප්‍රධාන බලවේගය, මූලික ක්‍රියාකාරකම සිතයි. මුවින් යමක් කියන නමුත් මුවේ වචන කියා දෙයක් නැත. කයින් යමක් කරන නමුත් කයේ ක්‍රියා කියා දෙයක් නැත. ඇත්තේ කීමක් සහ කිරීමක් පමණි. එසේ ම සිතින් යමක් සිතනවා කීවත් සිත කියා දෙයක් නැත. ඇත්තේ සිතීමක් පමණයි. ඒ නිසා අප මේ සිත කියන්නේ සිතීමටයි.

ලෝකයේ අපාගත සත්වයන් මිනිසුන්, දෙවියන්, බ්‍රහ්මයන් වශයෙන් විවිධ සත්ත්ව කොට්ඨාස ජීවත්වෙනවා. මේ විවිධ අයගේ සිතුම් පැතුම් විවිධයි. ඒ විවිධ සිතුම් පැතුම් හෙවත් ඒ විවිධ ලෝකවල ජීවත්වන සත්ත්වයන්ට පහළවන සිත් පිළිබඳවයි අභිධර්මයේ චිත්ත කාණ්ඩයෙන් විස්තර කෙරෙන්නේ. ඒ නිසා ම ඒ සියලුම සිත් ඒ සත්ත්ව කොට්ඨාස අනුව කොටස් හතරකට බෙදෙනවා. එනම්,

| | |
|---|---|
| **කාමාවචර සිත්** | 54 |
| **රූපාවචර සිත්** | 15 |
| **අරූපාවචර සිත්** | 12 |
| **ලෝකෝතර සිත්** | 8 |
| **සියල්ල සිත්** | 89 |

යනුවෙනි.

කාමාවචර සිත් කියන්නේ සතර අපායත්, දිව්‍යලෝක හයත්, මනුෂ්‍ය ලෝකයත් යන එකොළොස් කාමලෝකවල ජීවත්වන සත්ත්වයන්ට පහළවන සිත්. රූපාවචර කියන්නේ ප්‍රථමධ්‍යාන ආදී රූපධ්‍යාන වඩා බ්‍රහ්මපාරිසජ්ජ බ්‍රහ්මලෝකයේ සිට අකනිට්ඨාව දක්වා ඇති සොළොස් රූපාවචර බ්‍රහ්මලෝකවල වෙසෙන සත්වයන්ට පහළවන සිත්. අරූපාවචර සිත් යනු ආකාසඤ්චායතන ආදී සතර අරූප ලෝකවල සත්ත්වයන්ට පහළවන සිත්. ලෝකෝත්තර සිත් නම් සෝවන් ආදී සතරමග සතර ඵලයන්ට පත්වූ උතුමන්ට පහළ වන සිත්.

### කාමාවචර සිත් 54

පංචකාමයෙහි ඇලී ගැලී කාමලෝකවල වෙසෙන සත්ත්වයන්ට පහළවන සිත් කාමාවචර සිත් නම් වන බව අපි දනිමු. එකොළොස් කාම භව අතරින් කේන්ද්‍රස්ථානය වන්නේ මනුෂ්‍ය ලෝකයයි. එහි වෙසෙන සත්ත්වයා පංචකාමය නිසා පින් හෙවත් කුසල් ද පව් හෙවත් අකුසල් ද යන මේ කර්ම රැස්කරයි. එයින් අකුසල කර්මවල විපාක වශයෙන් නිරය, තිරිසන්, ප්‍රේත, අසුර යන සතර අපායේ ඉපිද එම අකුසල කර්මවල විපාක විඳී. පංචකාමය නිසා ම මිනිස්ලොව දී කුසල කර්ම හෙවත් පින් රැස්කරන සත්ත්වයා මිනිස් ලොවම හෝ චාතුම්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිම්මාණරතිය, පරනිම්මිත

වසවර්තිය යන සදිව්‍යලෝකයෙහි ඉපිද ඒ කුසල විපාක විඳී. එයින් මිනිස් ලොව දී අකුසල් කරන සත්ත්වයාටත් සතර අපායේ දී එහිවිපාක විඳින සත්ත්වයාටත් පහළවන්නේ අකුසල් සිත් ය. එසේ ම මිනිස්ලොව දී කුසල් කරන සත්වයාටත් නැවත මිනිස්ලොව ම ඉපද හෝ දෙව්ලොව ඉපිද විපාක විඳින සත්ත්වයාටත් පහළවන්නේ කුසල් සිත් ය. කුසලය හෝ අකුසලය කරන විට කුසලාකුසල සිත් හෝ කර්ම සිත් වශයෙන් හැඳින්වෙන අතර ඒවා විපාක විඳිනවිට විපාක සිත් යනුවෙන් හැඳින් වේ.

### අකුසල් සිත් 12

ලෝභය, ද්වේශය, මෝහය යන අකුසල් සිතුවිලි තුන මුල්කොටගෙන ප්‍රාණඝාත ආදී දස අකුසල් කරනවිට පහළවන්නේ අකුසල් සිත් ය. ඒවා ලෝභ, ද්වේශ, මෝහ යන අකුසල් මුල්තුන අනුව සිත් 12 ට බෙදේ.

| | |
|---|---|
| **ලෝභමූලික සිත්** | 08 |
| **දෝස මූලික සිත්** | 02 |
| **මෝහ මූලික සිත්** | 02 |
| **සියල්ල** | 12 |

ප්‍රාණඝාතය අකුසලයකි. එය විනෝදය, ආදායම, ආහාරය වැනි ලෝභ අදහසකින් කරනවිට ලෝභ මූලික වේ. ප්‍රාණඝාතය ම කෝපයෙන්, පලිගැනීමේ අදහසින් කරනවිට දෝස මූලික වේ. එම ප්‍රාණඝාතය ම ශික්ෂාපද ගැන සැකයෙන් තීරණයක් නැතිව, අවිනිශ්චිත සිතින් කරන විට මෝහ මූලික වේ. මේ අනුව එක ම අකුසලය මේ තුන් ආකාරයෙන් ම සිදුවිය හැකි ය.

### ලෝභමූලික සිත් 08

01. සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත
02. සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිත
03. සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිත
04. සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිත
05. උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත
06. උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිත
07. උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිත
08. උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිත

සොමනස්ස සහගත නම් තමන් කරන අකුසලය හෝ වරද සතුටින් කරන බව ය. දිට්ඨිගත සම්පයුත්ත නම් එය වරදක් ය. එයින් නරක විපාක ලැබෙන්නේ ය යන්න පිළිබඳ පිළිගැනීමක් නැතිබව ය. දිට්ඨිගත විප්පයුත්ත නම් එය පවක් ය. නරක විපාක ලැබෙන්නේ යයි දැන දැනම කරන බව ය. අසංඛාරික නම් ඒ ක්‍රියාව හෝ කතාව කාගේවත් මෙහෙයවීමක් නැතිව තමාගේ ම උවමනාවෙන් කරන බව ය. සංසඛාරික නම් වෙනත් කෙනෙකුගේ හෝ බලවේගයක මෙහෙය වීමෙන් කරන බව ය.

01. ළමයෙක් ආශාව නිසා සන්තෝෂයෙන් 'වරදක් ය නරක විපාක ලැබේ ය' යන පිළිගැනීමක් ද නැතිව තමාගේ ම වුවමනාවෙන් යමක් සොරකම් කරයි. ඔහුට ඒ මොහොතේ පහළ වන්නේ සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිතයි.

02. එම සොරකම ම වෙනත් අයකුගේ කීම නිසා සතුටින් වරදක් යැයි නොපිළිගෙන කරන විට පහළ වන්නේ සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිතයි.

03. ඒ ළමයා ආශාවෙන් හා සතුටින් එය වරදක් බව දැන දැන තමන්ගේ වුවමනාවට සොරකම් කළොත් පහළ වන්නේ සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිතයි.

04. අනුන්ගේ කීම නිසා කළොත් පහළවන්නේ සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිතයි.

05. ළමයෙක් ආවාට ගියාට අමුතු සතුටක් නැතිව වරද වරදක් වශයෙන් ද නොසිතා තමන්ගේ කැමැත්තෙන් බොරුවක් කියයි. එවිට ඔහුට පහළ වන්නේ උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිතයි.

06. ඔහු එවැනි බොරුවක් ම ආවාට ගියාට අමුතු සතුටක් නැතිව වරද වරදක් වශයෙන් ද නොසිතා අනුන්ගේ කීම නිසා කියයි. එවිට ඔහුට පහළවන්නේ උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිතයි.

07. ඒ ළමයා එම බොරුව කියන්නේ අමුතු සතුටක් නැතිව එහෙත් වරදක් බව දැන දැන තමන්ට සිතුණු නිසා නම් ඔහුට පහළ වන්නේ උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිතයි.

08. ඔහු එවැනි බොරුවක් අමුතු සතුටක් නැතිව වරද වරද බව දැන දැන අනුන් කී නිසා කියයි නම් ඔහුට පහළ වන්නේ උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිතයි.

**දෝස මූලික සිත් දෙක.**

**දොමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංඛාරික සිත.**
**දොමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සසංඛාරික සිත.**

දෝමනස්ස සහගත යනු තමාට කිසියම් කරුණක් නිසා අසතුටක් ඇතිවීමයි. පටිඝ සම්පයුක්ත නම් එනිසා ම කෝපයට ද පත්වී සිටී ම ය.

1. කිසියම් ළමයෙක් තමාට විරුද්ධව ගුරුතුමාට කේළමක් කීම නිසා අසතුටට පත්වෙයි. ඒ නිසා ම කෝප වී ඒ කේළම කී ළමයාට පරුෂ වචනයෙන් බැණවදී. ඔහු එසේ බැණ වදින්නේ තමා ම එය දැනගෙන තමාගේ ම අදහසිනි. එවිට ඔහුට පහළ වන්නේ දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංඛාරික සිතයි.

2. තමාට විරුද්ධව කෙනෙකු කේලම් කී බව අසා ඇති වූ දොම්නසින් කෝපයට පත් ළමයෙක් වෙනත් කෙනෙකුගේ උසිගැන්වීම නිසා කේළම් කී ළමයාට එරුෂ වචනයෙන් බැණවදින්නේ නම් එවිට පහළ වන්නේ දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සසංඛාරික සිතයි.

**මෝහ මූලික සිත් දෙක.**

**උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත සිත.**
**උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත සිත.**

යම්කිසි කාරණයක් ගැන සිතන විට ඒ කාරණය හරිහැටි දැනගැනීමට නොහැකි සිත අඳුරක සිටිනවා වැනි ස්වභාවය මෝහයයි. මෝහය නිසා අරමුණක ස්වභාවය හරිහැටි තේරුම් ගැනීමට නොහැකි ය. ඒනිසා ම පින් පව්/කුසල් අකුසල්, මෙලොව පරලොව ආදී කිසිවක් ගැන නිසි තීරණයකට එළඹීමට ද නොහැකි ය. මේ මෝහය නිසා සිතේ ඇතිවන අහිතකර ස්වභාවයන් දෙකකි. එනම්,

**විචිකිච්ඡාව හෙවත් සැකයත්**
**උද්ධච්චය හෙවත් නොසන්සුන් කැළඹුණු ගතියත් ය.**

ඒ අනුව මෝහ මූලික සිත් දෙකකි.

1. පළමු වැන්න උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත සිතයි. නිසි තීරණයක් නැති නිසා සොම්නසක් හෝ දොම්නසක් ඇති නොවන බැවින් උපෙක්ඛා සහගත ය. විචිකිච්ඡාව යනු ධර්මයේ දී බුදුන් දහම් සඟුන් පිළිබඳ ව, ශික්ෂාපද සීලය පිළිබඳ ව, පෙර ජීවිත මතු ජීවිත පිළිබඳ ව නැතහොත් මෙලොව පරලොව පිළිබඳ ව පටිච්ච සමුප්පාදය හෙවත් හේතුඵල ධර්මය පිළිබඳ ව යන මේ කාරණා අට සම්බන්ධව සැක ඇතිවීමයි.

   මේ සැකය නිසා හොඳ නරක වටහාගත නොහැකි ය. බොහෝ විට සිත නැමෙන්නේ පස්කම් සුවයට මිස කුසලට නොවේ. පින්පව් ගැන ද හරි තීරණයක් නැති නිසා වැඩිපුර සිත නැමෙන්නේ පවට ය. මෙය අකුසල සිතක් වන්නේ ඒ නිසා ය.

2. මෝහය නිසා ඇතිවන දෙවන සිත උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත සිතයි. මෝහය නිසා නිසි තීරණයක් නැති බැවිනුත් සැක ඇතිවීම නිසාත් මීළඟට සිදුවන්නේ සිත අවුල්වීම ය. නොසන්සුන් වීම ය. හදිසිය නිසා කළබලයෙන් වැඩ කරන්නට ගොස් අවුල් වන්නා සේ මේ නොසන්සුන්කම නිසා ද දුර්වල වූ සිත බොහෝ විට පවට බර වේ.

මේ මෝහය පෘථජ්ජනයාගේ සියලු ම සිතිවිලිවලට හේතුවන අතර මේ කියන විචිකිච්ඡා සහ උද්ධච්ච යන අවස්ථා දෙකේ දී දැඩිව බලපායි.

**අට්ඨධා ලොභ මූලානි - දොස මූලානි ච ද්විධා**
**මොහ මූලානි ච ද්වෙති - ද්වාදසාකුසලා සියුං**

**අභ්‍යාස**

01. අකුසල් සිත් දොළහ වනපොත් කරන්න.
02. කාමාවචර සිත් පහළ වන්නේ කවර ලෝකවල සත්ත්වයන්ට ද?
03. අභිධර්මය ඒ නමින් හඳුන්වන්නේ කුමන අර්ථයකින් ද?

17 පාඩම

# අභිධර්මය - II

## අහේතුක සිත් 18

අභිධර්මයේ දී අකුසල් සිදුකිරීමට මුල්වන ලෝභ, දෝස, මෝහ යන හේතු තුනක් ද කුසල් සිදුකිරීමට මුල්වන අලෝභ, අදෝස, අමෝහ යන හේතු තුනක් ද යනුවෙන් හේතු හයක් තිබේ. ඒවා යෙදෙන කුසලාකුසල සිත් සහේතුක සිත් යැයි කියනු ලැබේ. ඒ හේතු හයෙන් එකක් හෝ හරිහැටි නොයෙදෙන සිත් අහේතුක සිත් නම් වේ.

**අකුසල විපාක සිත් ය.**
**කුසල විපාක සිත් ය.**
**ක්‍රියා සිත්**

යැයි අහේතුක සිත් කොටස් තුනකි. ඒවාට අහේතුක යැයි කියන්නේ ඉහත කී ලෝභාදී හේතු හය මුල්නොවන නිසා මිස ඒවා පහළ වීමට කිසිම හේතුවක් නැති නිසා නොවේ. මන්ද ලොව කිසිවක් හේතු නැතිව සිදු නොවන බැවිනි.

| | |
|---|---|
| **අකුසල විපාක සිත්** | 07 |
| **කුසල විපාක සිත්** | 08 |
| **ක්‍රියා සිත්** | 03 |
| **සියල්ල** | 18 |

## අකුසල විපාක සිත් 07

විපාකය යනු කුසලාකුසල කළ තැනැත්තාගේ සිතෙහි කුසලාකුසලයන්ගේ බලයෙන් අනාගතයේ හෝ ඵල ලබන අවස්ථාවේ ඇතිවන සිත් ය. සිත් උපදනා ස්ථාන වශයෙන් ද සිත්වලින් සිදුකරන කෘත්‍යයන්ගේ වශයෙන් ද අකුසල විපාක සිත් 07 කි. එනම්,

### 01. උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණ සිත

ඇසත්, අනිටු රූපයත් මුණ ගැසීම නිසා පහළවන මධ්‍යස්ථ වේදනාවෙන් යුත් අකුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත.

### 02. උපෙක්ඛා සහගත සොත විඤ්ඤාණ සිත

කනෙහි අනිටු ශබ්දය ගැටීම නිසා මධ්‍යස්ථ වේදනාවෙන් යුක්තව පහළවන අකුසල විපාක සෝත විඤ්ඤාණ සිත.

**03. උපෙක්ඛා සහගත සෝණ විඤ්ඤාණ සිත**

සෝණ හෙවත් නාසයෙහි අනිටු ගන්ධය ගැටීම නිසා මධ්‍යස්ථ වේදනාවෙන් යුක්තව පහළවන අකුසල විපාක සෝණ විඤ්ඤාණ සිත.

**04. උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණ සිත**

දිවෙහි අමිහිරි රසය ස්පර්ශ වීම නිසා මධ්‍යස්ථ වේදනාවෙන් යුක්තව පහළවන අකුසල විපාක ජිව්හා විඤ්ඤාණ සිත.

**05. දුක්ඛ සහගත කාය විඤ්ඤාණ සිත**

වේදනාකාරී ස්පර්ශයක් කයෙහි ගැටීම නිසා දුක් වේදනා දෙමින් ම පහළවන අකුසල විපාක කාය විඤ්ඤාණ සිත.

**06. උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිත**

ඉහත කී චක්ඛු විඤ්ඤාණ ආදී විඤ්ඤාණ විසින් ගන්නා ලද අරමුණු පිළිගන්නා මධ්‍යස්ථ වේදනා සහිත අකුසල විපාක සම්පටිච්ඡන සිත ය.

**07. උපෙක්ඛා සහගත සන්තීරණ සිත**

ඒ සම්පටිච්ඡන සිතින් පිළිගත් අරමුණ තීරණය කරන්නාක් මෙන් පහළවන මධ්‍යස්ථ වේදනාවෙන් යුත් අකුසල විපාක සන්තීරණ සිත.

**"චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං"** යන සූත්‍ර පිටකයේ එන විවරණය අනුව ඉන්ද්‍රියත් අරමුණත් ගැටුණු පමණින් විඤ්ඤාණ සිත් පහළ වේ. අභිධර්මයේ චිත්ත වීථි ක්‍රමය හෙවත් සිත ගමන් කරන ක්‍රමය අනුව එසේ පහළවුණ සිත ගත් අරමුණ සම්පටිච්ඡන සිතින් පිළිගන්නා අවස්ථාව ද සිතකි. එය සම්පටිච්ඡනය යි. එහි ස්වභාවය තීරණය කරන අවස්ථාව ද සිතකි. එය සන්තීරණය යි. මේ සන්තීරණ සිත දක්වා ම සැප හෝ දුක් හෝ හොඳ නරක හෝ වේදනාවක් දැනෙන්නේ නැත. මෙම අකුසල විපාක සිත් හතෙන් හයක ම වේදනාව උපෙක්ඛා සහගත හෙවත් මධ්‍යස්ථ වන්නේ මේ නිසා ය. ඒ අරමුණ සැප වේදනා හෝ දුක් වේදනා උපදවන්නේ සන්තීරණයෙන් පසුවයි. කාය විඤ්ඤාණ සිත පමණක් දුක්ඛ සහගත යැයි කීවේ මදුරුවෙක් විදින අවස්ථාව මෙන් අකුසල විපාක වේදනාව ශරීරයෙහි ගැටෙන්නේ ම දුකක් උපදවමින් බැවිනි.

මේවා අකුසල විපාක වන්නේ ඇයි? සත්ත්වයාට ඇස, කන නාසාදී ඉන්ද්‍රියයන් ලැබී ඇත්තේ පූර්ව කර්මානුරූපවය. ඒවාට හමුවන අරමුණු අනිටු අරමුණු වන්නේ පෙර කළ අකුසල විපාක වශයෙන් බවත්, එම ඉන්ද්‍රියයන්ට මිහිරි ඉෂ්ටාරම්මණ ලැබෙන්නේ පෙර කළ කුසල විපාක නිසා බවත්, අභිධර්මයේ ම ඉගැන්වේ. අප සැප දුක යැයි කියන්නේ ද

මෙයට ය. සැකෙවින් කිවහොත් දුක් ලැබෙන්නේ අකුසල කර්ම නිසා ය. සැප ලැබෙන්නේ කුසල කර්ම නිසා ය. ඒවා ඉන්ද්‍රිය නමින් හැඳින්වෙන විඤ්ඤාණවලට ඇතුළත් ව ඇත්තේ එම සැප දුක් විඳින්නේ ඉන්ද්‍රියයන් මගින් වන නිසා ය. මෙම කාරණය කුසල විපාක සිත්වලට ද මේ ආකාරයෙන් ම යොදාගත යුතු ය.

### අහේතුක කුසල විපාක සිත් 08

#### 01. උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණ සිත

ඇසත් ඉෂ්ට (සොඳුරු) රූපත් මුණගැසීම නිසා මධ්‍යස්ථ වේදනාවෙන් යුතුව පහළවන කුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත.

#### 02. උපෙක්ඛා සහගත සොත විඤ්ඤාණ සිත

සෝත හෙවත් කණත්, මිහිරි ශබ්දයත් මුණගැසීම නිසා මධ්‍යස්ථ වේදනාවෙන් යුතුව පහළවන කුසල විපාක සොත විඤ්ඤාණ සිත.

#### 03. උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණ සිත

ඝාණ හෙවත් නාසයත් සුගන්ධයත් මුණ ගැසීම නිසා මධ්‍යස්ථ වේදනාවෙන් යුතුව පහළවන කුසල විපාක ඝාණ විඤ්ඤාණ සිත.

#### 04. උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණ සිත

දිවත් මිහිරි රසයත් මුණ ගැසීම නිසා මධ්‍යස්ථ වේදනාවෙන් යුතුව පහළවන කුසල විපාක ජිව්හා විඤ්ඤාණ සිත.

#### 05. සුඛ සහගත කාය විඤ්ඤාණ සිත

සුඛ ස්පර්ශයක් කයෙහි ගැටීම නිසා පහළවන කුසල විපාක කාය විඤ්ඤාණ සිත.

#### 06. උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිත

ඉහත කී කුසල විපාක විඤ්ඤාණ සිත් පහට අරමුණු වූ මිහිරි අරමුණු පිළිගනිමින් පහළවන කුසල විපාක මධ්‍යස්ථ වේදනාවෙන් යුතු සම්පටිච්ඡන සිත.

#### 07. සොමනස්ස සහගත සන්තීරණ සිත

එසේ විඤ්ඤාණ පසට අරමුණු වන ඉතා මිහිරි අරමුණක් සතුටින් ම තීරණය කරමින් පහළවන කුසල විපාක සෝමනස්ස සහගත සන්තීරණ සිත.

08. උපෙක්ඛා සහගත සන්තීරණ සිත.

එකී විඤ්ඤාණ පසට අරමුණුවන ඉතා මිහිරි නොවූ මධ්‍යම අරමුණු තීරණය කිරීමේ දී පහළවන මධ්‍යස්ථ වේදනාවෙන් යුතු කුසල විපාක සන්තීරණ සිත.

අහේතුක ක්‍රියා සිත් 03.

මෙතෙක් දක්වන ලද සිත් පහළොව ම ලෝභ, දෝස ආදී හේතු නැති එහෙත් කර්ම විපාක වශයෙන් ලැබෙන සිත් ය. කර්මයකුත් නොවන කර්ම විපාකයකුත් නොවන සිත් වලට ක්‍රියා සිත් යැයි කියනු ලැබේ. සෑම සිතක් ම සිතේ ක්‍රියාකාරකමකි. එයින් කුසල ක්‍රියාවන් කුසල සිත් වශයෙන් ද අකුසල ක්‍රියාවන් අකුසල සිත් වශයෙන් ද ඒවායින් උපදවන විපාක විපාක සිත් වශයෙන් ද හඳුන්වන ලදී. මේ කිසිවකට නොගැනෙන ක්‍රියාකාරකම් තුනක් සිතෙහි තිබේ. ඒවා ඒ ක්ෂණයෙහි උපදින සිත් මිස පෙර හේතුවකින් හෝ කුසලාකුසල කර්ම වශයෙන් හෝ උපදින ඒවා නොවේ. ඒවා නම්,

01. උපෙක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජන සිත.

චක්ඛු ආදී පඤ්චද්වාරයට පැමිණෙන අරමුණු මෙනෙහි කරන මධ්‍යස්ථ වේදනාවෙන් යුතු සිත.

02. උපෙක්ඛා සහගත මනෝද්වාරාවජ්ජන සිත.

සිතට සිහිවන අරමුණු මෙනෙහි කරන මධ්‍යස්ථ වේදනාවෙන් යුතු මනෝද්වාරාවජ්ජන සිත.

06. සොමනස්ස සහගත හසිතුප්පාද සිත.

බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලාට රාගයෙන් තොරව හුදු සොම්නසින් සිනහ පහළවන සිත.

සිත බාහිර කිසිදු අරමුණක් නොගෙන පවතින අවස්ථාව භවංග සිත නමින් හැඳින්වේ. එය අරමුණුවලට යොමුවන අවස්ථාව ආවජ්ජන යැයි කියනු ලැබේ. ආවජ්ජන ක්‍රම දෙකකි.

1. පඤ්චද්වාරාවජ්ජන සිත

ඉන්ද්‍රියයන්ට මුණගැසෙන අරමුණු ආවර්ජන හෙවත් මෙනෙහි කිරීම.

2. මනෝද්වාරාවජ්ජන සිත

සිතට කල්පනා වන අරමුණ ආවර්ජනය හෙවත් මෙනෙහි කිරීම යනුවෙනි.

නිදසුනක් ලෙස කෙනෙක් නිදාසිටින විට සිත පවතින්නේ භවංග තත්වයේ ය. ඔහු ශබ්දයක් ඇසී අවදිවන විට ඒ භවංග සිත බිඳී ආවජ්ජන අවස්ථාවට පත්වේ. එය සිදුවන්නේ මෙසේ ය.

බැහැරින් ශබ්දයක් මතුවන විට මුලින් ම භවාංගය චලනය හෙවත් සැලීම වේ. දෙවනුව භවංග උපච්ඡේදනය හෙවත් භවංග සිතුවිලි පරම්පරාව සිඳීම සිදු වේ. ශබ්දය පංචද්වාරයෙන් එකක් වන කනට අරමුණු වන්නක් නිසා පංචද්වාරාවජ්ජන සිත තෙවනුව පහළ වේ. එය කනට අරමුණුවන විට සෝත විඤ්ඤාණ සිත පහළ වේ. මෙහි කියන ලද්දේ එකී පඤ්චද්වාරාවජ්ජන අවස්ථාවයි.

**මනොද්වාරාවජ්ජනය**

ඇතැම් අරමුණු පඤ්චද්වාරයට යොමු නොවී කෙලින් ම මනෝද්වාරයට ම පැමිණෙයි. එනම් කල්පනාවට යොමුවීමයි. සිහිකිරීමයි. එයට මනෝද්වාරාවජ්ජනය යැයි කියනු ලැබේ. මේ සිත් දෙකම පහළවීමට අරමුණු ඉන්ද්‍රියයන්හි ගැටීම හෝ සිතට කල්පනා වීම හේතුවන නමුත් ලෝභාදී හේතු තවමත් මුල්වී නැති නිසා අහේතුක ය. ඒවා කුසලාකුසල කර්ම හෝ විපාක කාර්යයක් තවම සිදුකර නොමැති නිසා ක්‍රියා සිත් නම් වේ.

**හසිතුප්පාදය.**

බුදු, පසේබුදු මහරහතන් වහන්සේලාට සිතේ ප්‍රසන්න භාවය නිසා උපන් සොම්නසින් සිනා පහළ වේ. එහි කුසල හේතුවක් හෝ අකුසල හේතුවක් නැත. කුසල කර්මත් නොවේ. අකුසල කර්මත් නොවේ. හුදෙක් සිතේ ප්‍රසන්න භාවයේ ක්‍රියාකාරකමක් පමණි. ඒ නිසා එය ද ක්‍රියා සිත් ගණයට වැටේ.

**සත්තාකුසල පාකානි පුඤ්ඤපාකානි අට්ඨධා**
**කිරිය චිත්තානි තීනීති අට්ඨා රස අහෙතුකා**

අහේතුක අකුසල් විපාක සිත් සතය, අහේතුක කුසල විපාක සිත් අට ය. අහේතුක ක්‍රියා සිත් තුන යැයි අහේතුක සිත් අටලොස් (18) වැදෑරුම් වේ.

**කාමාවචර කුසල් සිත්**

දාන, සීල, භාවනා, පත්තිදාන, පත්තානුමෝදනා, වෙයයාවච්ච, අපචායන, ධම්මසවන, ධම්මදේශනා, දිට්ඨිජ්ජුකම්ම යන දස පුණ්‍යක්‍රියා සිදුකිරීමේ දී සාමාන්‍ය ශ්‍රද්ධාවන්තයාට පහළවන කුසල් කාමාවචර කුසල් නමින් හැඳින්වේ. එසේ හැඳින්වෙන්නේ ඒවායින් ලැබිය හැක්කේ දිව්‍ය ලෝක සය සහ මනුෂ්‍ය ලෝකය යන කාම සුගතිවල සැප විපාක පමණක් වන හෙයිනි. එසේ කාම සුගතීන්හි විපාක දෙන කුසල් කරන තැනැත්තාට ඇතිවන කුසල සිත් අටකි. මේවාට මහා කුසල හෙවත් අටමහා කුසල් යැයි ද කියනු ලැබේ.

මෙය අටක් වන්නේ සෝමනස්ස සහගත හා උපෙක්ඛා සහගත යන වේදනාව අනුවත් ඥාන සම්පයුත්ත හා ඥාන විප්පයුත්ත යන ඥාන අනුවත් අසංඛාර හා සසංඛාර යන භේදය අනුව ය.

01. සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික සිත.
02. සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික සිත.
03. සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික සිත.
04. සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත.
05. උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික සිත.
06. උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික සිත.
07. උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික සිත.
08. උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත.

**සොමනස්ස සහගත**

දන් දීම් ආදී දස කුසලයෙහි යෙදෙන්නාගේ බලවත් ශ්‍රද්ධාව දර්ශන සම්පත්තිය හෙවත් සම්‍යග් දෘෂ්ටිය ප්‍රත්‍ය සම්පත්තිය, ප්‍රතිග්‍රාහක සම්පත්තිය, ප්‍රදේශ සම්පත්තිය, කාල සම්පත්තිය, යන මේවා රිසි සේ පහසුවෙන් ලැබීම, ඒ කුසල චේතනාව සෝමනස්ස සහගත වීමට හේතු වේ. මෙහි ප්‍රදේශ සම්පත්තිය හා කාල සම්පත්තිය යනු සුදුසු ප්‍රදේශයක වාසය කිරීමත් බුද්ධෝත්පාද කාලයක් වීමත් ය.

**උපෙක්ඛා සහගත**

එකී පරිවාර කරුණුකාරණා කැමැති සැටියෙන් නොලැබීම නිසා හෝ ශ්‍රද්ධා බලයේ අඩුබව නිසා හෝ සිත මධ්‍යස්ථ තත්වයෙන් පැවැතීමයි.

**ඤාණ සම්පයුත්ත**

කුසලය පිළිබඳ සැබෑ තත්වය දැනීම හෙවත් ඒවායින් ඉෂ්ට විපාක ලැබෙන්නේ යැයි දැනීම ප්‍රඥාව ලැබීමට හේතුවන කර්ම ශක්තිය තිබීම, බඹලොව සිට පැමිණීම, ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්ම මුහුකුරා යෑම නීවරණයන්ගෙන් සිත තදංග වශයෙන් හෝ නිරාවරණය වී සිටීම යන මේ කාරණා කුසල් සිතක් ඥාන සම්පයුක්ත වීමට හේතු වේ.

**ඤාණ විප්පයුත්ත**

ඉහත කී කාරණා ද යම් යම් දේ අඩුවීමෙන් දුර්වල වීමෙන් පුණ්‍ය කර්මය කරන අවස්ථාවේ සිත ඥාන විප්පයුත්ත විය හැකි ය. ප්‍රමාණවත් ඥානයෙන් තොරවිය හැකි ය.

**අසංඛාරික හා සසංඛාරික**

අනුන්ගේ නියෝගයක් හෝ මෙහයවීමක් නොමැතිබව. තමාගේ ම පසුබැසීමකුත් නැතිව තියුණු එඩිතර සිතින් යුක්තව පුණ්‍ය කර්මය කරන විට එය අසංඛාරික වේ. ඊට අමතරව ඒ තැනැත්තා නිවාස පහසුකම් ඍතු පහසුකම්, ආහාර පහසුකම් ආදියෙන් පිරිපුන්ව සිටීමත් දන් දී පුරුදු බවත් අසංඛාර වීමට හේතුවන බව දැක් වේ.

සසංඛාරික යනු ඉහත කී කාරණා දුර්වල වීමෙන් හෝ අනුන්ගේ මෙහෙය වීමෙන් සිදුකිරීමයි.

01. ඉහත කී පරිදි පින්කමට අවශ්‍ය කාරණා සහ හුරුපුරුදුකම් පහසුවෙන් ලැබී තිබීම නිසා සොම්නසින් යුක්තව කර්ම කර්මඵල දන්නා නුවණින් ද යුක්තව අනුන්ගේ මෙහය වීමක් ද නැතිව දානාදී දසකුසල කර්මයන් සිදුකිරීමේ දී සෝමනස්ස සහගත ඥාන සම්පයුක්ත අසංඛාරික යන පළමුවන කුසල් සිත උපදී.

02. සොම්නසින් හා නුවණින් යුක්තව අනුන්ගේ මෙහෙයවීමෙන් හෝ නැවත නැවත පසුබසින තමා, තමා විසින් ම උනන්දු කරවීමෙන් ද සසංඛාරික වේ.

03. කුඩා දරුවෙක් හෝ ආගම දහම නොදන්නා කෙනෙකු වැනි පුද්ගලයෙක් සොම්නසින් පමණක් යුක්තව කම්පල දන්නා නුවණින් තොරව තමාගේ ම උනන්දුවෙන් දස පුණ්‍ය ක්‍රියාවෙන් යමක් කරන විට සෝමනස්ස සහගත ඥාන විප්පයුක්ත අසංඛාරික සිත උපදී.

04. එවැනි කෙනෙක් සොම්නසින් යුක්තව කම්පල අදහන නුවණින් තොරව මව්පියන් හෝ වෙනත් කෙනෙකුගේ මෙහෙයවීමකින්, උපදේශයකින්, නියෝගයකින් දස කුසලයෙන් යමක් කරන විට සෝමනස්ස සහගත ඥන විප්පයුක්ත සසංඛාරික සිත උපදී.

05. පින්කම පිළිබඳ සොම්නස ඇතිව ශ්‍රද්ධාව හුරු පුරුදුකම් වැනි කාරණා තමාවෙත නොතිබීමත් පින්කමට අවශ්‍ය කරන පරිවාර සම්පත් කැමැති පරිදි නොලැබීමත් නිසා උපේක්ෂාවට හෙවත් මධ්‍යස්ථ වේදනාවට වැටුණු සිතින් එනම් වැඩි සොම්නසක් හෝ දොම්නසක් නොමැතිව කර්ම කර්මඵල අදහාගෙන තමාගේ ම දැඩි වුවමනාවෙන් දස පින්කිරියවත්වලින් යමක් කරන තැනැත්තාට උපේක්ඛා සහගත ඥාන සම්පයුක්ත අසංඛාරික සිත උපදී.

06. පරිවාර කරුණු අවශ්‍ය පරිදි සම්පූර්ණ නොවීම නිසා මැදහත් වේදනාවට පත් සිතින් කර්ම කර්මඵල අදහාගෙන අනුන්ගේ මෙහයවීමකින්, උපදේශයකින් හෝ නියෝග යකින් පුණ්‍ය කර්මයක් කරන්නාට උපෙක්ඛා සහගත ඥාන සම්පයුක්ත සසංඛාරික සිත උපදී.

07. මැදහත් වේදනාවෙන් යුතුව කර්ම කර්මඵල පිළිබඳ දැනුමකින් තොරව තමාගේ ම උනන්දුවෙන් පුණ්‍ය කර්මයක් කරන්නාට උපෙක්ඛා සහගත ඥාන විප්පයුක්ත අසංඛාරික සිත උපදී.

08. මැදහත් වේදනාවෙන් යුතුව කම්ඵල දැනීමකින් ද තොරව අනුන්ගේ මෙහෙයවීමකින් හෝ නියෝගයකින් පින්කමක් කරන්නා හට උපෙක්ඛා සහගත ඥාන විප්පයුක්ත සසංඛාරික සිත උපදී.

මේ අටමහා කුසල් සිත් දස පුණ්‍යක්‍රියා චේතනා අනුව සියල්ල එකතුකළ විට කාමාවචර කුසල සිත් අසූවක් වේ. මේවා මහා කුසල් වන්නේ රූපාවචර ආදී කුසල්වලට වඩා බලවත් නිසා නොවේ. කාම සම්පත් ලබාදෙන ඉහළම කුසල් වන බැවිනි. මේ කුසලය බලවත් වීමට හේතුවන සොමනස්ස ආදී කාරණා අතරින් වඩා බලවත් වන්නේ ඥාන සම්පයුක්ත කුසලය යි. ඥාන විප්පයුක්ත කුසලය එතරම් බලවත් නොවේ. සෝමනස්ස සහගත ආදී කාරණා ඊට වඩා අප්‍රධාන කාරණාය. ඒ අතරින් උපෙක්ඛා සහගත කුසලයට වඩා සෝමනස්ස සහගත කුසලය ද සසංඛාරික කුසලයට වඩා අසංඛාරික කුසලය ද බලවත් වන්නේ ය. මේ කිසිම කුසලයක් ඥාන සම්පයුක්ත කුසලය තරම් බලවත් නැත.

**සහේතුක කාමාවචර කුසල විපාක සිත් 08**

මෙම කුසල අට නැවත විපාක සිත් අටක් වශයෙන් ද ක්‍රියා සිත් අටක් වශයෙන් ද දැක්වේ. ඒ අනුව සිත් සියල්ල 24 කි. මේ සියල්ල කාම සෝභන සිත් නමින් හැඳින් වේ.

**සහේතුක කාමාවචර විපාක සිත්.**

මෙහි සිත් නම් වශයෙන් කුසල සිත් අටට සමානය. අහේතුක සිත් 18 දී අලෝභ, අදෝස, අමෝහ යන හේතුන්ගෙන් තොර කුසල විපාක සිත් 8 ක් හෙවත් අහේතුක කුසල විපාක සිත් 8 ක් දක්වන ලදී. මෙහි දක්වන කුසලවිපාක අලෝභ, අදෝස, අමෝහ යන කුසල හේතුන් නිසා පහළවන හෙයින් මේවා සහේතුක කාමාවචර විපාක සිත් නමින් හැඳින්වේ. මේ කුසල් විපාක දීමේ දී අලෝභ, අදෝස, අමෝහ යන හේතු තුනම ඇතිව පහළ වූ කුසල් සිත් විපාක දීමේ දී ත්‍රිහේතුක කුසල විපාක නමින් හැඳින්වේ. එය ප්‍රතිසන්ධි වශයෙන් විපාක ලබන තැනැත්තා ත්‍රිහේතුක ප්‍රතිසන්ධියෙකැයි කියනු ලැබේ. අලෝභ, අදෝස යන කුසල මූල දෙක පමණක් බලවත් ව පහළ වූ කුසල සිත ද්විහේතුක ය. එයින් ප්‍රතිසන්ධිය ලද්දෝ ද්විහේතුක ප්‍රතිසන්ධිකයෝ ය. සාමන්‍යයෙන් එවැනි කෙනෙක් වත්පොහොසත් කම් ඇති වාසනාවන්තයෙකි. ප්‍රඥාවන්ත නොවිය හැකිය.

මෙම කුසල විපාක සිත් සත්ත්වයාට සතර ආකාරයකින් විපාක දේ.

1. **ප්‍රතිසන්ධි**
2. **භවංග**
3. **තදාලම්භන**
4. **චුති** වශයෙනි.

මීළඟ භවයෙහි ඉපදීම ප්‍රතිසන්ධි විපාකය යි. භවංග තදාලම්භන හා චුති ප්‍රවෘත්ති විපාක යැයි කියනු ලැබේ. එයිනුත් භවංග නම් සිත චක්ඛු ආදී ද්වාරයන්ගෙන් අරමුණු නොගෙන සිටින අවස්ථාවය. ඒ අවස්ථාවේ පවතින සිතත් මෙහි විපාක සිතකි. එයින් අදහස් වන්නේ එහි තත්වය ද මෙම කුසලයට සමාන බවය. තදාලම්භන නම් ද්වාර භයෙන් ගන්නා ලද අරමුණුවල එල්බ ගැනීමය. හෙවත් ඒ අරමුණ අල්වා ගැනීමය. චුති නම් ඒ භවයෙන් පිටවීමය. මේ අනුව මෙම මහා කුසලයකින් ප්‍රතිසන්ධිය ලැබූ තැනැත්තාට ප්‍රවෘත්ති වශයෙන් භවංග අවස්ථාවේ දීත් තදාලම්භන අවස්ථාවේ දී හෙවත් අරමුණු ගන්නා අවස්ථාවේ දීත් ඇතැම්විට චුත වන අවස්ථාවේ දීත් මෙම කුසල විපාකය බලපවත්වන බව දත යුතු ය.

මේ සහේතුක විපාක නිසා මනුෂ්‍යාදී සුගතියක සැපවත්ව උපදී. එහි දී එහි කියන ලද අට ආකාර සිත්වල ඇති අඩු ලුහුඬුකම් වෙනස්කම් අනුව ලබන විපාකයේ ද අඩුලුහඬුකම් වෙනස්කම් සිදුවිය හැකිය. අහේතුක කුසල විපාක සිත්වල දී කියන ලද චක්ඛුවිඤ්ඤාණ ආදී හොඳ රූප හොඳ හොඳ ශබ්ද වැනි හොඳ අරමුණු ලැබී ඒ අහේතුක සිත් පහළ වීමත් සිදුවන්නේ මේ කාමාවචර කුසල් සිත් අනුවය. වෙනත් විධියකින් කිවහොත් ඇසට සුන්දර රූපයක් දක්නට ලැබීම ඇස ලැබීමේ පුණ්‍ය පක්ෂය නිසා සිදුවන්නකි. ඒ අවස්ථාවේ පහළවන චක්ඛු විඤ්ඤාණ සිත අහේතුක විපාකයකි. ඒ අහේතුක විපාකය ලැබීමට හේතු වූ කුසලය නම් මේ කාමාවචර කුසලයයි. මේ පිනයි.

**සහේතුක කාමාවචර ක්‍රියා සිත්**

සම්පූර්ණයෙන් තෘෂ්ණාව දුරුකළ නැවත ඉපදීම අවසන් කළ රහතන් වහන්සේගේ පින්පව් කිරීමක් නැත. එහෙත් උන්වහන්සේලා පින්යැයි සම්මත පිදිය යුත්තන් පිදීම, දහම් දෙසීම, දහම් ඇසීම වැනි යහපත් ක්‍රියා කරති. ඒ අවස්ථාවේ උන්වහන්සේලාට ද සිත් පහළ වේ. ඒවා මතු විපාක නොදෙන හෙයින් කුසල් නොවේ. පෙරකළ කර්මයක විපකත් නොවන හෙයින් විපාක ද නොවේ. එහෙයින් මේවා ක්‍රියා සිත්යැයි කියනු ලැබේ. ඒවා ක්‍රියා මාත්‍රයකි.

**ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං............** පැරණි කර්මය ක්ෂය කළේ ය. අලුත් කර්ම කිරීමක් නැත. යැයි කීවේ ඒ හෙයිනි. උන්වහන්සේලා සිදුකරන කුසලයේ ද මේ අට ආකාරය ඇතිවිය හැකිය. එහෙයින් ක්‍රියා සිත් ද අටකි.

**වේදනා ඤාණ සංඛාර - භෙදෙන චතුවීසති**
**සහෙතු කාමාවචර - පුඤ්ඤපාක ක්‍රියාමතා**

## අභ්‍යාස

01. මෙම සිත් අහේතුක යැයි නම්කරන්නේ කිනම් කරුණු නිසා ද?
02. අකුසල විපාක හතෙන් හයක් උපෙක්ඛා සහගත වේදනාවෙන් යුක්තවීමටත් කාය විඤ්ඤාණය පමණක් දුක්ඛ සහගත වීමටත් හේතුව පහදන්න.
03. හොඳින් බණ දහම් උගත් කර්ම කර්මඵල අදහන උපාසකයෙකුට තම උපන්දිනය නිමිති කරගෙන දානයක් දීමට දැඩි උවමනාවක් ඇතිවිය හෙතෙම දානයට දස නමකට ආරාධනා කොට දැහැමින් උපයාගත් ධනය වැයකොට ඉතා ප්‍රණීත ලෙස කිසිදු අඩුපාඩුවක් නොමැතිව දානය පිළියෙල කරයි. නෑදෑයන් පිරිවරාගෙන දානය පිළිගන්වන්නට බලා සිටියි. භික්ෂූන් වහන්සේලා දෙනමකට සිදු වූ කිසියම් අපහසුතාවක් නිසා දනට වැඩියේ අටනමකි. ලොකුහාමුදුරුවෝ ඒ කාරණය කියා දායකයාගේ සිත සනසති. දහනමම හිටියනම් තමයි හොඳ දැන් මොනව කරන්නද? කමක් නැහැ. හාමුදුරුවනේ කියා හෙතෙම දානය පිළිගන්වයි. ඔහුට පහළවන කුසල් සිත කුමක් ද?

18 පාඩම

# අභිධර්මය - III

## රූපාවචර සිත්

### රූපාවචර කුසල සිත් 05

පසුගිය පාඩම්වලින් ඉගෙනගන්නා ලද්දේ කාමලෝකවල ජීවත්වන සාමාන්‍ය ජනයාගේ ක්‍රියාකාරකම් අනුව ඔවුන්ට පහළවන කුසල සහ අකුසල සිත් පිළිබඳව ය. එනම් කාමාවචර සිත් ය. මෙතැන් සිට රූපාවචර අරූපාවචර සහ ලෝකෝත්තර යැයි සිත් තුන් වර්ගයක් ඇත. ඒවා පෙර පින් ඇති වීර්ය සම්පන්න, කාමාශාවන් බැහැර කළ උසස් පුද්ගලයන්ට පහළ වන සිත් මිස සාමාන්‍ය පෘථජ්ජනයාට ඇතිවන සිත් නොවේ. රූපාවචර අරූපාවචර සිත්වලට ධ්‍යාන සිත්යැයි ද කියනු ලැබේ. ඒවා කාමාවචර සිත්වලට වඩා සහමුලින් ම වෙනස් ය. උසස් ය. බලවත් ය. විශේෂයෙන් ඍද්ධි ප්‍රාතිහාර්ය පවා කළ හැකි වන්නේ මීළඟට විස්තර කිරීමට යන රූපාවචර ධ්‍යාන සිත්වල බලයෙනි.

කාමාවචර සිත්වලට හැකිවන්නේ අරමුණක් බාහිර වශයෙන් ගැනීමට පමණි. අරමුණ හොඳින් ගතහැකි වන්නේ, තදින් ගතහැකි වන්නේ ධ්‍යාන සිත්වලට ය. අභිධර්ම ක්‍රමයට අනුව ප්‍රථම ධ්‍යාන, ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන, පංචම ධ්‍යාන යනුවෙන් ධ්‍යාන පහකි.

**01. විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා සහිත පඨමජ්ඣාන කුසල සිත.**
**02. විචාර පීති සුඛ ඒකග්ගතා සහිත දුතියජ්ඣාන කුසල සිත.**
**03. පීති සුඛ ඒකග්ගතා සහිත තතියජ්ඣාන කුසල සිත.**
**04. සුඛ ඒකග්ගතා සහිත චතුත්ථජ්ඣාන කුසල සිත.**
**05. උපෙක්ඛා ඒකග්ගතා සහිත පඤ්චමජ්ඣාන කුසල සිත.**

ධ්‍යානයෙන් කෙරෙන ප්‍රධාන කාර්ය දෙකකි. එනම් ආරම්මණ උපනිජ්ඣාන හෙවත් අරමුණ බැලීම නැතහොත් අරමුණ විශේෂයෙන් බැලීමයි. එම කාර්ය සඳහා උපකාරවන ධ්‍යාන අංග පහක් තිබේ. ඒවා චෛතසික පහකි. එනම් විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා යනුවෙනි. විතර්කය සිත අරමුණට නංවයි. අරමුණට යොමුකරවයි. විචාරය සිත අරමුණෙහි හසුරවයි. ප්‍රීතිය අරමුණින් සිත පිනවයි. සුඛය සිතට ආරම්මන රසය අනුභව කරවයි, විඳවයි. ඒකග්ගතාව සිත නොයෙක් අරමුණුවලට යා නොදී එක අරමුණක රඳවා තබයි. සමාධිය යනු ද මේ ඒකග්ගතාවයි.

ධ්‍යානයේ දෙවන කාර්යය විරුද්ධ ක්ලේශ ධර්මයන් හෙවත් නීවරණ දවාලීමයි. ඒ අනුව විතර්කය ථීනමිද්ධ නීවරණය මැඩ පවත්වයි. විචාරය විචිකිච්ඡා නීවරණය මැඩ වත්වයි. ප්‍රීතිය ව්‍යාපාද නීවරණය මැඩ පවත්වයි. සුඛය උද්ධච්ච කුක්කුච්ච නීවරණය මැඩ පවත්වයි. ඒකග්ගතාව කාමච්ඡන්ද නීවරණය මැඩ පවත්වයි. මේ පංචාංගයේ අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් උපදින ධ්‍යාන කුසල චිත්තය විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා සහිත ප්‍රථම ධ්‍යාන කුසල චිත්තය යැයි කියනු ලැබේ.

## භාවනාවෙන් ප්‍රථමධ්‍යාන කුසල චිත්තය ලැබෙන ආකාරය.

දෙව්ලොව හෝ මිනිස් ලොව කම් සැප ලාමකයැයි සළකන, මෙලොව දී සමාධි සුවයත් පරලොව බ්‍රහ්ම සුවයත් විඳිනු කැමැති ත්‍රිහේතුක ප්‍රතිසන්ධියකින් උපන් කෙනෙක් භාවනාවෙහි යෙදෙයි. එම යෝගාවචරයා පඨවි කසිණාදී කර්මස්ථාන අතරින් තමාගේ චරිතයට අනුරූප කමටහනක් ලබාගෙන සීලයෙන් පිරිසිදුව අරණ්‍යාදී විවේකස්ථානයක හිඳ භාවනාවට බසී.

යෝගාවචරයා අරමුණ වශයෙන් ගන්නේ පඨවි කසිණය නම් අරුණුවන් මැටියෙන් නිසිපරිදි සකස් කරගත් කසිණ මණ්ඩලය ඉදිරියෙහි තබාගෙන ඒ දෙස ම බලාගෙන ''පඨවි පඨවී'' යැයි සියවරක් හෝ අවශ්‍යනම් දහස් වරක් හෝ අරමුණෙහි සිත රැඳෙන තුරු භාවනා කරන්නේ ය. මෙනෙහි කරන්නේ ය. එසේ වඩන ඔහුගේ ඒ පඨවි කසිණ ආරම්මණයට පරිකර්ම නිමිත්ත යැයි ද භාවනාවට පරිකර්ම භාවනාව යැයි ද කියනු ලැබේ. මෙහි පරිකර්ම යනු භාවනා කාර්යය යන්නයි. මෙසේ භාවනා කරගෙන යන විට ඒ ඒ පුද්ගලයාගේ මානසික යෝග්‍යතාව අනුව කිසියම් කාලයක දී ඒ කසිණාරම්මණය ඇසට නොව සිතට ම අරමුණු වන්නට හුරුවන්නේ ය. ඇස පියාගෙන බැලුවත් වට පිට බැලුවත් එම ආරම්මණයට සමාන වූම ආරම්මණයක් පෙනෙන්නට පටන්ගනී. ඒ තත්වයට පත් ආරම්මණයට උග්ගහ නිමිත්ත යැයි කියන අතර භාවනාවට තවදුරටත් පරිකර්ම භාවනාව යැයි කියනු ලැබේ. එතැන් සිට කසිණ මණ්ඩලය පසෙක තිබිය දී ඒ උග්ගහ නිමිත්ත අරමුණු කොටගෙන පරිකර්ම භාවනාවෙන් භාවනා කරන කල්හි සඳ පලාගෙන නගින ආලෝකයක් සේ උග්ගහ නිමිත්ත පලාගෙන මෙන් අතිපරිශුද්ධ ආලෝකයක් පහළවන්නේ ය. ඒ ආලෝක ආරම්මණයට පටිභාග නිමිත්ත යැයි කියනු ලැබේ. එතැන්සිට භාවනාව හැඳින්වෙන්නේ උපචාර භාවනාව නමිනි. මෙසේ උපචාර භාවනාවෙන් පටිභාග නිමිත්ත වඩන කල්හි කමච්ඡන්දාදී පංච නීවරණයන් මැඩලන්නා වූ ද ආරම්මණය විශේෂ කොට දකින්නා වූ ද විතර්ක විචාර, පීති, සුඛ, ඒකග්ගතා යන ධ්‍යානාංගයන්ගෙන් සමන්විත වූ ප්‍රථම ධ්‍යාන කුසල චිත්තය පහළ වන්නේ ය.

## භාවනාවෙන් ද්විතීය ධ්‍යානාදී කුසල චිත්ත ලැබෙන ආකාරය.

ප්‍රථම ධ්‍යානය ලබාගත් යෝගාවචරයා එය හොඳින් ප්‍රගුණ වූ විට මේ ධ්‍යාන සමාපත්තියට තවමත් නීවරණ නැමැති සතුරන්ගෙන් බාධා ඇත්තේ යැයි වටහාගනී. එසේ ම එහි පළමු අංගය වන විතර්කය ඕලාරිකය, එය දැන් ප්‍රගුණ බැවින් නැවත අවශ්‍යය නැති බැවින් ද ප්‍රථම ධ්‍යානයෙහි ඇති දොස් සලකා ද්විතීය ධ්‍යානය ඊටවඩා ශාන්ත බව

දැක ඒ සඳහා භාවනා කරන්නේ ය. එවිට විතර්කයෙන් තොර විචාර ප්‍රීති සුඛ ඒකග්ගතා යන අංග සතරින් යුතු ද්විතීය ධ්‍යාන කුසල චිත්තය ලැබෙන්නේ ය. ද්විතීය ධ්‍යානය ලබාගත් යෝගාවචරයා එහි ඇතුළත් විචාරය ද ඕලාරිකය, එය ද දැන් හුරු පුරුදු බැවින් අනවශ්‍යය ද්විතීය ධ්‍යානය ද තවම නීවරණ සතුරන් සහිතය යනාදි ද්විතීය ධ්‍යානයෙහි දොස් දැක එය පිළිබඳ කැමැත්ත අතහැර තෘතීය ධ්‍යානය ඊට වඩා ශාන්තයැයි සළකා ඒ සඳහා භාවනාරම්භ කරන්නේ ය. එසේ භාවනා කරන ඔහුට විචාර රහිත වූ පීති සුඛ ඒකග්ගතා යන අංගත්‍රයෙන් යුක්ත තෘතීය ධ්‍යානය ලැබෙන්නේ ය. තෘතීය ධ්‍යානය ප්‍රගුණකරගත් යෝගාවචරයා ඊට ඇතුළත් වූ පීති අංගය ඕලාරික යැයි සළකා එය දුරුකර ගන්නා පිණිස යළිත් භාවනා කරන්නේ ය. එසේ භාවනා කරන ඔහුට සුඛ ඒකග්ගතා යන අංගද්වයෙන් යුත්ත චතුර්ථ ධ්‍යානය ලැබෙන්නේ ය. චතුර්ථ ධ්‍යානය ලබාගත් යෝග ාවචරයා එහි ඇතුළත් සුඛය ද ඕලාරික වශයෙන් සළකා එය දුරු කර ගන්නා පිණිස යළිත් භාවනා කරන්නේ ය. එසේ භාවනා කරන ඔහුට සුඛ දුක්ඛ දෙකින් තොර වූ උපෙක්ඛා ඒකග්ගතා යන අංග ද්වයෙන් යුක්ත පංචම ධ්‍යානය ලැබෙන්නේ ය.

මේ අනුව ප්‍රථම ධ්‍යානය විතර්කාදී අංග පහකින් සමන්විත වේ. පඨම ධ්‍යානය හුරු පුරුදු වූ විට එහි මුල් අංගය වන විතර්කය ද රළු අංගයක් සේ වැටහේ. එනිසා ඒ ඇතුළත් ප්‍රථම ධ්‍යානය කෙරෙහි ද යෝගාවචරයාගේ කැමැත්ත අඩුවේ. ඊට වඩා ද්විතීය ධ්‍යානය ශාන්තය යැයි වැටහේ. එනිසා ඒ විතර්ක අංගයත් සමඟ ම ප්‍රථම ධ්‍යානය ද බැහැර කොට ද්විතිය ධ්‍යානය කරා යයි. මේ ආකාරයෙන් එක් එක් අංග ඕලාරික යැයි බැහැර කරන අතර ඒවා ඇතුළත් ධ්‍යානය ද සතුරු ධර්ම ඇති එකක් සේ සළකා බැහැර කරමින් ගොස් වඩා සියුම් ශාන්ත ධ්‍යානයෙන් ධ්‍යානයට ගමන්කොට පංචම ධ්‍යානයට පත්වේ. ධ්‍යානාංග පහෙන් පංචම ධ්‍යානයට යනවිට ඉතිරිවන්නේ ඒකග්ගතාව පමණි. එය සෑම ධ්‍යානයකට ම පොදු ය. ධ්‍යානයෙන් බලාපොරොත්තු වන්නේ සමාධිය යි. ඒකග්ගතාව යනු ද එයයි. ඒකග්ගතාව සෙසු අංග සතරේ උපකාරයෙන් සිත එක් අරමුණක එකඟකොට තබාගනී. පංචම ධ්‍යානයට එනවිට සිත ඉහළ ම ඒකග්ගතාවට පත් වේ. එවිට සෙසු අංගයන්ගේ උපකාරයක් අවශ්‍ය නැත. පංච නීවරණ වැනි සෙසු බාධකයකින් තොරව නොසැලී සිටීමට සිත සමත් වේ. සිව්වන ධ්‍යානය දක්වා පැවැති සුඛ වේදනාවත් පස්වැන්නේ දී දුරුකෙරේ. එවිට ඔහුට පෙර තිබූ දුක්ඛයත් පසුව තිබූ සුඛයත් යන දෙකම නොදැනේ. දැන් සිත මැදහත්ය. ඒ නිසා පස්වන ධ්‍යානය උපරිම මධ්‍යස්ථතාවයෙන් යුතු තත්වයක් බැවින් උපෙක්ඛා ඒකග්ගතා යන අංග දෙකින් සමන්විත ධ්‍යානය ලෙස හැඳින්වේ. රූප ධ්‍යානවලින් ලැබිය හැකි ඉහළම ප්‍රතිඵලය එයයි.

මෙම රූප ධ්‍යාන ක්‍රමයේ දී සිත කසිණ වැනි බාහිර අරමුණක පිහිටුවාගෙන එකඟ කරන බැවින් ආරම්මණ උපනිජ්ඣාන යනුවෙන් හැඳින් වේ. සමථ යනු ද එය ම යි. එයින් පමණක් නිවන් දැකිය නොහැකි ය. ඒ සඳහා තවත් ධ්‍යාන ක්‍රමයක් ඇත. එනම් අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණයට අනුව ඇති සැටියෙන් බැලීමයි. එය ලක්ඛණ උපනිජ්ඣාන නමින් හැඳින් වේ. විදර්ශනාව යනු ද එයයි.

## රූපාවචර විපාක සිත් 05

**01. විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා සහිත පඨමජ්ඣාන විපාක සිත.**
**02. විචාර පීති සුඛ ඒකග්ගතා සහිත දුතියජ්ඣාන විපාක සිත.**
**03. පීති සුඛ ඒකග්ගතා සහිත තතියජ්ඣාන විපාක සිත.**
**04. සුඛ ඒකග්ගතා සහිත චතුත්ථජ්ඣාන විපාක සිත.**
**05. උපෙක්ඛා ඒකග්ගතා සහිත පංචමජ්ඣාන විපාක සිත.**

රූපාවචර ධ්‍යාන පස උපදවාගත් තැනැත්තා නොපිරිහී කළුරිය කළහොත් නොවරදවා ම බඹලොව උපදින්නේ ය. එසේ උපන්තැන් පටන් ඔහුට පහළ වන්නේ ඒ රූපාවචර සිත් ම ය. එය හඳුන්වන්නේ රූපාවචර විපාක සිත් නමිනි. බ්‍රහ්ම ලෝකයේ උපත ලබාදෙන විපාකය ප්‍රතිසන්ධි විපාකය නමින් ද එහි වෙසෙනතාක් කල් ලැබෙන විපාක ප්‍රවෘත්ති විපාක නමින් ද හැඳින් වේ. ප්‍රථම ධ්‍යානය ඒ ඒ යෝගාවචරයන් වඩන ආකාර තුනකි. ධ්‍යානයට පත්වීමෙන් පමණක් සෑහීම පරිත්ත නම්වේ. තවදුරටත් එය මධ්‍යම මට්ටමෙන් තම සිතට වසඟ කර ගැනීම, අවනත කරගැනීම මධ්‍යම නම් වේ. ඉහළ ම මට්ටමින් ධ්‍යාන වසඟ තත්වයට පත්කර ගැනීම ප්‍රණීත නම් වේ. ප්‍රථමධ්‍යානය පරිත්ත මට්ටමින් වඩා නොපිරිහී කළුරිය කළහොත් බ්‍රහ්ම පාරිසජ්ජ බඹලොව උපදී. මධ්‍යම වශයෙන් වැඩුවහොත් බ්‍රහ්ම පුරෝහිත බඹලොව ද ප්‍රණීත වශයෙන් වැඩුවහොත් මහාබ්‍රහ්මයේ ද උපදී. එහි උපදින විටත් වාසයකරන තාක් කාලය පුරාත් චුත වන අවස්ථාවේ පවතින්නේ ඔහුට පහළවන්නේ රූපාවචර ප්‍රථම ධ්‍යාන සිතයි.

ද්වතීය ධ්‍යානය සහ තෘතිය ධ්‍යානය පරිත්ත වශයෙන් වැඩුවේ නම් පරිත්තාභ බඹලොව ද, මධ්‍යම වශයෙන් වැඩුවේ නම් අප්පමාණාභා බඹලොව ද, ප්‍රණීත වශයෙන් වැඩුවේ නම් ආභස්සර බඹලොව ද උපදී. එහි දී ද ප්‍රතිසන්ධි විපාක වශයෙන් හා ප්‍රවෘත්ති විපාක වශයෙන් උපදින්නේ දුතිය ධ්‍යාන හෝ තතිය ධ්‍යාන සිතයි. චතුර්ථ ධ්‍යානය පරිත්ත වශයෙන් වැඩුවේ නම් පරිත්ත සුභ නම් බඹලොව ද මධ්‍යම වශයෙන් වැඩුවේ නම් අපමාණ සුභ බඹලොව ද ප්‍රණීත වශයෙන් වැඩුවේ නම් සුභ කින්නක බඹලොව ද උපදින්නේ ය. එහි දී ද ප්‍රතිසන්ධි විපාක හා ප්‍රවෘත්ති විපාක වශයෙන් උපදින්නේ චතුර්ථ ධ්‍යාන විපාක සිතයි. පංචම ධ්‍යානය වැඩූ පුද්ගලයා වේහප්ඵල බඹලොව උපදී. එම ධ්‍යානය ම සිත ඕලාරික යැයි සළකා සිතක් නැතිවන සේ භාවනා වැඩුවේ නම් අසඤ්ඤ සත්ත්ව බඹලොව උපදී.

## රූපාවචර ක්‍රියා සිත් 05.

මෙතෙක් කියන ලද පරිදි පෘථජ්ජනයෙක් හෝ සෝවන් මාර්ගයේ පටන් අනාගාමී ඵලය දක්වා වූ කෙනෙක් හෝ ප්‍රථම ධ්‍යානය ලැබුවේ නම් ඒ ප්‍රථම ධ්‍යාන කුසල චිත්තය යැයි කියනු ලැබේ. එය කුසල කර්මයක් වන හෙයිනි. රහතන් වහන්සේගේ කුසල කර්ම කිරීමක් ද නැත. ඒ හෙයින් උන්වහන්සේ ප්‍රථම ධ්‍යානය ලැබුවේ නම් එය ප්‍රථම ධ්‍යාන ක්‍රියා සිත යැයි කියනු ලැබේ. රහතන් වහන්සේ සෙසු ධ්‍යාන ලැබීම ද එසේ ම ය.

01. විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා සහිත පඨමජ්ඣාන ක්‍රියා සිත.
02. විචාර පීති සුඛ ඒකග්ගතා සහිත දුතියජ්ඣාන ක්‍රියා සිත.
03. පීති සුඛ ඒකග්ගතා සහිත තතියජ්ඣාන ක්‍රියා සිත.
04. සුඛ ඒකග්ගතා සහිත චතුත්ථජ්ඣාන ක්‍රියා සිත.
05. උපෙක්ඛා ඒකග්ගතා සහිත පංචමජ්ඣාන ක්‍රියා සිත.

මේ අනුව අභිධර්ම ක්‍රමයේ දී ධ්‍යාන පහකි. එය පංචකනය යැයි කියනු ලැබේ. සූත්‍ර ක්‍රමයේ දී ඇත්තේ ධ්‍යාන සතරකි. එය චතුක්කනය යනුවෙන් හැඳින් වේ. නය යනු ක්‍රමයි. අභිධර්මයේ එන පංචක ක්‍රමයේ දී ධ්‍යාන පහක් වන්නේ ධ්‍යාන අංග පහ සන්සිඳුවීමේ පිළිවෙළ අනුවය. ප්‍රථම ධ්‍යානයේ විතක්ක විචාරාදී අංග පහක් ඇතිබව ඔබ දනිති. මේ පහෙන් ප්‍රධාන ධ්‍යානාංගය වන්නේ බලවත් වූ ඒකග්‍රතාවයි. සාමාන්‍ය ජනයාට ද දුබල ඒකග්‍රතාවක් ඇත. එනම් අරමුණක මදවේලාවක් සිත රඳවා තැබීමේ හැකියාවයි. එහෙත් ධ්‍යාන ඒකග්‍රතාව බොහෝ වේලාවක් එක අරමුණක සිත පැවැත්වීමට සමත් වේ. එනිසා ධ්‍යාන ලාභීන්ට පැය ගණනක් වුවද දවස මුළුල්ලේ වුව ද සිත එක අරමුණේ පැවැත්විය හැකි ය. සෑම ධ්‍යානයක ම මේ ඒකග්‍රතාව නම් ධ්‍යානාංගය පවතී. වෙනත් ආකාරයකින් පවසතොත් ධ්‍යානයේ අග්‍රඵලය ඒකග්‍රතාවයි. සමාධිය යනු ද එයට ම කියන නමකි. මේ සමාධියට විතක්ක විචාර පීති සුඛ සහ උපේක්‍ෂාව යැයි උපකාරක ධර්ම පහක් ඇත. සමාධි චිත්තයට පසුබසින්නට හැකිලෙන්නට නොදී විතර්කය යෝගියාගේ සිත නැවත නැවත අරමුණට නංවයි. විචාරය අරමුණ පිරිමදියි. ප්‍රීතිය සිත ප්‍රබෝධමත් කරයි. සුඛයෙන් ධ්‍යාන ආශ්වාදය ඇතිවෙයි. මේ ධර්ම සතරේ උපකාරයෙන් ඒකග්‍රතාව බලවත්වීමෙන් ප්‍රථම ධ්‍යානය ඇතිවේ. ප්‍රථම ධ්‍යානය ලැබූ තැනැත්තාට තවදුරටත් විතර්කයෙන් තොරව පැවැත්විය හැකි තත්ත්වයට සමාධිය දියුණු වේ. එයින් දුතිය ධ්‍යානය පහළ වේ. තවදුරටත් භාවනාවේ යෙදෙන යෝගාවචරයාට විචාරයෙන් තොරව සමාධිය පවත්වාගත හැකි වේ. එයින් තෘතීය ධ්‍යානය ලැබේ. එතැනින් ඉදිරියට භාවනා කරන යෝගාවචරයාට ප්‍රීතියෙන් තොරව සමාධිය දියුණු වේ. එයින් චතුර්ථ ධ්‍යානය ලැබේ. මීළඟට යෝගාවචරයාගේ සිත සුඛ දුක්ඛ දෙකින් ම තොර වූ සොම්නස් දොම්නස් දෙකම නැති උපෙක්ෂාව සහ ඒකග්‍රතාව පමණක් ඇති පංචමධ්‍යානය පහළ වේ. මේ පංචකනය යි. එනම් අභිධර්ම ක්‍රමයයි. සූත්‍ර පිටකයේ එන්නේ චතුර්ථනය යි. එහි දී ප්‍රථම ධ්‍යානය ක්‍රම දෙකේ දීම සමානය. සූත්‍ර ක්‍රමයේ දී '**විතක්ක විචාරානං වූපසමා**' යනුවෙන් විතක්ක විචාර යන ධ්‍යාන අංග දෙකම එකවර සන්සිඳී යන බව කිය වේ. ඒ අනුව සූත්‍රවල එන දුතිය ධ්‍යානය යනු අභිධර්මයේ එන තතිය ධ්‍යානයයි. එනම් විතක්ක විචාර දෙකම සන්සිඳුණු සමාධිය යි. එතැන් සිට නැවතත් ක්‍රම දෙකේ ම ධ්‍යාන සමානය.

**පංචධා ඣාන භෙදෙන - රූපාවචර මානසං**
**පුඤ්ඤපාක ක්‍රියාභෙදා - තං පංචදසධා භවෙ**

## අරූපාවචර සිත් 12

සත්ත්වයා සකස් වී ඇත්තේ රූප,වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පඤ්චස්කන්ධයෙනි. මෙයින් රූපයට රූපය යැයි ද සෙසු ස්කන්ධ පහට නාම යැයි ද කියනු ලැබේ. නිරය, තිරිසන්, ප්‍රේත මනුෂ්‍ය යන ලෝකවල වෙසෙන සත්ත්වයන්ට විඳින්නට වන දුක් කම්කටොලු බලවත්ව දැනෙන්නේ මෙම රූපය නිසා ය. දෙවියන්ටත් රූපය ඇත. එහෙත් එය සියුම් ය. රූපාවචර බඹලොව සිටින බ්‍රහ්මයන්ටත් රූපය ඇත. එහෙත් එය ද මිනිසුන්ට තබා දෙවියන්ටවත් දැකිය නොහැකිතරම් සියුම්ය. කෙසේ වුවත් බණ භාවනාකොට ධ්‍යාන වඩන යෝගාවචරයාට රූපය පෙනෙන්නේ දුක් කම්කටළුවලට මුල්වන බාධක ධර්මයක් ලෙස ය. ඒ නිසා රූපාවචර ධ්‍යානවලින් පඤ්චමධ්‍යානය වැඩූ අයගෙන් සමහර කෙනෙක් මේ රූපය කෙරෙහි කලකිරීමෙන් අරූපී ආත්මභාවයක් ලැබීමේ අදහසින් අරූපධ්‍යාන වඩති. එසේ වඩා උපදවාගන්නා අරූප ධ්‍යාන සතරකි. එනම්

**01. ආකාසානඤ්චායතන කුසල සිත**
**02. විඤ්ඤාණඤ්චායතන කුසල සිත**
**03. ආකිඤ්චඤ්ඤායතන කුසල සිත**
**04. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසල සිත**

### 01. ආකාසානඤ්චායතන කුසල් සිත

ආකාස අනන්ත ආයතන යන්න උච්ඡාරණයේ පහසුවට ආකාසානඤ්චායතන වී ඇත. රූපයෙහි ආදීනව දැක රූපයෙන් දුරුවෙනු කැමැති යෝගාවචරයා දස කසිණයෙන් ආකාස කසිණය හැර අනෙකුත් කසින නවයෙන් එකක් අරමුණු කොටගෙන පඤ්චමධ්‍යානය උපදවාගනී. එහි මදවේලාවක් හිඳී. රූපය බැහැර කිරීමේ අදහසින් අරමුණු කරගත් කසිණ රූපය සිතින් බැහැර කොට ඒ රූපය පැවැති අකාසය ගැන මෙනෙහි කිරීමට පටන්ගනී. කසිණ රූපය තිබී ඉවත් කළ අකාශය නිසා එයට කසිනුග්ඝාටිම ආකාශය යයැ කියනු ලැබේ. එය සිංහලෙන් කිසිනු ඉගිළු අහස යැයි සඳහන් වේ. ආකාශය යනු සිතට අරමුණු වන්නක් මිස සැබැවින් ම ඇති දෙයක් නොවේ. එබැවින් එහි ඉමක් කොනක් ද නැත. අනන්තය. එයට අනන්ත ආකාශය යැයි කියනු ලැබේ. එය අරමුණු කරගෙන ''අනන්තො ආකාසෝ අනන්තො ආකාසෝ'' යැයි කියමින් භාවනා කරගෙන යන විට නීවරණ සංසිඳී ගොස් ආකාසානඤ්චායතන සිත පහළවන්නේ ය.

### 02. විඤ්ඤාණඤ්චායතන කුසල් සිත

මෙහි ද විඤ්ඤාණ අනන්ත ආයතනය යන්න විඤ්ඤාණඤ්චායතන වී ඇත. භාවනා යෝගියාගේ බලාපොරොත්තුව තවදුරටත් රූපයෙන් ඈත්වීම ය. ආකාශය කසිණ රූපය පදනම් කරගෙන අරමුණු වූවක් නිසා එය ද රූපයට ළඟ බැවින් ආකාශය බැහැර කොට ඒ අරමුණුකළ සිත හෙවත් විඤ්ඤාණය සළකාගෙන එය ද අනන්ත බැවින් විඤ්ඤාණං අනන්තං, විඤ්ඤාණං අනන්තං කියා භාවනා කරයි. එසේ භාවනා කරන විට විඤ්ඤාණඤ්චායතන කුසල සිත පහළ වන්නේ ය.

### 03. ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත

කිසිවක් නැත යන අර්ථය දීම සඳහා අකිඤ්චන යැයි කියනු ලැබේ. ඒ අකිඤ්චන බව හෙවත් කිසිවක් නැතිබව ආකිඤ්චඤ්ඤ නම් වේ. විඤ්ඤානඤ්චාතයන උපදවාගත් කල්හි ආකාසාඤ්චායතනය අභාවයට යන්නේ ය. ඒ අභාවයට යෑම හෝ නැතිව යාම මෙනෙහි කොට නත්ථි කිඤ්චි යන සිතුවිල්ලට එළඹෙන්නේ ය. එය ම නත්ථි කිඤ්චි, නත්ථි කිඤ්චි යැයි දිගට ම වැඩීමෙන් පළමුවන අරූපාවචර චිත්තයේ නැතිබව අරමුණු කරගත් ආකිඤ්චඤ්ඤායතන කුසල සිත පහළ වන්නේ ය.

### 04. නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිත

තෙල් තිබී හිස්කළ බඳුනක තෙල් ඇතැයි ද නැතැයි ද කිව නොහැකි වන්නා සේ සමාධි චිත්තයක ඕලාරික වශයෙන් හෙවත් ගොරෝසු වශයෙන් සඤ්ඤාවක් නැතිවා සේ ම සියුම් වශයෙන් සඤ්ඤාවක් ඇතිවිට එය නේවසඤ්ඤා නාසඤ්ඤා යැයි කියනු ලැබේ. එහි විග්‍රහය නෙව සඤ්ඤා න අසඤ්ඤා යනුයි. ඇතැයි කීමට තරම් සඤ්ඤාවකුත් නැත. එහෙත් සඤ්ඤාව මුළුමනින් ම නැත්තේ නොවේ යනු එහි අදහසයි. තුන්වන අරූප ධ්‍යානය වූ ආකිඤ්ඤායතනය ලබාගත් යෝගාවචරයා එයම අරමුණු කරගෙන මෙය ශාන්තය මෙය ප්‍රණීත යැයි කියා ඒ පිළිබඳ ව ම භාවනා කිරීමට පටන්ගනී. එසේ භාවනා කරන්නාට ඉතා ම සියුම් වූ නෙව සඤ්ඤානාසඤ්ඤා කුසල් සිත පහළ වේ. එය ලෞකික සිත් අතර සියුම් බවින් අගතැන්පත් සිතයි. ඊටවඩා සියුම් තවත් සිතක් නැත. කොතරම් සියුම් ද කිවහොත් යෝගාවචරයාට සිතක් ඇද්ද නැද්දැයි දැනගැනීමටත් අපහසු තරම් ය.

### අරූපාවචර විපාක සිත් 04

01. ආකාසානඤ්චායතන විපාක සිත
02. විඤ්ඤාණඤ්චායතන විපාක සිත
03. ආකිඤ්චඤ්ඤායතන විපාක සිත
04. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන විපාක සිත

### 01. ආකාසානඤ්චායතන විපාක සිත

ආකාසානඤ්චායතන සමාපත්තිය ලබා එයින් නොපිරිහී කළුරිය කළ කෙනෙක් ආකාසානඤ්චායතන අරූප බ්‍රහ්මලෝකේ උපදී. එහි ආයුෂ කල්ප විසි දහසකි. එහි ඉපදීම් වශයෙන් උපදින ප්‍රතිසන්ධි සිතත් වසනතාක් ඇතිවන භවාංග සිතත් අවසානයේ දී පහළවන චුති සිතත් වන්නේ මේ ආකාසානඤ්චායතන විපාක චිත්තය යි.

### 02. විඤ්ඤාණඤ්චායතන විපාක සිත

විඤ්ඤානඤාචායතන විපාක සිත උපදවා නොපිරිහි කළුරිය කළ කෙනෙක් විඤ්ඤානඤ්චායතන අරූපී බ්‍රහ්මලෝකයේ උපදී. එහි ආයුෂ කල්ප හතළිස් දහසකි. එහි දී ද ප්‍රතිසන්ධි භවාංග චුති වශයෙන් පහළ වන්නේ මේ විඤ්ඤානඤ්චායතන විපාක සිත යි.

### 03. ආකිඤ්චඤ්ඤායතන විපාක සිත

ආකිඤ්චඤ්ඤායතන විපාක සිත උපදවා නොපිරිහී කළුරිය කළ කෙනෙක් ආකිඤ්චඤ්ඤායතන අරූපී බ්‍රහ්ම ලෝකයේ උපදී. එහි ආයුෂ කල්ප හැට දහසකි. එහි දී ද ප්‍රතිසන්ධි, භවාංග හා චුති වශයෙන් පහළ වන්නේ ආකිඤ්චඤ්ඤායතන විපාක සිත යි.

### 04. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන විපාක සිත

නේවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය උපදවා ඉන් නොපිරිහී කළුරිය කළ කෙනෙක් නේවසඤ්ඤානාසඤ්ඤායතන අරූපී බ්‍රහ්මලෝකයේ උපදී. එහි දී ද ප්‍රතිසන්ධි, භවාංග හා චුති වශයෙන් පහළ වන්නේ මේ නේවසඤ්ඤානාසඤ්ඤායතන විපාක සිත යි.

### අරූපාවචර ක්‍රියා සිත් 04

01. ආකාසානඤ්චායතන ක්‍රියා සිත
02. විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිත
03. ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා සිත
04. නෙවසඤ්ඤා නාසඤ්ඤායතනන ක්‍රියා සිත

මෙතෙක් සඳහන් කළ අරූපාවචර කුසල් සිත් පහළ වන්නේ පෘථග්ජනයන්ට හා රහතන් වහන්සේගෙන් මෙපිට ශෛක්ෂයන්ට හෙවත් සෙසු මාර්ගඵල ලාභීන්ට ය. රහතන් වහන්සේට පහළ වන්නේ මේ ක්‍රියා සිත් ය. රහතන් වහන්සේ නමක් මේ ධ්‍යාන සතරින් කුමක් හෝ උපදවාගත හොත් ඒවා ක්‍රියා සිත් ලෙස හඳුන්වනු ලැබේ. මන්ද ඒවා උන්වහන්සේට විපාක නොදෙන හෙයිනි.

**ආලම්බනප්පභෙදෙන - චතුධාරූප්ප මානසං**
**පුඤ්ඤපාක ක්‍රියාභෙදා - පුන ද්වාදසධා ඨිතං**

(ආකාස විඤ්ඤාණ ආදි ආරම්මන භේදයෙන් අරූපාවචර සිත චතුර්විධ වේ. එය නැවත කුසල විපාක ක්‍රියා වශයෙන් දොළොස් වැදැරුම් වේ.

### ලෝකෝත්තර සිත් 08

ලෝකෝත්තර සිත් අටකි. එනම් කුසල සිත් හෙවත් මාර්ග සිත් සතරත්, විපාක සිත් හෙවත් ඵල සිත් සතරත් ය. මෙහි ලෝක යනු ඉපදෙමින් මැරෙමින් යන සංසාරයයි. එම සංසාර නැමැති ලෝකයෙන් එතෙරවෙනු කැමැතිව විදර්ශනා භාවනා කරන යෝගාවචරයා සම්මාදිට්ඨි ආදී මාර්ග අංග අට දියුණු කරයි. එසේ දියුණු කරන ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෝකෝත්තර මාර්ගය යැයි කියනු ලැබේ. එම මාර්ගයේ නිවනට ළඟා කරවමින් පහළවන සිත් ලෝකෝත්තර සිත් නම් වේ. ඒවා සතරකි. එනම්,

01. සොතාපත්ති මාර්ග සිත.
02. සකදාගාමි මාර්ග සිත.
03. අනාගාමි මාර්ග සිත.
04. අරහත්ත මාර්ග සිත.

### 01. සොතාපත්ති මග්ග චිත්ත.

නිවනට අනිවාර්යයෙන් පමුණුවන හෙයින් එසේ දියුණු කළ ආර්ය අෂ්ටාංගික මාර්ගය සෝත නම් වේ. එය සැඩ පහරක් සේ ගමන් කරන හෙයින් ඒ නම යෙදේ. සැඩපහරකට හසු වූ දෙයක් එක එල්ලේ ම ගඟට හෝ මුහුදට ගසාගෙන යයි. එසේ ම සෝවන් මාර්ගයට පැමිණි පුද්ගලයා අනිවාර්යෙන් ම නිවනට ළඟා වේ. ''නියතො සම්බොධි පරායණො'' යනුවෙන් ඒ බව දක්වා තිබේ. ඒ අනුව ලෝකෝත්තර මාර්ගයේ පළමුවෙනි අවස්ථාව සෝවන් මාර්ග සිතයි. එය සත්ත්වයා සසර බැඳ තබන දස සංයෝජන අතුරින් සක්කාය දිට්ඨි (ආත්ම දෘෂ්ටිය) විචිකිච්ඡා (සැකය) සීලබ්බත පරාමාස (විවිධ නිෂ්ඵල සිල්ව්‍රත අනුගමනය කිරීම) යන සංයෝජන තුන මුළුමනින් ම නසා දමමින් පහළවන සිතයි.

### 02. සකදාගාමි මග්ග චිත්ත.

සකිං ආගාමි යන්න සකදාගාමී නම් වී ඇත. එනම් එක් වරක් පමණක් එන්නේ ය යන අදහසයි. මෙම දෙවන මාර්ගයට පත්වූ පුද්ගලයා මියගොස් නැවත කාම ස්වර්ගයකට එන්නේ නම් ඒ එක්වරක් පමණි. ඉන්පසු පිරිනිවන් පාන්නේ ය. සකදාගාමි පුද්ගලයා කාමරාගය හා පටිඝය හෙවත් ද්වේශය යන සංයෝජන දෙක තුනී කරන්නේ ය. බල බිඳින්නේ ය. වරක් කාම ලෝකයට එන්නේ කාමරාගය මුළුමනින් සිඳ නොදැමූ නිසා ය.

### 03. අනාගාමි මග්ග චිත්ත.

අනාගාමී යනු න ආගාමි හෙවත් නො එන්නේ ය යන අදහසයි. මේ මාර්ගයට පත් වූ පුද්ගලයා රහත් නොවී කළුරිය කළහොත් නැවත කිසිදාක කාම භවයකට නොඑන්නේ ය. ශුද්ධාවාස බ්‍රහ්මලෝකවල ඉපිද එහි දීම පිරිනිවන් පාන්නේ ය. එසේ සිදුවන්නේ ඒ පුද්ගලයා සක්කාය දිට්ඨි විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග පටිඝ යන ඕරම්භාගිය සංයෝජන පහම සහමුලින් ම සිඳලන බැවිනි. ඕරම්භාගිය යනු කාම සුගති වශයෙන් සැළකෙන දිව්‍යලෝක හයේ සහ මිනිස් ලොව ඉපදීමට හේතුවන සංයෝජනයි. මේවා හීන හෙවත් පහත් ස්වර්ග ලෙස සලකන බැවින් ඕරම්භාගිය යැයි කියනු ලැබේ.

### 04. අරහත්ත මග්ග චිත්ත.

අරහත් මාර්ගයට පත්වන උත්තමයන්ට පහළවන සිත අරහත් මාර්ග සිතයි. මෙම මාර්ගයට පත්වන උතුමා රූපරාග අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන උද්ධම්භාගිය හෙවත් බ්‍රහ්මලෝකවල ඉපදීමට හේතුවන සංයෝජන පහ ද මුළුමනින් ම සිඳ දමයි. එයින් අදහස් වන්නේ උන්වහන්සේ සංසාරයෙහි ඉපදීමට හේතුවන සියලු සංයෝජන නැසූ බවයි. නැවත උන්වහන්සේගේ ඉපදීමක් නැත.

**ලෝකෝත්තර ඵල (විපාක) සිත් 04**

**01. සොතාපත්ති ඵල සිත.**
**02. සකදාගාමි ඵල සිත.**
**03. අනාගාමි ඵල සිත.**
**04. අරහත්ත ඵල සිත.**

මාර්ග සිත් සතර කුසල් සිත් වශයෙන් ද ඵල සිත් සතර විපාක සිත් වශයෙන් ද සැලකේ. මාර්ග කුසල් සිත්වල වෙනත් කුසල් සිත්වල මෙන් විපාක දීමට කල්ගත වන්නේ නැත. මාර්ග සිත පහළවූ සැනින් ම වෙනත් කිසිදු සිතක් පහළ නොවී ඵල සිත පහළ වන්නේ ය. ධර්මයේ ගුණ සඳහන් කරන විට අකාලිකො යැයි වදාළේ මේ මාර්ගඵල අතර කල්ගතවීමක් නැති නිසා ය. සෝවන් ඵලයට පත් වූ තැනැත්තා නැවත කිසිදාක අපාගාමී වීමක් නැත. මෙලොව දී ම රහත් නොවූයේ නම් ජන්ම සතක් ඇතුළත රහත් වන්නේ ය. එයින් දෙවන ජන්මයේ රහත්වන පුද්ගලයා ඒක බීජී නමින් ද, සත්වන ජන්මයෙහි රහත්වන්නා සත්තක්ඛත්තු පරම යැයි ද ඒ අතරතුර රහත් වන්නා කෝළං කෝළ යැයි ද හඳුන්වනු ලැබේ.

සකදාගාමී පුද්ගලයා එක්වරක් පමණක් මනුලොවට නැවත පැමිණීමට ඉඩ ඇතිබව සඳහන් කරන ලදී. අනාගාමි පුද්ගලයා කිසි දිනක දිව්‍ය මනුෂ්‍ය යන කාම ලෝකයකට පැමිණෙන්නේ නැත. රූප අරූප බ්‍රහ්මලෝක අතරත් උපදින්නේ අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨ යන පංච ශුද්ධාවාසයේ පමණි. ඔහු එහි දී ම පිරිනිවන් පාන්නේ ය. රහතන් වහන්සේ ජීවත්ව සිටිමින් කෙලෙසුන් නැසීම සෝපාදිසේස පරිනිර්වාණය යනුවෙන් ද, රහත් වී මිය යෑම අනුපාදිසේස පරිනිර්වාණය යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

මෙතෙක් දක්වන ලද පරිදි අභිධර්මයේ චිත්ත කාණ්ඩයට අයත් සිත් ප්‍රමාණය අසූ නවයකි. එහෙත් සෝවන් ආදී මාර්ග ඵල වලට පත්වන පුද්ගලයින් අටදෙනා ප්‍රථමධ්‍යාන ආදී ධ්‍යාන පහ වැඩුවේ නම් ධ්‍යාන පහ වැඩූ සෝවන් මාර්ග ලාභී පුද්ගලයෝ පස්දෙනෙක් ද, සෝවන් ඵල ලාභී පුද්ගලයෝ පස් දෙනෙක් ද යනාදි වශයෙන් මාර්ග ඵල ලාභී පුද්ලයන් අට දෙනාගේ වශයෙන් සිත් හතළිහක් වන්නේ ය. එම සිත් හතළිහ කාමාවචර 54 ය. රූපාවචර 15 ය. අරූපාවචර සිත් 12 යන සිත් අසූ එකට එකතු කළ විට සියලු සිත් 121 ක් වන්නේ ය.

**චතුමග්ගප්පභෙදෙන - චතුධාකුසලං තථා**
**පාකං තස්ස ඵලත්තාති - අට්ඨධානුත්තරං මතං**

ලෝකෝත්තර සිත් මාර්ග භේදයෙන් චතුර්විධ වේ. ඒ මාර්ගයන්ගේ ඵලය විපාකය වන බැවින් විපාකය චතුර්විධය. මෙසේ ලෝකෝත්තර සිත් අෂ්ටවිධ වේ.

### අභ්‍යාස

01. අරූපාවචර සිත් යනුවෙන් හඳුන්වන්නේ කවර කරුණක් නිසාද?
02. රූපාවචර ධ්‍යානාංගවලින් නීවරණ නැසෙන ආකාරය පැහැදිලි කරන්න.
03. සෝතාපත්ති යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.
04. එක් එක් මාර්ගඵලයන් හි දී නැසෙන සංයෝජනධර්ම වෙන වෙන ම ලියන්න.

### භාවිතයට

**අභිධර්මාර්ථ සංග්‍රහය ද ඇසුරු කරමින් චිත්ත කාණ්ඩයේ පෙළ වණපොත් කරන්න.**

19 පාඩම

# චිත්ත වග්ගය

තථාගත ධර්මය සූත්‍ර ත්‍රිපිටකය, විනය පිටකය, අභිධර්ම පිටකය, යනුවෙන් පිටක තුනකට බෙදේ. ඉන් සූත්‍ර පිටකය,

| | | |
|---|---|---|
| 01. දීඝ නිකාය | - දික් සඟිය | - දීඝාගම |
| 02. මජ්ඣිම නිකාය | - මැදුම් සඟිය | - මජ්ඣිමාගම |
| 03. සංයුක්ත නිකාය | - සංයුත් සඟිය | - සංයුත්තාගම |
| 04. අංගුත්තර නිකාය | - අඞගුත්තර සඟිය | - අංගුත්තරාගම |
| 05. ඛුද්දක නිකාය | - කුදුගත් සඟිය | - ඛුද්දකාගම |

යනුවෙන් ග්‍රන්ථ පහකින් (5)න් යුක්ත වේ. මේවා නිකාය නමින් ද, සඟි නමින් ද, ආගම නමින් ද පාලි සාහිත්‍යයෙහි හැඳින්වේ.

මේ අතරින් ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ සංඛ්‍යාව පහළොවකි. ඒවා

| | |
|---|---|
| 01. ඛුද්දක පාඨ | 06. විමාන වත්ථු |
| 02. ධම්මපද | 07. ප්‍රෙත වත්ථු |
| 03. උදාන | 08. ථෙර ගාථා |
| 04. ඉතිවුත්තක | 09. ථෙරී ගාථා |
| 05. සුත්තනිපාත | 10. ජාතක |
| 11. නිද්දෙස (චුලල-මහා) | 12. අපදාන (ථෙර-ථෙරී) |
| 13. පටිසම්භිදා මග්ග | 14. බුද්ධ වංස |
| 15. චරියා පිටක | |

යනුවෙනි.

ධම්ම පදය ඛුද්දක නිකායේ දෙවැනි පොත යි. මෙහි අඩංගු වන්නේ බුදුරජාණන් වහන්සේ යම්යම් කරුණු අරමුණු කර ගනිමින් දේශනා කරන ලද සංක්ෂිප්ත ගාථා දේශනාවන් ය. ඒවා එක් එක් මාතෘකා අනුව වග්ග 26කට බෙදා ඇත. උදාහරණ ලෙස සිත පිළිබඳ දේශනා ''චිත්ත වග්ගයටත්'' භික්ෂුව පිළිබඳ දේශනා ''භික්ඛු වග්ගය''ටත් ආදී වශයෙන් වර්ග නම් කොට ඇත. වග්ග සියල්ල 26 කි. ඒ සියල්ලේ ඇතුළත් ගාථා ගණන 423කි. මෙම හැම ගාථාවකම පාහේ නිදාන කථාවක් ද ඇත. එම නිදාන කතා ඇතුළත් වන්නේ ධම්මපද අටුවාවෙහි ය. එහි නිදාන කතාවට අමතරව ගාථාව පිළිබඳ ධර්ම විවරණ ද ඇතුළත් ව ඇත.

බුද්ධ ධර්මයේ එන චතුරාර්ය සත්‍යය, කර්මය පුනර්භවය ආදී සෑම ධර්ම කොට්ඨාසයක්ම පාහේ ධම්මපදයෙහි ගාථා මාර්ගයෙන් සැකෙවින් ඉදිරිපත් කොට තිබීම විශේෂත්වයකි.

උදාහරණ ලෙසඃ-

**''දුක්ඛං දුක්ඛ සමුප්පාදං**
**දුක්ඛස්ස ච අතික්කමං**
**අරියංඡට්ඨංගිකං මග්ගං**
**දුක්ඛූපසමගාමිනං''**
**(ධම්ම පදය - බුද්ධ වග්ගය - 13 වෙනි ගාථාව)**

යනු චතුරාර්ය සත්‍යය දක්වා ඇති ආකාරයයි.

කර්මය බුදු දහමෙහි එන ගැඹුරු ඉගැන්වීමකි. ධම්මපදයේ **''මනො පුබ්බංගමා ධම්මා''** වැනි ගාථාවලින් සරලව උපමා මාර්ගයෙන් ඉදිරිපත් කිරීම විශිෂ්ඨය. මෙලෙස බුදු දහමේ එන ගැඹුරු ධර්ම කාරණා ඉතා සරලව, සුගමව ධම්මපදයේදී ගාථා මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම මතක තබා ගැනීමට ද පහසුවකි.

මෙහි යෙදී ඇති උපමා ද මහා උගතුන්, නැණවතුන් පණ්ඩිතයන් විසින් අපහසුවෙන් පෙරලා දැනගත යුතු ඒවා නොව සාමාන්‍ය ජනයාට එදිනෙදා ජීවිතයේ දී හොඳට හුරුපුරුදු උපමාය.

**''දබ්බිසූපරසං යථා''**
**''ජිව්හාසූපරසං යථා''**
**''වාරිජොව ථලෙ ඛිත්තො''**
**''චක්කංව වහතො පදං''**
**''ඡායාව අනපායිනී''**

යනු එබඳු උපමා කීපයකි.

ධම්ම පදයේ එන ධර්ම උපදේශ මගින් භික්ෂු ජීවිතය නිසිමගට යොමුවීමටත් සාර්ථකව පවත්වාගෙන යාමටත් විශාල පිටුවහලක් සපයයි.

''ඛන්තී පරමං තපො තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා
න හි පබ්බජිතො පරූපඝාති
සමණො හොති පරං විහෙඨයන්තො''

(ධම්ම පදය - බුද්ධ වග්ගය - 06 වෙනි ගාථාව)

''යො හවෙ දහරො භික්ඛු
යුඤ්ජති බුද්ධ සාසනෙ
සො ඉමං ලොකං පභාසෙති
අබ්භාමුත්තොව චන්දිමා''

(ධම්ම පදය - භික්ඛු වග්ගය - 23 වෙනි ගාථාව)

''කායෙන සංවරො සාධු
සාධු වාචාය සංවරො
මනසා සංවරො සාධු
සාධු සබ්බත්ථ සංවරො
සබ්බත්ථ සංවුතො භික්ඛු
සබ්බ දුක්ඛා පමුච්චති''

(ධම්ම පදය - භික්ඛු වග්ගය - 02 වෙනි ගාථාව)

යනාදී දේශනා මෙයට කදිම නිදසුන් ය.

ලෝකයේ භාෂා බොහෝ ගණනකට පරිවර්තනය කර ඇති ධම්මපදය ශ්‍රී ලාංකික **''බෞද්ධයාගේ අත්පොත''** යන විරුදාවලිය දිනා ඇති ග්‍රන්ථයකි.

නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ ධර්මාශෝක රජතුමාට බුදු දහම හඳුන්වා දුන්නේ ද **''අප්පමාදො අමතපදං''** ආදී ධම්මපදයේ අප්පමාද වග්ගයේ ගාථාවෙන් තමන් දන්නා පමණින් කළ දේශනාව මගිනි.

එදත් අදත් ධර්ම දේශකයන් වහන්සේලා සිය දේශනාවන්ට වැඩි වශයෙන් ම මාතෘකා කර ගන්නේ ධම්මපද ගාථාවන් ය. ධර්ම දේශනා හුරුපුරුදු වන නවක සාමණේරයන් වහන්සේලාට ධම්මපද ගාථාවක් මාතෘකා කරගෙන එහි නිදාන කතාව විස්තර කරමින් ධර්ම දේශනා පුහුණුවීම පහසු කාර්යයකි.

ශාසනයේ පැවිදි වන සෑම හිමිනමක් ම ධම්මපදය වනපොත් කිරීම අනිවාර්ය කටයුත්තකි. විශේෂයෙන් ම උපසම්පදා අපේක්ෂකයන් වහන්සේලා ධම්ම පදය වනපොත් කර තැබිය යුතු ය.

### 3.5.1 චිත්ත වග්ගය

ධම්ම පදයේ තෙවන වර්ගය චිත්ත වර්ගයයි. මෙහි ගාථා එකොළහක් (11) හා නිදාන කතා නමයකින් (9) යුක්ත වේ. චිත්ත වග්ගයෙන් සිත පිළිබඳ ඉදිරිපත් කෙරෙන දහම් කරුණු සදාතනික අගයකින් යුක්ත ය. මෙසේ සිත පිළිබඳ ඉදිරිපත් කරන කරුණු ප්‍රධාන වශයෙන් කොටස් හතරකට (4) ට බෙදා දැක්විය හැකි ය.

- චිත්ත ස්වභාවය හෙවත් සිතේ සැටි විස්තර කිරීමෙන් සිත හඳුන්වා දීමත්
- චිත්ත සංවරය හෙවත් සිතේ සංවරභාවය ඇතිකරගත යුතු අයුරු පැහැදිලි කිරීමත්
- චිත්ත සංවරයෙන් ලැබෙන ප්‍රතිඵලත්
- නුවණැත්තා (පණ්ඩිතයා) සිත තමන්ට අවශ්‍ය ආකාරයට දමනය කරගන්නා ආකාරයත් යනුවෙන් ඒ කොටස් හතර විස්තර කළ හැකි ය. මෙසේ සිත පිළිබඳ ව අප විසින් දැනගත යුතු කරුණු ඉතා සරල ව හා සමීප උපමා භාවිතයෙන් චිත්ත වග්ගයේ විස්තර කර ඇත.

මෙසේ සිත පිළිබඳ ව අප විසින් දැනගත යුතු කරුණු ඉතා සරලව හා සමීප උපමා භාවිතයෙන් චිත්ත වග්ගයේ විස්තර කෙර ඇත.

සිත යනු මිනිසා සතු උසස්ම සහ වටිනාම ඉන්ද්‍රියයි. සිතෙහි පවතින පිරිසිදුකම හෝ අපිරිසිදුකම අනුව පුද්ගලයෙකුගේ දියුණුව හෝ පරිහානිය සිදුවේ. එමෙන් ම සිතෙහි ස්ථිර බවක් නොමැත. සිත චංචලය, සසලය, පඤ්ච ඉන්ද්‍රියයන්ට ගෝචර වන අරමුණු වෙත යොමුවන සිත වහා ඒවාට ඇදී යයි. එසේම සැලෙන සුලු සිත වළකාලීම අපහසු ය. නිග්‍රහයට හෙවත් අවවාදයට අවනත නැත. සියුම්ය, දුර ගමන් යන සුලුය, තනිවම හැසිරේ, ඊට ශරීරයක් නැත. සත්ත්ව ශරීරය නැමැති ගුහාව ඇසුරු කොට පවතී. යනු චිත්ත වග්ගයේ දී  සිත හඳුන්වා දී ඇති ආකාරය යි.

සිත මැනවින් සකස් කර ගැනීම හා පාලනය කර ගැනීම මගින් බුදු දහමින් අපේක්ෂිත අරමුණු ඉටු කරගත හැකි ය. ඒ සඳහා සකස් කරගත යුතු ඒ සිත සකස් කර ගන්නා ආකාරය චිත්ත වග්ගයේ දී මෙසේ දක්වා තිබේ.

> **" කුම්භූපමං කායමිමං විදිත්වා**
> **නගරූපං චිත්තමිදං ඨපෙත්වා**
> **යොධෙථ මාරං පඤ්ඤාවුධෙන**
> **ජිතංච රක්ඛෙ අනිවෙසනොසියා"**
>
> **(ධම්මපදය- චිත්ත වග්ගය -08 වෙනි ගාථාව)**

මේ ශරීරය මැටි බඳුනක් ලෙස අවබෝධ කරගෙන සිත නගරයක් ලෙස සලකා කෙලෙස් නැමැති මාරයාට ප්‍රඥාව නැමැති ආයුධයෙන් පහර දිය යුතු ය. එහි දී දිනාගන්නා

විදර්ශනා නුවණ ආරක්ෂා කරගත යුතු ය. යන මේ දේශනාවෙන් පැහැදිලි වන්නේ කයෙහි නිසරු බව සහ සිතේ බලවත් බව වටහාගෙන විදර්ශනා නුවණින් නිවනට යොමුවිය හැකි බවයි.

යහපත් සිතිවිලි උපදවා ගැනීමෙන් යහපත් ක්‍රියාවන් ගොඩනැගේ. යහපත් ක්‍රියාවෙන් දෙලොව අභිවෘද්ධිය සැලසේ. ''**චිත්තං ගුත්තං සුඛාවහං**'' යනුවෙන් සිත සංවර කර ගැනීමෙන් සැප ගෙන දෙන බව පැවසෙන්නේ ඒ නිසාය. බෞද්ධයන් ලෙස කාගේත් අපේක්ෂාව සසර දුක් නැති කර ගැනීමය. එසේ නම් ඒ සඳහා ප්‍රධාන වන්නේ සිත කිළුටු කරන කෙලෙස් ඉවත් කර ගැනීමයි. එය චිත්ත පාරිශුද්ධිය නමින් හැඳින්වේ.

### 3.5.1.1 සසල සිත නිසල කර ගන්න.

බුදුරජාණන් වහන්සේ එක් කලෙක චාලිකා නුවර චාලිකා පර්වතයෙහි වැඩ වාසය කරන සේක. එවකට බුද්ධෝපස්ථායක වූයේ මේඝිය තෙරුන් වහන්සේය. උන්වහන්සේ දිනක් පිණ්ඩපාතය නිමවා කිමිකාලා ගං ඉවුරට වැඩියේ ය. ඒ අසල තිබූ ඉතා රමණීය සිත්කළු අඹ උයනක් දුටු උන්වහන්සේට ගොස් භාවනා කිරීමට සිතුණි. ඒ අනුව ශාස්තෘන් වහන්සේගෙන් අවසර ගෙන එම අඹ උයනට ගොස් භාවනා කිරීමට පටන් ගත්හ. එහෙත් සිත එකඟකර ගැනීමට නොහැකි විය. එයට හේතුව නම් එම ස්ථානය පෙර ආත්මභාව පන්සීයක දී තමන් රජ කෙනෙකු වශයෙන් නළඟනන් පිරිවරා රජසිරි විඳ පුරුදු ස්ථානයක් වීමයි. මේඝිය හිමියන් නැවත භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණ තමන් වහන්සේට සිදු වූ සියළු කරදර බාධක පිළිබඳ දන්වා සිටියහ. එහි දී භාග්‍යවතුන් වහන්සේ, මේඝිය, තම සිතට වහලෙකු නොවිය යුතු ය. සිත තමාගේ වසඟයට ගත යුතු යැයි දක්වමින් ''**ඵන්දනං චපලං චිත්තං**'' ආදී වූ මෙම ගාථාව දේශනා කළ සේක.

1) **ඵන්දනං චපලං චිත්තං**
**දූරක්ඛං දුන්නිවාරයං**
**උජුං කරොති මෙධාවී**
**උසුකාරො 'ව තෙජනං**

**පදාර්ථ:-** **ඵන්දනං**, සැලෙන, **චපලං**, සෙලවන, **දූරක්ඛං**, හීලෑකිරීමට අපහසු, **දුන්නිවාරයං**, වැලැක්වීමට අපහසු **චිත්තං**, සිත **මෙධාවී**, නුවණැත්තා, **උජුංකරොති**, සෘජුකරයි. හෙවත් ඇද නැති කරයි. (කෙසේද යත්) **උසුකාරොව**, හී වඩුවා **තෙජනං ඉව**, හී දණ්ඩ සෘජු කරන්නාක් මෙනි.

**විවරණය:-** හී දණ්ඩක් සෘජු කරනවා යනු ලී දඬු කැබැල්ලක් කපාගෙන විත් පොතුහැර කැඳ තෙලෙහි දමා තම්බා ගිනි අඟුරු කබලක දමා තවා, ගස් දෙබලක දමා ඇදහැර

දුන්නෙහි ලා විදීමට සුදුසු ආකාරයෙන් සකස් කිරීමයි. එසේම නුවණැත්තා සැලෙන තැන තැන දුවන ස්වභාව ඇති සිත ධුතාංග සමාදානය, විවේක සේනාසන වාසය වැනි ක්‍රමවලින් ද, කෙලෙස් ගතිවලින් ද සිත මුදාගෙන පස්කම් ඇසුරෙන් බැහැරට ගෙන ශ්‍රද්ධා නැමැති කැඳ තෙලෙහි දමා කායික මානසික වීර්යය නැමැති ගිනි කබලෙන් තවා සමථ විදර්ශනා නැමැති ගස් දෙබලෙහි දමා ඇදහැර නැවත කෙලෙස් වසඟයට පත්නොවන ආකාරයට සිත සකස් කර ගනී. නැතහොත් රහත් ඵලයට පත්වේ.

2) **වාරිජෝ’ව ථලෙ ඛිත්තො**
**ඔකමොකත උබ්භතො**
**පරිඵන්දතිදං චිත්තං**
**මාරධෙය්‍යං පහාතවෙ**

**පදාර්ථ:-** **ඉදං චිත්තං**, මේ සිත, **ඔකමොකත**, ජලය නමැති වාසස්ථානයෙන් **උබ්භතො**, උඩටගෙන, **ථලෙඛිත්තො**, ගොඩට දමන ලද, **වාරිජෝ ඉව**, මාළුවෙකු මෙන්, **පරිඵන්දති**, සැලෙයි **මාරධෙය්‍යං**, සසරෙහි බැඳ දමන කෙලෙස්, **පහාතවෙ**, දුරු කළ යුතු ය.

**විවරණය:-** දියෙන් ගොඩදමන ලද මාළුවා ජලය නොමැතිවීම නිසා සැලෙයි. ඉපිලෙයි. එසේම මේ සිතද පංචකාම ගුණයෙහි ඇලී අරමුණෙන් අරමුණට පනිමින් සැලෙමින් පවතින්නකි. මෙම පංචකාමය මාරයාට අයත් ගොදුරු බිම වන බැවින් මාරධෙය්‍ය නම් වේ. සත්ත්වයා මැරි මැරී ඉපිදි ඉපිදි සසර සැරිසරන්නේ එහි ඇලී සිටින නිසා ය. ඒ කෙලෙස් සංසාරය නැමැති මාරධෙය්‍යය දුරුකළ යුතු ය. නැතහොත් සිත පංචකාම කෙලෙසීමෙන් මුදාගත යුතු ය. එවිට නැවත මරුවාට හසු නොවේ එනම් නැවත ඉපදීමක් නැති බැවිනි.

### 3.5.1.2 දමනය කළ සිත සසර දුක නවතාලයි.

එක්තරා වස් කාලයක් සමීපයේ භික්ෂූන් වහන්සේලා හැටනමක් බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් ලබා මාතිකගාම නම් ගමට වැඩම කළහ. එහි ගම්ප්‍රධානියා වූ මාතිකගේ මව එම භික්ෂූන් වහන්සේලා දැක තම නිවසට වැඩමවා දානය පිළිගැන්වූවා ය. උන්වහන්සේලා පැමිණි කාරණාව විමසා දන විහාර කරවා දී එම වස් තෙමස එහිවැඩ සිටින්නට ආරාධනා කළහ. උන්වහන්සේලා එම ආරාධනාව පිළිගෙන මාතික ග්‍රාමයේ ම වැඩ සිටිමින් භාවනා කරන්නට පටන් ගත්හ. දිනක් භික්ෂූන් එකට රැස්වී ඔවුනොවුන්ට ම අවවාද කරගත්හ. ‘‘ඇවැත්නි, අප අප්‍රමාදී විය යුතු ය. දෙදෙනෙකු එකතැන නොසිටිය යුතු ය, නොහිඳගත යුතු ය, සවස් යාමෙහි මහ තෙරුන්ට උපස්ථාන කරන වෙලාවේත් උදෑසන පිණ්ඩපාතය වඩින වෙලාවේත් එක්වෙමු. ගිලන් වූ භික්ෂුවකට උපස්ථාන කළ යුතු වෙලාවේත් හැර එකට රැස් නොවෙමු’’යි, කතිකා කොට වෙන් වෙන් ව තම තමන් වසන තැන්වල සිටම මහණදම් පුරමුයි කියා සියළුදෙනා වහන්සේ වෙන් වෙන්ව විසූහ. මේ අතර දිනක් සවස් කාලයෙහි මාතික මාතාව තම පිරිවර ද සමග ගිතෙල් මී පැණි ආදියත්

රැගෙන විහාරයට පැමිණ භික්ෂූන් නොදක ආර්යයන් වහන්සේලා කොහි වැඩියාහු ද යි මිනිසුන්ගෙන් ඇසුවා ය. උන් වහන්සේලා තම තමන්ගේ දිවා රාත්‍රී වැඩ සිටින ස්ථානවල ඇතැයි ද ගෙඩිය ගැසූ කළ වඩිනු ඇතැයි ද ඔවුහු පැවසූහ. එවිට ගෙඩිය ගසා භික්ෂූන් කැඳවා ගිතෙල් මී පැණි ආදී ගිලන්පස පූජා කොට වැඳ ස්වාමීනි, ඔබ වහන්සේලා, කෝලාහල කරගෙන අමනාපව සිටිත්දැයි විමසූහ. එසේ නැතැයි භික්ෂූන් වහන්සේලා පිළිතුරු දුන්හ. එසේනම් එක එක තැන්වල වෙන වෙන ම හිඳ මහණ දම් පුරන නිසාවෙනුයි භික්ෂූහු පැවසූහ. එවිට ඇය, ඔබ වහන්සේලා කුමන මහණ ධර්මයක් පුරන්නේදැයි විමසූහ. ද්වතිංසාකාරය සජ්ඣායනා කරමින් ශරීරයේ ඇතිවීම නැති වීම සලකමින් අසුභානුස්සතිය වඩන්නෙමුයි පැවසූහ. එය අපට වැඩිය නොහැකි දැයි උපාසිකාව විමසුවා ය. කාටත් කළ හැකි යැයි තෙරවරු පැවසූහ. එසේ නම් ඒ කමටහන අපටත් දෙනු මැනවැයි කියා භික්ෂූන් වහන්සේලාගෙන් කමටහන් ලබා ගත් ඕ තොමෝ බවුන් වඩා භික්ෂූන් වහන්සේලා ට පෙර මුල් මාර්ග ඵල තුනම ලැබුවා ය. එසේම සිව් පිළිසිඹියා සහ පඤ්ච අභිඥා ද උපදවා ගත්තා ය. අනතුරුව ඕ තොමෝ මාගේ ආර්යයන් වහන්සේලා මගඵලවලට පත්ව ඇද්දැයි දිවසින් බැලුවා ය. කිසිවෙක් එබඳු විශේෂයකට පැමිණ නැති බව නුවණින් මෙනෙහි කොට බලා ඊට හේතුව ආහාර සප්පාය නැතිකම යැයි දැන ගත්තා ය. අනතුරුව ඒ ඒ භික්ෂූන් වහන්සේට ගැලපෙන ආකාරයෙන් ආහාරපාන ආදී පහසුකම් ලබා දීමෙන් පසු උන් වහන්සේලා නොබෝකලකින් ම මාර්ගඵලයන්ට පත් වූහ. වස් සමය අවසන් ව එම භික්ෂූහු බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ මාතික මාතාවගේ ගුණ කියූහ. එය අසා සිටි එක්තරා භික්ෂුවක් ද භාවනා කිරීමට එහි ගියේ ය. එම භික්ෂුවට ද සිතන පතන සියලු ආහාරපාන ආදියෙන් මාතික මාතාව උපස්ථාන කළා ය. ඒ අනුව උන්වහන්සේ ඇය පරසිත් දන්නා නුවණ ඇති කෙනෙකු බව දැන, පුහුදුන් අපි විවිධ දේ සිතම්හ. ඒ නිසා මෙහි වාසය කිරීම නොකළ යුතු යැයි සිතා නැවත බුදුරජාණන් වහන්සේ වෙත ගොස් එම සියලු පුවත් දන්වා සිටිය හ. එය ඇසූ භාග්‍යවතුන් වහන්සේ මහණ ඔබ එහිම යන්න. එහි දී ඔබේ සිත පමණක් රැකගන්න. සිත රැකීම අපහසු ය. ඔබ ඔබේ සිතටම අවවාද කර ගන්න. වෙනත් කිසිවක් නොසිතන්න යැයි අවවාද කොට ''**දුන්නිග්ගහස්ස ලහුනො**'' ආදී වූ මේ ගාථාව දේශනා කළ සේක.

3) **දුන්නිග්ගහස්ස ලහුනො**
**යත්ථකාමනිපාතිනො**
**චිත්තස්ස දමථො සාධු**
**චිත්තං දන්තං සුඛාවහං**

පදාර්ථ:- **දුන්නිග්ගහස්ස,** නිග්‍රහයට හෙවත් මෙල්ල කරගැනීමට අපහසු, **ලහුනො,** වහා ඇති වී නැතිවන සුලු, **යත්ථ කාම නිපාතිනො,** කැමති කවර හෝ අරමුණක වැටෙන සුලු, **චිත්තස්ස,** සිතෙහි, **දමථො සාධු,** දමනය මැනවි (යහපති) **දන්තං,** දමනය කළ, **චිත්තං,** සිත **සුඛාවහං,** සුව ගෙනදේ.

අදහස:- මේ සිත වනාහි නිග්‍රහ කොට මෙල්ල කිරීමට අපහසුය. වහ වහා ඉපදී නැතිවන සුළුය. තමන් කැමති සුදුසු තැන හෝ නුසුදුසු තැන ගැලපෙන නොගැලපෙන බව නොබලා

සිතූ සිතූ අරමුණෙහි වැටෙන සුලු ය. ඒ අරමුණු ඔස්සේ දිවීම, වළකා දමනය කර ගැනීම සතර මාර්ගයෙන් කෙලෙසුන්ගෙන් මුදවා ගැනීම යහපති. මන්දයත් එසේ දමනය වූ සිත මගඵල සුවයත්, පරම නිර්වාණ සුවයත් ගෙන දෙන්නේ ය.

### 3.5.1.3 රැක්කොත් සිත ලැබේය සැප.

බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටින කාලයෙහි සැවැත් නුවර එක්තරා සිටුපුත්‍රයෙකු තම කුළුපග සිල්වත් භික්ෂූන් වහන්සේ නමක් වෙත ගොස් සංසාර දුකින් නිදහස්වීම පිණිස මග කියාදෙනු මැනැවැයි ඉල්ලීය. තෙරුන්වහන්සේ පළමුව දානාදී පිංකම් කිරීම සඳහා ද දෙවනුව සීලාදී ගුණදහම් රැකීම සඳහා ද ආදී වශයෙන් අනුපූර්ව පිංකම් කිරීමට යොමු කළහ. මෙසේ අනුපූර්ව පිංකම් කළ හෙයින් ''**අනුපුබ්බසෙට්ඨිපුත්ත**'' යන නම ලැබීය. අනතුරුව පැවිදිවන්නැයි අනුසාසනා ලැබ පැවිදි වූහ. එක් ආභිධම්මික තෙරුන් වහන්සේ නමක් ගුරුවරයා ලෙසත් විනයධර භික්ෂුවක් උපාධ්‍යාය ලෙසත් තබාගෙන උන්වහන්සේ උපසම්පදා වූහ. එහිදී ආචාර්ය උපාධ්‍යාය තෙරවරු මෙය නම් කළ යුතුය මෙය නොකල යුතු යැයි ද, මෙය කැපයැයි ද මෙය අකැපයැයි ද නිතර අවවාද කරති. එවිට මෙම භික්ෂුව මාගේ ආචාර්ය උපාධ්‍යායාය දෙදෙනා වහන්සේ එකිනෙකට වෙනස් වූ කරුණු කියති. මෙය මහත් පීඩාවකැයි සිතූ උන්වහන්සේ සිවුරු හැරගොස් ගිහිගෙදර සිටම දුකින් මිදීමට ක්‍රියා කළ හැකි යැයි සිතා පැවිදි බවෙහි කලකිරී බණ භාවනා කිරීම අත්හළහ. ඉන් උන්වහන්සේ පාණ්ඩු රෝගියෙකු මෙන් කෙසගව කුෂ්ඨ රෝගයකින් ද පෙළෙන්නට වූහ. මේ බව දුටු සෙසු විහාරවාසී භික්ෂූන් කරුණු විමසූහ. උන්වහන්සේ සියළු පුවත් කීහ. භික්ෂූන් ඒ බව ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලාට දන්වූහ. උන්වහන්සේලා ඔහු කැටුව බුදුරජාණන් වහන්සේ හමුවට ගොස් සියළු පුවත් ප්‍රකාශ කොට විස්තර කියූහ. එවිට බුදුරජාණන් වහන්සේ මහණ, ඔබ පැවිද්ද හැර යාට සිතුවේ මන්දැයි විමසූහ. එවිට එම භික්ෂුව ස්වාමිනි, මා පැවිදි වූයේ දුකින් මිදීමට ය. එහෙත් මාගේ ආචාර්යයන් වහන්සේ මට අභිධර්ම කතා කියති. උපාධ්‍යායන් වහන්සේ විනය කතා කියති. දැන් මට අතක් පයක් දිගහරින්නටවත් ඉඩක් නැත එහෙයින් ගිහිවන්නට සිතුවෙමැයි කීහ. එසේ නම් මහණ, ඔබට එකක් රැකිය හැකිදැයි භාග්‍යවතුන් වහන්සේ විමසූහ. එකක් නම් හැකිය ඒ කුමක්දැයි ඇසූ විට එසේ නම්, ඔබ තම සිත පමණක් රැක ගන්නයයි අවවාද කොට ''**සුදුද්දසසං සුනිපුනං**'' ආදී වූ මෙම ගාථාව දේශනා කළ සේක. මේ දේශනාව අවසානයේ ඒ භික්ෂුව සෝවාන් ඵලයෙහි පිහිටියේ ය. සෙසු පිරිස ද සෝවාන් ආදී මාර්ග ඵලයන්හි පිහිටියහ.

4) **සුදුද්දසං සුනිපුනං**
**යත්ථකාමනිපාතිනං**
**චිත්තං රක්ඛෙථ මෙධාවී**
**චිත්තං ගුත්තං සුඛාවහං**

**පදාර්ථ:-** **සුදුද්දසං,** දකින්නට ඉතා අපහසු වූ, **සුනිපුණං,** ඉතා සියුම් වූ, **යත්ථකාම නිපාතිනං,** කැමති යම් අරමුණකට වැටෙන සුළු වූ, **චිත්තං,** සිත, **මේධාවී,** නුවණැත්තා, **රක්ඛෙථ,** රැකගන්නේය, **ගුත්තං,** රැකගන්නා ලද, **චිත්තං,** සිත, **සුඛාවහං,** සැපගෙන දෙයි.

**අදහස:-** මේ සිත වනාහි භාවනාව හුරුපුරුදු කිරීමෙන් මිස වෙනත් ක්‍රමයකින් දැකගැනීම අපහසුය. සිත හසුකර ගත හැක්කේ සිතටම පමණි. එසේ හසුකර ගැනීමටත් අපහසු තරම් සිත සියුම්ය. ජාති කුල ගොත් සුදුසු නුසුදුසුකම් කිසිවක් නොසලකා සිතූ සිතූ තැන වැටෙන සුලු ය. එයට වසඟ වන අනුවණයන්ට සිත රැකිය නොහැකි ය. ඔවුහු සිතටම වසඟ වී විනාශ වන්නාහ. සිත රැකිය හැක්කේ ඥාණවන්තයෙකුටම පමණි. එහෙයින් ඔබත් සිත රකින්න. එසේ රකින ලද සිත මග ඵල නිවන්සුව ගෙන දෙයි.

## 3.5.1.4 රැකගෙන සිත පරදමු මරු.

සැවැත්නුවරවාසී එක්තරා කුලපුත්‍රයෙක් සිටියේ ය. හෙතෙම බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා පැවිදි විය. සංඝරක්ඛිත නම් වූ උන්වහන්සේ ඉතා කෙටි කලකින්ම විදසුන් වඩා රහත් බවට පත් වූහ. උන්වහන්සේගේ කනිටු සොහොයුරාගේ බිරිඳට ලැබුණු කුළුඳුල් පුත්‍රයාට ද තෙරුන් වහන්සේගේ නාමය ම තබන ලදී. ඒ කුමරුවා ද උන්වහන්සේ වෙතම පැවිදි ව භාගිනෙය්‍ය සංඝරක්ඛිත නමින් ප්‍රකට විය. එක්තරා වස්කාලයක වෙනත් දුර බැහැර ගමක භාගිනෙය්‍ය සංඝරක්ඛිත තෙරුණුවෝ වස් විසූහ. වස් කාලය අවසානයේ උන්වහන්සේට සත්රියන් සහ අටරියන් බැගින් වූ රෙදිකඩ දෙකක් වස්සාවාසික චීවර පූජා වශයෙන් ලැබුනි. ඉන් අටරියන් රෙදිකඩ ගුරු දේවයන් වහන්සේට පුදමි'යි සිතා එයත් රැගෙන සංඝරක්ඛිත මහරහතන් වහන්සේ වැඩ සිටින විහාරයට වැඩම කළ හ. ගුරු දේවයන් වහන්සේ වැඳ ඇප උපස්ථාන කොට එම රෙදිකඩ උන්වහන්සේ පාමුල තබා ස්වාමීනි, මෙයින් චීවරයක් සකසා පරිභෝග කරනු මැනවැයි කියා රෙදිකඩ පිළිගන්වා විජිනිපත ගෙන ගුරුදේවයන් වහන්සේට පවන් සලන්නට විය. තෙරණුවෝ, සංඝරක්ඛිත, මාගේ තුන් සිවුරු සම්පූර්ණයි. මෙය ඔබ පරිභෝග කරන්නැයි කීහ. භාගිනෙය්‍ය හිමියන් ස්වාමීනි, මෙය ඔබ පිළිගෙන පරිභෝග කළහොත් මට මහත්ඵල මහානිසංස වේයැයි තෙවරක් ම ඉල්ලා සිටියත් මහතෙරුන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළහ. පවන් සලමින් සිටි භාගිනෙය්‍ය සංඝරක්ඛිත හිමියෝ එයින් මහත් සිත් තැවුලට පත්වූහ. එසේ පවන් සලමින් සිටිය දී ම උන් වහන්සේගේ සිත බොහෝ දුර ගමන් කළේ ය. ගිහිව සිටිය දී බෑණා වූ ද, දුන් සද්ධි විහාරික වූ ද, මාගේ පූජාව උපාධ්‍යායන් වහන්සේ නොපිළිගන්නේ නම් උන්වහන්සේ වෙත තවදුරටත් මහණදම් පිරීමෙන් පලක් නැත. මම සිවුරු හැර යමි. ඒත් මට ජීවත්වීමට ක්‍රමයක් නැත. මම මේ රෙදිකඩ දෙක විකුණමි. ඒ මිළෙන් එළුදෙනක් මිළදී ගන්නෙමි. එළු දෙන්නු ඉක්මනින් පැටවු බිහි කරති. ඒ පැටවුන් විකුණා මම මුදල් උපයා ගනිමි. එසේ මුදල් රැස්කර බිරිඳක් කැන්දා ගෙන එන්නෙමි. ඇය එක් පුතෙකු බිහි කරන්නීය. මම ඔහුට මාමාගේම නම තබා කුඩා රථයක් සාදවා ගෙන පුතා සහ බිරිඳ එහි නංවාගෙන මාමා වූ මහ තෙරුන් වහන්සේ බලන්නට එන්නෙමි. එසේ එන අතරමගදී මම රථය පදවන ගමන්ම ඇගෙන් මොහොතකට දරුවා වඩාගන්නට ඉල්ලන්නෙමි. එවිට ඇය ඔබ දරුවා ගන්නේ කුමට ද රථය පදවන්නැයි කියා මා සමග අමනාප වී පොරබදද්දී දරුවා

බිමට වැටී රථ රෝදයට හසු වෙයි. එයින් කෝපයට පත්වන මම දරුවා මට දුන්නේ නැත. තී රැකගත්තේ ද නැතැයි කියා ඇයට අතේ තිබෙන කෙවිටෙන් පහරදෙන්නේ මෙසේයයි සිතා බිරිඳට පහර දෙන අදහසින් උන්වහන්සේ අතේ තිබුණු විජිනිපතින් මහතෙරුන්ගේ හිසට වැරෙන් පහරක් දුන්නේ ය. භාගිනෙය්‍ය සංඝරක්ඛිත මට පහර දුන්නේ මන්දැයි දිවැස් නුවණින් බැලූ මහ තෙරුන් වහන්සේට මුළු පුවත ම පෙනිණ. අනතුරුව උන් වහන්සේ ඔබ බිරිඳට දුන් පහර වැදුනේ මටය. මේ මහළු මම කළ වරද කුමක්දැයි ඇසූහ. භාගිනෙය්‍ය හිමියන් අහෝ මම නැසුනෙමි. උපාධ්‍යායන් වහන්සේ මගේ සිත දැනගත්තේ යැයි ලැජ්ජාවටත්, බියටත් පත්ව විජිනිපත දමා පැන දුවන්නට විය. සෙසු සාමණේර භික්ෂූහු උන්හන්සේ ලුහුබැඳ ගොස් අල්ලාගෙන බුදුරජාණන් වහන්සේ වෙත ඉදිරිපත් කළහ. මහණ, ඔබ කලබල නොවන්න. සිත නම් මෙවැනිය. මේ සිත ක්ෂණයකින් ඉතා දුර තිබෙන අරමුණු ද ගන්නා එකකි. එහෙයින් මේ සිත රාග, දෝස, මෝහ, බන්ධනවලින් මුදාගන්නට වෑයම් කළ යුතුයැයි වදාරා ''**දූරං ගමං එකචරං**'' ආදී වූ මේ ගාථාව දේශනා කළ සේක.

**5. දූරඞ්ගමං එකචරං**
**අසරීරං ගුහාසයං**
**යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති**
**මොක්ඛන්ති මාරබන්ධනා**

**පදාර්ථ:-** **දූරඞ්ගමං**, අරමුණ කරා (දුර ගමන් යන්නා වූ) **එකචරං**, තනිව හැසිරෙනඃ **අසරීරං**, ශරීරයක් නොමැති වූ, **ගුහාසයං**, ශරීරය නමැති ගුහාවක් ඇසුරු කරන, **චිත්තං**, සිත **යෙ**, යමෙක්, **සඤ්ඤමෙස්සන්ති**, සංවර කරගනිත් ද, (ඔවුහු) **මාර බන්ධනා**, මාරබන්ධනයෙන්, **මොක්ඛන්ති**, මිදෙත්.

**විවරණය:-** සිත දුර යතැයි කීවත් සිත තමා සමගම පවතින්නකි. බැහැර යන්නේ නැත. එහෙත් තමාට හුරු පුරුදු, දැක පුරුදු ඉතා දුර තිබෙන දේ පවා අරමුණු කළ හැකි ය. **දූරඞ්ගමං** යනුවෙන් කියවෙන්නේ එයයි. **එකචරං**, යන්නෙන් අදහස් වන්නේ තත්පරයකට සිතිවිලි සිය ගණනක් පහළ විය හැකි ය. එක් සිතක් පහළ වී නැතිව ගොස් වෙන සිතක් පහළ වීම ස්වභාවයයි. ඒ අනුව **එකචරං**, යයි කීවේ එක් වරකට එක් සිතක් පමණක් පවතින බවයි. යනු සිතට හැඩරුවක් නැත. ඇත්තේ සියුම් ශක්තියක් පමණි. එය මේ සතර මහා භූතයන්ගෙන් සැදුණු ශරීර ගුහාවෙහි හෘදය වස්තුවේ ලේ ධාතුව ඇසුරුකොට පවතින්නේ ය. යම්කිසි ස්ත්‍රී පුරුෂ කෙනෙක් ගිහිපැවිදි කෙනෙක් නූපන් කෙලෙස් උපදින්නට නොදී උපන් කෙලෙස් දුරු කරමින් සිත සංවර කරත් නම් ඒ කෙලෙස් බන්ධනවලින් මිදීම නිසා සසරේ ඇති කාම, රූප, අරූප යන සියලු භව බන්ධනවලින් මිදෙන්නේ ය.

### 3.5.1.5 කෙළෙස් නැසූ කල බියක් නොවේ තව.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වැඩ වාසය කරන සමයෙහි එනුවර වාසී එක් කුලපුත්‍රයෙක් ගාලෙන් පැනගිය ගොනෙකු සොයා වනයට පිවිසියේ ය. උදේ වරුව පුරාම වනයෙහි ඇවිද මද්දහනෙහි ගවයා සොයා ගත්තේ ය. ගවයා ගාලට දක්කා, කුසගිනි නිවා ගැනීමට ආසන්නයේ පිහිටි විහාරයට ගියේ ය. විහාරවාසී භික්ෂූහු ඔහුට ආහාර ලබා දුන්හ. එම ආහාර වළඳා ඔහු කල්පනා කරන්නේ අප දිවා රෑ දෙක්හි කොපමණ වෙහෙසී හරිහම්බ කළත් මෙවැනි ප්‍රණීත ආහාරයක් නම් අපට නොලැබේ. භික්ෂූහු නිතර මෙබඳු ප්‍රණීත ආහාර ලබන්නාහ. මේ ගිහි බවින් ඵලක් නැත. මා ද පැවිදි වෙමියි සිතා භික්ෂූන් වහන්සේලා ද ඔහු පැවිදි උපසම්පදා කළෝ ය. දැන් උන්වහන්සේ සියලු වත්පිළිවෙත් කරගෙන වාසය කරති. මේ අතර බුදුරජාණන් වහන්සේට ලැබෙන ප්‍රණීත ආහාර වළඳන උන් වහන්සේ නොබෝ දිනකින් ම මහත් වූ සිරුරු ඇත්තෙක් විය.

දැන් ඉතිං මේ හිඟමනෙන් ජීවත් වෙන්නේ කුමට ද ගිහිවෙමියි සිතා හෙතෙම සිවුරු හැර ගෙදර ගියේ ය. ගිහිගෙයි දුක් විඳිනවිට ඔහුගේ සිරුර නැවත කෘෂ වී මැළ වී ගියේ ය. මම මේ දුක් විඳින්නේ කුමට ද නැවත පැවිදි වෙමියි සිතා හෙතෙම නැවත පැවිදි විය. වැඩි දිනක් ගත නොවී හෙතෙම කළකිරී නැවත ගෙදර ගියේ ය. මොහු පැවිදි වී විහාරයේ ගත කරන විට භික්ෂූන් වහන්සේලාට මහත් ප්‍රයෝජනවත් කෙනෙකි. එහෙයින් උන්වහන්සේලා ද ඔහු යන යන වතාවට පැවිදි කරති. මෙසේ සය වතාවක්ම හෙතෙම පැවිදිව උපැවිදි විය. ඒ භික්ෂුව සිතට වසඟව වාසය කරන හෙයින් චිත්තහත්‍ථ තෙරුන් යැයි ප්‍රකට විය. මෙසේ ඔහු දෙපැත්තට යමින් එමින් සිටින අතර අන්තිම වතාවේ දී බිරිඳ ගැබ්ගෙන සිටියාය. දිනක් ඔහු ගොවිතැන් කොට අවුත් කාමරයට පිවිසියාය. එවිට එහි නිදාගෙන සිටි බිරිඳගේ ඇඳිවත ඉවත් වී ගොරවමින් කුණුකෙළ වගුරමින් සිටියේය. ඔහුට ඇය පෙනුණේ සොහොනෙහි ලා ඉදිමී ගිය මළ සිරුරක් ලෙසය. අනිත්‍ය නම් මෙය නොවේද, දුක නම් මෙය නොවේද, මෙතෙක් වරක් පැවිදිවීත් මට මේ මහණකමේ සිටින්නට නොහැකි වූයේ මැ නිසා නොවේදැයි සිතා සිවුරුපොට ඉනේ බැඳ බැඳම විහාරය කරා දුවන්නට විය. එය දුටු නැන්දනිය කාමරයට දිවගොස් දියණිය නිදා සිටින ආකාරය දැක මැ නිසා ඔහු කළකිරී ගිය බව වටහාගෙන දියණියට පහරක් දී අවදි කරවීය. අවදිකොට කාලකන්ණිය නැගිටිනු. තී නිදා සිටිනු දැක තිගේ සැමියා කළකිරී පැවිදිවීමට ගියේ ය. නැවත ඔහු නොයෙනු ඇතැයි දොස් නගන්නට වූවාය. ඔහුගේ ගමන් ගැන හොඳට හුරු පුරුදු දියණිය, අම්මා නිහඬ වන්න. ඔහු තව කීප දිනකින්ම මා සොයා එනු ඇතැයි පැවසුවා ය. චිත්තහත්‍ථ තැන ''අනිච්චං දුක්ඛං'' යනුවෙන් මෙනෙහි කරමින් යන අතරම සෝවාන් විය. හෙතෙම නැවත භික්ෂූන් වහන්සේලා වෙත ගොස් පැවිද්ද ඉල්ලීය. මුලින් ම පැවිදි කිරීම ප්‍රතික්ෂේප කළ උන් වහන්සේලා අන්තිමේ දී අනුකම්පා කොට පැවිදි කළ හ. හෙතෙම නොබෝ දිනකින් ම සිව්පිළිසිඹියාපත් රහත් ඵලයට පැමිණියහ. මෙවර ගෙදර යාම ප්‍රමාද වන විට, චිත්තහත්‍ථ ඔබ තවම ගෙදර නොගියේ මන්දැයි භික්ෂූන් වහන්සේලා විමසන්නට වූහ. එවිට චිත්තහත්‍ථ තෙරණුවෝ ස්වාමිනි, ගිහි බැඳුම් ඇති කාලයේ ගියෙමි. දැන් ඒ බැඳුම් සිඳී ගොස් ය. දැන් නැවත නොයන තැනට

පත්වූවෙමියි කීහ. එය නොඇදහූ භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ වෙත ගොස් ඒ පුවත සැල කළහ. එවිට උන් වහන්සේ මහණෙනි, සැබෑය. මාගේ පුත්‍රයා තමාගේ සිත අස්ථාවරව පැවති කාලයේ සද්ධර්මය නොදන්නා කාලයේ ඔබ මොබ ගමන් කළේ ය. දැන් උන්වහන්සේ පිං පවු දෙකම ප්‍රහීණ කර ඇතැයි වදාරා ''**අනවට්ඨිත චිත්තස්ස**'' ආදී වූ මෙම ගාථාව දේශනා කළහ.

**6. අනවට්ඨිතචිත්තස්ස**
**සද්ධම්මං අවිජානතො**
**පරිප්ලව පසාදස්ස**
**පඤ්ඤා න පරිපූරති**

**පදාර්ථ:- අනවට්ඨිත චිත්තස්ස,** එක තැනක නොපිහිටි සිත් ඇති, **සද්ධම්මං,** සත්තිස් බෝධිපාක්ෂික ධර්මය, **අවිජානතො,** නොදන්නා වූ, **පරිප්ලව පසාදස්ස,** ඉපිලෙන සැදැහැ ඇත්තහුගේ **පඤ්ඤා න පරිපූරති,** ප්‍රඥාව නොපිරේ.

**විවරණය:-** මේ සිත කිසිතැනක බැඳී තිබීමක් හෝ ස්ථිර බවක් නැත. අසු පිට තැබූ කලයක් සේ ද දහයියා ගොඩක සිට වූ කණුවක් සේ ද සෙලවෙන සුලු ය. එබඳු පුද්ගලයා වරෙක බුද්ධ ශ්‍රාවකයෙක් වේ. වරෙක නිඝණ්ඨයෙක් වේ. තවත් වරෙක තාපසයෙක් වේ. මෙසේ සිතුණු සිතුණු විට සිතූ සිතූ තැනට යන විශ්වාසයක් තැබිය නොහැකි අස්ථිර සිත ''**අනවට්ඨිත චිත්ත**'' නම් වේ. එබඳු වූද, සත්තිස් බෝධි පාක්ෂික ධර්මය නැමැති ධර්මය නොදන්නා වූද ශ්‍රද්ධාව අල්ප වූ හෝ එහෙ මෙහේ පනින ශ්‍රද්ධාව ඇත්තාවූ පුද්ගලයාගේ ප්‍රඥාව නොපිරේ.

**7. අනවස්සුත චිත්තස්ස**
**අනන්වාහත චෙතසො**
**පුඤ්ඤපාප පහීණස්ස**
**නත්ථි ජාගරතො භයං**

**පදාර්ථ:- අනවස්සුත චිත්තස්ස,** රාගයෙන් තෙත් නොවුණු සිත් ඇති, **අනන්වාහත චෙතසො,** කෝපයෙන් (ද්වේශයෙන්) පහර නොලත් සිත් ඇති, **පුඤ්ඤපාප පහීණස්ස,** අරහත් මාර්ග යෙන් ප්‍රහීන කළ පුණ්‍ය පාප ඇති **නත්ථි ජාගරතො භයං,** කෙලෙස් නින්දෙන් නොනිදන ක්ෂීණාශ්‍රවයන් (රහතන්) වහන්සේට කෙළෙස් නිසා බියක් නැත.

**විවරණය:-** රාගයෙන් තෙත් නොවූ ද්වේෂයෙන් පහර නොලත් සිත් ඇති සතර මාර්ගයෙන් පින් පවු දෙකම නැසූ රහතන් වහන්සේලා ශ්‍රද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා යන ජාගර

ධර්මයන්ගෙන් යුක්ත බැවින් හෙවත් ඒ ධර්මයන්ගෙන් අවදිව සිටින බැවින් උන්වහන්සේ නිදා සිටියත්, අවදිව සිටියත්, කෙලෙස්වලින් වන බියක් නැත. නැවත කෙලෙස් ලුහුබැඳ ඒමක් නැත.

### 3.5.1.6 මෙත් සිතින් දෙවියන් පැහැද වූ පන්සියක් භික්ෂූහු.

සැවැත් නුවරවාසී පන්සීයක් භික්ෂූහු බුදුරජාණන් වහන්සේගෙන් රහත්භාවය තෙක් කමටහන් ලබා ගත්හ. එසේ කමටහන් ලබා මහණදම් පුරන්නෙමියි සිතා යොදුන් සියයක් පමණ දුරින් පිහිටි එක්තරා ගමකට පැමිණියහ. ඒ ගමෙහි මිනිස්සු උන්වහන්සේලා දැක වඩා හිඳුවා උන්වහන්සේලා කැඳ අවුළු ආදියෙන් සතපවා ආර්යයන් වහන්සේලා කොහි වඩින්නේදැයි ඔවුන් විමසූහ. පහසු තැනකටැයි කී කල්හි, ස්වාමීනි, මේ තුන් මාසය මෙහිම වැඩ සිටිනු මැනවැයි ද අපිත් ඔබ වහන්සේලා ළඟ තිසරණයෙහි පිහිටා සිල් රකින්නෙමු යැයි ඉල්ලා සිටියහ. උන්වහන්සේලා ආරාධනය පිළිගත්හ. එසේ ඔවුන්ගේ ආරාධනාව පිළිගත් උන්වහන්සේලා ඒ අසල ඇති වන ලැහැබකට පිවිසියහ. ඒ වන ලැහැබෙහි වෘක්ෂ අධිගෘහිත දේවතාවෝ සිල්වතුන් වහන්සේලා බිම සිටිය දී අප දූ දරුවන් සමග ගස්වල විසීම නුසුදුසු යැයි කියා බිමට බැස්සෝ ය. ඒ දේවතාවන් සිතුවේ උන්වහන්සේලා එදා රාත්‍රිය ගතකොට පසුදා ආපසු යනු ඇතැයි කියාය. එහෙත් ඒ භික්ෂූන් වහන්සේලා ගමෙන් පිණ්ඩපාතය ලබාගෙන අවුත් දිගටම එහිම විසූහ. රුක් දෙවියෝ ද උන්වහන්සේලා අද යනු ඇත හෙට යනු ඇතැයි සිතමින් අඩමසක්ම බිම විසූහ. අනතුරුව දෙවියෝ මෙසේ සිතූහ. මේ ආකාරයෙන් උන්වහන්සේලා මේ තුන්මාසයම මෙහිම වසනු ඇත. අපට එතෙක් රුක්වල විසිය නොහැකි ය. අඹුදරුවන් සමග බිම විසීම ද දුෂ්කරය. එහෙයින් මුන් වහන්සේලා පලවා හැරිය යුතු ය. මෙසේ සිතා ඔවුහු භික්ෂූන් වහන්සේලා වෙසෙන රුක් මුල්වල සක්මන් මළුවල තැන තැන හිස නැති කවන්ධ රූප දැක්වූහ. බිහිසුණු රුදුරු හඬ නැගූහ. මේ හිරිහැර නිසා භික්ෂූන්ට කැසි කාසාදී රෝග හට ගත්තේය. උන්වහන්සේලා ඔවුනොවුන් හමු වී තොරතුරු විමසා ඔවුනොවුන්ට දකින්නට අසන්නට ලැබුණු බිහිසුණු භය භෙරවයන් ගැන දැනගත්හ. සැමටම කුමන හෝ රෝග හටගෙන ඇති බව දැනගත්හ. අන්තිමේදී දැන් අපට තවදුරටත් මෙතැන විසීම අපහසුය. බුදුරජාණන් වහන්සේ හමුවී මෙය සැලකරමු'යි කියා පිටත්ව ගියහ. එසේ ගොස් බුදුරජාණන් වහන්සේට මේ බව දන්වා සිටියහ. එවිට උන්වහන්සේ මහණෙනි, ඔබ එතැනටම යා යුතුයැයි වදාළහ. භික්ෂූහු එයට එකඟ නොවූහ. භාග්‍යවතුන් වහන්සේ ''මම ඔබට ආයුධයක් දෙමි. එය රැගෙන යන්නැයි වදාළහ. කුමන ආයුධයක් දැයි ඇසූ කල උන් වහන්සේ, ''**කරණීය මත්‍ථ කුසලෙන යන්‍තං සන්‍තං පදං අභිසමෙච්ච**'' යනාදී වශයෙන් **කරණීය මෙත්ත සූත්‍රය** වදාරා මහණෙනි, ඔබ වන ලැහැබට ඇතුල් වන තැන පටන් මෙය සජ්ඣායනා කරමින්ම වනයට පිවිසෙන්නැයි උපදෙස්දී පිටත් කර යැවූහ. උන්වහන්සේලා ද එකී පරිද්දෙන් ''කරණීය මෙත්ත සූත්‍රය'' සජ්ඣායනා කරමින් වන ලැහැබට පිවිසියහ. එසේ පිවිසෙන උන් වහන්සේලාට එරෙහිව සිටි රුක් දෙවියන්ට එයින් මෙත් සිත් පහළ වුණි. දේවතාවෝ උන් වහන්සේලාගේ පෙරග මන් කොට පා සිවුරු පිළිගෙන සියලු ඇප උපස්ථාන කරන්නට වූ හ. හැම අතකින්ම ආරක්ෂා සංවිධානය කළෝ ය. බිහිසුණු හඬවල් සියල්ලක් ම නැතිව ගියේ ය. භික්ෂූන්

වහන්සේලා ඉතා පහසුවෙන් ඒ වනයෙහි වෙසෙමින් විදර්ශනා වඩන්නට වූ හ. අපගේ මේ ආත්මභාවය හෙවත් මේ ශරීරය නම් බිඳෙන සුළුය. අස්ථිරය කුඹල් වලං වැනි යැයි සලකමින් විදසුන් වැඩූ හ. බුදුරජාණන් වහන්සේ ද ගඳකිළියෙහි වැඩහිඳිමින් ම ආලෝකයක් පතුරුවා සවණක් ඝන බුදුරැස් විහිදුවමින් ඒ භික්ෂූන් වහන්සේලා ඉදිරියෙහි පෙනී සිටිමින් මේ ගාථාව දේශනා කළ සේක.

8. **කුම්භූපමං කායමිමං විදිත්වා**
**නගරූපමං චිත්තමිදං ඨපෙත්වා**
**යොධෙථ මාරං පඤ්ඤාවුධෙන**
**ජිතඤ්ච රක්ඛෙ අනිවෙසනො සියා**

**පදාර්ථ:-** "**ඉමං කායං**, මේ ශරීරය, **කුම්භූපමං**, මැටිකලයක් සේ, **විදිත්වා**, දැන, **ඉදං චිත්තං**, මේ සිත, **නගරූපමං**, නගරයක් (නුවරක්) සේ, ඨපෙත්වාඃ තබා **පඤ්ඤායුධෙන**, ප්‍රඥාව නමැති ආයුධයෙන්, **මාරං**, කෙළෙස් නමැති මාරයාට, **යොධෙථ**, පහර දෙන්නේය, **ජිතඤ්ච**, එසේ දිනන ලද තරුණ විදර්ශනාව, **රක්ඛෙ**, රකින්නේය, **අනිවෙසනොසියා**, ආලය නොමැත්තෙක් වන්නේය.

**විවරණය:-** අබල, දුබල බැවින්ද ස්ථිර නැති තාවකාලික බැවින් ද මේ ක්ලේශාදී සමූහය හෙවත් මේ කය මැටි කලයක් බඳුයැයි දැනගෙන විදර්ශනා වඩමින් ඒ විදර්ශනා සිත පවුරු, දිය අගල් ආදියෙන් වටකොට සතුරන්ට පිවිසිය නොහැකි ලෙස ආරක්ෂා සංවිධානය කරන ලද නගරයක් සේ ආර්ය මාර්ගය නැමැති ප්‍රඥා ආයුධයෙන් ඒ ඒ මාර්ගයෙන් නැසිය යුතු ක්ලේශ මාරයන් නසා දැමිය යුතු ය. එහිදී ඒ සඳහා වඩන විදර්ශනා සිත මගඵල නොලැබූ මුල් අවස්ථාවේ දී නැසෙන්නට නොදී, ආවාස සප්පාය ආදී උපකාරයන් ලබා පිරිසිදු සිතින් සංස්කාරයන් මෙනෙහි කරමින් රැකගත යුතු ය. සමහර කෙනෙක් ප්‍රථම ධ්‍යාන ආදී ධ්‍යානවලට පත්වූ පසු විදර්ශනාවෙන් නිවන් මගට නොගොස් ඒ ප්‍රථමධ්‍යාන ආදී ධ්‍යානවලින් සතුටු වී එහිම නවතිති. එසේ සමාපත්තිවල වාසය නොකොට විදර්ශනාවෙන් නිවන් මගට යායුතු බව "**අනිවෙසනොසියා**" යනුවෙන් කියන ලදී.

මේ දේශනාව අවසානයේ 500 දෙනා වහන්සේ සිව්පිළිසිඹියා සහිත රහත්භාවයට පත්වූහ.

## 3.5.1.7 සිත කයෙන් වෙන් වූ පසු කයෙන් වැඩක් නැත.

එක් කලෙක බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වැඩ වාසය කරන සේක. සැවැත්නුවරවාසී එක් කුලපුත්‍රයෙක් භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්මය අසා පැවිදි විය. උපසම්පදාවලත් උන්වහන්සේ තිස්ස ස්ථවිර නම් වූහ. කලක් යනවිට උන්වහන්සේගේ

ශරීරයෙහි කුෂ්ඨ රෝගයක් හටගත්තේ ය. කුඩා අබ ඇට ප්‍රමාණයට හටගත් බිබිලි වර්ධනය වී බෙලිගෙඩි තරමට විශාල විය. මුළු ශරීරයම තැන තැන සිදුරුකළාක් මෙන් විය. ලේ සැරවවලින් මුළු සිරුරත් සිවුර අඳනා ආදියත් තෙත්වී පැවතුණි. ඒ නිසාම උන් වහන්සේ පූතිගත්තතිස්ස තෙරුන් නමින් හැඳින්වූහ.

පසුව උන්වහන්සේගේ ශරීරයේ ඇට කැඩී බිඳී ගියේ ය. පිළියම් කළ නොහැකි තත්වයට පත්විය. හැඳ පොරවා සිටි සිවුරු අඳනා ආදියෙහි ලේ සැරව තැවරී දුගඳ හමන්නට විය. උන්වහන්සේගේ උපස්ථායක සද්ධිහාරික ආදීහුද උන්වහන්සේට උපස්ථාන කළ නොහැකිව අතහැර ගියෝ ය. උන්වහන්සේ මහත් සේ අසරණව වැදහොත්තේ ය.

දවසට දෙවරක් මහාකරුණා සමාපත්තියට සමවැදී ලෝකය දෙස බලන බුදුරජාණන් වහන්සේට දිනක් උදෑසන පූතිගත්ත තිස්ස තෙරුන් දිස්විය. උන්වහන්සේට රහත්වීමට ඇති උපනිශ්‍රයත් දැක භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් ද සමගින් ගිනිහල් ගෙට වැඩමකොට වතුර උණුකරවා උන්වහන්සේව නාවා සිවුරු සෝදා වේලා නැවත පොරවාලූහ. අනෙකුත් සිවුරු අඳනා ආදියත් සෝදා වියළා තැබූහ. උන් වහන්සේ බොහෝ කලකින් ලැබුණු උපස්ථානයත් සමඟ සුව සේ වැතිර සිටියහ. එවේලෙහි උන්වහන්සේගේ සිත එකඟ විය. සන්සුන් විය. බුදුරජාණන් වහන්සේ තිස්ස තෙරුන්ගේ ඇඳෙහි හිස පෙදෙසෙහි වැඩහිඳ මහණ, ඔබගේ මේ කයෙන් විඤ්ඤාණය පහව ගිය කළ මේ ශරීරය දිරාපත් වී ගිය දර කඩක් මෙන් පොළොවෙහි වැටී යන්නේ යයි වදාරා ''**අචිරං වතයං කායෝ**'' ආදී මෙම ගාථාව දේශනා කළ සේක. මේ දේශනාව අවසානයේ පූතිගත්තතිස්ස තෙරුණුවෝ සිවුපිළිසිඹියාපත් රහත් බවට පැමිණ පිරිනිවන් පෑ සේක.

බුදුරජාණන් වහන්සේ පූතිගත්තතිස්ස තෙරුන්ගේ සිරුර ආදාහනය කරවා ධාතුන් වහන්සේලා ගෙන චෛත්‍යයක් ද කරවූහ. මේ අතර දිනක් උන්වහන්සේ කොහි උපන්නේදැයි භික්ෂූන් වහන්සේලා විමසූහ. උන්වහන්සේ පිරිනිවන් පෑවේ යැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. රහත්වීමට පින් පුරවා සිටි උන්වහන්සේගේ ශරීරය කුණු වූයේ කුමක් නිසාද ඇට බිඳුනේ කුමක් නිසාදැයි භික්ෂූන් වහන්සේලා විමසූහ. උන්වහන්සේ එසේ වීමට කළ කර්මය මෙලෙස බුදුරජාණන් වහන්සේ විස්තර කළ සේක.

මහණෙනි, කාශ්‍යප සම්බුද්ධ සමයේ ඔහු කුරුළු වැද්දෙක්ව සිටියේ ය. කුරුල්ලන් අල්ලා ධනවතුන්ට දෙයි. ඉතිරිවන කුරුල්ලන් විකුණයි. විකුණා ඉතිරි වුවහොත් මරා තබයි. ඒවා කුණු වී යයි. සමහරවිට කුරුල්ලන්ට පියාඹන්නට නොහැකි වන සේ පා ඇට, පිහාටු ඇට බිඳ ගොඩගසා තබා පසුදින විකුණයි. බහුලව කුරුල්ලන් ඇතිවිට උන්මරා ඒ මස් තමනුත් පිසගෙන කයි. මෙසේ සිටින විට දිනක් පසේ බුදුරජාණන් වහන්සේ නමක් වැඩියහ. උන්වහන්සේ කෙරෙහි පැහැදුනු හෙතෙම උන්වහන්සේට පාත්‍රය පුරවා මස් පිදීය. පුදා පසඟ පිහිටුවා වැඳ, ස්වාමීනි, ඔබ වහන්සේ අවබෝධ කළ ධර්මය මටද අවබෝධ කර ගන්නට ලැබේවායි කීය. උන්වහන්සේ ද එසේ ම වේවායි වදාළහ.

මහණෙනි, තිස්ස තෙරුන් රහත් බවට පැමිණියේ ඒ ප්‍රාර්ථනාව නිසාය. උන්වහන්සේට විඳින්නට සිදුවූයේ ඒ කුරුල්ලන්ට කළ විපත්වල විපාක යයි වදාළ සේක.

9. අචිරං වතයං කායො
පඨවිං අධිසෙස්සති
ඡුද්දො අපෙත විඤ්ඤාණො
නිරත්ථං'ව කලිඞ්ගරං

**පදාර්ථ:-** **අචිරං වත:** මහණ නොබෝකලකින් ම, **අයං කායො:** මෙම ශරීරය, **අපෙත විඤ්ඤාණො:**විඤ්ඤාණය පහවී, **ඡුද්දො:** හිස් වී ඉවත දමන ලද, **නිරත්ථං'ව:** ප්‍රයෝජනයට ගත නොහැකි, **කලිඞ්ගරං ඉව:** දිරාගිය දරකඩක් සේ, **පඨවිං අධිසෙස්සති:** පොළොව මත ඇද වැටෙන්නේය.

**විවරණය:-** මේ ශරීරය ස්ථිර නැත. වැඩිකල් නොගොස් මරණාසන්න වූ කල්හි විඤ්ඤාණය පහවන්නේ ය. එවිට මේ ශරීරය හිස් එකක් වේ. ඡුද්දො යනු එයයි. ලී දඬුවලින් යම් යම් වැඩ කටයුතු කරන මිනිස්සු ලී දඬුවලින් සුදුසු කැලි තෝරා කපාගෙන යති. වැඩකට ගත නොහැකි නුසුදුසු කොටස් ඉවත දමා යති. මේ ශරීරය ද එබඳු නිශ්ඵල දර කැබලි මෙනි. මෙහි කිසිම කොටසකින් ලිපට දමන දරකඩක් තරම්වත් ප්‍රයෝජනයක් නැත. එහෙයින් විඤ්ඤාණය පහවූ දවසට මෙය පොළොවෙහි වැටී කුණු වී නැසී යන්නේ ය.

## 3.5.1.8. සතුරෙකුට වඩා නපුරක් වැරදි සිත තමාට කරයි.

බුදුරජාණන් වහන්සේ කොසොල් රට වාසය කරන සමයක සැවැත් නුවර අනේපිඬු සිටුතුමාගේ ගවයන් රැකබලා ගන්නා නන්ද නම් ගොපල්ලෙක් සිටියේය. ඔහු මහත් ධන භෝග සම්පත් ඇත්තෙකි. ඔහුට ලැබුණු ගෝපාලක තනතුර නිසාම රාජානුග්‍රහය ද ලැබුණි. එසේම කලින් කලට ඔහු පස්ගෝ රසය ද ගෙන සිටුතුමා හමුවී ඔහු සමග බුදුරජාණන් වහන්සේ දකින්නට යයි. ධර්මය ද අසයි. එක් දිනක් බණ අසා පසුදින දානය සඳහා සිය නිවසට වඩින ලෙස බුදුරජාණන් වහන්සේට ආරාධනා කළේ ය. එම ආරාධනාව පිළිගත් භාග්‍යවතුන් වහන්සේ පිළිවෙලින් සත්දිනක්ම ඔහුගේ නිවසින් දන් වැළඳූ සේක. සත්වෙනි දින දානය වළඳා අවසානයේ අනුමෙවැනි ධර්ම දේශනාව සිදුකොට දාන කතා, සීල කතා ආදී වූ පිළිවෙල කතාව දේශනා කළ සේක. එය අවසන නන්ද ගෝපාලක සෝවාන් ඵලයෙහි පිහිටියේ ය. අනතුරුව උන්වහන්සේගේ පාත්‍රය රැගෙන පසුගමන් කරමින් සිටියේ ය. මද දුරක් ගිය කල්හි උපාසක! නවතින්න, යයි බුදුරජාණන් වහන්සේ වදාළහ. වැඳගෙනම ඔහු නැවතී බලා සිටියේ ය. එහි දී එක්තරා හී වැද්දෙකු විද්ද හී තලයක් වැදී ඔහු මරණයට පත්විය. එදින බුදුරජාණන් වහන්සේ නොවැඩියා නම් නන්ද ගෝපාලකට මෙවැනි මරණයක් සිදු නොවන්නේ යැයි භික්ෂූන් වහන්සේලා අතර කතාබහක් ඇතිවිය. එහි දී බුදුරජාණන් වහන්සේ මහණෙනි, මා එහි ගියත් නොගියත් ඔහුගේ කර්මය අනුව ඔහු අද දිනයේ කවර දිසාවකට ගියත් මරණයෙන් ගැලවෙන්නේ නැත. තමා තුළ පවතින වැරදි ලෙස පිහිටුවාගත් සිත සතුරන් විසින් වෛරක්කාරයෙකුට නොකරන තරම් විපතක් සිදු කරන්නේ ය. යැයි වදාරා **''දිසො දිසං යංතං කයිරා''** ආදී වූ මේ ගාථාව දේශනා කළ සේක.

10. දිසො දිසං යන්තං කයිරා
වෙරී වා පන වෙරිනං
මිච්ඡා පණිහිතං චිත්තං
පාපියො නං තතො කරෙ

**පදාර්ථ:- දිසොදිසං:** සතුරෙක් තමාගේ සතුරකු දැක, **වෙරිවාපන යන්තං කයිරා:** ඔහුට යම් අනර්ථයක් කරයි ද, **වෙරිවාපනවෙරිනං:** වෛරයක්කාරයෙක් තමා හා වෛර බැඳගත්තකු දැක යම් විපතක් කරයි ද: **මිච්ඡාපණිහිතං:** දස අකුසල කර්ම වශයෙන් වැරදිව තබාගත්, **චිත්තං:** සිත, **තතො නං පාපියො කරෙ:** ඊටත් වඩා පව්ටු විපතක් ඔහුට කරන්නේ ය.

**විවරණය:-** සතුරකු දුටු සතුරකු හෝ වෛරක්කාරයෙකු දුටු වෛරක්කාරයකු ඒ තමාගේ නපුරුකම නිසාත් වෛරය නිසාත් ඔහුට සමහරවිට මහා විපතක් සිදුකරන්නේ, ධන සම්පත් වනසනු ඇත. අඹුදරුවන්ට පීඩා කරනු ඇත. සමහරවිට දිවිපවා තොර කරනු ඇත. කයින් වචනයෙන් සිතින් අකුසලයට නැමුණු සිත නරක අතට නැමුණු පව්ටු සිත ඒ සතුරන් වෛරක්කාරයන් කරන විපතටත් වඩා විපතක් තමා හා ඒ නරක ලෙස පවත්වාගෙන යන සිත තමාට සිදු කරන්නේ ය.

### 3.5.1.9. මව්පිය නෑයන්ටත් වඩා යහපතක් තමාට කරන තමාගේම සිත.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වැඩවසන එක්තරා සමයෙක සෝරෙය්‍ය නුවර සෝරෙය්‍ය නම් සිටු පුත්‍රයෙක් වාසය කළේය. ඔහු දිනක තම යහළුවකු සමග සුවපහසු යානයක හිඳුගෙන මහත්වූ පිරිවරින් ස්නානය සඳහා නගරයෙන් නික්මුණේය. මහා කච්චායන හිමියන් ඒ අවස්ථාවේ නගරයෙන් පිටත ස්ථානයක සිට නගරයට පිඬු පිණිස හැසිරෙන අටියෙන් සිවුරු පෙරවමින් සිටියහ. උන්වහන්සේගේ සිරුරු රන්වන් පාටය. ඒ දුටු සෝරෙය්‍ය සිටුවරයා අනේ මේ හිමියන් මගේ භාර්යාව වෙනවා නම්, එසේත් නැතහොත් මගේ බිරිඳට මෙබඳු රන්වන් සිරුරක් ඇත්තියක වෙනවා නම් මැනවියයි සිතුවේ ය. ඔහු එසේ සිතනවාත් සමගම ඔහුගේ පුරුෂ ලිංගය අතුරුදහන් වී ස්ත්‍රී ලිංගයක් පහළ විය. පිරිවර ජනයාට පවා ඔහු හඳුනාගත නොහැකි විය. ලැජ්ජාවට පත් ඔහු යානයෙන් බැස පලා ගියේ ය. ඔහු තක්ෂිලාව බලා යන්නට විය. ඇය තක්ෂිලාව බලා යන මාර්ගයට බට විට තක්ෂිලාව බලා යන වෙළෙඳුන් සමූහයක් හමු වී ඔවුන් සමග තක්ෂිලා නුවරට ගියේ ය. එහි දී තක්ෂිලාවේ සිටුපුත්‍රයා විසින් ඇය විවාහ කර ගන්නා ලදී. එයින් දරුවන් දෙදෙනෙකු ලැබුවාය. සෝරෙය්‍ය සිටුපුත්‍රයා ලෙස ද සිටියදී දරුවන් දෙදෙනෙකි (දූන් දරුවන් සිවුදෙනෙකි). පසුව සෝරෙය්‍ය නුවරින් තක්ෂිලා නුවරට වෙළෙඳාමේ පැමිණි යහළු සිටුවරයෙකු දැක ඔහු ගෙන්වා සෝරෙය්‍ය නුවර තොරතුරු විමසා දැනගෙන එම සිටුවරයාගේ උපදෙස් පරිදි මහා කච්චායන තෙරුන්ගෙන් සමාව ලබා ගත්තා ය. ඒ සමගම පෙර පරිදි පුරුෂයෙකු විය. මෙයින් විවාහය පිළිබඳ කළකිරී බුදුසසුනේ පැවිදි විය. එතැන් සිට ඔහු සෝරෙය්‍ය තෙරුන් ලෙස හඳුන්වන ලද අතර භාවනා වඩා නොබෝදිනකින් ම

රහත් භාවයට පත්විය. මුල සිටම උන්වහන්සේ හමුවන භික්ෂූහු ඔබ ගිහිකළ පිරිමියෙකු ලෙස දරු දෙදෙනෙක් ද, ස්ත්‍රියක ලෙස තම කුසින් දරු දෙදෙනෙක් ද බිහි කළෙහිය. මෙම දරුවන් අතරින් ඔබ කාට වැඩිපුර ආදරේදැයි නිතර විමසූහ. එවිට උන්වහන්සේ පෙර නම් කුසින් වැදූ දරුවන්ට වඩා ආදරේ යයි ද, දැන් කිසිවෙකු කෙරෙහි සෙනෙහසක් නැතැයිද යනුවෙන් ප්‍රකාශ කළහ. එවිට භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට මේ බව සැල කළහ. ස්වාමීනි, සෝරෙය්‍ය තෙරුන් මුලදී නම් තමා කුසින් වැදූ දරුවන් කෙරෙහි සෙනෙහස වැඩියයි කියා ද, දැන් කිසිවෙකුටත් සෙනෙහසක් නැතැයි රහත් වූයේ යැයි අඟවන්නේ යයි කියා භාග්‍යවතුන් වහන්සේට ඒ බව සැල කළ හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මා පුත් සෝරෙය්‍ය භික්ෂුව රහත් වූයේ යැයි අඟවනවා නොවේ. සිත මනාව පිහිටුවාගෙන මගඵල ලැබූ දවසේ පටන් කිසිවෙකු කෙරෙහි සෙනෙහසක් නැතිව ගියේ යැයි වදාරා මෙම ගාථාව දේශනා කළ සේක.

11. **න තං මාතා පිතා කයිරා**
**අඤ්ඤෙ වා පි ච ඤාතකා**
**සම්මාපණිහිතං චිත්තං**
**සෙය්‍යසො නං තතො කරෙ**

**පදාර්ථ:- න තං,** ඒ මනාව පිහිටුවාගත් සිත කරන උතුම් දෙය, **මාතා,** මවද, **කයිරා,** නොකරන්නීය, **පිතා,** පියාද, **න කයිරා,** නොකරන්නේ ය, **අඤ්ඤෙ වා පි ච,** වෙනත් නෑදෑයෝද නොකරන්නාහ. **සම්මාපණිහිතං චිත්තං,** දස කුසල කර්මයන්හි පිහිටුවාගත් තමාගේ සිත, **තතොනං,** ඒ සියලු දෙනා කරනවාට වඩා, **සෙය්‍ය සො,** ඉතා උතුම් උපකාරයක්, **නං කරෙ,** ඔහුට කරන්නේය.

**විවරණය:-** ප්‍රාණඝාතාදී අකුසලයන්ගෙන් වෙන්වී දස කුසල කර්මයන්හි මනාව පිහිටුවා ගත් සිත තමාටම ඉතාම උතුම් මෙහෙවරක් කරන්නේය. එතරම් උතුම් මෙහෙවරක් කිසිදු මවක් පියෙක් හෝ වෙනත් නෑදෑයෙක් හෝ කිසිවෙකුටත් නොකරන්නේය.

## අභ්‍යාස

01. ''ත්‍රිපිටකය තුළින් ධම්ම පදය සොයා ගනිමු'' යන මැයෙන් ත්‍රිපිටකයේ ධම්ම පදය ඇති ස්ථානය පිළිබඳ කථාවක් පන්තියේ දී ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.
02. ධම්ම පදයේ චිත්තවග්ගය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
03. චිත්ත වග්ගයේ ගාථාවක් ඇසුරින් ශිෂ්‍ය සමිතියේ ධම්ම චින්තාවක් කරන්න.
04. මෙම ගාථාවක් මාතෘකා කරගනිමින් ධර්ම දේශනාවක් පිළියෙල කරන්න.
05. සිත පිළිබඳ විග්‍රහ කරමින් ශිෂ්‍ය සමිතියේ ධර්ම සාකච්ඡාවක් මෙහෙයවන්න.
06. මෙම වග්ගය ඇසුරෙන් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් සිදුකරන්න.

20
පාඩම

# පුප්ඵ වග්ගය - I

සොබා දහමේ අපූරු නිර්මාණයකි මල. හැඩරුවින් පැහැයෙන් හා සුවඳින් විවිධ වූ මල් අපේ පරිසරය විසිතුරු කරයි. මිනිසුන්ට මව්පියන් මෙන් පරිසරයේ ගස්වැල්වල හටගැනීමට මූලික සාධකය වන්නේ මලයි. මලත් සමගම අපට සිහිවන්නේ බඹරුන්ය. එපමණක් නොව මීමැස්සන් සමනලයන් මෙන් ම පැණිකුරුල්ලන් බටිලිත්තන් වැනි කුරුල්ලෝ ද මල් ඇසුරු කරති. මල්වලින් පැණි බී ජීවත්වෙති. ඔවුන් ඒ සඳහා මල්වලට පියාසලන විට මල්වල පරාග පෝෂණය සිදුවේ. ඒ තුළින් ඵල හටගනියි. ඒ ඵලවලින් නැවත ගස්වැල් බිහිවේ. ඒ අතර තවත් බොහෝ සොඳුරු මිහිරි සොබා දම් නිමැවුම් බිහිවේ. ඒ අතර අපට බොහෝ ප්‍රයෝජනවත් මිහිරිතම නිපැයුම වන්නේ මී පැණිය.

මෙසේ සොබාදහමේ නිමැයුම්කරුවා යැයි කිවයුතු ජීවමාන වස්තුවක් වන්නේ මලයි. අපේ ජීවිතය හා මල් අතර ඇත්තේ වෙන් කළ නොහැකි සම්බන්ධතාවයකි. දුප්පත් පෝසත් ලොකු, කුඩා භේදයක් නැතිව සෑම දෙනාගේම ජීවිතයේ සිහිකටයුතු අවස්ථාවන්, උත්සව, නැකැත් කෙළි ආදී සියලු තැන් සැරසෙන්නේ විවිධ වූ විචිත්‍රවත් මල්වලිනි. ස්වාභාවික මල් නැති තැන මල් සංකේතවත් කරමින් කෘත්‍රිම මල්වලින් හෝ ඒ සැරසිලි කරනු ලැබේ. මඟුල් ගෙදර මෙන් ම මළ ගෙදර ද සැරසිලිවලට මුල්වන්නේ මල් ය. ඇතැම්හු උත්සව අවස්ථා ආදියට යාමට සැරසෙන්නේ ද මල්වලිනි. රජ මැති ඇමතිවරුන් ආදී ප්‍රභූවරුන් ද, ක්‍රීඩාවලින් ජය ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ද විවිධාකාර ජයග්‍රහණ හා අභියෝග ජයගත් වෙනත් අය මල්මාලා පළඳවමින් පිළිගනු ලැබේ.

මේ සියල්ලටමත් වඩා ආගමික උත්සව පුදපූජා ආදියේ දී මුල්තැන ගන්නේ මල් ය. බුදුදහමේ ද පූජාවන් අතර මල් පූජාව විශේෂ තැනක් ගනී. පිදිය යුත්තන් පිදීමේ දී බුදුරජාණන් වහන්සේ පවා මල් පුදා ඇත. රහතන් වහන්සේලාට බුහුමන් දැක්වීම විශේෂයෙන් දැක්විය හැකි ය.

**''ඉහේ මලක් පිපුණා වාගේ''**
**''මගේ බලාපොරොත්තුව මල්ඵල ගත්තා''**

යනාදී යෙදුම්වලින් එය පැහැදිලි වේ.

බුදුරජාණන් වහන්සේ සිය දහම ශ්‍රාවක ජනයාට අවබෝධ කරවීමේ දී ඔවුන්ගේ ජීවිතයට ඉතා සමීප උපමා යොදාගත් බව ප්‍රකට කරුණකි. ඒ අතරින් නිතර යොදාගත් උපමාවකි මල. එසේ මල් උපමා කරමින් කරන ලද දේශනාවන්ගේ එකතුවකි. ධම්මපදයේ පුප්ඵ වග්ගය. මෙහි ගාථා සංඛ්‍යාව 16කි. ඒ සඳහා ධම්මපද අටුවාවේ එන නිදාන කතා ගණන 12 කින් ද යුක්ත වේ.

## 3.5.2.1 අර්හත්වය වෙත යන්නා දක්ෂ මල්කරුවෙකු මෙනි.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩවෙසෙන සමයක වරක් පන්සීයක් රහතන් වහන්සේලා පිරිවරා ජනපද චාරිකාවෙහි හැසිර නැවත දෙව්රම් වෙහෙරට වැඩි සේක. එදින සවස්යාමයේ භාග්‍යවතුන් වහන්සේ උපස්ථාන ශාලාවට වඩින විට භික්ෂූන් වහන්සේලා උපස්ථාන ශාලාවේ රැස්වී අසවල් ගමේ සිට අසවල් ගමට යන පාර සම විෂමයි, මඩ බහුලයි, කැටගල් බහුලයි, කළු මැටි සහිතයි, යනාදී වශයෙන් මග දිගට පැවති මහ පොළවෙහි තොරතුරු කතා කරමින් සිටියහ. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩමවා මා මෙතනට එන්න පළමුව කුමන කතාවක් කරමින් සිටියෙමු දැයි විමසූහ. භික්ෂූන් වහන්සේලා, ''ස්වාමීනි, අප ඇවිද්ද තැන්වල පොළවෙහි තොරතුරු පිළිබඳ කතාකරමින් සිටියෙමුයි'' පිළිතුරු දුන්හ. ''මහණෙනි, නුඹලා මේ බාහිර පොළොව පිළිබඳ නොව ආධ්‍යාත්මික පොළොව පිළිබඳ ව කතා කිරීම හා ඒ පිළිබඳ අවබෝධය සඳහා කළයුතු කර්ම කිරීම වටනේයැයි වදාරා ''කො ඉමං පඨවිං විජෙසසති''ආදී වූ මේ ගාථා දෙක දේශනා කළ සේක.

1. **කො ඉං පඨවිං විජෙසසති**
**යමලොකඤ්ච ඉමං සදෙවකං**
**කො ධම්මපදං සුදෙසිතං**
**කුසලො පුප්ඵමිව පචෙසසති**

**පදාර්ථ:-** **කො.** කවරෙක්, **ඉමං පඨවිං**, මේ අප ලබා සිටින ආත්මභාව නමැති පොළව ද, **යමලොකඤ්ච**, සතර අපාය ද, **ඉමං සදෙවකං**, දෙව් ලොව හා මිනිස් ලොව ද; **විජෙසසති**, ඇති සැටියෙන් නුවණින් අවබෝධ කරගනී ද: **කුසලො පුප්ඵං ඉව** දක්ෂ මල්කරුවෙක් මල් කඩා විසිතුරු ලෙස සකස් කරගන්නා සේ: **කො** කවරෙක්: **සුදෙසිතං**, මැනවිං දේශනා කරන ලද: **ධම්මපදං**, සත්තිස්බෝධිපාක්ෂික දහම්පද, **පචෙසසති**, මැනවින් අවබෝධ කරගන්නේද,

**විවරණය:-** මෙහි ආත්මභාවය සහ අපාය, දෙව්ලොව, මිනිස්ලොව යන ලෝක පිළිබඳ ඇති සැටියෙන් දැන ගැනීම නම් ඒවා නාම, රූප, ස්කන්ධ, ධාතු ආයතන වශයෙන් හා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැකීමයි.

සත්තිස් බෝධිපාක්ෂික ධර්ම යන්නෙහි බෝධි යනු චතුරාර්ය සත්‍ය අවබෝධ කිරීමෙන් මාර්ගඵල ලැබීමයි. ඒ මාර්ගඵල අවබෝධයට උපකාරවන ධර්ම බෝධි පාක්ෂික ධර්ම නම් වේ. ඒවා

| | |
|---|---|
| සතර සතිපට්ඨාන | කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා |
| සතර සම්‍යක්ප්‍රධාන | නූපන් අකුසල් නොඉපදවීමට ද, උපන් අකුසල් දුරුකිරීමට ද, නූපන් කුසල් ඉපදවීමට උපන් කුසල් වැඩි දියුණු කිරීමට ද, කරන වීර්යයි. |
| සතර ඉද්ධිපාද | ඡන්ද, චිත්ත, විරිය, වීමංසා යනු ඉද්ධිපාදයෝය. |
| පඤ්ච ඉන්ද්‍රිය | සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන මේවා සත්‍යාවබෝධ කිරීමේ මාර්ගයේ දී ප්‍රධාන වන බැවින් ඉන්ද්‍රිය නම් වේ. |
| පඤ්ච බල | මේ ඉන්ද්‍රිය ධර්ම ම බල ධර්ම වේ. |
| සත්තබොජ්ඣංග | සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා. |
| ආර්ය අෂ්ටාංගික මාර්ගය | සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මාසති, සම්මා සමාධි |

2. **සෙඛො පඨවිං විජෙස්සති**
**යමලොකඤ්ච ඉමං සදෙවකං**
**සෙඛො ධම්මපදං සුදෙසිතං**
**කුසලො පුප්ඵමිව පචෙස්සති**

පදාර්ථ:- **සෙඛො**, ආර්ය මාර්ගයේ හික්මෙන ශෛක්ෂ පුද්ගලයා: **පඨවිං**, මේ ආත්මභාවය නැමැති පොළොව: **විජෙස්සති**, අවබෝධ කරන්නේය: **යමලොකඤ්ච,** සතර අපායද: **සදෙවකං**, සදෙව්ලොව සහිත **ඉමං**, මේ මිනිස් ලෝකයද, **විජෙස්සති,** අවබෝධකරන්නේය, **සුදෙසිතං**, මනාව දේශනා කරන ලද, **ධම්මපදං**, සත්තිස් බෝධිපාක්ෂික ධර්මය: **කුසලො පුප්ඵමිව**, දක්ෂ මාලාකාරයෙකු මල්කඩා රැස්කරන්නාක් මෙන්: **පචෙස්සති,** අවබෝධ කර ගන්නේය.

**විවරණ:-** සේඛ, ශෛක්ෂ හෙවත් හිකමන්නෝ සත්දෙනෙකි. එනම් සෝවාන් මාර්ගය, ඵලය, සකදාගාමී මාර්ගය, ඵලය, අනාගාමී මාර්ගය, ඵලය, අරහත් මාර්ගය යන අවස්ථා හත සඳහා හික්මෙන පුද්ගලයෝ සේඛ හෙවත් ශෛක්ෂ නම් වේ. රහත් ඵලය සඳහා හික්මෙන්නෝය යන අර්ථයෙන් එසේ කියනු ලැබේ.

## 3.5.2.2 මේ සිරුර මිරිඟුවකි පෙණපිඬකි.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වැඩ වාසය කරන සේක. එකල්හි සැවැත්නුවරවාසී එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේගෙන් කමටහන් ලබාගෙන මහණදම් පුරමින් භාවනා වඩන්නට වනයට වැඩියේය. එහිදී බොහෝ උත්සාහ කළත් රහත්වීමට නොහැකිවිය. එනිසා බුදුරජාණන් වහන්සේ බැහැදැක මේ පුවත කියනු පිණිස යාමට පිටත් විය. එසේ යන අතර මගදී උන්වහන්සේ මිරිඟුවක් දුටුවහ. ග්‍රීස්ම කාලයට මහා මාර්ගයට මද්දහනේ හිරුරැස් වැටුණු විට ඉදිරියේ ජලය තිබෙන්නා සේ පෙනී ලංවන විට එය එතැන නැත නැවත එය ඈතින් පෙනේ. මේ මායාකාරී දර්ශනය මරීචි හෙවත් මිරිඟුව යයි කියනු ලැබේ. මෙය දුටු උන්වහන්සේ මාගේ මේ ශරීරය ද උපදින නැසෙන ස්වභාවයෙන් යුතු බැවින් ද දුකක්ව තිබිය දී සැපයක් සේ දකින බැවින් ද මිරිඟුවක් වැනි යයි මරීචි කර්මස්ථානය වඩමින් ගමන් කළහ. අතරමග දී උන්වහන්සේට අචිරවතී නදිය හමුවේ. මග වෙහෙස නිවාගනු පිණිස එහි බැස නා ගං ඉවුරෙහි ගස් සෙවනක වැඩ හුන්හ. ගඟදෙස බලා සිටින උන්වහන්සේට සැඩ පහර බිඳී බිඳී වැටෙන තැන්වල පෙණ පිඬු නැඟී ටික වේලාවකින් බිඳී යනු පෙනේ. අනිත්‍ය මෙනෙහි කරමින් සිටි උන්වහන්සේට මේ ශරීරය ද මොහොතින් මොහොත බිඳී බිඳී යන හෙයින් පෙණ පිඬුවක් වැනි යැයි සිතුනේය. දෙව්රම්වෙහෙර ගඳකිළියෙහි වැඩ සිටි බුදුරජාණන් වහන්සේට සෘද්ධි බලයෙන් උන්වහන්සේ ඉදිරිපිට පෙනී සිට එසේය මහණ මේ ආත්මභාවයත් පෙණ පිඬක් මෙන් ද මිරිඟුවක් මෙන් ද උපදින බිඳෙන ස්වභාව ඇත්තේමයයි ද යට සිතුවිලි උපමා කරගෙන මේ ගාථාව දේශනා කළ සේක.

3. **ඵේණූපමං කායමිමං විදිත්වා**
**මරීචිධම්මං අභිසම්බුධානො**
**ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි**
**අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ**

**පදාර්ථ:-** **ඉමංකායං,** මේ ශරීරය: **ඵේණූපමං,** පෙණ පිඬක් ලෙස, **විදිත්වා,** දැන: **මරීචිධම්මං,** මිරිඟුවක් ලෙස: **අභිසම්බුද්ධානො,** අවබෝධ කරගන්නා (භික්ෂුව) **මාරස්ස,** මාරයාගේ **පපුප්ඵකානි,** මල් විශේෂයක් බඳු සංසාරය, **ඡෙත්වාන,** සිඳ: **මච්චුරාජස්ස,** මාරයාට, **අදස්සනං,** නොපෙනෙන (නිවන කරා) **ගච්ඡෙ,** යන්නේය.

**විවරණය:-** කේසාදී දෙතිස් කුණපයකින් සැදුණු මේ ශරීරය අබල දුබල බැවින් ද ස්ථිර නොවන තාවකාලික වූවක් බැවින් ද, පෙණ පිඬක් හා සමාන යැයි දැන ගත්හ. ගිනි මද්දහනේ දිය දහරක් සේ පෙනෙමින් දුර සිටින්නන් රවටන මිරිඟුවක් සේ මේ ශරීරය ද හිස් වූ ගන්නට කිසිවක් නැති මායාවක් සේ වටහාගත්හ. එසේ වටහාගත් පුද්ගලයා මාරයාගේ මල් දැලක් බඳු වූ මේ කාම, රූප, අරූප යන තෛයභූමික සංසාරය සිඳින්නේය. එය සිඳින රහතන් වහන්සේ නැවත නූපදින බැවින් මාරයාගේ දර්ශනයෙන් මිදෙන්නේ ය.

## 3.5.2.3 පඤ්චකාමයට ගිජු වූවෝ මරු වසඟයට යති.

බුදුරජාණන් වහන්සේ කෙරෙහි අතිශයින් පැහැදී සිටි පසේ නදී කොසොල් මහ රජතුමා උන්වහන්සේ සමඟ නෑ සබඳකමක් ඇතිකර ගත්තොත් මැනවැයි සිතුනේය. ඒ සඳහා උපක්‍රමයක් ලෙස එතුමා බුදුරජාණන් වහන්සේගේ ඥාති දියණියක් ආවාහ කරගන්නට තීරණය කළේය. ඒ අනුව තමා වෙත ශාක්‍ය කුමාරිකාවක් එවන ලෙස දන්වා ශාක්‍ය රජ දරුවන් වෙත දූතයෙකු යැවීය.

කොසොල් රජු අධිරාජ්‍යයෙකි. ඔහු යටතේ පාලනය වන කුඩා රාජ්‍ය රාශියක් විය. ශාක්‍ය රට ද ඉන් එකකි. එහෙයින් ශාක්‍යයන්ට ඔහුගේ නියෝග පැහැර හැරිය නොහැකි විය. ශාක්‍යයෝ වනාහි මහා මාන්නක්කාරයෝය. ඔවුන්ගේ පිළිගැනීම වූයේ ඔක්කාක පරපුරෙන් පැවත එන තමන් දඹදිව ඉහළම කුලවතුන් ලෙසය. එනිසා තමා හා කුලයෙන් සමාන නොවන කිසිදු කුලයක් සමඟ ඔවුන් ආවාහ විවාහ සබඳකම් නොපැවැත්වූහ. එහෙත් මහ රජුන්ගේ ඉල්ලීම පැහැර හැරියහොත් කරදර විය හැකි බැවින් ඔවුහු ඒ සඳහා උපායක් කල්පනා කළහ. එනම් මහානාම ශාක්‍යයාට දාව දාසියකගේ කුසින් උපන් වාසභඛත්තියා නම් රූමත් කුමාරිකාවක් වූවාය. ශාක්‍යයෝ ඇය කොසඹෑ රජතුමාට පාවා දී යැවූහ. කොසොල් රජුට දාව වාසභඛත්තියා පුතෙකු බිහි කළාය. ඔහුට විඩූඪභයයි නම් තබන ලදී. විඩූඪභ කුමාරයා සිප්සතර හදාරා පැමිණ සොළොස් වියේදී පමණ තම මවගේ ඥාතීන් දැකීමට ශාක්‍යයන් වෙත ගියේය. නෑදෑයන් දැක බලාගෙන නැවත පැමිණෙන අතර එක රාජ පුරුෂයෙකු තමාට බැරිවී දමා ගිය ආයුධයක් ගැනීමට නැවත මාළිගයට පැමිණියේය. එසේ පැමිණෙන විට විඩූඪභ කුමරු හිඳගත් පුටුව කිරිදියෙන් සෝදනවා දැක හේතු විමසීය. එවිට දාසියකුගේ පුතෙකු හිඳගත් පුටුව කිරිදියෙන් සෝදනවා යැ'යි දාසිය කීවාය. ඒ බව රාජපුරුෂයා විසින් විඩූඪභ කුමරුට සැලකර සිටියේ ය. මේ කළ අපහාසයට මම දිනක ඔවුන්ගෙන් පළිගන්නෙමි'යි හේ තීරණය කළේය. ඔහු රජ වී අවස්ථා තුනක දී ම ශාක්‍යයන් ඝාතනය කිරීමට ගියත් බුදුරජාණන් වහන්සේ ඒ තුන් වතාවේ ම පෙර මඟට වැඩම කොට එය වළකාලූහ. සිවුවෙනි වර උන්වහන්සේ පෙර මඟට නොවැඩියහ. ඊට හේතුව වූයේ ශාක්‍යයන් පෙර කලෙක ගංගාවකට වස මුසුකොට විශාල ජන සංහාරයක් කිරීමේ පාපකර්මය නිසා ඔවුන් බේරාගැනීමට නොහැකි බව දුටු හෙයිනි. විඩූඪභ සිය සෙනග සමඟ ගොස් ශාක්‍යයන් සමූල ඝාතනය කළහ. එසේ සමූල ඝාතනය කොට පෙරලා කෝසලය වෙත යන අතරතුර අචිරවතී ගං ඉවුරෙහි කඳවුරු බැඳ එහි රාත්‍රිය ගත කළහ. එදා රාත්‍රියෙහි මහා වැස්සකින් අචිරවතී නදිය පිටාර ගලා විඩූඪභ ඇතුළු පිරිස ගංවතුරට හසු වී විනාශ වූහ. මෙය නිමිති කරගෙන බුදුරජාණන් වහන්සේ ''පුප්ඵානිහෙව පචිනන්තං'' ආදී වූ මෙම ගාථාව දේශනා කළහ.

4. පුප්ඵානි හෙව පචිනන්තං
ඛ්‍යාසත්ත මනසං නරං
සුත්තං ගාමං මහොඝොව
මච්චු ආදාය ගච්ඡති

**පදාර්ථ:- පුප්ඵානි පචිනන්තං** එව, මල් කඩා රැස්කිරීමෙහි ම යෙදුණු මාලාකාරයෙකු මෙන්: **ඉහ,** මේ ලෝකයෙහි: **බ්‍යාසත්ත මනසං,** ලැබුණු හා නොලැබුණු පංචකාමයෙහි ම ඇළුණු සිත් ඇති: **නරං,** මිනිසා: **සුත්තං ගාමං මහොඝොව,** මහා සැඩ පහරක් අවුත් නිදිගත් ගමක් පිටින් ම ගසාගෙන යන්නාක් මෙන්: **මච්චු ආදාය ගච්ඡති,** මාරයා රැගෙන යන්නේය.

**විවරණය:-** මල් නෙලන මල් කරුවා නොයෙක් විසිතුරු මල් දැක මල් වර්ග එක දෙකකින් සෑහීමට පත් නොවී වඩ වඩාත් විසිතුරු මල් තෝරමින් මල් උයනේ මල්ගස් අතර ඒ මේ අත සැරිසරමින් හොඳ හොඳ මල් තෝරා නිම කරගත නොහැකිව ප්‍රමාදවන්නා සේ පස්කම් සැපයෙහි ගිජු වූ පුද්ගලයා ලැබෙන ලැබෙන රූප ශබ්ද ආදී පංචකාම ගුණයෙන් මත් වී දිවා රෑ නැතිව වඩ වඩාත් මහරු කම් සැප සොයමින් ම කල් ගෙවන්නේ ය. ඒ අතර ඔහු නොදැනුවත්ව ආයුෂ ගෙවී මරු වසඟයට යන්නේය.

## 3.5.2.4 දෙව්ලොවින් පැමිණි පතිපූජිකාව.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වැඩවසන සමයේ තවුතිසා දෙව්ලොව උපන් මාලාභාරී දිව්‍ය පුත්‍රයා දිව්‍ය අප්සරාවන් දහසක් පිරිවරා උයනට පිවිසියේය. පන්සියයක් පමණ දිව්‍ය අප්සරාවෝ ගස්වලට නැගී මල් කඩා දමත්. පන්සියයක් පමණ දිව්‍ය අප්සරාවෝ කැඩූ මල්ගෙන දිව්‍ය පුත්‍රයා සරසති. එක් දෙව්දුවක් ගසේ අත්තකදී ම මියගියේය. ඇගේ සිරුර පහන් සිළුවක් නිවී යන්නාක් මෙන් අතුරුදහන් විය. ඇය සැවැත් නුවර එක්තරා කුලගෙයක උපන්නීය. උපන් විගසම පසුගිය ජාති සිහිකිරීමේ ශක්තිය ඇයට ලැබුණි. පෙර මාලාභාරී දිව්‍ය පුත්‍රයාගේ භාර්යාවක වූ බව දැක වැඩිවිය පැමිණ සුවඳමල් පුදා යලිත් සිය සැමියා ළඟම ඉපදීමට ප්‍රාර්ථනා කළාය.

ඇය සොළොස් වියේ දී පතිකුලයට පිවිස දාන මාන ආදී පිංකම් කොට මේ පිනෙන් මාගේ සැමියා ළඟම ඉපදීමට හේතුවේවායි පැතුවාය. ඉන් පසු භික්ෂූහු මොනොමෝ මහත් උනන්දුවෙන් තම සැමියාම පතමි කියා ඇය පතිපූජිකාව ලෙස හැඳින්වූහ. මෙසේ ඇය බොහෝ පිං කරමින් කුසල් රැස් කරගත්තාය. මේ අතර ඇය පුතුන් සතර දෙනෙකුම ලැබුවාය.

දිනක් ඇය දානාදී පිංකම්වල යෙදී සවස් කාලයේ හටගත් හදිසි රෝගයකින් කළුරිය කළාය. කළුරිය කොට තව්තිසා දෙව්ලොව තම ස්වාමියා වූ මාලාභාරී දිව්‍යපුත්‍රයා වෙතම උපන්නීය. සෙසු දිව්‍යාංගනාවෝ ඒ වන විටත් දිව්‍ය පුත්‍රයා මලින් සරසමින් සිටියාහුය. දිව්‍ය පුත්‍රයා ඇය දැක ඔබ උදේ පටන් ම නොදක්කෙහිය කොහි ගියා දැයි විමසුවේය. ස්වාමීනි, මම චුත වීමි. ඔබ කුමක් කියන්නෙහි ද? කොහි උපන්නෙහි දැයි ඇසුවේ ය. ස්වාමීනි, සැවැත් නුවර කුලගෙයක උපන්නෙමි. කෙතෙක් කල් සිටියාද? දසමසක් ඇවෑමෙන් මව්කුසින් ඉපිද සොළොස්වියේ දී විවාහ වී පුතුන් සිව් දෙනෙකු ද බිහිකර දාන සීලාදී පිංකම් කර ඔබ ම පතා අවුත් ඔබ සමීපයෙහි ම උපන්නෙමියි කීවා ය. එහි මිනිස්සුන්ට කොපමණ ආයුෂ ඇත් ද, අවුරුදු සියයක් පමණයි කී කල්හි ආයු ප්‍රමාණය එතෙක් නම් කෙසේ ද මිනිස්සු පව්කම් කරත් ද පිංකම් කරත් දැයි විමසීය.

ස්වාමීනි, ඔබ කුමක් කියත් ද අසංඛ්‍යක් ආයුෂ ඇතිව උපන්නාක් මෙන් ද අජරාමර වුවන් මෙන් ද මිනිස්සු නිතර ප්‍රමාද වන්නෝ යැයි කීවා ය. මාලභාරී දිව්‍යපුත්‍රයාට බලවත් සංවේගයක් ඇතිවිය. සියක් ආයුෂ ඇත්තවුනුත් මෙසේ ප්‍රමාද වන්නේ නම් කවදා දුකින් මිදෙන්නට ද. මෙබඳු අල්පායුෂ්ක මිනිස්සු ප්‍රමාදවීම අකටයුත්තකි යි පැවසීය.

ඇය කළුරිය කර දෙවැනි දින භික්ෂූහු දානයට ගමට වැඩම කොට ආසන ශාලාව සූදානම් කර අසුන් පනවා නැති බව දැක පතිපූජිකාව කොහේදැයි විමසූහ. ඇය ඊයේ සවස් වේලෙහි කළුරිය කළ බව අසා පුහුදුන් භික්ෂූන් කඳුළු වැගිරූහ. රහතන් වහන්සේලාට ධර්ම සංවේගය ඇතිවිය. භික්ෂූහු දන් වළඳා අවසන්ව විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසූහ. ස්වාමීනි, පතිපූජිකාව මහත් උනන්දුවෙන් පිංකම් කර තම ස්වාමියාව පැතුවාය. දැන් ඇය මියගොස් ය. කොහි ඉපදුනි ද? මහණෙනි, තම සැමියා ලඟමයැයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. ස්වාමීනි, ඇය තම සැමියා පැතුවා පමණක් නොවේ. තවුතිසාවේ මාලාභාරි දෙව්පුතු ඇගේ ස්වාමියා වෙයි. ඇය ඔහුට මල්දම් පළඳවමින් සිට එතැනින් චුතව අවුත් මෙහි උපන්නීය. එසේ ම නැවත කළුරිය කර ගොස් එහි ම උපන්නාය. එසේද ස්වාමීනි. සත්ත්වයාගේ ජීවිතය කෙතරම් කෙටි ආයුෂක් ඇත්තේ ද? උදේ අපට දන් දී සවස උපන් රෝගයකින් ඇය මළායයි භික්ෂූහු පැවසූ විට බුදුරජාණන් වහන්සේ, එසේය මහණෙනි, සත්වයන්ගේ ජීවිතය අල්පායුෂ්කය. එහෙයින් මේ සත්ත්වයෝ වස්තුකාම ක්ලේෂකාමයන් ගෙන් අතෘප්තිකර හෙයින් මරුවා ඔවුන් හඬද්දී වැළපෙද්දී තමා වසඟයට ගෙන යන්නේ යැයි වදාරා මෙම ගාථාව දේශනා කළ සේක.

**5. පුප්ඵානිහෙව පචිනන්තං**
**බ්‍යාසත්ත මනසං නරං**
**අතිත්තං යෙව කාමෙසු**
**අන්තකො කුරුතෙ වසං**

පදාර්ථ:- **පුපඵානි,** මල් ; **පචිනන්තං ඉව,** කඩා එක් රැස් කරන මාලාකාරයෙකු මෙන්, **ඉහ,** මේ ලෝකයෙහි, **බ්‍යාසත්ත මනසං,** පංචකාමයන් හි ඇළුණු සිත් ඇති: **නරං,** මිනිසා **කාමේසු,** කාමයන් හි, **අතිත්තං යෙව,** තෘප්තිමත් වීමෙන් තොරව සිටියදී ම: **අන්තකො,** මාරයා: **වසං කුරුතෙ,** ඔහු තම වසඟයට ගත්තේය.

21 පාඩම

# පුප්ඵ වග්ගය - II

## 3.5.2.5 මල නොතලා රොන් ගන්නා වන බඹරා.

රජගහ නුවර අසබඩ සක්ඛර නම් නියම් ගමෙහි කෝසිය නම් සිටුවරයෙක් විසීය. ඔහු ඉතා ධනවත්ය. එහෙත් ඉතා මසුරුය. ඔහුගේ ධනය කහවණු අසූකෝටියක් පමණ තිබූ නමුත් තණපත් අග තැවරුන තෙල් බිඳක් තරම්වත් දෙයක් කිසිවෙකුටත් නොදෙයි. අඹුදරුවන්ටවත් භුක්ති විඳින්නටවත් නොදෙයි. තමන්වත් භුක්ති නොවිඳියි. පිනකට දහමකට නම් යොදවන්නේ ම නැත. ඔහුගේ ධනය රකුසුන් අරක්ගත් විලක් මෙන් විය. ඒ නිසා ඔහු මච්ඡරිය කෝසිය සිටු යැයි ප්‍රසිද්ධ විය. හේ දිනක් රජවාසලේ රාජකාරි සඳහා ගොස් ආපසු පැමිණෙමින් සිටියේය. එසේ එන අතරතුර සාගින්දරෙන් පෙළුණු මිනිසෙකු කැවුම් ගෙඩියක් රසකරමින් කනවා ඔහු දුටුවේය. මසුරුකම නිසා කිසිදු රසකැවිල්ලක් කෑමේ පුරුද්දක් නැති සිටුවරයාට එය දැක කැවුම් කෑමේ බලවත් ආශාවක් ඇති විය. හේ කල්පනා කරනුයේ කැවුම් කන්නට ආශාබව සිටු මැඳුරේ අයට කීවොත් ඉතා විශාල පිරිසකට කැවුම් සාදා දීමට සිදුවේ. එවිට විශාල ප්‍රමාණයක් ධනය වැයවේ. සිදුවන ධන හානිය පිළිබඳ කල්පනා කළ ඔහු ආශාව සිටු දේවියට වත් නොකියා සිතෙහි තදකරගෙන සිටියේය. මේ නිසා ඔහුගේ සිරුර සුදුමැලි වී කෘෂ වී ගියේය. මේ අපහසුව හා වෙනස දුටු ඔහුගේ බිරිඳ, කිමෙක් ද ස්වාමීනි යම් අපහසුවක් වේ දැයි විමසීය. එසේ නැතැයි හේ කීය. එසේ නම් රජුගෙන් දැසි දස්සන්ගෙන් දූ දරුවන්ගෙන් හෝ වෙනත් කිසිවෙකුගෙන් කිසියම් දෝෂයක් වීද ඒ නිසා අමනාපයෙන් සිටී දැයි විමසීය. එසේ ද නැතැයි හේ පැවසීය. එසේ නම් ධන හානියක් වේ යැයි බියෙන් කිසිත් නොකියා නොඅඟවා සිටින කිසියම් ආසාවක් වේ දැයි විමසීය. එසේ පෙරත්ත කරමින් අසන විට ඉතා අපහසුවෙන් ඇඹරෙමින් සිටිනු දැක, කියන්න ස්වාමීනි, කිමෙක් ද ඔබට ඇති වූ ආශාව කියනු මැනවියි යනුවෙන් නැවත නැවතත් පෙරත්ත කරමින් විමසුවාය. එවිට මහත් අපහසුවෙන් කැවුමක් කනු කැමැත්තෙමි යි හේ කීය. කිමෙක්ද ස්වාමීනි, ඔබ දිළින්දෙක් ද අපට ඇති වස්තුව අනුව මේ ගම් නියම් ගම් සියල්ලහි ම සිටින්නන්ට සෑහෙන පරිදි සූදානම් කරමු යි ඈ යෝජනා කළාය. උන්ගෙන් මට ඇති ප්‍රයෝජන කිමද? එසේ නම් ඔබත් මමත් පමණක් සාදාගෙන කමුයි බිරිඳ කීවේ ය. නුඹට කුමටද දොළදුක ඇත්තේ මටයැ'යි සිටුවරයා කීය. එසේනම් ස්වාමීනි ඔබ වහන්සේට පමණක් කැවුම් සාදා දෙන්නෙමි'යි ඇය පැවසුවාය. හේ එයට කැමති විය. කිසිවෙකුටත් නොදැනෙන සේ අවශ්‍ය බඩු මුට්ටුත් රැගෙන සත්මහලෙන් උඩු මහල් තලයට වැදී සියලුම දොරවල් වසා අගුළු දමා කැවුම් පිසින්නට වූහ.

බුදුරජාණන් වහන්සේ මුගලන් තෙරුන් අමතා අසවල් සිටාණන් සිටුමැඳුරේ සත්වෙනි මහලේ කැවුම් පිසින්නේ ය. එම සිටුතුමාට හා බිරිඳට සෝවාන් වීමේ ආසාව ඇත. එහි ගොස් සිටුවරයා දමනය කොට ඔවුන් සෘද්ධි බලයෙන් මෙහි පමුණුවන්නේ යැයි

වදාළහ. මුගලන් තෙරණුවෝ එම ස්ථානයට සෘද්ධියෙන් වැඩම කොට මැදුරු කවුළුව අසල අහසෙහි වැඩ සිටියහ. තෙරුන් වහන්සේ දුටු සිටුවරයා කවුරුන් හෝ දකීයැයි බියෙන් කැවුම් පිසින්නට මෙතැන තෝරාගෙනත් මේ භික්ෂුව මෙතනටත් ආවේ යැයි කෝපයට පත් ව ගින්නෙහි ලූ ලුණු කැට මෙන් පුපුරන්නට විය. එසේ කෝපයෙන් දැවෙමින්, ශ්‍රමණය අහසෙහි සිටියා නොව අහසෙහි සක්මන් කළත් ඔබට නම් මගෙන් කිසිවක් නොලැබෙන්නේ යැයි කීය. එවිට උන්වහන්සේ අහසෙහි සක්මන් කළහ. ඔබ සක්මන් කළා නොව අහසෙහි හිඳගෙන සිටියත් දෙන්නේ නම් නැතැයි සිටුවරයා කීය. එවිට උන්වහන්සේ අහසෙහි හිඳගත්හ. මෙසේ උන්වහන්සේ සිටුවරයා කියන කියන සෑම ප්‍රාතිහාර්යයක් ම පෑ සේක. අන්තිමේ දී මේ ශ්‍රමණයා ආශාවෙන් ඇළුණු කෙනෙකි කිසිවක් නොලබා යන්නේ ම නැතැයි කියා එක කුඩාම කැවුමක් පිස දෙන ලෙස බිරිඳට නියම කළේය. ඇය ද පිටි ස්වල්පයක් ගෙන තෙල් තාච්චියට දැමුවාය. එයින් මුළු තාච්චිය පිරෙන්නට මහා කැවුමක් මතු වී ආවේ ය. එය දුටු සිටුවරයා නුඹ පිටි ස්වල්පයක් ගෙන තෙල් තාච්චියට දැමුවේ ය. එය කලින් පිසූ කැවුමටත් වඩා විශාල විය. මෙසේ පිසින පිසින කැවුම විශාල වේ. ඒවා වට්ටියට දම දමා අලුතින් කුඩා කැවුමක් පිසින්නට වෑයම් කරති. මෙහි කෙළවරක් නැති බව දුටු සිටුවරයා බැරිම තැන වට්ටියෙන් කැවුමක් දී මේ ශ්‍රමණයා පිටත් කර හරින්නැයි බිරියට කීය. ඇය කැවුමක් ගන්නට ගිය විට සියළු කැවුම් එකට ඇලී තිබුණි. අනතුරුව දෙදෙනාම එකතු වී දහඩිය දමන තුරු දෙපසට අදිමින් කැවුමක් වෙන්කර ගන්නට වෑයම් කළත් සාර්ථක නොවීය. අන්තිමේ දී සිටුතුමාටත් කැවුම් එපාවිය. මට කැවුම්වලින් කම් නැත. මේ සියල්ල වට්ටියත් සමගම උන්වහන්සේට පූජාකරන්නැයි හේ නියම කළේය. ඇය එම කැවුම් උන්වහන්සේට පුදන්නට ගිය විට උන්වහන්සේ දහම් දෙසූහ. එයින් සිටුවරයා පැහැදුනේ ය. එහිම සිට කැවුම් වළඳන්නැයි හෙතෙම ආරාධනා කළේය. තෙරුන් වහන්සේ ද මහ සිටු තුමනි, බුදුරජාණන් වහන්සේ පන්සියයක් මහ සඟන පිරිවරා කැවුම් වළඳමියි විහාරයෙහි වැඩ සිටින සේක. ඔබ කැමති නම් කැවුම් සහ ආහාර පාන ආදියත් ගෙන විහාරයට යමුයි කියා සෘද්ධියෙන් ම කළ අධිෂ්ඨාන බලයෙන් ඔවුන් සියලු දෙනාම දෙව්රම් වෙහෙරෙහි පහළ වූහ. එහිදී ඔවුහු බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට කැවුම් හා ප්‍රණීත ආහාර පාන පිදීය. තෙරුන් වහන්සේගේ අධිෂ්ඨාන බලය නිසා සියලු දෙනාට ම ඇති තරම් බෙදීමෙන් පසුවත් කැවුම් නිම නොවීය. මේ කැවුම්වලට කුමක් කරමු දැයි විමසූ විට දෙව්රම් වෙහෙර දොරටුව අසල දමන්නැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. ඔවුහු එසේ කොට නැවත පැමිණ බුදුරජාණන් වහන්සේට වැඳ එකත් පසෙක සිටියෝය. උන්වහන්සේ දහම් දෙසූහ. එම ධර්මය අසා සිටු යුවල සෝවාන් වූහ. එතැන් පටන් සිටුවරයා සිය අසූ කෙලක් ධනය බුදු සසුනේ දියුණුවට හා පිනට දහමට යෙදවූහ. පසුදා මෙම පුවත නිමිති කරගෙන භික්ෂූන් වහන්සේලා දම්සභාවෙහි හිඳිමින් මුගලන් තෙරුන්ගේ ආනුභාවය වර්ණනා කරන්නට වූහ. එවේලෙහි එහි වැඩම කළ බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා අමතා මුගලන් තෙරුන්ට ප්‍රශංසා කරමින් මේ ගාථාව දේශනා කළ සේක.

6. යථාපි භමරෝ පුප්ඵං
වණ්ණ ගන්ධං අහෙඨයං
පළෙති රසමාදාය
එවං ගාමෙ මුනීචරෙ

**පදාර්ථ:-** **යථා අපි,** යම් සේ: **භමරෝ,** බඹරා: **පුප්ඵං,** මල ද: **වණ්ණ ගන්ධං,** පැහැය හා සුවඳ ද: **අහෙඨයං,** නොනසමින්, **රසං ආදාය,** රසයන්ගෙන, **පළෙති,** යන්නේ ද: **එවං,** එපරිද්දෙන්, **මුනි,** භික්ෂූන් වහන්සේ: **ගාමෙ,** ගමෙහි: **චරෙ,** හැසිරෙයි.

**විවරණය:-** බඹරකු මලකින් පැණි උරා බිව්වාට මල් පෙතිවලට හෝ එහි පැහැයට හෝ හානියක් නොවේ. මලේ සුවඳ අඩු නොවේ. ගමෙහි පිඬු පිණිස හැසිර ජීවත්වන භික්ෂූන් වහන්සේ ද එසේ ය. සංවරයෙන් ශීලයෙන් යුතු බැවින් මහජනයාගේ ශ්‍රද්ධාවට හානියක් නොකරයි. එක් ගෙයකින් බත් පිඩක් දෙකක් පමණක් ලබාගන්නා බැවින් ඔවුන්ට ද බරක් නොවේ.

### 3.5.2.6 තම වරදස නොදිස්නේ මෙරමා වරදම දිස්නේ.

සැවැත් නුවර පාඨික නම් ආජීවකයෙක් විසුවේය. ආජීවක යනු ඒ අවධියේ විසූ පැවදි පිරිසකි. පැවිද්ද ජීවත් වීමේ මාර්ගයක් ලෙස කරගෙන ගිය බැවින් ඔවුන් ආජීවක නමින් හඳුන්වන ලදහ. සැවැත් නුවර විසූ එක්තරා ගෘහණියක් මේ පාඨික ආජීවකයාට පුතෙකුට මෙන් සංග්‍රහ කළාය.

මේ අතර අසල්වැසි ජනයා බුදුරජාණන් වහන්සේගේ බණ අසා පැමිණ මේ ගෘහපති සමග බුදු ගුණ කියති. ඒ ඇසූ ඇයට ද බුදු රජාණන් වහන්සේගෙන් බණ අසන්නට යාමට සිත්විය. මේ බව පාඨක ආජීවකයාට දන් වූ විට හෙතෙම ඊට විරුද්ධ විය. ඇය කීප වතාවක් ම මේ අදහස පාඨකයාට කීවත් ඔහුගෙන් නම් අවසරයක් නොලැබුණි. අන්තිමේ දී භාග්‍යවතුන් වහන්සේ සිය නිවසට වඩමවා බණ අසන්නට සිතූ ඇය පසු දින දානයට බුදුරජාණන් වහන්සේට ආරාධනා කර එන්නට කියා සිය පුතු දෙව්රම් වෙහෙරට යැව්වාය. හෙතෙම යන ගමන් පාඨික ආජීවක හමුවට ද ගියාය. කොහි යන්නෙහි දැයි විමසූ ආජීවකයා, දෙව්රම් වෙහෙරට යනබව කී විට ඔහුගේ ගමන වලකන්නට උත්සාහ කළේය. මවගේ කීම පැහැර හරින්නට බිය වූ පුතු ඊට එකඟ නොවීය. එවිට ආජීවකයා, එසේනම් ගොස් දනට එන්නට කියන්න එහෙත් නිවසට එන මඟ නොකියන්න. ඔබ එන විට වෙනත් පාරකින් එන්නැයි උපදෙස් දී ඔහු යැවීය. පුත්‍රයා ද ඒ කී ලෙසම කළේ ය.

නිවනට යන මග තමාම සොයාගෙන මුළු තුන් ලෝකයට ම මඟ පෙන්වා වදාළ සම්බුදු රජාණන් වහන්සේ නමකට ගමක නගරයක පාරක් කියාදෙන්නට අවශ්‍ය නැත. බුදුරජාණන් වහන්සේ පසු දින උදෑසනම එම උපාසිකාවගේ නිවසට වැඩම කළහ. පාඨික

ආජීවකයා ද බුදුරදුන්ට මඟ සොයාගත නොහැකි බව එම දානයට නොවඩිනු ඇතැයි සිතා උන්වහන්සේට පිළියෙල කළ මිහිරි ආහාරපාන රිසිසේ භුක්ති විඳින අදහසින් කල් ඇතිවම ඒ නිවසට ගොස් සිටියේය. බුදුරදුන් වඩිතැයි ඇසූ අසල්වැසියෝ එහි පැමිණ එම උපාසිකාවට උපකාර වෙමින් ගෙබිම ගොමමැටි ගා පිරිසිදු කොට ලදපස්මල් ඉස මැනවින් බුදුරජාණන් වහන්සේට ආසනය පිළියෙල කළේය. එසේම ආජීවකයාට හිඳින්නට නිවසේ පිටුපස කාමරයක් පිළියෙල කොට ඔහු එහි හිඳුවාලීය.

උපාසිකාව ද බුදුරජාණන් වහන්සේ පසග පිහිටුවා වැඳ පිළිගෙන අසුනෙහි වඩා හිඳුවා ප්‍රණීත ආහාර පානයෙන් වැළඳෙව්වාය. දන් වළඳා අවසානයෙහි බුදුරජාණන් වහන්සේ අනුමෝදනා දේශනාව ආරම්භ කළහ. උපාසිකාව එහි සිටි පිරිස ද සමග මහ හඬින් සාධුකාර දෙමින් බණ අසයි. ගෙයි පිටුපස කාමරයේ සිටි ආජීවකයාට මෙය උහුලාගත නොහැකි විය. දන් මැයට මාගැන ප්‍රසාදයක් නැත. මේ කාලකන්නි ගැහැණිය ඒ ශ්‍රමණ භවත් ගෞතමයාට සලකන්නේ යැයි, එම උපාසිකාවටත් බුදුරජාණන් වහන්සේටත් බැන වදිමින් එතනින් පිටව ගියේය. එයින් උපාසිකාවට මහත් ලැජ්ජාවක් ඇතිවිය. ඇයට හරිහැටි බණ අසාගැනීමට නොහැකිව සිත අවුල්වී ගියේය. මෙය දැනගත් බුදුරජාණන් වහන්සේ, උපාසිකාවෙනි ඔබට බණට සිත යොමු කරගන්නට නොහැකි වූවා නොවේ දැයි ඇසූහ. එසේ ය ස්වාමීනි මේ ආජීවකයාගේ කතාව නිසා, මගේ සිත අවුල්ව ගියේ යැයි ඇය පැවසුවාය. එවිට බුදුරජාණන් වහන්සේ, එබඳු නොහික්මුණු මිනිසා නිසා සිත අවුල් කර නොගන්නැයි අවවාද කරමින් ''අනුන්ගේ කටයුතු ගැන නොසිතා තමා කරන කියන දේ ගැන පමණක් සෙවීම වටනේ'' යැයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**7. න පරේසං විලොමානි**
**න පරේසං කතාකතං**
**අත්තනොව අවෙක්ඛෙය්‍ය**
**කතානි අකතානි ච**

**පදාර්ථ:-** **පරේසං,** අනුන්ගේ: **න විලොමානි,** නපුරු හදවත දැදුරු කරන වචන ගැන මෙනෙහි නොකළ යුතු ය: **පරේසං,** අනුන්ගේ: **නකතාකතං,** කළ නොකළ දේ පිළිබඳ නොසෙවිය යුතු ය: **අත්තනොව,** තමාගේ ම: **කතානි අකතානිච:** කළ දේ නොකළ දේ ගැන පමණක්: **අවෙක්ඛෙය්‍ය,** සලකා බැලිය යුතු ය.

**විවරණය:-** අනුන්ගේ ඇසේ ඇති ඉඳිකටුව පවා පෙනෙන්නේය, තමාගේ ඇසේ ඇති පොල් පරාලය නොපෙනෙන්නේයයි අපේ පැරණි කියමනක් ඇත. ඒ අනුව අනුන්ගේ වරද පෙනෙන තරමට තමන්ගේ වරද අපට නොපෙනේ මේ බව ''**සුදස්සං වජ්ජං මඤ්ඤෙසං අත්තනො පන දුද්දසං**'' යනාදී වශයෙන් අනුන්ගේ වැරදි දැකීම පහසු බවත්, තමන්ගේ වැරදි දැකීම අපහසු බවත්, අනුන්ගේ වරද වැද්දෙකු තමා කොළ අතුවලින් වසාගන්නා සේ සඟවා ගන්නේ යැයි ධම්ම පදයේ මළ වග්ගයේ 18 වන ගාථාවේ වදාරා ඇත. මේ නිසා අප කළ යුත්තේ අනුන් කළ නොකළ දේ සෙවීම නොව අප කළ නොකළ දේ සෙවීමය. දියුණුවට මඟ එයයි.

## 3.5.2.7. සුභාෂිත දහම සුවඳැති මනරම් මලක් කරගන්න.

සැවැත් නුවර ඡත්තපාණී නම් උපාසක තුමෙක් විසීය. හෙතෙම අනාගාමී ත්‍රිපිටක ධාරියෙකි. දිනක් හෙතෙම උදෑසනම පෙහෙවස් සමාදන් වී බුදුරජාණන් වහන්සේට උපස්ථාන කිරීම සඳහා දෙව්රම් වෙහෙරට ගියේය. ඔහු එකත් පසෙක හිඳගෙන භාග්‍යවතුන් වහන්සේගේ දහම් කතාවට සවන් දෙමින් සිටින අතර පසේනදී කොසොල් රජතුමා ද බුදුරජාණන් වහන්සේ බැහැදකීමට පැමිණියහ. රජු එන විට තමා නැඟී සිටිය යුතු ද නැද්දැයි උපාසකතුමාට දෙගිඩියාවක් ඇති විය. මා සිටින්නේ තුන්ලොවට අධිපති අගරජු සමීපයේය. ඒ නිසා එක් ප්‍රදේශයකට අධිපති ප්‍රාදේශීය රජ කෙනෙකු එන විට නැඟී සිටීම අයුතුය. රජු දැක නැඟී සිටියහොත් භාග්‍යවතුන් වහන්සේට අගෞරවයක් කළා වන්නේය. රජතුමා නුවණැත්තෙක් නම් වඩා ගරු කළ යුතු උත්තමයකු ලඟ නැඟී නොසිටීම ගැන කෝප නොවනු ඇතැයි සිතා උපාසක තුමා හිඳගෙනම සිටියේය.

එහි පැමිණි රජතුමාට තමා කෙරෙහි ගරු සරු නැතිව හිඳින උපාසක තැන කෙරෙහි කෝපයෙක් ඇති වුවත් ඒ බව නොඅඟවා බුදුරදුන් වැඳ එකත් පසෙක හිඳ ගත්තේය. බුදුරජාණන් වහන්සේ ද රජතුමා උපාසක තැන කෙරෙහි කුපිත වූ බව දැන මහරජ මේ ඡත්තපාණී උපාසක තැන පණ්ඩිතයෙකි, නිර්වාණ ධර්මය දුටු කෙනෙකි, ත්‍රිපිටක ධාරියෙකි. යහපත අයහපත පිළිබඳ දක්ෂයෙකියි උපාසක තුමාගේ ගුණ වදාළ සේක. එයින් රජතුමාගේ සිත මෘදු විය.

පසු දවසක උපාසකතුමා පාවහන් පැළඳ කුඩයක් ඉසලාගෙන රජ මිදුලෙන් යමින් සිටියේය. රජතුමා ඔහු කැඳවීය. හෙතම කුඩය හකුලා පාවහන් ගලවා ඉවත් කොට රජතුමා වෙත ගොස් වැඳ එකත් පසෙක සිටියේය. එවිට රජතුමා එදා මා එන විට නැඟී නොසිටි ඔබ අද මා දැක කුඩ පාවහන් පසෙකලා පැමිණියේ මන්දැයි විමසුවේය. උපාසකතුමා ඊට හේතුව පැහැදිලි කළ විට පැහැදුණු රජතුමා තම අනතඃපුරයේ බිසොවරුන්ට ධර්මය උගන්වන ලෙස උපාසක තුමාගෙන් ඉල්ලා සිටියේය. උපාසක තුමා එය භාරනොගෙන බුදුරජාණන් වහන්සේට සැලකරන ලෙස දැන්වීය. එසේ ආරාධනා කළ පසු බුදුරදුන් එම කාර්යය අනඳ තෙරුන්ට පැවරූහ. දැන් අනඳ තෙරනුවෝ දිනපතා රජ ගෙදරට වැඩම කර බිසෝවරුන්ට දහම් කියා දෙති. ඒ අතරින් මල්ලිකා දේවිය හොඳින් බණ ඉගෙන ගනියි, පාඩම් දෙයි, වාසභඛත්තියා දේවිය හරිහැටි නොඋගනී. පාඩම් නොදෙයි. වාසභඛත්තියා යනු බුදුරදුන්ගේ නෑයෙකු වීමේ බලාපොරොත්තුවෙන් කොසොල් රජතුමා ශාක්‍ය රටින් ආවාහ කරගත් දේවියයි. පසුකලෙක ශාක්‍ය රටත් විනාශ කොට පිය රජතුමා ද රටින් නෙරපා රාජ්‍ය පැහැරගත් විඩූඩභ කුමරාගේ මව ද ඇයයි.

බුදුරජාණන් වහන්සේ දිනක් කෙසේද ආනන්ද රජ ගෙදර උපාසිකාවෝ හොඳින් බණ දහම් උගනිත් දැයි ඇසූහ. ස්වාමීනි, මල්ලිකා දේවිය නම් හොඳින් ඉගෙන ගනී. එහෙත් ඔබ වහන්සේගේ ඥාති දියණිය හරිහැටි ඉගෙන ගන්නේ නැතැයි තෙරණුවෝ පැවසූහ. එය ඇසූ බුදුරජාණන් වහන්සේ, ආනන්දය, මා විසින් දෙසන ලද ධර්මය හරිහැටි නොඅසන හරිහැටි ඉගෙන නොගන්නා පාඩම් නොකරන අයට පැහැයෙන් සුන්දර වුවත් සුවඳ නැති මලක් මෙන් ධර්මයේ ප්‍රතිඵල ලබාගත නොහැකි යැයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

8. යථාපි රුචිරං පුප්ඵං
වණ්ණවන්තං අගන්ධකං
එවං සුභාසිතා වාචා
අඵලා හොති අකුබ්බතො

**පදාර්ථ:-** යථා, යම්සේ; රුචිරං වණ්ණවන්තං අපි, සිත්කළු වූද පැහැපත් වූද; **වණ්ණවන්තං, පුප්ඵං,** මල ; **අගන්ධකං,** සුවඳ නැත්නම්; **අඵලාහොති,** නිශ්ඵල වේද, **එවං,** එසේම, **සුභාසිතා වාචා,** මනාව දෙසන ලද බුද්ධ වචනයෙන්: සකුබ්බතො, **අකුබ්බතො,** හරිහැටි ඇසීම, ධාරණය කර ගැනීම, ඉගෙනීම නොකරන්නා හට, **අඵලාහොති,** ඵලයක් නොලැබෙන්නේ ය.

9. යථාප රුචිරං පුප්ඵං
වණ්ණවන්තං සගන්ධකං
එවං සුභාසිතා වාචා
සඵලා හොති සකුබ්බතො

**පදාර්ථ:- යථා,** යම්සේ; **රුචිරං,** පියකරු වූද; **වණ්ණවන්තං,** විවිධ පැහැයෙන් යුතු වූ ද; **සගන්ධකං,** සුවඳවත් වූ ද; **පුප්ඵං,** මල **සඵලාහොති,** ඵලවත් වේ ද, **එවං,** එසේම, **සුභාසිතා වාචා,** බුදුරජාණන් වහන්සේගේ ස්වාක්ඛාත ධර්මය: **සකුබ්බතො,** ඇසීම, ධාරණය, ඉගෙනීම ආදිය මැනවින් කරන්නාට; **සඵලාහොති,** මහත් ඵලදායී වන්නේ ය.

**විවරණය:-** මල් කොතරම් සුන්දර වුවත් පාටින් විසිතුරු වුවත් සුවඳ නැත්නම් අගයක් නැත. සියලු දෙනා පැළඳීමට සැරසීමට පිදීමට මුලින් ම තෝරාගන්නේ සුවඳැති මල් ය. එසේ ම බුදුරජාණන් වහන්සේගේ ධර්මය කොතරම් ස්වාක්ඛාත වුවත් මුල මැද අග යහපත් කොට දෙසන ලද හෙයින් සුභාෂිතයක් වුවත් යමෙක් එය හරිහැටි අසන්නේ නැතිනම්, ධාරණය කරගන්නේ නැතිනම්, එය පිළිපදින්නේ නැතිනම් ඔහුට ඒ දහමින් කිසිදු ඵලක් නැත්තේමය. දහමින් ඵල ලැබීමට නම් කළ යුතු සියල්ල මැනවින් කළ යුත්තේ ම ය.

### 3.5.2.8. විසිතුරු ලෙස මල්දම් ගොතන්නෙකු සේ පිංකම් කළ යුතු ය.

විශාඛාව බුද්ධ ශාසනයේ අග්‍ර උපාසිකාව වූවාය. ඇය අංග රට භද්දිය නුවර ධනඤ්ජය සිටුවරයාගේ සහ සුමනා දේවියගේ දියණියයි. බුදුරජාණන් වහන්සේ භද්දිය නුවරට වැඩම කළ අවස්ථාවේ දී ඇය සත් හැවිරිදි වියේදී ම බණ අසා සෝවාන් වූවාය. පසු කලෙක ඈ සැවැත් නුවර මිගාර සිටුතුමාගේ පුතා වූ පූර්ණ වර්ධන කුමාරයා සමඟ විවාහ වූවා ය. මිථ්‍යාදෘෂ්ටික නිඝණ්ඨ ශ්‍රාවකයෙකු වූ මිගාර සිටුතුමා බුදු සසුනේ පහදවාගත් ඇයට සිටුතුමා සැලකුවේ මවකට මෙනි.

නිතර දෙව්රම් වෙහෙරට ගොස් බණ අසන ඇයට දිනක් තමාගේ කහවණු කෝටියක් වටිනා මේල පළඳනාව විහාරයේ අමතක විය. නැවත එය ගැනීමට අකමැති වූ ඇය ඒ නව කෝටියත් සමග තවත් දහ අට කෝටියක් ද ඇතුළුව විසිහත් කෝටියක් වැයකොට සියලු විහාර අංගෝපාංගයන්ගෙන් සමන්විත පූර්වාරාම විහාරය ඉදිකර වූවාය. විහාර පූජාව සිදුකළ දවසේ මගේ සියළු පැතුම් මුදුන්පත් වී යැයි මහත් ප්‍රීතියට පත් ඇය දරු මුණුබුරන් ද කැටුව ගොස් විහාරය පුරා ඇවිදිමින් මිහිරි ගී ගයමින් උදම් ඇනුවාය, එය අසා සිටි භික්ෂූන් වහන්සේලා බුදුරදුන් වෙත ගොස් ස්වාමීනි, අද විශාඛාව දරු මුණුපුරන් පිරිවරාගෙන ගී ගයමින් විහාරය පුරා හැසිරේ. අප මීට පෙර ඇයගේ මෙබඳු හැසිරීමක් දක නැත. කිමෙක් ද ස්වාමීනි ඇයට උමතුවක් ඇති වී දැයි විමසූහ. එවිට බුදුරජාණන් වහන්සේ ''මහණෙනි, මාගේ දියණිය උමතුවෙන් ගී ගයනවා නොව ඇයගේ කල්ප ගණනක් තිස්සේ පැවති පැතුමක් ඉටුවීමෙන් ප්‍රීතියෙන් පිනාගොස් උදම් අනනවායැයි වදාරා විශාඛාව මීට කල්ප ලක්ෂයකට පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි කළ ප්‍රාර්ථනාවක් විස්තර කළ සේක. විශාඛාව එදා පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි කළ ප්‍රාර්ථනාවන් විස්තර කළ සේක. විශාඛාව එදා පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ අග්‍ර උපස්ථායිකාව උන්වහන්සේට ඉතා සමීපව උවටැන් කරන ආකාරය, බණ අසන ආකාරය දක තමනුත් මතු බුදුවන බුදුකෙනෙකුගේ අග්‍ර උපස්ථායිකාව වීමට ප්‍රාර්ථනා කොට බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට සත් දවසක් මහ දන් පවත්වා ප්‍රාර්ථනාවක් කළාය. ඇය කාශ්‍යප බුදු රජාණන් වහන්සේගේ කාලයේ දී ද සංඝදාසි නමින් ඉපිද දානාදී පිංකම් කොට එම ප්‍රාර්ථනාව ම කළා ය. අද මේ සඵලව ඇත්තේ ඇය ඒ කල්ප ලක්ෂයක් මුළුල්ලේ පතාගෙන ආ පැතුම යැයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**10.** **යථාපි පුප්ඵරාසිම්හා**
**කයිරාමාලා ගුණෙබහූ**
**එවං ජාතෙන මච්චෙන**
**කත්තබ්බං කුසලං බහුං**

**පදාර්ථ:-** දක්ෂ මල්කරුවෙක්: **පුප්ඵරාසිම්හා,** මල් රැසකින්: **බහුමාලා,** ගුණෙ බොහෝ මල් දම්: **යථාපි කයිරා,** කරන්නේ යම් සේද: **එවං,** එසේ: **ජාතෙන මච්චෙන,** මෙලොව උපන් මිනිසා විසින් : **බහුං කුසලං, කත්තබ්බං,** බොහෝ කුසල් කළ යුතු ය.

**විවරණය:-** ගිහි වුවත් පැවිදි වුවත් දෙවි වුවත් මිනිස් වුවත් කාටත් පින් උවමනා කරන බව අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ සුමනා සූත්‍රයේ දී වදාරා තිබේ. එසේම පින් කරන තැනැත්තා හැකිතරම් පිංකළ යුතු ය. මන්ද යත් පිං වැඩිවීම සැප වැඩිවීමකැයි ද ධම්මපදයේ පාප වග්ගයේ සඳහන් වේ. එසේ ම පින් කරගෙන පරලොව යන තැනැත්තා පිටරටකට ගොස් මුදල් යහමින් රැස්කරගෙන එන්නෙකු නෑයන් විසින් පිළිගන්නා සේ පින ඉදිරියට අවුත් සැප දෙමින් පිළිගන්නා බව ධම්ම පදයේ ම පිය වග්ගයේ සඳහන් වේ. මේ නිසා සුගතියට යාමටත් සැප ලැබීමටත් පින්දහම් කළ යුතු ය. එය කළ හැකි එකම තැන මේ මිනිස් ලොව පමණි. එහි උපන්නෙකු විසින් අනිවාර්යයෙන් ම පින් දහම් කළ යුත්තේම ය. නැතිනම් ලැබූ මිනිස් බවින් ඵලක් නැත.

22 පාඩම

# පුප්ඵ වග්ගය - III

## 3.5.2.9 දෙව්ලොවටත් හමන සිල් සුවඳ සඳුන් සුවඳ පරදයි.

දිනක් විවේකීව කල්පනාවේ යෙදී සිටින ආනන්ද තෙරුන්ට මෙසේ සිත් විය. සුවඳ වර්ග තුනක් තිබේ. සාර ගන්ධ හෙවත් සඳුන් වැනි අරටුවෙන් හමන සුවඳ, මූලගන්ධ හෙවත් මුල්වලින් සුවඳ හමන සැවැන්දරා වැනි මුල් වර්ග, පුප්ඵ ගන්ධ හෙවත් දෑසමන් ආදී මල්වලින් හමන සුවඳ යනුවෙනි. එහෙත් මේ එකම සුවඳක් වත් අනුවාතයට හෙවත් සුළඟට එරෙහි අතට (පටිවාතයට) හමා යන්නේ නැත. අනුවාත පටිවාත දෙකටම හමන සුවඳක් නැත්දැයි සිතූ අනඳ තෙරණුවෝ බුදුරජාණන් වහන්සේ වෙත ගොස් ඒ පිළිබඳව විමසා සිටියහ. එවිට භාග්‍යවතුන් වහන්සේ ආනන්දය, හැම අතටම හමන සුවඳක් ඇතැයි වදාළහ. ඒ කුමක්දැයි ආනන්ද තෙරුන් විමසූ විට, ආනන්දය, යම්කිසි ගමක කිසියම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් බුදුන්, දහම්, සඟුන් සරණ ගියේවෙයි ද ප්‍රාණඝාතාදී පංච දුෂ්චරිතයෙන් වැළකුනේ වෙයි. සිල්වත් ය, ගුණවත් ය. මසුරුකම් නැත. ආශාව අතහැර දන්දෙන සුලුය. දන් දීමෙහි බෙදාහදාගෙන භුක්ති විඳීමෙහි ඇළුණු කෙනෙකි. එබඳු සිල් ගුණ ඇති ඔහු හෝ ඇය පිළිබඳ අසා, අවට නොයෙකුත් ගම් නගරවල මිනිස්සු අසවල් ගමේ අසවල් තැනැත්තිය හෝ තැනැත්තා මෙසේ සිල්වත් ය, ගුණවත්ය ත්‍යාගශීලීය යි ගුණ කියති. ආනන්දය, අනුවාත පටිවාත දෙකටම හමායන සුවඳ නම් මෙය වේ යයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

11. **න පුප්ඵ ගන්ධො පටිවාත මෙති**
**න චන්දනං තගරමල්ලිකාවා**
**සතඤ්ච ගන්ධො පටිවාතමෙති**
**සබ්බා දිසා සප්පුරිසො පවාති**

**පදාර්ථ:-** **පුප්ඵ ගන්ධො**, මල් සුවඳද: **චන්දනං**: සඳුන් සුවඳ ද: **තගරමල්ලිකාවා**: තුවරලා, බොලිද්ද සුවඳ ද: **නපටිවාත එති**, උඩු සුවඳට නොහමයි, **සතඤ්ච ගන්ධො**, සත්පුරුෂයන්ගේ සිල් සුවඳ නම් උඩු සුළඟට හමයි. **සප්පුරිසෙ**, සත්පුරුෂයා: **සබ්බා දිසා පවාති**, සිල් ගුණ සුවඳින් හැම දෙසට ම පැතිරේ.

12. චන්දනං තගරං වාපි
උප්පලං අථ වස්සිකී
එතෙසං ගන්ධ ජාතානං
සීල ගන්ධො අනුත්තරො

**පදාර්ථ:-** **චන්දනං**, සඳුන් ද, **තගරං** වා, තුවරල ද, වා **උප්පලං** අපි, මහනෙල් ද, **අථ**, එසේම, **වස්සකී** දෑ සමන් ද (යන) **එතෙසං ගන්ධජාතානං**, මේ සියලු සුවඳ වර්ග අතරින්: **සීල ගන්ධො**: සිල් සුවඳ: **අනුත්තරො**: වඩා උතුම්ය.

**විවරණය:-** මල් සුවඳ ඇතුළු සෑම සුවඳක් ම පැතිරෙන්නේ සුළඟත් සමඟමය, සුළඟ හමන අතටය, එසේම සාමාන්‍ය මනුෂ්‍යයන් පිළිබඳව කීර්තිය, ගුණය, අගය යම් යම් අය අතර පැතිරෙන්නේ නෑ හිතවත්කම ධනය බලය වැනි හේතු නිසාය. එසේ පැතිරෙන්නේ ද ඔවුන්ට ගරු කරන ඔවුන්ගෙන් යැපෙන අය පමණි. එහෙත් සිල්වතාගේ ගුණවතාගේ සිල් සුවඳ ගම් නියම්ගම් රටවල් විශේෂයක් නැතිව හැමතැනම පැතිර යන්නේ ය. දෙව්ලොවට පවා පැතිර යන්නේ ය.

## 3.5.2.10 දෙවියන්ගෙනුත් පූජා ලබන සිල්වතුන් වහන්සේ.

මහා කාශ්‍යප මහරහතන් වහන්සේ වරක් සත් දවසක් නිරෝධ සමාපත්තියෙන් වැඩ හිඳ සත්වන දින ඉන් නැගී රජගහනුවර පිඬු පිණිස හැසිරුණේය. ශක්‍ර දේවේන්ද්‍රයාගේ සුජාතා දෙව්දුව ඇතුළු දෙවඟනන් පන්සියයකට මහ කසුප් තෙරුන්ට පිණ්ඩපාත දානයක් දීමට සිත්විය. එබැවින් ඔවුහු පිණ්ඩපාතය සකසාගෙන උන්වහන්සේ වඩින මග දෙපස සිටියෝය. ඒ බව දැනගත් මහ කසුප් තෙරණුවෝ මා පිඬු පිණිස යන්නේ දුගී දුප්පතුන්ට සංග්‍රහ පිණිසය. එහෙයින් ඔබ ඉවත්වන්නයැයි ඔවුන්ගේ පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කළහ. කිහිපවතාවක් ම ඔවුන් ආයාචනය කළත් උන්වහන්සේ එය නොඉවසූහ. බලාපොරොත්තු සුන් වූ ඔවුහු, ආපසු දෙව්ලොවට ගොස් සක් දෙවියන්ට මේ බව සැල කළ හ. මීට උපක්‍රමයක් කල්පනා කළ සක්දෙවිඳු තමනුත් සුජාතා දෙව් දුවත් මහළු යුවලක් සේ වෙස්වලාගෙන පෙහෙකම්කරුවන්ගේ වීදියක පෙහෙකම්කරන දුගියන් සේ සිටියෝය. සක්‍රයා නූල් දිගහැර දෙයි සුජාතාව නූල්පන්දු ඔතයි. තෙරුන් වහන්සේ ඔවුන් දුගියන් සේ සළකා පිඬු පිළිගැනීම පිණිස එහි නැවතුනහ. ඔවුහු ප්‍රණීත ආහාරයෙන් පාත්‍රය පුරවාලූහ. මෙවැනි දුගියෙකුට මෙතරම් ප්‍රණීත ආහාරයක් සපයාගත නොහැකි බව සුවඳින් ම තේරුම්ගත් තෙරණුවෝ මේ කවුරුන්දැයි විමසා බැලූහ. ඔවුන් දෙවියන් බව දැනගත් උන්වහන්සේ ඔබ කර ඇත්තේ බරපතල ක්‍රියාවකි. සමාපත්ති සුවයෙන් නැගී සිටි මට අද දුගියෙකු යමක් පිදුවේ නම් ඔහුට සෙනවි තනතුරක් හෝ සිටු තනතුරක් ලැබීමට තිබුණි. ඔබ එය පැහැර ගත්තෙහි යැයි වදාළහ. ස්වාමීනි, මමත් දුගියෙක්ම සක් දෙවිඳු කීවේය. දෙව්ලොව රජසිරි විඳින ඔබ දුගියෙකු වන්නේ කෙසේද? ස්වාමිනි, මමත් අබුද්ධොත්පත්ති

කාලයෙහි දුප්පත්ව නොයෙකුත් පිංදහම් කොට මෙතනට පැමිණියෙමි. වෙනත් තේජස් ඇති දෙව්වරුන් අතර අදත් මම දුගියෙක් මියි කීවේ ය. එවිට තෙරුන් වහන්සේ ඒ කෙසේ වෙතත් මින් මතු මෙසේ වංචාකොට දන් නොදෙන්නයැයි වදාළහ. එවිට සක්දෙවිඳු ස්වාමීනි, එසේ වංචාකොට හෝ ඔබට දානයක් දුන්විට මට කුසලයක් ඇත් ද නැත්දැයි විමසීය. කුසලයක් ඇතැයි තෙරණුවෝ කීහ. එසේ නම් කුසල් කිරීම මගේ කටයුත්තක් යැයි කියා සක්දෙව් තෙරුන් වහන්සේ වැඳ **''අහො දානං පරමදානං කස්සපෙ සුපතිට්ඨිතං''** අනේ මෙහෙමත් දානයක් උතුම් දානයක් මා විසින් කාශ්‍යප තෙරුන් වෙත පුදන ලදැයි උදම් අනමින් සුජාතාව සමඟ පිටත්ව ගියේ ය.

මේ සිද්ධි බලාසිටි බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා අමතා, බලන්න මහණෙනි, සක්‍රදේවේන්ද්‍රයා මම පුත් කාශ්‍යපයන් වහන්සේ රවටා පිණ්ඩපාත දානයක් දී ප්‍රීතියෙන් පිනාගිය සිතින් උදම් අනමින් යන සැටියයි වදාළ සේක. එවිට භික්ෂූන් වහන්සේලා සක්‍ර දේවේන්ද්‍රයා කාශ්‍යප තෙරුන්ට පිණ්ඩපාත දානයක් දීමට සිතුවේ ඇයිදැයි විමසූහ. මහණෙනි මාගේ මේ පුත්‍රයා බඳු පිණ්ඩපාතිකයන් වහන්සේලාට දෙවියෝ පවා ප්‍රියය. උන්වහන්සේගේ සිල් සුවඳට මෙසේ අවුත් පිණ්ඩපාතය පිදීයැයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

13. **අප්පමත්තො අයං ගන්ධො**
**යායං තගර චන්දනී**
**යො ච සීලවතං ගන්ධො**
**වාති දෙවෙසු උත්තමො**

**පදාර්ථ:-** **යො අයං**, යම් මේ; **තගර චන්දනී**, තුවරල, සඳුන් ආදී ද්‍රව්‍ය සුවඳක් වේද; **අයං ගන්ධො**, මේ සුවඳ; **අප්පමත්තො**, ඉතා අල්පමාත්‍ර සුවඳකි; **යොච සීලවතං ගන්ධො**, යම් ඒ සිල්වතුන්ගේ උතුම් සිල් සුවඳක් වේද; **වාති දෙවෙසු උත්තමො**, ඒ උතුම් සුවඳ දෙවියන් අතර පවා හමා යයි.

**විවරණය:- නිරෝධ සමාපත්තිය**

බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා ඇතැම්විට සතියක් පවා නිරෝධ සමාපත්තියට සමවැදී වැඩ සිටිති. එනම් තමන් ලැබූ නිවන් සුවය මෙලොවදී ම විඳිමින් වාසය කිරීමයි. ඒ කාලය තුළ සිටීම් සැතපීම් ආදී ඉරියවු පැවැත්වීමක් නැත. ආහාර ගැනීමක් ද නැත. සමාපත්තියට සමවදින අවස්ථාවේ ගත් ආහාරයෙන් සත් දිනම ගත වේ. නිවන් සුවය මෙලොවදීම විඳින මේ අවස්ථාව රහතන්වහන්සේලාගේ පවා ඉතා උතුම් අවස්ථාවකි. එහෙයින් ඒ සමාපත්තියෙන් නැගී සිටි දවසේ උන්වහන්සේට කරන පූජාව එදාම විපාක දීමට තරම් බලවත්ය. ශක්‍රදේවේන්ද්‍රයන් කසුප් තෙරුන්ට පිණ්ඩපාතය පිදීමට එදිනම තෝරාගත්තේ ඒ නිසාය.

**පිණ්ඩපාතිකාංගය**

මහා කාශ්‍යප තෙරණුවෝ ධූතාංගධාරීන් අතර අගතැන්පත්ය. ධූතාංග යනු සීලයට අමතරව සමාදන්වී රකින රූක්ෂ (දැඩි) පිළිවෙත් සමූහයකි. ධූතාංග සියල්ල දහතුනකි. මහකසුප් තෙරණුවෝ එයින් වැඩි කොටසක් අනුගමනය කළහ. පිණ්ඩපාතිකාංගය හෙවත් ගෙපිළිවලින් ගන්නා පිණ්ඩපාතයෙන් පමණක් යැපීම ඉන් එකකි. පිණ්ඩපාතික යනු පිණ්ඩපාතයෙන් පමණක් යැපීමයි.

## 3.5.2.11. මාරයාටවත් නොපෙනෙන රහතන්වහන්සේගේ ගමන් මග.

ගෝධික නම් තෙරුන්වහන්සේ නමක් රජගහනුවර ඉසිගිලි පර්වත පාමුල කාලසිලා නම් ස්ථානයක අප්‍රමාදීව කෙළෙස් තවන දැඩි වීර්යයෙන් යුතුව භාවනාවෙහි යෙදී සිටියහ. උන්වහන්සේ කාමයන්ගෙන් සිත මුදවාගෙන චෙතෝවිමුක්තියට හෙවත් ධ්‍යානයට පත්වීමට ආසන්න වන හැම විටම ඒ ධ්‍යානයෙන් පිරිහේ. එසේ වූයේ උන්වහන්සේ තුළ තිබූ නිධන්ගත රෝගයක් නිසාය. මෙසේ සයවරක්ම උත්සාහ කළත් හයවතාවක්ම ධ්‍යානයෙන් පිරිහුනේය. ධ්‍යානයෙන් පිරිහී මියගියහොත් උපදිනා තැන ස්ථිර නැත. එහෙයින් මෙවර ගෙල සිඳගන්නෙමියි සිතා දැලිපිහිය ගෙන ඇඳක හිඳගෙන ගෙල සිඳින්නට සැරසුනේ ය. මෙය දුටු මාරයා බුදුරජාණන් වහන්සේ වෙත වෙස්වලාගෙන පැමිණ ඒ බව දන්වා සිටියේය. ඔහු ඒ බව කීමට ඉක්මන් වූයේ, උන්වහන්සේ ගෙල සිඳගතහොත් විමුක්තියක් ලබාවියයි බියෙන් බුදුරදුන් ලවා එය වළක්වනු පිණිස ය.

කෙසේ වෙතත් හත්වෙනි වතාවේ ධ්‍යානයට ආසන්න වෙනවාත් සමගම ආපසු ධ්‍යානය පිරිහෙන්නට පෙර උන්වහන්සේ ගෙල සිඳගත්හ. ගෙල සිඳගැනීමත් සමගම උපන්වේදනාව ධර්මානුකූලව මෙනෙහි කරමින් උන්වහන්සේ රහත්ඵලයට පත් වූ හ. මාරයා බුදුරදුන්ට දැනුම්දෙනවිටත් ඒ සියල්ල සිදුවී හමාරය. අනතුරුව මාරයා උන්වහන්සේගේ සිත කවර ලෝකයක පිළිසඳගත්තේ දැයි දසත සැරිසරමින් සොයන්නට විය. මාරයාගේ ඒ සෙවිල්ල පෙනුනේ දුම්රොටුවක් ගමන් කරන්නාක් ලෙසිනි. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට එය පෙන්වා, මහණෙනි, පවිටු මාරයා ගෝධික කුල පුත්‍රයාගේ විඤ්ඤාණය පිළිසිඳගත් තැන සොයසොයා සැරිසරයි. එහෙත් උන්වහන්සේ පිරිනිවන් පා වදාළහ. අනතුරුව ගෝධික තෙරුන්ගේ විඤ්ඤාණය සොයා පරාජයට පත් වූ මාරයා අමතා, පවිටු මාරය, ගෝධික කුල පුත්‍රයා උපන් ස්ථානය නුඹ වැනි සියයකට හෝ දහසකටවත් සොයාගත නොහැකි යැයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

14. **තෙසං සම්පන්න සීලානං**
**අප්පමාද විහාරිනං**
**සම්මදඤ්ඤා විමුත්තානං**
**මාරෝ මග්ගං න වින්දති**

**පදාර්ථ:- සම්පන්නසීලානං,** පිරිපුන් සිල් ඇති, **අප්පමාද විහාරිනං,** සිහියෙන් තොරනොවී අප්‍රමාදව වසන සුලු වූ: **සම්මා අඤ්ඤාය,** චතුරාර්ය සත්‍ය මැනවින් දැන: **විමුත්තානං,** කෙලෙසුන් කෙරෙන් මිදුනා වූ: **තෙසං,** ඒ රහත් උතුමන්ගේ: **මග්ගං,** මාර්ගය, **මාරො,** මාරයා: **න වින්දති,** නොදක්නේය.

**විවරණය:-** සමසීසී - යම් කිසි පුද්ගලයකුගේ දිවිතොරවීමත් රහත් වීමත් එකම මොහොතක සිදුවී නම් එතුමන් හඳුන්වනු ලබන්නේ සමසීසී නමිනි, ගෝධික තෙරණුවෝ ද සමසිසීව පිරිනිවන් පෑ කෙනෙකි.

## 3.5.2.12 කෙලෙස් මල දුරුකළ රහතන් වහන්සේ පියුමකි.

සැවැත් නුවර සිරිගුත්තික ගරහදින්න යයි යහළුවෝ දෙදෙනෙක් වූහ. එයින් සිරිගුත්ත තෙරුවන් සරණ ගිය බෞද්ධ උපාසකයෙකි. ගරහදින්න මිථ්‍යාදෘෂ්ටික නිගණ්ඨ ශ්‍රාවකයෙකි. නිගණ්ඨයෝ නිතර නිතර ගරහදින්න අමතා කියන්නේ ගරහදින්නය, ඔබේ හිතමිතුරු යහළුවා වන සිරිගුත්තයන්ගෙන් මෙසේ විමසන්න. ඔබ ශ්‍රමණ භවත් ගෞතමයන් වෙත යන්නේ ඇයි? ඔහුගෙන් ඔබට ලැබෙන්නේ කුමක් ද? එසේ විමසා නිගණ්ඨයින් වන අප ළඟටම පැමිණෙන ලෙසත් දියයුතු දෑ අපටම දෙන ලෙසත් ඔහුට අවවාද කරන්න යැයි පැවසූහ. එබස් ඇසූ ගරහදින්න නිරතුරුවම සිරිගුත්ත මුණගැසෙන අවස්ථාවල ඔහු අමතා යහළුව ඔබේ ශ්‍රමණ භවත් ගෞතමයන් වෙත යන්නේ ඇයි? එසේ යාමෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? අපේ ආර්යයන් වහන්සේලා වෙත නොයන්නට හේතු කිම ද? ඔවුන් වෙත දන් නොදෙන්නේ මන්දයි විමසයි. සිරිගුත්ත ඒ සෑම දිනකම නිහඬවිය. එක් දිනක් තම යහළුවාගේ කරදර කිරීම ගැන කළකිරී ඔබේ ආර්යයන් වහන්සේලා ගැන ඔබ නිතර පවසන්නෙහිය. ඔවුන් දන්නේ කුමක්දැයි ප්‍රශ්න කළේය. එවිට ඔහු කියන්නේ ඔවුන් නොදන්නා දෙයක් නැත. අතීත අනාගත වර්තමාන යන තුන් කල්හි සිදුවෙන කාය,වචී, මනෝ කර්ම සියල්ල දනිති, දකිති යනුවෙන් ප්‍රකාශ කළහ. හොඳයි, එසේ නම් හෙට දින දානය සඳහා අප නිවසට එන ලෙස ආරාධනා කරන්න යයි කියා ඔහු පිටත්කර යැවුවේය. සිරිගුත්ත ද තම නිවස කරා ගොස් බොරුවලක් කපා එහි අසූචිමඩ ආදිය පුරවා ඒ මත ලැලි අතුරා එම ලැලි මත අසුන් පනවා ඇතිරිලි එලා, සූදානම් කළේය. ආහාර පිළියෙලව ඇති බව ඇඟවීමට ගෙය පිටුපස මහ හැලිවලං තබා කෙසෙල් කොළවලින් වසා කඩවැස්මක් බැඳ, කැඳ අවුළු ආදී සුවඳ විහිදෙන අයුරෙන් හැලි වලංවල තවරා සුවඳ ගල්වා තැබූහ.

පසුදින දානයට නිඝණ්ඨයින් පැමිණි පසු සිරුගුත්ත දානශාලාවේ දොරකඩ සිට ඔබ වහන්සේලා අතීත අනාගත ආදී තුන්කල් දන්නේ නම් දක්නේ නම් පමණක් ඇතුළට වඩින්න නැතහොත් නොවඩින්න යැයි කියා ආරාධනා කළේ ය. නිගණ්ඨයෝ සියලු දෙනාම ඇතුළට වැඩියහ. එසේ වැඩම කොට පනවන ලද ආසනවල වාඩි වූහ. නිගන්ඨයෝ සියලු දෙනාම එකවරම අසූචිවලට වැටී අසූචි මඩ තැවරුණු සිරුරුවලින් යුතුව වලෙන් පිටතට එක් එක්කෙනා බැගින් වරින්වර පැමිණියහ. එසේ පැමිණෙද්දී පොලුවලින් පහර දී එලවා දමන ලදී.

ඊට පළිගනු පිණිස ගරහදින්න ද බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයාට සිරිගුත්ත ලවා ආරාධනා කරවා දානයක් පිළියෙල කරන බව මවා පෑවේය. ඔහු ද නිවසේ විශාල වලක් කනවා එහි කිහිරිදර දමා ගිනි අවුළුවා ගිනි අඟුරු මත්තෙහි ලෑලි අතුරා ඒ මත ආසන පැනවීය. එම වලෙහි දමා භාග්‍යවතුන් වහන්සේ ඇතුළු මහ සඟ පිරිසට නිග්‍රහ කිරීම ඔහුගේ අරමුණ විය. පසුදින මිථ්‍යාදෘෂ්ටිකයෙකුගේ ගෙදර දෙන දානයක් බැවින් එය දැක ගැනීමට විශාල පිරිසක් එහි රැස් වී සිටියහ. සියලු දෙනාම බලා සිටියේ මිසදිටුවන්ට බුදුරජාණන් වහන්සේ කුමක් කරයි ද කියාය. උන්වහන්සේලා මණ්ඩපයට වඩින විට ගහරහදින්න ද දොරකඩ සිට ඔබවහන්සේලා තුන්කල් දන්නේ නම් පමණක් ඇතුළට වඩින්නැයි කියා සිටියේය. ඒ අනුව බුදුරජාණන් වහන්සේ මහාසංඝයා පිරිවරා ඇතුළට වැඩම කළහ. උන්වහන්සේලා දන්සලට පිවිසෙත්ම ගරහදින්නයන් පුදුම කරවමින් මහා නෙළුම් මල් පිපී මතුවිය. උන්වහන්සේලා ඒ පියුම් මත වැඩ සිටියහ. ගරහදින්න අන්දමන්ද විය. ඔහු පිළියෙල කළ දානයක් නැත. බියට පත් වූ හෙතෙම වහා සිරිගුත්ත වෙත දිවගොස් දන් කුමක් කරන්නෙමි දැයි විමසීය. එවිට බුදුරජාණන් වහන්සේගේ ආනුභාවය දන්නා සිරිගුත්ත යහළුව බිය නොවන්න, ඔබ කොළ අතුවලින් වසා තැබූ හිස් හැලිවලං දන් අහරවලින් පිරී ඇත. ඒවා විවර කරන්න. සැනකින් එහි දිවගිය ගරහදින්නට දකින්නට ලැබුණේ මිහිරි ආහාර පානයෙන් පිරී ඉතිරී ගිය හැලිවලංය. බිය දුරුවී ප්‍රීතියෙන් පිනා ගිය ගරහදින්න බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා මැනවින් වළඳවා අවසානයේ පින් අනුමෝදන් වීමට සැරසුනේය. එවිට භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනා කරන සේක්, නුවණ නැති බොහෝ දෙනා මගේ ශ්‍රාවකයන් හෝ බුද්ධ ශාසනයේ ගුණ නොදන්නාහ. නුවණැස නැත්තෝ අන්ධයන් වැනි යයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

15. **යථා සඞ්කාර ධානස්මිං**
**උජ්ඣිතස්මිං මහාපථෙ**
**පදුමං තත්‍ථ ජායෙථ**
**සුචිගන්ධං මනොරමං**

පදාර්ථ:- **මහාපථෙ**, මහ මඟ අසළ, **උජ්ඣිතං**, ඉවත දමන ලද, **සඞ්කාරධානසංමිං**, කුණු කසල පිරි මඩ ගොහොරුවක; **සුචිගන්ධං**, ඉමිහිරි සුවඳ ඇති, **මනොරමං**, සිත් පිනවන, **පදුමං තත්‍ථජායෙථ**, නෙලුම් මල් පිපෙන්නේ යම් සේද)

16. **එවං සඞ්කාර භූතෙසු**
**අන්‍ධභූතෙ පුථුජ්ජනෙ**
**අතිරොචති පඤ්ඤාය**
**සම්මාසම්බුද්ධ සාවකො**

**පදාර්ථ:- එවං,** එසේම: සම්මාසම්බුද්ධ **සාවකො,** සම්‍යක් සම්බුද්ධ ශ්‍රාවක වූ රහතන් වහන්සේ: **සංඛාරභූතෙසු:** කුණු කසල වැනි වූ: **අන්ධභූතෙ,** නුවණැති කමින් අන්ධ වූ ද: **පුථුජ්ජනෙ,** පෘථග්ජනයන් අතර, **පඤ්ඤාය,** ප්‍රඥාවෙන්: **අතිරෝචති,** ඉහළින් ම බබලන්නේය.

**විවරණය :-** මහ මග ඇති මඩගොහොරුවල, කසළ පිරවීම කවදත් දකින්නට ලැබේ. ඒ මඩ ගොහොරුවල කෙතරම් කසල තිබුණත් නෙළුම් මල් ද හටගනී. හටගත්තේ මඩගොහොරුවක යන්න නෙළුම් මල්වලින් නොපෙනේ. එය පියකරුය, සුවඳවත්ය, එසේම රහතන් වහන්සේලා ද උපදින්නේත් වැඩෙන්නේත් මල්ගොහොරුවක් වැනි මේ පෘථග්ජන ලෝකයෙහි ය. එහෙත් උන්වහන්සේලා අරහත් මාර්ග ප්‍රඥාවට පත්වීමෙන් පසු ඒ පෘථග්ජන මඩ සේදී පිවිතුරුභාවයට පත්වන්නේ ය.

**අභ්‍යාස**

01. පුප්ඵ වග්ගය පිළිබඳ විස්තර කරමින් එහි වැදගත්කම පැහැදිලි කෙරෙන කතාවක් ශිෂ්‍ය සමිතියට ඉදිරිපත් කරන්න.
02. මෙම ගාථා කීපයක් ගෙන තාලයට ගායනා කරමින් අර්ථ සහිතව යුගාසන දේශනාවක් ලෙස ඉදිරිපත් කරන්න.
03. ධම්ම පදයේ පුප්ඵවග්ගය ඇසුරින් ප්‍රශ්නාවලියක් සකස් කරන්න.
04. මෙම වග්ගයේ ගාථා හා අර්ථ ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න.
05. මෙම ගාථාවක් ඇසුරින් ධම්ම චින්තාවක් පංතියේදී ඉදිරිපත් කරන්න.
06. මෙහි එන ගාථාවක් හා නිදාන කතාවක් ඇසුරෙන් ධර්ම දේශනාවක් කරන්න.

**පොදුවේ**

1. ධම්මපදයේ ගාථා තාලයට ගායනා කරමින් කටපාඩම් කරගන්න.
2. ගාථාවල අර්ථ මතකයේ රැඳෙන පරිදි පාඩම් කර ගන්න.
3. මෙම ගාථාවල තේරුම් පදගතාර්ථ සහිත ව පාඩම් කරන්න.
4. සෑම නිදාන කතාවක්ම හොඳින් කියවා ගුරුවරයා ලවා පැහැදිලි කරගන්න.
5. මෙම සෑම කතාවකින් ම ධර්මදේශනාවක් කිරීමට සුදුසු බව ඔප්පු කරන්න.
6. සෑම ගාථාවකින් ම කෙටි ධර්ම දේශනාවක් හෝ ධම්මචින්තාවක් සිදු කරන්න.

23 පාඩම

# දියුණු කළ සිත සලසයි සියලු සෙත

දිනක් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා අමතා ඉතා රසවත් උපමා කතා පුවතක් මෙසේ වදාළ සේක.

මහණෙනි, දිනක් ඉබ්බෙක් කෑම සොයාගෙන ගං තෙරක ඇවිද යයි. නරියෙක් ද අහර සොයමින් ඒ මේ අත ගමන් කරයි. මේ නරියා දුරදීම ඉබ්බා දැක රස කෑමක් ලැබුණේයැයි මහත් සතුටින් ඉබ්බා දෙසට ළං විය. නරියා දුටු ඉබ්බා බියපත්ව වහා සිය අඟ පසඟ කටුව තුළට ගෙන සැඟවුනේය. නරියා ද කොයි මොහොතක හෝ ඉබ්බා කටුවෙන් එළියට එනතුරු නොඉවසිල්ලෙන් බලා සිටියේය. ඉබ්බා ද නරියා එතැනින් පිටමංවන තුරුම හිස හෝ අතක් පයක් කටුවෙන් එළියට දැම්මේ නැත. නරියා පිටත්ව ගිය බව දැනගත් ඉබ්බා සිතුසේ තමන්ගේ ගමන යන්නට ගියේය.

සංයුත්ත නිකායේ කුම්මූපම සූත්‍රයෙහි එන මෙම උපමාවට අනුව ඉබ්බාගෙන් සංකේතවත් වන්නේ පඤ්ච ඉන්‍ද්‍රියයි. නරියාගෙන් සංකේතවත් වන්නේ ක්ලේශ මාරයායි. ඉබ්බාට පා හතරත් හිසත් යන අංග පසක් ඇත. මෙයින් එකක් හෝ පිටතට දැමුවේ නම් ඉබ්බා නරියාට ගොදුරු වන්නේය. පංච ඉන්ද්‍රියත් එසේය. ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පඤ්ච ඉන්ද්‍රියන්ට කුමක් හෝ අරමුණක් හමුවී ඊට වහල් වුව හොත් ක්ලේශ මාරයාට හසුවන්නේය. එයින් කියැවෙන්නේ පසිඳුරන් අසංවරව සිටිය හොත් කෙලෙස් උපදින බවයි. එබැවින් පංච ඉන්ද්‍රියන් රකින්න. ඉන්ද්‍රියන් සංවරය කරගන්න. මාරයාට අවස්ථාවක් නොදෙන්නැයි බුදුරජාණන් වහන්සේ වදාළහ.

මෙම ඉන්‍ද්‍රියන් පහෙන් වඩාත් බලවත් වන්නේ මනින්‍ද්‍රිය හෙවත් සිතයි. ඇස, කණ, නාසය, දිව, ශරීරය යන කුමකින් අරමුණු ගත්තත් ඒවා පිළිබඳ කෙලෙස් ඇතිවන්නේ සිතෙහි ය. ඒ අනුව ඉඳුරන් සංවර කරගැනීම යනුවෙන් අදහස් කරන්නේ ඉඳුරන් ඔස්සේ අරමුණු පසු පස දුවන සිත සංවර කරගැනීමයි. උදාහරණයක් ලෙස ඇස සංවර කළ නොහැක. සංවර කළ යුත්තේ ඇසට පෙනෙන රූපය ගැන සිතන සිතයි.

මේ නිසා පඤ්ච ඉන්‍ද්‍රියන්ට මුණගැසෙන අරමුණුවලදී ඒ පිළිබඳ ඇලීමට හෝ ආසාවට නැතිනම් ගැටීමට හෝ ද්වේෂයට නොවැටී සිත පාලනය කරගත යුතු ය. එසේ මනින්ද්‍රිය සංවරකර ගැනීමෙන් නරියාට ඉබ්බා ගොදුරුකර ගැනීමට නොහැකි වූවා සේ ක්ලේශ මාරයාට අපට හසුකර ගැනීමට ඉඩ නොලැබෙයි.

| ඉන්ද්‍රිය | අරමුණු |
|---|---|
| චක්ඛු ඉන්ද්‍රිය | රූප ආරම්මණ |
| සෝත ඉන්ද්‍රිය | ශබ්ද ආරම්මණ |
| ඝාණ ඉන්ද්‍රිය | ගන්ධ ආරම්මණ |
| ජිව්හා ඉන්ද්‍රිය | රස ආරම්මණ |
| කාය ඉන්ද්‍රිය | ස්පර්ශ ආරම්මණ |
| මන ඉන්ද්‍රිය | ධර්ම ආරම්මණ |

"පභස්සර මිදං භික්ඛවෙ චිත්තං ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං"

සිත නිරායාසයෙන් ම පිරිසිදු ය. එහෙත් බැහැරින් එන අරමුණු මත සිත අපවිත්‍ර වෙයි. ඇසින්, කණින්, නාසයෙන්, දිවෙන්, ශරීරයෙන් ගන්නා අරමුණු නිසා සිත කිලිටි වේ. ඒ කිලිටි කරන ධර්ම කෙලෙස් යැයි කියනු ලැබේ.

සුකරානි අසාධූනි - අත්තනො අහිතානි ච
යං වෙ හිතං ච සාධුං ච - තං වෙ පරමදුක්කරං

යථා අගාරං දුච්ඡන්නං - වුට්ඨී සමති විජ්ඣති
එවං අභාවිතං චිත්තං - රාගො සමති විජ්ඣති

සිත තමන්ට ම අහිතකර දෙයට යෙදවීම පහසුය. හිතකර දෙයට යෙදවීම ඉතා අපහසුය. ඒ සඳහා සිත වැඩිය යුතුය. පුහුණු කළ යුතු ය. පුහුණුවක් නොලද සිත අයාලේ ගමන් කරයි.

මනාව සෙවිලි නොකළ පියස්සෙන් ගෙය තෙමෙයි. එසේම අභාවිත වූ සිත රාගාදී ක්ලේශයන් ගෙන් තෙමෙයි. අභාවිත සිත කෙළෙසුන් නිසා නිතර කිළිටි වේ. භාවිත හෙවත් වැඩූ සිත හෙවත් පුහුණු කළ සිත කෙළෙසුන්ගේ වසඟයට නොයයි. යනු එහි අදහසයි.

කිළිටි වූ සිතින් කරන කියන දේ අකුසල් ය. එය තමාට මෙලොවත් පරලොවත් අහිත පිණිස පවතී. සතුරෙක් නිතරම කෙනෙකුට කරන්නේ සතුරුකමක් ම ය. වෛරී පුද්ගලයෙකු නිතරම සිටින්නේ වෛරයෙන් ම ය. මේ සතුරාගෙන් හෝ වෛරී තැනැත්තාගෙන් වන හානියට වඩා බලවත් හානියක් පව්වු සිත නිසා අපට සිදුවේ. සිත කුසල් දහම්හි යෙදවීමෙන් මව්පියන් හෝ වෙනත් ඥාතියෙකු සිදුකරන යහපතට වඩා යහපතක් අපට සිදුකරයි. එසේ සිත කුසල ධර්මයන්හි දියුණු කිරීම සිත වැඩීම හෙවත් පුහුණු කිරීම

භාවනාව යැයි කියනු ලැබේ. භාවනාවෙන් සිත සකස්වූ විට, පුහුණු කළ විට, සංවර කළ විට, අපගේ කතාවත්, ක්‍රියාවත්, සංවර වේ. යහපත් වේ.

මේ අනුව එදිනෙදා ජීවිතයටත් භාවනාව මහත් උපකාරී වේ. කෙලෙසුන් යටපත්වීමෙන් නිවන් මගට ද භාවනාව අත්‍යවශ්‍ය වේ.

භාවනාව සමථ භාවනාව, විදර්ශනා භාවනාව වශයෙන් කොටස් දෙකකි. සමථ භාවනාව යනු නිතරම විවිධ අරමුණුවල දුවන, සැලෙන සිත එක්තැන් කිරීමයි. එකග කිරීමයි. සමාධියයි. විදර්ශනා භාවනාව යනු අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ලෝකයේ ස්වභාවය ඇති සැටියෙන් විමසා බැලීමයි.

**සමථ භාවනාව**

''කාමච්ඡන්දාදී පච්චනික ධම්මේ සමේතීති සමථො''

කාමච්ඡන්ද ආදී පංච නීවරණ ධර්ම සංසිඳුවාලනුයේ සමථය යි.

කුසලයට විරුද්ධවන නිවන් මග වළකාලන අයහපත් ධර්ම අපගේ සිතෙහි හටගනී. කාම වස්තූන් කෙරෙහි ඇති කැමැත්ත, තරහව, සිතෙහි කයෙහි මැලි බව, සිතෙහි විසුරුණු බව, සද්ධර්මය පිළිබඳ සැකය යන මේවා පංච නීවරණ නමින් හැඳින් වේ. පංච නීවරණ ධර්ම සමනය කිරීම සමථ භාවනාවෙන් සිදුකරයි. එබැවින් භාවනාව මගින් සිදු කරන්නේ පාපී චේතනාවන් සිතින් බැහැර කරමින් අලෝභ, අදොස, අමොහ, සද්ධා, විරිය, හිරි ඔත්තප්ප ආදී කුසල චේතනාවන් වර්ධනය කිරීමය.

| | |
|---|---|
| කාමච්ඡන්ද | කාමවස්තූන් කෙරෙහි ඇති කැමැත්ත |
| ව්‍යාපාද | තරහව |
| ථීනමිද්ධ | සිතෙහි කයෙහි මැලි බව |
| උද්දච්ච කුක්කුච්ඡ | සිතෙහි විසුරුණු බව හා කුකුස |
| විචිකිච්ඡා | ධර්මය පිළිබඳ සැකය |

අපගේ සිතෙහි හටගන්නා රාග- දෝස- මෝහ- ඊර්ෂ්‍යාව- ක්‍රෝධය- වෛරය- මානය- සැකය ආදී ක්ලේශ ධර්මයන් එක්වර දුරු කළ නොහැක. ක්‍රමයෙන් බැහැර කළ යුතු ය. නුවණැත්තා විසින් මෙම කෙලෙස් සිතින් බැහැර කරනුයේ වරින් වර ටිකෙන් ටික රන් රිදියෙහි මලකඩ ඉවත් කරන්නාක් මෙනි.

''අනුපුබ්බෙන මේධාවි ථොක ථොකං ඛණෙ ඛණෙ''

සිත පුහුණු කිරීම මගින් බුද්ධිය වර්ධනය වේ. ප්‍රඥාව දියුණු වීමෙන් ජීවිතාවබෝධය, ධර්මාවබෝධය ඇති වේ. එදිනෙදා ජීවිතයේ යහපතට හේතුවන සිතේ සන්සුන් බව, ඉවසීම, ධාරණ ශක්තිය ඇතිකර ගැනීමට උපකාරී වේ. නූතන වෛද්‍ය විද්‍යාවෙහි ද ස්නායුගත රෝග සහ රුධිර පීඩා වැනි ආබාධයන්ට මානසික නොසන්සුන්කම ද හේතුවන බවත්, ඒ සඳහා ප්‍රතිකාර වශයෙන් භාවනාව බෙහෙවින් ඉවහල්වන බව පිළිගෙන ඇත. ශිෂ්‍ය ජීවිතයේ සිටින අපගේ ද මානසික සන්සුන් බව ඇතිකර ගැනීමෙන් නිරෝගී බව, ධාරණ ශක්තිය වර්ධනය කර ගැනීම, ගැටළු නිරාකරණය කර ගැනීම, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, ඥාන ශක්තිය දියුණු කර ගැනීම වැනි ප්‍රතිඵල ළඟා කර ගත හැකි වෙයි.

භාවනාවට එළඹෙන තැනැත්තා යෝගාවචරයා යි. යෝගාවචරයා භාවනාවට එළඹීමේ දී මුලින් ම කළයුතු වතාවත් පූර්වකෘත්‍යය නමින් හැඳින් වේ. ප්‍රථමයෙන් මුහුණ කට සෝදාගෙන පිරිසිදු විය යුතු ය. අනතුරුව භාවනාවට බාධා නොවන සුදුසු ස්ථානයක් (සේනාසනය) වෙත යායුතු ය. නිහඬ ස්ථානයක් වෙත ගිය යෝගාවචරයා ගිහියෙකු නම් සිල් සමාදන් විය යුතු ය. (පන්සිල් හෝ අටසිල්) පැවිද්දෙකු නම් සිල් අළුත් කිරීම හෝ උපසම්පන්නයෙකු ඇවැත් දෙසීම කළ යුතුයි.

ඉන්පසු තෙරුවන් ගුණ සිහිකර වන්දනා කළ යුතුය. අනතුරුව තෙරුවන් හා මව් දෙමාපිය වැඩිහිටියන් වෙත දැනුවත්ව හෝ නොදැනුවත් ව සිදු වූ වරදට සමාව ගැනීම සිදුකරයි.

කම්මට්ඨානාචාර්යයන් වහන්සේලා විසින් දෙනු ලබන අවවාද පිළිපදිමි, එම උප-දෙස් පරිදි භාවනා වඩමියි. ඒ මගින් උතුම් නිවන් සැප අවබෝධ වේවායි අධිෂ්ඨාන කිරී-මෙන් පසු චතුරාරක්ඛා භාවනාවට එළඹිය යුතු ය.

**බුද්ධානුස්සති මෙත්තා ච අසුභං මරණස්සති**
**ඉතිඉමා චතුරාරක්ඛා භික්ඛු භාවෙය්‍ය සීලවා**

**සිල්වත් යෝගාවචරයා බුද්ධානුස්සතිය ද, මෛත්‍රානුස්සතිය ද, අසුභානුස්සතිය ද, මරණානුස්සතිය ද යන මේ අනුස්සති භාවනා සතර වඩන්නේය.**

ඒ අනුව ප්‍රථමයෙන් බුදුගුණ අතුරින් එක් බුදුගුණයක් සිහිකරමින් බුද්ධානුස්සති භාවනාව වැඩිය යුතුයි. බුද්ධානුස්සතිය වැඩීමෙන් භාවනාවට අවශ්‍ය කරන ශ්‍රද්ධාව උපදී. දෙවනුව තමන් ඇතුළු සියලු සත්වයන්ට සුළු වේලාවක් මෛත්‍රී භාවනාව වැඩිය යුතු යි. මෛත්‍රී භාවනාව වැඩීමෙන් භාවනාට එරෙහි නුරුස්නා ගති ද්වේෂ සහගත සිතුවිලි දුරු වේ. තෙවනුව ශරීරයේ යථාස්වභාවය සිහිකරමින් සුළු වේලාවක් අසුභ භාවනාව වැඩී වැඩිය යුතුයි. එමගින් ශරීරය පිළිබඳව ඇති ආලය, ඇගයීම දුරුවේ. සිව්වනුව ජීවිතයේ අස්ථිරභාවය ගැන සිහිකරමින් සුළු වේලාවක් මරණානුස්මෘතිය වැඩීම සිදුකළ යුතු ය.

මරණය ගැන සිහි කිරීමෙන් මරණ බිය දුරුවෙනවා සේම මරණය ඒමට පෙර භාවනාව සපුරාගත යුතුය යන අප්‍රමාදී සිතුවිල්ල ඇතිවේ. මේ ආකාරයෙන් භාවනාවට ආරක්ෂාව සැපයෙන නිසා මේවාට චතුරාරක්ඛාව යැයි කියනු ලැබේ.

ඉන් පසුව වීර්යයෙන් භාවනාවෙහි නිරත වෙමියි අධිෂ්ඨානයක් ඇතිකර ගෙන එතැන් සිට කම්මට්ඨානාචාර්යවරයා (භාවනා ගුරුතුමා) දුන් කමටහන (භාවනා උපදේශය) අනුව භාවනා කිරීම ආරම්භ කෙරේ.

භාවනාව සඳහා ගත කළ කාලය අවසන් වූ පසු දෙවියන්ට පින් දී භාවනා ආසන-යෙන්, ඉරියව්වෙන් නිදහස් විය යුතු ය.

**භාවනා කිරීමට අනුපිළිවෙලක්:**

1. සිල් සමාදන් වීම.
2. තුනුරුවන් ගුණ සිහිකර වන්දනා කිරීම.
3. තෙරුවන් හා මව් දෙමාපිය වැඩිහිටියන් වෙත දැනුවත්ව හෝ නොදැනුවත් ව සිදුවූ වරදට සමාව ගැනීම.
4. තෙරුවන් කෙරෙහි හා කම්මට්ඨානාචාර්යවරුනට ජීවිතය පූජා වේවායි ජීවිත පරිත්‍යාග කිරීම.
5. කමටහන් ඇදුරුතුමන් වහන්සේලා විසින් දෙනු ලබන අවවාද පිළිපදිමි, එම උපදෙස් පරිදි භාවනා වඩමි. ඒ මගින් උතුම් නිවන් සැප අවබෝධ වේවායි පැතීම.
6. බුදුගුණ අතුරින් එක් බුදුගුණයක් සිහිකරමින් බුද්ධානුස්සති භාවනාව වැඩීම.
7. තමන් ඇතුළු සත්වයන්ට සුළු වේලාවක් මෛත්‍රී භාවනාව වැඩීම.
8. ශරීරයේ යථාස්වභාවය සිහිකරමින් සුළු වේලාවක් අසුභ භාවනාව වැඩීම.
9. ජීවිතයේ අස්ථිරභාවය ගැන සිහිකරමින් සුළු වේලාවක් මරණානුස්මෘතිය වැඩීම.
10. වීර්යයෙන් භාවනාවෙහි නිරත වෙමියි අධිෂ්ඨානයක් ඇතිකර ගැනීම.
11. මෙතැන් සිට කමටහන් ලැබී ඇති පරිදි භාවනා කිරීම.
12. දෙවියන්ට පින් දී භාවනාව අවසන් කිරීම.

**අභ්‍යාස**

01. පංචමාරයන් නම් කරන්න.
02. ඉන්ද්‍රිය හා අරමුණු දැක්වෙන ලෙස චිත්‍රයක් අඳින්න.
03. නීවරණ ධර්ම නම් කරන්න.
04. භාවනා කිරීමේ අනුපිළිවෙල අනුව මෛත්‍රී භාවනාවෙහි යෙදෙන්න.

24 පාඩම

# ආනාපානාසතිය වඩමු

සිදුහත් බෝසත් පුංචි කුමාරයා වප්මගුල් දා දඹගස් සෙවනේ සිටිය දී සිදු වූ ආශ්චර්යවත් සිදුවීම ඔබට මතකයි නේ ද? අහසේ පලක් බැඳගෙන භාවනාවේ යෙදී සිටිය හැටි. බෝසතාණන් වහන්සේ සය අවුරුදු දුෂ්කර ක්‍රියාවෙන් පසුව ද ජය ශ්‍රී මහ බෝමැඩ බුදු බවට පත්වීමේ දී ද වඩන ලද්දේ ආනාපාන සති භාවනාව යි. සිත තැන්පත් කරගැනීම සඳහා ඉතා සුලබ, ඉතා ශාන්ත, ප්‍රණීත කර්මස්ථානයක් ලෙස ආනාපාන සතිය වැදගත් වේ.

ආනාපාන සති යනු පාලි වචනයකි. එය **ආන - අපාන - සති** යන පද තුන සම්බන්ධ වී සකස් වී ඇත. ආන යනු හුස්ම ගැනීමයි. අපාන යනු හුස්ම හෙළීමයි. සති යනු සිහියයි. ආශ්වාස ප්‍රාශ්වාසයේ දී සිහිකල්පනාවෙන් යුතුව ඒ පිළිබඳ මෙනෙහි කිරීම ආනාපාන සති භාවනාව යි.

### ආනාපාන සති භාවනාවේ පූර්ව කෘත්‍ය

බුදුගුණ භාවනාව, මෛත්‍රී භාවනාව වැනි භාවනාවන් මෙන් ආනාපානසති භාවනාව කලබලකාරී පරිසරයක කළ නොහැකි ය. එසේම ඉඳීම, සිටීම, ඇවිදීම, සැතපීම යන සියළු ඉරියව්වලදී ද කළ නොහැකි ය. ඒ සඳහා පළමුකොට කළබලකාරී පරිසරයෙන් මිදුණු අරණ්‍ය, වෘක්ෂ මූල, ශූන්‍යාගාර යන විවේක ස්ථානයක් තෝරාගත යුතු ය. අනතුරුව බද්ධපර්යංකයෙන් හිඳගෙන ශරීරය සෘජුව තබාගෙන භාවනාව සඳහා සූදානම් විය යුතු ය.

**ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤ ගතො වා රුක්ඛමූල ගතො වා සුඤ්ඤාගාර ගතො වා උජුං කායං පනිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා**

මහණෙනි, මේ ශාසනයෙහි යෝගාවචරයා වනයට ගියේ හෝ, ගසක් මුලට ගියේ හෝ, ජනයාගෙන් හිස් තැනකට ගියේ හෝ පලග බැඳ උඩුකය කෙළින් තබාගෙන සිහිය කමටහන් අරමුණට යොමුකොට ඉඳගනී.

### පළමු අවස්ථාව:

අපි නිතරම ආශ්වාස කරමු. නැතහොත් හුස්ම ගන්නෙමු. එය භාවනාවක් නොවේ. එබැවින් ආනාපාන සති භාවනාවේ දී අප මුලින් ම කළ යුත්තේ අප ගන්නා හුස්ම සිහියෙන් ගැනීමයි. හෙළන හුස්ම සිහියෙන් හෙළීමයි. ඒ ආනාපානසති භාවනාවේ පළමු අවස්ථාවයි.

''සො සතොව අසසසති සතොව පසසසති''

සිහියෙන්ම හුස්ම ගනියි. සිහියෙන්ම හුස්ම පිටකරයි.

මෙහි දී භාවනාව සඳහා අමුතුවෙන් හිතාමතා හුස්ම ගැනීමක් හෝ හෙළීමක් අවශ්‍ය නැත. එනිසා අප කළ යුත්තේ ගැනෙන හෙළෙන හුස්ම ගැන සිතීමයි. එය සිදුකළ යුත්තේ දොරටු පාලයෙකු සේ ය. දොරටු පාලයා දොරටුවෙන් ඇතුල් වන අයත් පිටවන අයත් පරීක්ෂා කරන්නා සේ යෝගාවචරයා ද නාසය අග සිත රඳවාගෙන එහි ගැටෙමින් ඇතුල්වන පිටවන ආශ්වාසය ප්‍රශ්වාසය මෙනෙහි කරයි.

පටන් ගැන්මේ දී හැම හුස්මක් ම අත් නොහැරෙන පරිදි මෙනෙහි කිරීම අපට පහසු නැත. එබැවින් මේ සඳහා පහසු ම උපක්‍රමය නම් ගණන් කිරීමයි. ඊටත් පළමුව ආශ්වාස ප්‍රශ්වාස ඇතුල්වීමේ දී හා පිටවීමේ දී හැපෙන තැන හඳුනාගත යුතුයි. ආශ්වාස ප්‍රශ්වාසය ගණන් කළ යුත්තේ හෝ මෙනෙහි කළ යුත්තේ සිහිය එතැන තබාගෙන ය.

සාමාන්‍යයෙන් හුස්ම හැපෙන තැන ලෙස බොහෝ දෙනාට දැනෙන්නේ නාස් පුඩුවේ අග ය. උඩු තොළ උස්ව ඇති විට උඩු තොළ අග ද හුස්ම හැපෙනු දැනේ. ඒ අනුව එම ස්ථානයේ සිත රඳවාගෙන ඇතුල්වන පිටවන හුස්ම ගණන් කළ යුතු ය. මෙනෙහි කළ යුතු ය.

ආශ්වාස ප්‍රශ්වාස ගණන් කිරීමේ දී බෞද්ධ ආචාර්ය පරම්පරා අතර ක්‍රම දෙකක් පවතී. ඉන් පළමු වැන්න නම් ඇතුළට ගන්නා හුස්ම ශරීරය තුළ ගමන් කොට නැවත පි-ටවන තුරු ම එකයි..... එකයි..... එකයි..... දෙකයි..... දෙකයි..... දෙකයි..... යනාදී වශයෙන් ගණන් කිරීමයි.

එය වී මණින්නන්ගේ ක්‍රමය ලෙස අටුවාවන් හි දැක්වේ. වී මනින්නා මල්ලට වී පුරවන විටම එකයි..... එකයි..... කියා ගණන් කිරීමට පටන් ගනී. එය මල්ලට දමන තුරුම ඔහු එකයි..... එකයි..... යනුවෙන් ම කියයි. මේ ක්‍රමය අනුව ගන්නා හුස්මක් නැවත පිටවන තුරුම එකක් ලෙස ගණන් ගැනේ.

දෙවන ක්‍රමය නම් තවත් සමහර කෙනෙක් හුස්ම ගන්නා විට එකයි කියා ද පි-ටවන විට දෙකයි කියා ද ගණන් කරති. මේ කවර ක්‍රමයක් වුව ද වරදක් නැත. එහෙත් පැරණි සම්ප්‍රදාය අනුව වඩාත් පිළිගත් ක්‍රමය පළමු වැන්නයි.

ගණන් කිරීමේ දී පහට අඩුවෙන් ද දහයට වැඩියෙන් ද ගණන් නොකළ යුතු ය. අඩුවෙන් ගණන් කිරීමේ දී සීමාව පටු වැඩිවේ. දහයට ගණන් කිරීමේ දී ගණන අමතක වීම වැනි ගැටළු ඇතිවේ. මෙසේ දිගට ම ගණනා භාවනාව කරගෙන ගොස් ගණන් නොකර ම ආශ්වාස ප්‍රශ්වාසයෙහි සිහිය ඉබේම රඳවා ගත හැකිවන තුරුම මේ ක්‍රමය අනුගමනය කළ යුතු ය. සමහර විට ඒ සඳහා මාස ගණනක් වුව ද ගතවිය හැකි ය.

**දෙවන අවස්ථාව:**

මෙසේ ආශ්වාස ප්‍රශ්වාසය අපේ සිතට හොඳට ම හුරුපුරුදු වූ විට දෙවන අවස්ථාවට යා හැකිය. මෙතෙක් අප කළේ හුස්ම ගන්නා බව හා හෙළන බව පමණක් සිහි කිරීමයි. එහි වෙනස්කම් ගැන විමසීමක් නොවීය. දෙවන අවස්ථාවේ දී ඒ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ තිබෙන ප්‍රධාන වෙනස පිළිබඳ සැළකිලිමත් වෙයි. එනම් හුස්මෙහි දිග බව හා කෙටි බව යි. කිසියම් කෙනෙකුට එකම ප්‍රමාණයකට එක දිගට ම ආශ්වාස ප්‍රශ්වාස සිදුනොවේ. උදාහරණයක් ලෙස අපි සන්සුන් ව සිටින විට සෙමෙන් තරමක් දිගට ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමු. දිවීමෙන් හෝ කඳු නැගීම වැනි දෙයකින් හති වැටුණු විට වේගයෙන් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමු. මේ සිදුවීම සාමාන්‍යයෙන් හුස්ම ගනිමින් සිටින වේලාවට ද අතරින් පතර සිදුවේ.

මේ ආකාරයෙන් ගැනෙන හෙළෙන දිගු හුස්ම දිගු හුස්ම ලෙසත්, කෙටි හුස්ම කෙටි හුස්ම ලෙසත් වෙන් වෙන්ව සිහිකල්පනාවෙන් හිඳිමින් මෙනෙහි කිරීම දෙවන අවස්ථාවයි.

**''දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති''**
දිග හුස්මක් ගන්නා විට දිග හුස්මක් ගන්නා බව දැනගනියි.

**''දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති''**
දිග හුස්මක් හෙලන විට දිග හුස්මක් හෙළන බව දැන ගනියි.

**''රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති''**
කෙටි හුස්මක් ගන්නා විට කෙටි හුස්මක් ගන්නා බව දැනගනියි.

**''රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති''**
කෙටි හුස්මක් හෙලන විට කෙටි හුස්මක් හෙලන බව දැන ගනියි.

**තෙවන අවස්ථාව:**

සාමාන්‍යයෙන් අප ගන්නා හුස්ම නාසයෙන් ඇතුළු වී ස්වාසනාලය ඔස්සේ කුස තුළ නාභි ප්‍රදේශය දක්වා ගමන් කොට නැවත එම ස්වාසනාලයෙන් ම අවුත් නාසයෙන් පිටවී යයි. ඒ අනුව ආශ්වාසයේ මුල නාස් පුඩුවයි. මැද හෘදය වස්තුවයි, අග නාභියයි. ප්‍රශ්වාසයේ මුල නාභියයි, මැද හෘදයයි, අග නාසයයි. ආනාපාන සති භාවනාවේ තුන්වන අවස්ථාව වන්නේ මේ හුස්ම ඇතුළුවී සිරුර පුරා ගමන් කොට නැවත පිටවන තැන දක්වා සම්පූර්ණ හුස්ම මෙනෙහි කිරීමයි. එය ඉහත කී පරිදි මුල, මැද, අග වශයෙන් සනිටුහන් කොටගෙන මෙනෙහි කිරීම පහසු ය. සබ්බ කාය හෙවත් සම්පූර්ණ ආශ්වාස ප්‍රශ්වාස කය වශයෙන් හැඳින්වෙන එහි කාය යනු මුළු ආශ්වාස ප්‍රශ්වාස ම ඒකකයක් සේ ගැනීමයි.

''සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති''
සියලු ආශ්වාස කාය මුල, මැද, අග තුන් තැන්හි දැන ආශ්වාස කරමියි හික්මෙයි.

''සබ්බකාය පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති''
සියලු ප්‍රශ්වාස කාය මුල, මැද, අග තුන් තැන්හි දැන ප්‍රාශ්වාස කරමියි හික්මෙයි.

**හතරවන අවස්ථාව:**

මෙතෙක් සඳහන් කළ පියවර තුනෙන් එක් එක් පියවරක් හොඳින් හුරුපුරුදු වීමට මාස ගණන් සමහර විට අවුරුදු ගණන් වුවද ගත විය හැකි ය. ඒ ආකාරයෙන් මේ තුන්වන අවස්ථාව දක්වා එනවිට සිතට ආශ්වාස ප්‍රශ්වාසය හොඳට ම හුරුපුරුදු ය. මෙසේ පියවරින් පියවරට ආශ්වාස ප්‍රශ්වාස භාවනාව වඩන විට සිත ද සන්සුන් වේ. ආශ්වාස ප්‍රශ්වාසය ද සන්සුන් වෙයි. එන්න එන්නම ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳ දැනීම සියුම්ව යන්නේ ය. ඒ අනුව හතරවන අවස්ථාවේ දී ආශ්වාස ප්‍රශ්වාසයෙහි තිබුණු ඕලාරික ගතිය, රළු ගොරෝසු ගතිය තුනී වී ගොස් දැනෙන නොදැනෙන තරමට පත්වන්නේ ය. පස්සම්භයං යනු ආශ්වාස ප්‍රශ්වාසයේ එකී සන්සිඳුවීමයි.

එතැන් සිට ඒ බව දනිමින් ආශ්වාස ප්‍රශ්වාස මෙනෙහි කරන්නේය.

''පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති''
ආශ්වාස ප්‍රශ්වාස සන්සිඳෙන සැටි දනිමින් ආශ්වාස කරමියි හික්මෙයි.

''පස්සම්භයං කායසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති''
ආශ්වාස ප්‍රශ්වාස සන්සිඳෙන සැටි දනිමින් ප්‍රශ්වාස කරමියි හික්මෙයි.



**අපි භාවනා කරමු.**

- පෙර පාඩමෙහි අනුපිළිවෙල පරිදි පූර්වකෘත්‍ය සිදුකොට භාවනාව ආරම්භ කරන්න.
- විහාර මන්දිරයට හෝ වෙනත් සුදුසු විවේකස්ථානයකට ගොස් කය ඍජු ව තබා හිඳගන්න.

- දෑත් නළලෙහි තබා වැඳගෙන නමස්කාරය කියා වම් අත්ල මත දකුණු අත්ල මත සිටින සේ දෑත් තබාගන්න. ක්‍රමයෙන් දෙනෙත් පියාගන්න.

- හොඳින් හුස්මක් ඉහළට ගෙන එය ක්‍රමයෙන් පහළට හෙළා, කය සැහැල්ලු කොටගෙන භාවනාවට පිවිසෙන්න.

**පළමු පියවර:**

ආශ්වාස ප්‍රශ්වාසය ගැන සිත යොමු කරන්න.

උඩු තොල මැද හෝ නාසය අග හුස්ම ගැටෙන ආකාරය මෙනෙහි කරන්න.
හුස්මක් ගනිමි ...... හුස්මක් ගනිමි ...... හුස්මක් ගනිමි ......
හුස්මක් හෙළමි ..... හුස්මක් හෙළමි ..... හුස්මක් හෙළමි .....

යනුවෙන් හුස්ම ගැනීම හෙළීම මෙනෙහි කරමින් දිගටම භාවනාවහි යෙදී සිටින්න.

(පළමු පියවර හොඳින් ප්‍රගුණ කොට ඉදිරි පියවරට යෑම වැදගත් වේ)

**දෙවන පියවර:**

ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ස්වභාවය සිහියෙන් යුතු ව හඳුනා ගන්න.

දිග හුස්මක් ගන්නා විට
දිග හුස්මක් ගනිමි......දිග හුස්මක් ගනිමි...........
දිග හුස්මක් හෙළන විට
දිග හුස්මක් හෙළමි........දිග හුස්මක් හෙළමි......... යනුවෙන් සිහි කරන්න.
කෙටි හුස්මක් ගන්නා විට
කෙටි හුස්මක් ගනිමි.......... කෙටි හුස්මක් ගනිමි..........
කෙටි හුස්මක් හෙළන විට
කෙටි හුස්මක් හෙළමි.......... කෙටි හුස්මක් හෙළමි.......... යනුවෙන් සිහිකරන්න.

මෙසේ බොහෝ වේලාවක් භාවනාවෙහි යෙදෙන්න.

**තෙවන පියවර:**

ආශ්වාස ප්‍රශ්වාස වාතයෙහි මුල මැද අග පිළිබඳ අවධානය යොමු කරන්න. නාසය අග හෝ උඩු තොල මැද ගැටෙන හුස්ම හඳුනාගනිමින්,
හුස්ම ඇතුල් වෙනවා ...... හදවතට දැනෙනවා...... කුස පිම්බෙනවා ...... කුස හැකිලෙනවා ..... හුස්ම පිටවෙනවා.......

මෙසේ මෙනෙහි කරන්න, දිගටම භාවනාවෙහි යෙදෙන්න.

මෙසේ භාවනාව හොඳින් පුරුදුවන වන විට ආශ්වාස ප්‍රශ්වාස සියුම්ව දැනෙන නොදැනෙන තරමට පත්වන්නේ ය. එය පෙර සේ පියවරක් ලෙස මෙනෙහි කළ නොහැක. හේතුව ආශ්වාස ප්‍රශ්වාස නොදැනෙන බැවිනි. එබැවින් කළ යුත්තේ ඒ සන්සුන් බව විඳිමින් සිටීමයි.

එහි දී දැන් මගේ හුස්ම සන්සුන් ය ........... හුස්ම සන්සුන් ය ........... හුස්ම සන්සුන් ය ........... කියා මෙනෙහි කරන්න.

**අවසන් පියවර:**

මගේ සිත සන්සුන් වේවා.
නැණ නුවණ දියුණු වේවා.
කායික මානසික පීඩා දුරු වේවා.
යනාදී වශයෙන් අධිෂ්ඨානය ඇති කර ගන්න.

නළලෙහි දෑත් තබා වැඳගෙන තෙරුවන් සමා කර ගැනීමේ ගාථා කියන්න. දෙවියන්ට පින්දී භාවනාව අවසන් කරන්න.

මෙසේ පන්ති කාමරයේ දී හෝ විහාරයට ගොස් ගුරුතුමාගේ උපදෙස් පරිදි භාවනාව ටික කලක් හුරු පුරුදු වන්න.

**අභ්‍යාස**

01. ආනාපාන සති යන පදය පැහැදිලි කරන්න.
02. බෝසත් සිරිතේ ආනාපාන සති භාවනාව වැඩූ අවස්ථාවන් නම් කරන්න.
03. භාවනාවට සුදුසු ස්ථාන තුන නම් කරන්න.
04. ''උජුං කායං'' යනු කුමක් ද?
05. ඔබ පොහොය දින සිල් පිරිස වෙනුවෙන් ආනාපානසති භාවනාව මෙහෙය වීමට පුරුදු වන්න.

25 පාඩම

# කය නම් නිසරුය

**(පිළිකුල් භාවනාව)**

අපි හැම කෙනෙකුම අපේ සිරුරට කැමැති ය. කොතරම් අවලක්ෂණ කෙනෙක් වුවත් තමන්ගේ සිරුරට ප්‍රියවේ. ලෝකයේ ගහ කොළ සත්තු ආදී සෑම ස්වභාව ධර්ම නිර්මාණයක ම බැලූ බැල්මට කිසියම් සුන්දරත්වයක් තිබේ. අපේ සිරුර ද එසේ ය. එයද මනහර රථයක් වැනිය. රථයේ අවලස්සන ඇතුළත කොටස් වසා ලස්සන කවරයක් සකසා තිබේ. අපේ සිරුරද එසේ ය. එහි ඇතුළත සැබෑ ස්වරූපය වසා බාහිර සමකින් ආටෝප ගන්වා තිබේ. ඒ නිසා මේ සිරුරට අප තුළ කැමැත්තක් ඇති වේ. මෙය මායාවකි, රැවටීමකි. ස්ත්‍රීන් පුරුෂයන්ටත්, පුරුෂයන් ස්ත්‍රීන්ටත් ඇලීම මේ මායාවේ දරුණුම අවස්ථාවකි.

මේ සසර ගමන දික් වන්නේ ද රාගයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් අප නොමග යන්නේ ද මේ රැවටීම නිසාය. එය නොදන්නා අය රූපය ගැන උඩගු වෙති. අහංකාර වෙති. රූප ශ්‍රීය හැමදාමත් එක විදිහට පවතී යැයි සිතා රූප මදයෙන් මත් වෙති.

අපගේ මේ ශරීරය සිදුරු නවයකින් යුත් තුඹසක් වැනිය. දෙ ඇස්, දෙ කන්, නාසා සිදුරු දෙක, රෝම කූප, මල මාර්ගය හා මූත්‍ර මාර්ගය යන සිදුරු නවයෙන් නිරන්තරයෙන් අපවිත්‍ර දේ පිට කරයි. දුගඳ හමන, පිළිකුල් සහගත එම තත්වයන් වළකා ගැනීමට අපට සිදුවේ. ඒ නිසා මුහුණ කට සෝදමින්, ස්නානය කරමින්, වෙනත් ආලේප කිරීම් ආදිය මගින් නිතර පිරිසිදු කරමින් මේ සිරුර නඩත්තු කරන්නට සිදුවේ. ශරීරය නැමැති මේ තුඹස සකස් වී ඇත්තේ එවැනි පිළිකුල් සහගත කුණුප කොටස් තිස් දෙකක එකතුවෙනි.

**කෙස්, ලොම්, නිය, දත්, සම්,**
**මස්, නහර, ඇට, ඇට මිදුළු, වකුගඩු,**
**හදවත, අක්මාව, දළබුව, බඩදිව, පපුමස,**
**බඩවැල්, අතුණු බහන්, නොදිරවූ අහර, අශුචි, හිස් මොළය,**
**පිත, සෙම, සැරව, ලේ, දහඩිය, මේද තෙල්,**
**කඳුළු, වුරුණු තෙල්, කෙළ, සොටු, සඳමිදුලු, මුත්‍ර යනුවෙනි.**

මෙම කුණප කොටස් තිස් දෙක භාවනාවට පහසුවන ලෙස වර්ග කොට දක්වා ඇත්තේ මෙසේය,

| | | | |
|---|---|---|---|
| **තච පඤ්චකය** | (05) | **වක්ක පඤ්චකය** | (05) |
| **පප්ඵාස පඤ්චකය** | (05) | **මත්ථලුංග පංචකය** | (05) |
| **මේද ඡක්කය** | (06) | **මුත්ත ඡක්කය** | (06) |

මෙම පාද තලයෙන් උඩ හිසෙහි කෙස්වලින් යට සම කෙළවර කොට ඇති ඒ තුළ පිහිටි මේ දෙතිස් කුණප කොට්ඨාස වෙන් වෙන් ව මෙනෙහි කිරීම, අවබෝධයෙන් සිහිකිරීම කායගතා සතියයි. පිළිකුල් භාවනාව, ද්වත්තිංසාකාර භාවනාව, කොට්ඨාස භාවනාව යනුවෙන් ද හැඳින්වේ.

**''පුනචපරං භික්ඛවෙ ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තච පරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති''**

නැවත ද මහණෙනි, පාදාන්තයේ සිට කේසාන්තය දක්වා සමෙන් වටකොට ඇති නොයෙක් අසූචියෙන් පිරි මේ ශරීරයම නුවණින් සිහි කරයි .........

භාවනාවට සිත යොමු කළ භික්ෂුව මේ ශරීරයෙහි දෙතිස් කුණප කොටස් දෙස බලන ආකාරය දක්වා ඇත්තේ හරි අපූරු උපමාවකිනි. දෙපැත්තේ කටවල් සහිත මල්ලක පුරවා ඇති නොයෙක් ධාන්‍ය වර්ග එකිනෙක වෙන්කරමින් බලන්නාක් මෙනි.

**''සෙය්‍යථාපි භික්ඛවෙ, උභතො මුඛා පුටොළි පූරා නානා විහිතස්ස ධඤ්ඤස්ස, සෙය්‍යථීදං'' ?**

මහණෙනි, යම්සේ උඩින් සහ යටින් කටවල් දෙකක් ඇති නොයෙක් ධාන්‍ය වර්ගවලින් පුරවන ලද මල්ලක් වේ ද?

**''සාලීනං, වීහීනං, මුග්ගානං, මාසානං, තිලානං, තණ්ඩුලානං, තමෙනං චක්ඛුමා පුරිසො මුඤ්චිත්වා පච්චවෙක්ඛෙය්‍ය, ඉමෙ සාලි, ඉමෙ වීහි, ඉමෙ මුග්ගා, ඉමෙ මාසා, ඉමෙ තිලා, ඉමෙ තණ්ඩුලාති''**

ඇස් ඇති පුරුෂයෙක් ඒ ධාන්‍ය මල්ල ලිහා එහි ඇති හැල් සහල්, වී, මුං, මෑ, තල, සහල් යන ධාන්‍ය අතුරින් මේ හැල් සහල් ය, මේ වී ය, මේ මුං ය, මේ මෑ ය, මේ තලය, මේ සහල් යැයි තෝර තෝරා බලන්නේ ය.

මේ පිළිකුල් භාවනාවෙන් කෙරෙන්නේ ශරීරය පිළිබඳ මුලාවී ආටෝපයට, මායාවට, නොරැවටී ඇති සැටියෙන් දැකීමයි. පිළිකුල් භාවනාව වැඩීමෙන් රාගික හැඟීම් පහ වේ. ද්වේෂ සහගත සිතුවිලි සන්සිඳේ. කාමච්ඡන්දයෙන් සිත මිදෙයි. සිත එකඟ වෙයි.

මෙම ශරීරයෙහි ඇතුළත් කුණප කොට්ඨාසවල පිළිකුල් බව ඉතා මැනවින් විස්තර කෙරෙන ගාථා පෙළක් සාමණේර බණ දහම් පොතට ඇතුළත්ව තිබේ. අපි ඒවා අර්ථ සහිතව මෙසේ හදාරමු.

1. අවිඤ්ඤාණකා සුභනිභං සවිඤ්ඤාණකා සුභං ඉමං
කායං අසුභතො පසසං අසුභං භාවයෙ යති

සාමාන්‍යයෙන් මෘත ශරීරය අසුභයක් සේ දකින පරිදිම සිත් පිත් ඇති ශරීරය ද අසුභයක් සේ දැක භික්ෂුව අසුභ භාවනාවෙහි යෙදෙයි.

2. වණ්ණ සණ්ඨාන ගන්ධෙහි ආසයො කාසතො තථා
පටික්කූලානි කායෙ මෙ කුණපානි ද්වත්තිංස

පැහැයෙන්, හැඩයෙන්, ගඳින් අප්‍රසන්න වූ ද, ආසය හෙවත් පෝෂණය කරන ලේ පිත් සෙම් ආදී පිළිකුල් කොටස් නිසා අප්‍රසන්න වූ ද, ශරීරයෙහි ඒවා පිහිටා ඇති තැන්වල අප්‍රසන්න භාවය නිසා ද මේවා පිළිකුල් ය. ඒ පිළිකුල් කුණපයෝ දෙතිසක් මේ ශරීරයෙහි පිහිටා ඇත.

3. පතිතම්හාපි කුණපා ජෙගුච්ඡං කායනිස්සිතං
ආධාරෝ හි සුචී තස්ස කායො තු කුණපෙ ඨිතං

සාමාන්‍යයෙන් ශරීරයෙන් ගිලිහී වැටුණු කෙස් ආදී කුණපයන් වඩා පිළිකුල් යැයි අපට සිතුනත්, ඊට වඩා ශරීරයෙහි පවතින කුණප පිළිකුල් ය. මන්ද එයට පිහිටා සිටීමට ආධාර වූ ශරීරය ද කුණපයෙහිම පිහිටි හෙයිනි.

4. මීළ්හෙ කිමිව කායොයං අසුචිම්හි සමුට්ඨිතො
අන්තො අසුචි සම්පුණ්ණො පුණ්ණවච්චකුටී විය

මේ කය අසුචියෙහි උපදනා පණුවකු මෙන් අසුචියෙහිම හටගත් දෙයකි. ඇතුළත මළමුත්‍රා දී කුණපයෙන් සපිරුණු මේ කය පිරුණු වැසිකිළියක් වැන්න.

5. අසුචි සන්දතෙ නිච්චං යථා මෙදකථාලිකා
නානා කිමිකුලාවාසො පක්කචන්දනිකා විය

තෙල් සැලියකින් තෙල් වැගිරෙන්නා සේ, මෙම ශරීරයෙන් නිතර මල මුත්‍ර, කෙළ, සෙම්, සොටු වැනි අසුචි වැගිරේ. මේ ශරීරය පල් වූ ගවර වලක් මෙන් නොයෙක් කෘමීන්ගේ වාසස්ථානයකි.

### 6. ගණ්ඩභූතො රොගභූතො වණ්ණභූතො සමුස්සයො
### අතෙකිච්ඡො තිජෙගුච්ඡො පභින්න කුණපූපමො

පැසවන ලද ගඩුවක් වූ, රෝගයක් වූ, වණයක් වූ, මේ කය පිළියම් කළ නොහැකි ඉතා පිළිකුල් කටයුතු ඉදිමී පිපුරුණු මළකුනක් වැනිය.




**දෙතිස් කුණුප කොටස් අතරින් තච පංචකය මෙනෙහි කිරීම.**

කෙසා - කෙස්, ලොමා - ලොම්, නඛා - නිය, දන්තා - දත්, තචො - සම.

අනුලෝම වශයෙන් සිහිකිරීම : කේසා, ලෝමා, නඛා, දන්තා, තචො.
ප්‍රතිලෝම වශයෙන් සිහිකිරීම : තචෝ, දන්තා, නඛා, ලෝමා, කේසා.

**අපි තච පංචකය අනුව පිළිකුල් භාවනාව වඩමු.**

භාවනාවට අදාළ පූර්ව කෘත්‍යය:

පෙර පාඩමෙහි අනුපිළිවෙල පරිදි පූර්වකෘත්‍ය සිදුකොට භාවනාව ආරම්භ කරන්න.

විහාර මන්දිරයට හෝ වෙනත් සුදුසු විවේකස්ථානයකට ගොස් කය ඍජු ව තබා හිඳගන්න.

දෑත් නළලෙහි තබා වැඳගෙන නමස්කාරය කියා වම් අත්ල මත දකුණු අත්ල සිටින සේ දෑත් තබාගන්න. ක්‍රමයෙන් දෙනෙත් පියාගන්න.
හොඳින් හුස්මක් ඉහළට ගෙන එය ක්‍රමයෙන් පහළට හෙළා,
කය සැහැල්ලු කොටගෙන භාවනාවට පිවිසෙන්න.

**පළමු පියවර:**

කෙසා, ලොමා, නඛා, දන්තා, තචො.
තචො, දන්තා, නඛා, ලොමා, කෙසා.
යනුවෙන් නැවත නැවත මෙනෙහි කරන්න.

**දෙවන පියවර:**

මගේ කෙස් පැහැයෙන් ද, සටහනින් ද, පිහිටි ස්ථාන වශයෙන් ද පිළිකුල්ය, නිසරුය.
මගේ ලොම් පැහැයෙන් ද, සටහනින් ද, පිහිටි ස්ථාන වශයෙන් ද පිළිකුල්ය, නිසරුය.
මගේ නිය පැහැයෙන් ද, සටහනින් ද, පිහිටි ස්ථාන වශයෙන් ද පිළිකුල්ය, නිසරුය.
මගේ දත් පැහැයෙන් ද, සටහනින් ද, පිහිටි ස්ථාන වශයෙන් ද පිළිකුල්ය, නිසරුය.
මගේ සම පැහැයෙන් ද, සටහනින් ද, පිහිටි ස්ථාන වශයෙන් ද පිළිකුල්ය, නිසරුය.

යනුවෙන් මෙනෙහි කරන්න.

**අවසන් පියවර:**

මගේ සිත සන්සුන් වේවා.
නැණ නුවණ දියුණු වේවා.
කායික මානසික පීඩා දුරු වේවා.
යනාදී වශයෙන් අධිෂ්ඨානය ඇති කර ගන්න.

නළලෙහි දෑත් තබා වැඳගෙන තෙරුවන් සමා කර ගැනීමේ ගාථා කියන්න.
දෙවියන්ට පින්දී භාවනාව අවසන් කරන්න.

**ක්‍රියාකාරකම**

01. ශරීරය සුභ වශයෙන් හඳුනා ගන්නේ කවුරුන්ද ?
02. යෝගී භික්ෂුව දෙතිස් කුණුප කොටස් දෙස බලන්නේ කුමක් උපමා කොටද ?
03. නව දොර නම් කරන්න.
04. ''පුණ්ණවච්චකුටී විය'' යන උපමාවෙන් අදහස් කරන්නේ කුමක් ද?
05. පන්තියේ සියලු දෙනා එක් වී එක් කාලච්ඡේදයක දී පිළිකුල් භාවනාවෙහි යෙදෙන්න.

26 පාඩම

# චතුරාර්ය සත්‍යය

"සත්හට වන බව දුකට වෙදාණන්" යයි සඳහන් වන පරිදි බුදු කෙනෙකුන් ලොව පහළ වන්නේ සත්ත්වයා සසර දුකින් මුදවනු පිණිස ය. සංසාරය යනු ඉපදි ඉපදී මැරි මැරි භවයෙන් භවයට ගමන් කිරීමයි. මෙය සැපයක් නොවේ. දුකකි. "**දුක්ඛෙ ලොකො පතිට්ඨිතො**" යනුවෙන් වදාළ පරිදි මුළු ලෝකයම හෝ සසරසැරිසරණ ලෝ වැසියාම පිහිටා සිටින්නේ දුක මත ය. මෙය වටහා ගැනීම ඒ දුකෙහි ම ගැලී සිටින අයට පහසු නැත. බුදු කෙනෙක් ලොව පහළ වී මේ බව පහදා දෙති. එහෙත් කාලයාගේ ඇවෑමෙන් එය යටපත් වී නොතේරී යයි. නැවත එය වටහා දෙන්නේ තවත් බුදු කෙනෙකි. මේ නිසා බුදු කෙනෙකුන් ලොව පහළ වන්නේ මේ ලෝකයේ සැබෑ තත්ත්වය වටහා දෙනු පිණිස ය. එනම් දුක හඳුන්වා දී එයින් මිදෙන මග කියා දෙනු පිණිස ය.

මේ දුක යයි කියන ලෝකයේ සැබෑ තත්ත්වය සහ එයින් මිදීම බුදුවරුන් විසින් සතරාකාරයකින් විග්‍රහ කරණු ලැබේ. එනම්

1. දුක යනු කුමක්දැයි හඳුනා ගැනීම.
2. එයට හේතුව වටහා ගැනීම.
3. එයින් මිදිය හැකි බව වටහා ගැනීම.
4. එයින් මිදීමට මගක් ඇති බව වටහා ගැනීම යනු ඒ විග්‍රහය යි. එය චතුරාර්යය සත්‍ය නමින් හැඳින්වේ.

බුදුරජාණන් වහන්සේ එදා බරණැස ඉසිපතනයේ දී පස්වග මහණුන්ට මංගල ධර්ම දේශනාව වූ දම්සක් පැවැතුම් සූත්‍රයෙන් දේශනා කළේ මේ චතුරාර්ය සත්‍යය යි. එය බුදුරජාණන් වහන්සේලා විසින් තමාම අවබෝධ කරගෙන දේශනා කරන සත්‍යයයි. ඒ නිසා ම මෙය සාමුක්කංසික දේශනා නමින් හැඳින්වේ. දම්සක් පැවැතුම් සූත්‍රයේ සඳහන් වන ආකාරයට එම සත්‍ය සතර මෙසේ ය.

1. **දුක්ඛ ආර්ය සත්‍යය - දුක පිළිබඳ ආර්ය සත්‍යය.**
2. **දුක්ඛ සමුදය ආර්ය සත්‍යය - මේ දුක ඇතිවීමට හේතුව පිළිබඳ ආර්ය සත්‍යය.**
3. **දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය - දුක නැතිකිරීම පිළිබඳ ආර්ය සත්‍යය.**
4. **දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය. - දුකෙහි නැති කිරීම සඳහා වන පිළිවෙත පිළිබඳ ආර්ය සත්‍යය.**

දුකින් මිදීමට හෙවත් නිවන් දැකීමට නම් මෙම ආර්ය සත්‍ය සතර දැනගෙන සිටීම පමණක් ප්‍රමාණවත් නොවේ. මේ එක් එක් ආර්ය සත්‍යයන් පිළිබඳ කළයුතු කාර්ය සතරක් තිබේ. එනම් දුක්ඛාර්ය සත්‍යය සෑම අතකින්ම විමසා පිරිසිඳ දැන ගත යුතු ය. (පරිඤ්ඤෙය්‍යං) දුක්ඛ සමුදය ආර්ය සත්‍යය හෙවත් තෘෂ්ණාව දුරු කළ යුතු ය. (පහාතබ්බං) දුක්ඛ නිරෝධාර්ය සත්‍යය හෙවත් නිර්වාණය තමන් විසින්ම අවබෝධ කළ යුතු ය. අත්දැකිය යුතු ය. (සච්ඡිකාතබ්බං) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාර්ය සත්‍යය අනුගමනය කළ යුතු ය. වැඩිය යුතු ය. (භාවේතබ්බං)



මෙම ආර්ය සත්‍ය සතර සත්‍යය යැයි ඇත්තක් යැයි පිළිගැනෙන්නේ කරුණු තුනක් නිසා ය. ඒවා මෙසේ ය.

තථ - ලෝකයේ සැබැවින්ම පවතින්නේ සිදුවන්නේ එයම බව.
අවිතථ - කිසි විදියකින් එය එසේ නොවේ යැයි ඔප්පු කළ නොහැකි බව.
අනඤ්ඤථ - එය ඒ ආකාරයෙන් මිස වෙනත් ආකාරයකින් නොපවතින බව සිදු නොවන බව.

මෙම සත්‍ය සතරේ සරල අදහස නම් චතු යනු සතරයි. ආර්ය යනු උතුම් යන්නයි. සත්‍යය යනු ඇත්තයි. බුදුදහමේ ආර්ය හෙවත් ශ්‍රේෂ්ඨයෝ නම් බුදු, පසේබුදු, මහ රහතන් වහන්සේලා ය. එම ආර්ය සත්‍ය එනමින් හඳුන්වන්නේ කරුණු කිහිපයක් පදනම් කරගෙන ය.

- බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා විසින් අවබෝධ කරන නිසාද
- කිසිලෙසත් බොරු නොවන, වෙනස් කළ නොහැකි උතුම් සත්‍ය වන නිසාද
- මෙම සත්‍යයන් අවබෝධ කිරීමෙන් සෝවාන් ආදී ආර්ය තත්ත්වයන්ට පැමිණෙන නිසාත් ය.

මෙම සත්‍ය සතර මෙසේ සතරාකාරයකින් දැක්වූයේ ඇයි එය වටහා ගැනීමට අවබෝධ කර ගැනීමට එසේ බෙදා දැක්වීම පහසු වන නිසා ය. රෝගියෙකු ළඟට ගිය විට වෛද්‍යවරයා කරුණු සතරක් සලකා බලයි.

1. ඔහුට රෝගයක් ඇති බව.
2. ඒ රෝගයට හේතුව.
3. රෝගය සුව කළ හැකි බව.
4. සුව කිරීමට යෙදිය යුතු පිළියම යනු එසේ සලකා බලනු ලබන කරුණු සතරයි.

මේ ආකාරයෙන් ම මෙම සත්‍ය සතර පිළිබඳ ව ද අංග හතරක් තිබේ. එය මෙසේ දැක්වේ.

**පවත්ති** - **පවත්ති යනු ලොව පවත්නා සැබෑ ස්වභාවය යි. එනම් දුකයි.**
**පවත්තක** - **පවත්තක යනු එම දුක පවත්වන්නා හෙවත් ඒ දුක ඇතිවන්නේ කුමන හේතුවක් නිසාද යන බව.**
**නිවත්ති** - **නිවත්ති යනු එම දුකෙහි නැවැත්මක් ඇති බව හා ඒ නැවැත්ම කුමක් ද යන බව.**
**නිවත්තක** - **නිවත්තක යනු දුක නවත්වන්නා හෙවත් නැවැත්වීමේ මාර්ගය.**

සත්ත්වයා සසර දිගින් දිගට සැරි සරන්නේ මෙම ආර්ය සත්‍යය මේ ආකාරයෙන් අවබෝධකර නොගැනීම නිසා බව බුදුරජාණන් වහන්සේ ම වදාළේ "**ඉමෙසං චතුන්නං අරියසච්චානං අනනුබොධා අප්පටිවෙදා දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං තුම්හාකංචෙව මමඤ්ච**" යනුවෙනි. බුදුරජාණන් වහන්සේලා මෙම චතුරාර්ය සත්‍යය අකාර තුනකින් අවබෝධ කර ගනිති. එනම්,

1. **සත්‍ය ඤාණය** - **ඒ සත්‍යයක් බව තේරුම් ගැනීමේ නුවණ.**
2. **කෘත්‍ය ඤාණය** - **ඒ සත්‍ය පිළිබඳ කළ යුතු කෘත්‍ය දැන ගැනීමේ නුවණ.**
3. **කෘත ඤාණය** - **ඒ සත්‍ය පිළිබඳ කළ යුතු දේ කර නිම වූ බව දැන ගැනීමේ නුවණ.**

මෙලෙස එක් එක් සත්‍යය පියවර තුනකින් යුක්ත බැවින් තිපරිවට්ටය නමින් හැඳින්වේ. මෙම පියවර තුන සත්‍ය සතර අනුව දොළොස් ආකාරවේ. බුදුකෙනෙකුන් වහන්සේ නමක් මෙම සත්‍ය සතර කිසිවෙකුගේ පිහිටක් නැතිව තමන් වහන්සේ ම දැන අවබෝධ කරගන්නා බැවින් සම්මා සම්බුද්ධ නම් වන සේක. රහතන් වහන්සේ අර්හත් ඵලයට පත් වන්නේ ද මෙම චතුරාර්ය සත්‍යය අසා අවබෝධ කර ගැනීමෙනි.

**දුක්ඛාර්ය සත්‍යය.**

ගඳ, දුගඳ, සිරිත්, දුසිරිත් යැයි කීවාසේ "දු" යන්න නරක පිළිකුල් කටයුතු යන අදහස දෙයි. "ඛ" යනු ආකාසයට නමකි. ආකාසය යනු හිස් දෙයකි. කිසිවක් නැති තැනකි. ඒ අනුව නොයෙකුත් අපල, උපද්‍රව, විපත්තිවලට හේතුවන හෙයින් මෙම සසර පැවැත්ම හා පංචස්කන්ධය පිළිකුල් කටයුතු ය. නරක ය. එසේම බොහෝ දෙනා සිතන පරිදි මෙම සංසාර ජීවිතය ධ්‍රැව හෙවත් සදාකාලික නැත. සුබ හෙවත් සැප සහිත නැත. සුභ හෙවත් යහපත් නැත. ආත්මය මමය මාගේය යැයි ගත යුතු දෙයක් නැත. එහෙයින් මෙය හැම අතකින්ම හිස් ය. මෙසේ මේ සංසාරගත ජීවිතයත් පඤ්චස්කන්ධයත් පිළිකුල් කටයුතු බැවින් ද හිස් බැවින් ද දුක්ඛ යැයි කියනු ලැබේ. (විශුද්ධි මාර්ගය) ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ දී දුක්ඛාර්ය සත්‍යය පැහැදිලි කරන්නේ මෙසේ ය.



"ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛං අරිය සච්චං ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා,
ව්‍යාධිපි දුක්ඛො, මරණම්පි දුක්ඛං අප්පියෙහි සම්පයොගො දුක්ඛො
පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං න ලභති
තම්පි දුක්ඛං සංඛිත්තෙන පංචුපාදානක්ඛන්ධා දුක්ඛා."

මෙම පාඨයට අනුව පහත සියල්ල දුක් වේ. එනම්

1. ජාතිය (ඉපදීම)
2. ජරාව (මහළු වීම)
3. ව්‍යාධිය (ලෙඩ වීම)
4. මරණය (මරණයට පත්වීම)
5. අප්‍රියන් සමග එක් වීම.
6. ප්‍රියයන්ගෙන් වෙන් වීම.
7. කැමැති දේ නොලැබීම.
8. සැකෙවින් මමය, මාගේය යයි උපාදාන වශයෙන් අල්ලා ගත් විට පංචස්කන්ධය ම දුක ය.

දුක යැයි කී විට එක්වරම අපට හැඟෙන්නේ රිදීමක්, දුක් වේදනාවක් ගැනය. එහෙත් චතුරාර්ය සත්‍යයේ දී දුක්ඛ යන්න යෙදෙන්නේ වේදනාකාරී ස්වභාවයට පමණක් නොව. ඊට වඩා පුළුල් අර්ථයකිනි. දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය යන සැප සහිත සුගති තුනෙහිම කොතරම් සැපවත් සත්ත්වයන් සිටියත් ඔවුන් සැමවිට ම සුවෙන් සතුටෙන් සිටින්නෝ නොවෙති. මේ කාරණයෙන් චතුරාර්ය සත්‍යයෙහි දුක්ඛ යැයි කියන්නේ කුමක්දැයි යාන්තමින් තේරුම් ගත හැකි ය. ඒ නිසා සුගතියේ සැප විඳින සත්ත්වයාටත් දුගතියේ දුක් විඳින සත්ත්වයාටත් දුක පොදු කාරණයකි. එය එසේ වන්නේ කුමන හේතුවක් නිසාදැයි තේරුම් කර දීමට දුක ආකාර තුනකින් විස්තර කරනු ලැබේ. ඒවා මෙසේ ය.

1. දුක්ඛ දුක්ඛතා (සාමාන්‍ය දුක)
2. විපරිණාම දුක්ඛතා (වෙනස් වීමේ දුක)
3. සංඛාර දුක්ඛතා (ඇතිවීම නැතිවීම හේතුවෙන් හටගන්නා දුක)

දුක්ඛ දුක්ඛතා හෙවත් සාමාන්‍ය දුක යනු සත්ත්වයා සාමාන්‍ය ජීවිතයේ දී මුහුණ දෙන දුක් සහගත, අප්‍රසන්න, අමිහිරි, අසහනකාරී, අතෘප්තිකාරී, වේදනාකාරී, කලහකාරී, ක්‍රෝධය ඇතිකරවන ගැටුම්කාරී, කායික හා මානසික අත්දැකීම් ය. දුකෙහි පවත්නා මෙම තත්ත්වය විස්තර කෙරෙන්නේ ඉපදීම, වයසට යෑම, අසනීප වීම, මිය යෑම, අප්‍රියයන් හා එක් වීම, ප්‍රියයන්ගෙන් වෙන් වීම, කැමති දේ නොලැබීම යනුවෙනි. මෙම කරුණු සහ ඒ හා සම්බන්ධ අනෙකුත් අප්‍රසන්න සියල්ල දුක් ලෙස තේරුම් ගත හැකි ය.

**විපරිණාම දුක්ඛතා හෙවත් වෙනස් වීමේ දුක** නම් සියල්ල අනිත්‍ය බැවින් නිරතුරුව වෙනස් වන බව යි. එසේ වෙනස්වීම හේතුවෙන් ඇතිවන අප්‍රසන්න තත්ත්වය විපරිණාම දුක්ඛ නම් වේ. සත්ත්වයාගේ උප්පත්තිය මරණයෙන් ද යෞවනය මහළු වීමෙන් ද නිරෝගී බව රෝගී වීමෙන් ද අවසන් වේ. එසේ සිදුවන වෙනස් වීම විපරිණාම දුක්ඛ නම් වේ.

**සංඛාර දුක්ඛතා හෙවත් සංස්කාර දුක** නම් ඇතිවීම නැතිවීම හේතුවෙන් හටගන්නා දුකයි. හේතු ප්‍රත්‍යයෙන් ඇතිවන සියල්ල සංඛාර හෙවත් සංස්කාර නම් වේ. ලොව පවත්නා සියල්ල මෙන් ම මිනිසාගේ යහපත් සහ අයහපත් කායික, වාචසික සහ මානසික ක්‍රියා ද සංස්කාර වේ. අප රැස් කරන කුසලාකුසල කර්මයෝ ද සංස්කාරයෝ ය. එමගින් නැවත නැවත ඉපදී සසර දුක් විඳීමට හේතුවන බැවින් කර්ම ද සංස්කාර දුක් ගණයට වැටේ. ඒ අනුව සත්ත්වයා මෙන් ම සත්ත්වයාගේ පැවැත්ම ද සංස්කාර සමූහයක් වේ. එබැවින් මෙම සංස්කාර ධර්ම ද දුක් වේ.

බුදුරජාණන් වහන්සේගේ දුක පිළිබඳ අවසන් පැහැදිලි කිරීම වන්නේ, "**සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා**" යන්න යි. එමගින් පැහැදිලි කෙරෙන්නේ කෙටියෙන් කිවහොත් පඤ්ච උපාදානස්ඛන්ධය ම දුක් සහිත බව යි. සත්ත්වයාගේ පැවැත්ම ඇතිවන්නේ මෙම පඤ්චස්ඛන්ධය දැඩි ලෙස උපාදානය කිරීමෙන් හෙවත් අල්ලා ගැනීමෙනි. මෙම ස්කන්ධ පහ පිළිබඳ උපාදානය ඇතිතෙක් සත්ත්වයා දුකෙන් නිදහස් නොවේ. මේ දුක්ඛාර්ය සත්‍යය යි. එය පිරිසිඳ දත යුතු ය.

## දුක්ඛ සමුදයාර්ය සත්‍යය

රෝගයට රෝග නිදානය මෙන් දුකට එය ඇතිවීමට හේතුව සමුදය නම් වේ. දුක ඇතිවීමට හේතුව ලෙස බුදු දහමේ ඉගැන්වෙන්නේ තණ්හාවයි. තණ්හා යන වචනයෙහි අර්ථය වන්නේ පිපාසය යන්න යි. කාමය සඳහා නොසන්සිඳෙන පිපාසය තණ්හා නම් වේ. දුක්ඛ සමුදයාර්ය සත්‍යය දම්සක් පැවැතුම් සූත්‍රයේ විස්තර කෙරෙන්නේ මෙසේ ය.

**ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛ සමුදයං අරියසච්චං යායං තණ්හා**
**පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී සෙය්‍යථීදං?**
**කාම තණ්හා භව තණ්හා විභව තණ්හා**

මේ අනුව තණ්හාව දුකට හේතු වන්නේ කාරණා තුනක් නිසා බව කියවේ.

1. පොනොභවිකා - පුනර්භවය ඇතිකරන ස්වභාවය
2. නන්දිරාගසහගතා - සිත කාමයෙන් හෝ භවයන්හි ඉපදීමෙන් කුල්මත්වන, ඉල්පෙන, ඇලෙන ස්වභාවය.
3. තත්‍රතත්‍රාභිනන්දිනී - ඒ උපන් භවයෙහි හෝ රූප ශබ්ධ ආදී අරමුණෙහි සිත ඇලෙන ස්වභාවය.

මේ නිසා තණ්හාව සත්ත්වයාට දුක් ඉපදවීමට හේතුවේ. සත්ත්වයා කම්සැප විඳීමට ආසා කරයි. සසර භවයෙන් භවය ඉපදීමටත් ආසා කරයි. සමහර විට සමහර කෙනෙක් නොඉපදීමටත් කැමති ය. ඒ ඒ සත්ත්වයන්ගේ විවිධ අදහස් අනුව තණ්හාව තුන් ආකාර වේ.

1. කාම තණ්හා - **ඇස, කන, නාසය, දිව, ශරීරය හා මනස යන ඉන්ද්‍රියන්ගෙන් ගනු ලබන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ධර්ම යන අරමුණු කෙරෙහි ඇති ආශාව කාම තණ්හා වේ.**

2. භව තණ්හා - **භවය හෙවත් පැවැත්ම කෙරෙහි ඇති ආශාව භව තණ්හා නම් වේ. කාම භව, රූප භව, අරූප භව යනුවෙන් පැවැත්මේ ආකාර තුනක් වේ. ඒවායේ පැවැත්ම පිළිබඳ ඇති ආශාව තණ්හාවේ මූලික ස්වභාවය යි.**

3. විභව තණ්හා - **නොපැවැත්ම පිළිබඳ ඇති ආශාව විභව තණ්හා නම් වේ. පරලොවක් නැත යන පිළිගැනීම මත මෙලොව හැකි තාක් පස්කම් සැප විඳීමේ ඇති ආශාව විභව තණ්හාව වේ.**

මේ අනුව තණ්හා තුනෙන් කුමන තණ්හාව වුවත් සත්ත්වයාට නැවත නැවත ඉපදීමට හේතුවන බැවින් ද එතැන් සිට සියලු දුක් විඳීමට හේතුවන බැවින් ද දුක්ඛ සමුදයාර්ය සත්‍ය නම් වේ. මෙම දුක්ඛ සමුදයාර්ය සත්‍යය ප්‍රහාණය කළ යුතුය දුරු කළ යුතු ය.

## දුක්ඛ නිරෝධාර්ය සත්‍යය

දුකෙහි ඇතිවීම, දුකෙන් නිදහස් වීම, තෘෂ්ණාවේ කිසිවක් ඉතිරි නොකොට සහමුලින් ම නැති කිරීම නිවන හෙවත් නිර්වාණය නම් වේ. ලෝකය දුක මත පිහිටා ඇති බවත් එයට මූලික හේතුව මිනිස් සිත තුළ පවත්නා අසීමිත ආශාව බවත් පෙන් වූ බුදුන් වහන්සේ එම දුකින් අත්මිදීම, නිදහස් වීම දුක්ඛ නිරෝධාර්ය සත්‍යය ලෙස හෙළිකොට වදාළහ. දම්සක් පැවැතුම් සූත්‍රයේ දුක්ඛ නිරෝධාර්ය සත්‍යය විස්තර කෙරෙන්නේ මෙසේය.

**"ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛ නිරොධං අරියසච්චං යො**
**තස්සායෙව තණ්හාය අසෙස විරාග නිරොධො චාගො**
**පටිනිස්සග්ගො මුත්ති අනාලයො"**

තෘෂ්ණාව ඉතිරි නොකොට ඉවත් කිරීම, අත්හැරීම මුළුමනින් ම ඉවත දැමීම ඉන් මිදීම හා එහි නොඇලීම නිරෝධය යි. එය ම විරාගය ලෙස ද දැක්වෙයි. රාගය යනු ඇලීමයි. විරාගය යනු නොඇලීමයි. එය ම ත්‍යාගය හෙවත් අත්හැරීම ලෙස ද දැක්වෙයි. එය සැබෑ නිදහස ය. සියලු දුක්වලින් නිදහස් වීම ය. ගසක මුල ශක්තිමත් ව තිබේනම් මැදින් කපා දැමුව ද නැවත ලියලයි. නැවත හට නොගැනීමට නම් එම ගසෙහි මුල උදුරා දැමිය යුතු ය. එමෙන් ම තෘෂ්ණාව මුලිනුපුටා දැමීමෙන් සසර ගමන අවසන් කළ හැකි ය. නිවන් අවබෝධ කළ හැකි ය.

මේ අනුව දුක්ඛ නිරෝධය යනු නිර්වාණය යි. නිරෝධ යන්නෙහි අර්ථය නැති කිරීමයි. නැසීමයි. නැති කරන්නේ නසන්නේ තෘෂ්ණාවයි. වෛද්‍යවරයා රෝගියාගේ රෝග නිදානය සොයා එයට පිළියම් කරයි. එවිට රෝගය නැතිව යයි. එසේම දුකට හේතුව වූ තෘෂ්ණාව නැතිකළ විට දුක ද නැතිව යයි. හේතුවක් නිසා යමක් හටගත්තේ නම් ඒ හේතුව නැති කල්හි එම හටගත් දේ නැතිවන්නේ ය. යනු බුද්ධ දේශනාවයි. **(හෙතුං පටිච්ච සම්භූතං හෙතු භංගා නිරුජ්ඣති)** ඒ අනුව නිරෝධ හෙවත් නිවන යනු නැවත නොඉපදීමයි. නැවත ඇති නොවීමයි.

මුං ඇටයක් වැනි බීජයක් තම්බාගත් විට එහි බීජ ශක්තිය නැතිවේ. නැවත පැල නොවේ. නිරෝධය ද එසේ ය. තණ්හා බීජය නැති කළ විට නැවත නූපදියි. "**තෙ ඛීණ බීජා අවිරූළ්හිච්ඡන්දා**" කීවේ ඒ නිසා ය. නිරෝධ හෙවත් නිවන තවත් තැනක ඉපදීමක් නොවේ. මෙහිදී ම නිවී යාමකි. පහණක් තිරය හෝ තෙල් හෝ ඒ දෙකම හෝ අවසන් වූ විට නිවී යන්නේ ය. එසේම රහතන් වහන්සේ ද නැවත ඉපදීමේ තණ්හාව නැතිවිට මෙහිදී ම නිවෙන්නේ ය. "**නිබ්බන්ති ධීරා යථායං පදීපො**" යයි වදාළේ ඒ හෙයිනි. මේ දුක්ඛ නිරෝධාර්ය සත්‍යය තමා විසින් ම සාක්ෂාත් කළ යුතු ය. ප්‍රත්‍යක්ෂ කළ යුතු ය. "**පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති**" යනුවෙන් වදාළේ ද එයයි.

## දුක්ඛ නිරෝධ ගාමිණිපටිපදාර්ය සත්‍යය

සසර දුකින් මිදී නිවන් අවබෝධ කිරීමට අනුගමනය කළ යුතු මාර්ගය වන්නේ දුක්ඛ නිරෝධ ගාමිණිපටිපදාර්ය සත්‍යය යි. එය ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෙස ද මැදුම් පිළිවෙත ලෙස ද දැක්වේ. දුක්ඛ නිරෝධ ගාමිණිපටිපදාර්ය සත්‍යය ආර්ය අෂ්ටාංගික මාර්ගය ම වන බැව් දම්සක් පැවතුම් සූත්‍රයේ සඳහන් කෙරෙන්නේ මෙසේ ය.

**''ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛ නිරොධ ගාමිණී පටිපදා අරියසච්චං<br>අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො සෙය්‍යථීදං, සම්මා දිට්ඨි,<br>සම්මා සංකප්පො, සම්මා වාචා, සම්මා කම්මන්තො, සම්මා ආජීවො,<br>සම්මා වායාමො, සම්මා සති, සම්මා සමාධි.''**

**1. සම්මා දිට්ඨි**

සම්මා දිට්ඨි යනු යහපත් දැකීම හෙවත් සත්‍ය අවබෝධය යි. චතුරාර්ය සත්‍යය පිළිබඳ ඤාණය සම්මා දිට්ඨිය යි.

**2. සම්මා සංකප්ප**

සම්මා සංකප්ප යනු යහපත් කල්පනාව යි. පස්කම් සැපතින් නික්මීම (නෙක්කම්ම සංකප්ප) අනුන් නැසීමෙන් වැලකීම (අව්‍යාපාද සංකප්ප) අනුන්ට හිංසා කිරීමෙන් වැලැකීම (අවිහිංසා සංකප්ප) යන සංකල්පනාවෝ සම්මා සංකප්පය යි.

**3. සම්මා වාචා**

සම්මා වාචා යනු යහපත් වචන භාවිතය යි. වචනයෙන් සිදුවන බොරු කීම, කේලාම් කීම, හිස් වචන කීම හා රළු වචන කීම යන අකුසල් සතරින් වැලැකීම සම්මා වාචා වේ.

**4. සම්මා කම්මන්ත**

සම්මා කම්මන්ත යනු යහපත් ක්‍රියාවල නිරත වීම යි. කයින් සිදුවන වැරැදි වන පරපණ නැසීම, සොරකම, වැරැදි කාම සේවනය යන අකුසල් වැලැකීම සම්මා කම්මන්ත වේ.

**5. සම්මා ආජීව**

සම්මා ආජීව යනු යහපත් දිවිපැවැත්ම යි. සාර්ථක ජීවනෝපායක නිරත වීම යි. අදැහැමි අකුසල පක්ෂයෙහි වැටෙන පාපකාරී ජීවනෝපාය අතහැර දමා දැහැමි ව උපයාගෙන ජීවත්වීම සම්මා ආජීවය යි.

**6. සම්මා වායාම**

සම්මා වායාම යනු යහපත් උත්සාහය යි. නූපන් අකුසල නොඉපදවීමටත්, උපන් අකුසල නැතිකිරීමටත්, නූපන් කුසල් ඉපදවීමටත්, උපන් කුසල් දියුණු කිරීමටත් ගන්නා සතරාකාර උත්සාහය සම්මා වායාම වේ.

**7. සම්මා සති**

සම්මා සති යනු යහපත් සිහිය යි. කායානුපස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව, ධම්මානුපස්සනාව යන සතරාකාර අනුපස්සනා දියුණු කිරීම සම්මා සතිය වේ.

8. සම්මා සමාධි

සම්මා සමාධි යනු යහපත් සමාධිය හෙවත් මානසික එකඟකම යි. ප්‍රථමධ්‍යානය, ද්විතීයධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය යන ධ්‍යාන උපදවා ගැනීම සම්මා සමාධිය වේ.

බුදු දහම ධර්මයක් සහිත විනයකි. හික්මීමේ මාර්ගයකි. එය හැඳින්වෙන්නේ සික්ඛා හෙවත් ශික්ෂා යනුවෙනි. බුදුදහමේ ශික්ෂා තුනකි. අධිශීල, අධිචිත්ත, අධිපඤ්ඤා යනු ඒ ශික්ෂා තුනයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා දිට්ඨි හා සම්මා සංකප්ප යන අංග අධිපඤ්ඤා ශික්ෂාවටත් සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන අංග අධිශීල ශික්ෂාවටත් සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන අංග අධිචිත්ත ශික්ෂාවටත් ඇතුළත් වේ. ඉහත කී ශීලයෙන් සමාධියට ද සමාධියෙන් ප්‍රඥාවට ද ගමන් කළ හැකි ය. එය නිවන් මග යි. දුක්ඛ නිරෝධගාමිණී පටිපදාවයි.

**චතුරාර්ය සත්‍යය හඳුන්වන විවිධ නාම**

| | | | |
|---|---|---|---|
| දුක්ඛාර්ය සත්‍යය | දුක | පරිඤ්ඤෙය්‍ය | පවත්ති |
| දුක්ඛ සමුදයාර්ය සත්‍යය | දුකට හේතුව | පහාතබ්බ | පවත්තනක |
| දුක්ඛ නිරෝධාර්ය සත්‍යය | දුක නැතිකිරීම | සච්ඡිකාතබ්බ | නිවත්ති |
| දුක්ඛ නිරෝධගාමිණී පටිපදාර්ය සත්‍යය | දුක නැතිකිරීමේ මාර්ගය | භාවෙතබ්බ | නිවත්තක |

**ක්‍රියාකාරකම**

01. චතුරාර්ය සත්‍යයේ අංග වෙන වෙන ම ලියා දක්වන්න.
02. තෘෂ්ණාව දුකට හේතුව යි. දුක්ඛ සමුදාර්ය සත්‍ය මගින් පැහැදිලි කරන්න.
03. දුක්ඛ නිරෝධාර්ය සත්‍යය යනු නිවන යි. කෙටියෙන් පැහැදිලි කරන්න.

**පැවරුම**

ඔබට හෝ ඔබ පවුලේ කෙනෙකුට පැන නැගුණු යම් ගැටලුවක් විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යය න්‍යාය යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

### පුහුණුවට

**යථාපි මූලේ අනුපද්දවෙදළ්හෙ - ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති**
**එවංපි තණ්හානුසයෙ අනූහතෙ - නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං**
(ධම්ම පදය - තණ්හා වග්ගය 5 ගාථා)

**කිසියම් ගසක මුල උපද්‍රවයක් නොමැතිව තිබේ නම්, එම ගස කෙනෙක් කැපුවත් නැවත නැවත ලියලයි. එසේ ම තණ්හාවෙන් හා තණ්හාව හා බැඳුණු අනෙක් ක්ලේශයනුත් සම්පූර්ණයෙන් ම නොනසන තාක් මේ සාංසාරික දුක නැවතත් හටගනී.**

27 පාඩම

# භාරතීය බ්‍රාහ්මණ සමාජ ධර්ම

භාරත ඉතිහාසයේ දැනට තහවුරු කරගෙන ඇති ඉපැරණි ම යුගයන් ලෙස මොහෙන්දොජාරෝ - හරප්පා හෙවත් ඉන්දුනිම්න ශිෂ්ටාචාරය හඳුනාගත හැකි ය. එම භාරතීය සංස්කෘතිය ආර්යාගමනයත් සමග සුවිශේෂී පරිවර්තනයකට නතු විය. එහිදී භාරතයේ විසූ මුල් ජනයා අනාර්ය නාමයෙන් හඳුන්වනු ලැබීය. එම ජනතාවගේ සංස්කෘතිය යටපත් කරගෙන පැන නැගුණු ආර්ය සංස්කෘතිය භාරතයේ තහවුරු වන්නට වීය. ඍග්, යජුර්, සාමන්, අථර්වන් යන වේද යුගයන් පසු කරමින් පැමිණි වෛදික සංස්කෘතිය බ්‍රාහ්මණ සංස්කෘතියේ පදනම නිර්මාණය කළේය යන්න විද්වත් මතය යි. මෙහිලා අපගේ විශේෂ අවධානය යොමු වන්නේ ක්‍රි.පූ. හයවැනි (6) සියවසෙහි භාරතයේ ප්‍රචලිතව පැවැති එකී බ්‍රාහ්මණ සමාජ ධර්ම පිළිබඳ අධ්‍යනයකටය.

වේද මන්ත්‍ර පරම නිෂ්ඨාව කරගත් බ්‍රාහ්මණ ඉගැන්වීම් පසු කාලීනව සමාජ නීති බවට පරිවර්තනය වූ බව මනුස්මෘතිය වැනි ග්‍රන්ථ පරීක්ෂා කිරීමෙන් තහවුරු වේ. එපමණක් නොව ඍග් වේදයට පවා පසු කාලීනව කරන ලදැයි සැළකෙන එකතු කිරීම් තුළින් මෙම බ්‍රාහ්මණ සමාජ ධර්ම තහවුරු කිරීමට ඔවුන් සතුව පැවැති අවශ්‍යතාව පසක් කරගත හැකි ය.

ඍග් වේදයෙන් ආරම්භ වන වෛදික සාහිත්‍යය වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් යන සාහිත්‍යය යුග හතරක් පසුකරමින් සංවර්ධනයට පත්වූ බව පොදු පිළිගැනීමයි. බ්‍රාහ්මණ සාහිත්‍යය යුගය වැදගත් වන්නේ බ්‍රහ්මණ සමාජ ධර්ම ස්ථාපනය කිරීමට දරන උත්සාහය නිසා ය. ඒ පිළිබඳ අධ්‍යයනය මූලික වශයෙන්,

1. නිර්මාණවාදය
2. වර්ණ ධර්ම
3. ස්ව ධර්ම
4. ආශ්‍රම ධර්ම
5. ආපද් ධර්ම
6. යාගය
7. උපනයනය

ආදී මූලික ඉගැන්වීම් ලෙස දැක්විය හැකි ය. එම ඉගැන්වීම් පදනම් කරගෙන සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලනික හා ආගමික පසුබිම ද නිර්මාණය වී තිබූ බව පැහැදිළි වේ.

## නිර්මාණවාදය

මිනිසා හා අවට පරිසරය ගහ කොළ සතා සිවුපාවා, ඇළදොළ, ගංගා, මහ මුහුද, ආකාශය, ඉර හඳ, තාරකා ආදීයෙහි වෙසෙන සත්ත්වයන් ඇතුළු සමස්ත විශ්වය කිසියම් බලගතු අයෙකු විසින් මවා පාලනය කරනු ලබයි යන විශ්වාසය නිර්මාණවාදය ලෙස පිළිගැනේ. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව මේ සමස්තයේ නිර්මාපකයා මහා බ්‍රහ්මයාය. ඔහු සියල්ල දක්නා බැවින් සර්ව දර්ශීය. සෑම තැනම පැතිර ඇත. එබැවින් සර්ව ව්‍යාපීය. සෑම අතින්ම යහපත්ය. ඒ නිසා සර්වතෝ භද්‍රය. ඔහු විශ්වයේ කතෘවරයා බැවින් විශ්වස්‍ය කර්තෘ හෙවත් විශ්ව කර්තෘ ය. විශ්වයේ අසහාය මැවුම්කරුවා බැවින් විශ්ව මාපකය. එබැවින් සියල්ල ඔහුගේ වසඟයෙහි පවතී. කිසිවකුටත් එය ඉක්මවා කටයුතු කළ නොහැකිය යන්න නිර්මාණවාදයේ පදනම් වේ. එකී ඉගැන්වීම් මත පදනම්ව වර්ණ ධර්ම ආදී ඉගැන්වීම් සැකසී පවතී.

## වර්ණ ධර්ම

භාරතයේ විසූ ස්වදේශික ජනතාව කළු හමක් සහිත වූහ. ආගන්තුකව එහි පැමිණි ආර්ය ජනයා සුදු හමක් සහිත වූහ. ඒ නිසා ඔවුන් අතර සුදු-කළු වශයෙන් භේදයක් මූලිකව උපන්නේය. එය හමේ පැහැය හෙවත් වර්ණය පදනම් කරගෙන නිර්මාණය වූ බැවින් වර්ණ භේදය ලෙස හැඳින්වීය. නමුත් එයට ආගමික අර්ථයක් ආරෝපණය කිරීම නිසා පසු කාලීනව අද අප අධ්‍යයනය කරන වර්ණ ධර්ම සංකල්පය බිහිවිය යන්න විද්වත් පිළිගැනීමයි. ඍග් වේදයේ 10 වැනි මණ්ඩලයේ (මෙම කොටසේ භාෂා ලක්ෂණ අනුව ද මෙය පසු කාලීන නිර්මාණයක් වශයෙන් සැළකේ) 90 වන පුරුෂ සුක්තයේ දක්වෙන පරිදි බ්‍රාහ්මණ වර්ණ ධර්ම 4 ක් ඇති බව මෙසේ ප්‍රකාශ වේ.

> බ්‍රාහමණොස්‍ය මුඛමාසිද් - බාහු රාජාන්‍යඃ කෘතඃ
> ඌරූ තදස්‍ය යද් වෛශ්‍යං - පද්භ්‍යාම් ශුද්‍රෝ අජායත

අනුපිළිවෙළින් වර්ණ භේදය ලෙස,

| | | |
|---|---|---|
| බ්‍රාහමණ | - | මහා බ්‍රහ්මගේ මුවෙන් උපන් |
| ක්‍ෂත්‍රිය | - | මහා බ්‍රහ්මගේ බාහුවලින් උපන් |
| වෛශ්‍ය | - | මහා බ්‍රහ්මගේ කලවාවලින් උපන් |
| ශුද්‍ර | - | මහා බ්‍රහ්මගේ යටි පතුල්වලින් උපන් |

යනුවෙන් සිවු වර්ණයක් බ්‍රාහ්මණයින් විසින් හඳුන්වාදෙනු ලැබී ය.

මෙහි දී අපගේ අවධානයට ලක්විය යුතු විශේෂ කාරණයක් වන්නේ මුලින් සඳහන් කළ වර්ණ තුන ආර්යයන් වන බවත් ඔවුන්ට කිසියම් ප්‍රමාණයක අයිතිවාසිකම් ප්‍රමාණයක් හිමිව පැවැති බවත්ය. නමුත් බ්‍රාහ්මණ හැඳින්වීමට අනුව **අකර්මණ, අබ්‍රාහ්මණ, අද්වර්යු, ශිෂ්ණදේව** නම් වූ අනාර්යයන් බ්‍රාහ්මණයින්ගේ හතුරන් ලෙස සළකා ඔවුන්ට **දේශපාලන, ආර්ථික, සාමාජික, ආගමික, අධිකරණ** යනාදී ක්ෂේත්‍රයන්හි කිසිදු අයිතිවාසිකමක් හිමි නොවීය. අනාර්යයන් සමාජයෙන් කොන් කොට වෙන් කර තැබීමේ ඊළඟ පියවර වශයෙන් ඔවුහු ස්වධර්ම නමින් ඒ ඒ වර්ණයට අදාළ වෘත්තීන් ද මහා බ්‍රහ්මගේ නියමයන් ලෙස ඉදිරිපත් කළහ. මෙහිදී බමුණන් උත්සහ කළේ සියලු වර්ණයන් අතර තම ආධිපත්‍යය තහවුරු කර ගැනීම ය.

**බ්‍රාහ්මණ ස්වධර්ම**

> **අධ්‍යාපන මධ්‍යයනං - යජනං යාජනං තථා**
> **දානං ප්‍රතිග්‍රහණංචෛව - බ්‍රාහමණානාමකල්පයත්**

- **ඉගැනීම** - **අධ්‍යයනං**
- **ඉගැන්වීම** - **අධ්‍යාපනං**
- **යාග කිරීම** - **යජනං**
- **යාග කරවීම** - **යාජනං**
- **දානය** - **දානං**
- **දන් පිළිගැනීම** - **ප්‍රතිග්‍රහණං**

යන කරුණු බ්‍රාහ්මණයින් විසින් පමණක් සිදු කළ යුතු කටයුතු ලෙස සළකන ලදී. එ බැවින් ඒවා බ්‍රාහ්මණ ස්ව ධර්ම නම් වීය.

**ක්ෂත්‍රිය ස්වධර්ම**

> **ප්‍රජානං රක්‍ෂණං දානමිජ්‍යාධ්‍යනමෙවච**
> **විෂයෙශ් ච ප්‍රශක්තිශ් ච ක්‍ෂත්‍රියස්‍ය සමාසතඃ**

- **ප්‍රජා රක්‍ෂණය** - **ප්‍රජානං රක්‍ෂණං**
- **දන්දීම** - **දානම්**
- **යාග කරවීම** - **ඉජ්‍යා**
- **වේද අධ්‍යන** - **අධ්‍යයනං**
- **කාමයෙහි නොඇලීම** - **විෂයේශ ච ප්‍රශක්තිශ් ච**

යන කරුණු ක්‍ෂත්‍රියයන් විසින් සිදු කළ යුතු කටයුතු ලෙස සළකන ලදී. එබැවින් ඒවා **ක්‍ෂත්‍රිය** ස්ව ධර්ම නම් වීය.

### වෛශ්‍ය ස්වධර්ම

> පශූනං රක්ෂණං දාන - මිජ්‍යාධ්‍යනමෙවච
> වණික් පථං කුසීදඤ්ච - වෛශ්‍යස්‍ය කෘෂිමෙව ච

- පශු රක්ෂණය - පශූනංරක්ෂණං
- දානය - දානං
- යාග කරවීම - ඉජ්‍යා
- වේද අධ්‍යනය - අධ්‍යයනං
- වෙළෙඳාම - වණික් පථං
- මුදල් පොළියට දීම - කුසීදං ච
- කෘෂිකර්මය - කෘෂිං

යන කරුණු වෛශ්‍යයන් විසින් සිදු කළ යුතු කටයුතු ලෙස සළකන ලදී. එබැවින් ඒවා වෛශ්‍ය ස්ව ධර්ම නම්වීය.

### ශුද්‍ර ස්ව ධර්ම

> එකමෙවකු ශුද්‍රස්‍ය ප්‍රභූඃ කර්ම සමාදිශත්
> එතෙෂාමෙව වර්ණානං ශුශ්‍රෑ ෂාධනසූයයා

බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය යන ප්‍රභූ වර්ණවලට කීකරුව දාසකම් කිරීම ම ශුද්‍ර වර්ණයට හිමි එකම ස්ව ධර්මය වීය.

### ආපද් ධර්ම

මෙම වර්ණ ධර්ම හා ස්වධර්ම සංකල්පය තවදුරටත් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉගැන්වීමක් ලෙස ආපද් ධර්ම යන ඉගැන්වීම ගත හැකි ය. ආපදාපන්න අවස්ථාවක දී මෙකී ස්ව ධර්ම වෙනස් කර ගත හැකි ය, යන්න එහි අදහසයි. එනම් ජලගැල්මක්, ලැව් ගින්නක්, සොරසතුරු උවදුරක්, දුර්භික්‍ෂයක් වැනි විපත්ති කර අවස්ථාවක අවරෝහණ ක්‍රමයට ස්ව ධර්ම ඉක්මවා යෑමේ නිදහසයි. බමුණාට තමාට වඩාපහත් වර්ණවල ස්ව ධර්ම ද, ක්‍ෂත්‍රියයාට තමාට වඩා පහත් වර්ණවල ස්ව ධර්ම ද, ද එබඳු අවස්ථාවක තම පැවැත්ම වෙනුවෙන් ක්‍රියාත්මක කළ හැකි ය. නමුත් පහත් වර්ණයකට අයිති වූවෙකුට ඊට වඩා ඉහළ වර්ණයක ස්ව ධර්ම ක්‍රියාවට නැඟිමේ අවකාශයක් නොලැබෙන බව මෙහිදී අවධාරණය කෙරේ.

### ආශ්‍රම ධර්ම

තවත් බ්‍රාහ්මණ ඉගැන්වීමක් ලෙස ආශ්‍රම ධර්ම පිළිබඳ මතය දැක්විය හැකි ය. ඒ

අනුව උපතේ සිට මරණය දක්වා පුද්ගල ජීවිතය ගත කළ යුතු ආකාරය ආශ්‍රම ධර්ම මඟින් ඉගැන්වෙයි. එනම්,

**බ්‍රහ්මචාරී - ශිෂ්‍ය අවධිය**

බ්‍රහ්මචාරී ව පිරිසිදු ජීවිතයක් ගතකරමින් වේදවේදාංග ප්‍රධාන කරගත් ශිල්ප ශාස්ත්‍ර හැදෑරීම.

**ගෘහස්ථ - තරුණ අවධිය**

විවාහකව දූ පුතුන් ලබමින් , පස්කම් සුව විඳිමින්, යාග විධි ආදී ආගමික වතාවත් පැවැත්වීම. මව්පියන් අඹුදරුවන් පෝෂණය කිරීම ආදී ගිහි ජීවිතයේ කටයුතුවලින් තෘප්තිමත් විම.

**වානප්‍රස්ථ - මැදිවිය**

තරුණ වයස ඉක්මවායත්ම ලෞකික සැප සම්පත් අත්හැර වන ගතව තාපස ජීවිතයක් ගත කිරීම.

**සන්‍යාසි - මහළු විය**

සම්පූර්ණයෙන් ම ආගමික, අල්පේච්ඡ, නිෂ්කාමී සංචාරක ජීවිතයක් ගත කරමින්, ආගමික වතාවත් ඉටුකරමින් නිදහස්ව විවේකීව කටයුතු කිරීම, මරණයට සූදානම් වන කාලසීමාව වශයෙන් එකී ආශ්‍රම ධර්ම පිළිබඳ ඉගැන්වීම් දැක්විය හැකි ය. කාලිදාසයන් රඝුවංශයෙහි සඳහන් කරන පරිදි,

- **ශෛෂවේභ්‍යස්ථ විද්‍යානාම්** - සිසු අවධියේ ඉගෙනීම - **බ්‍රහ්මචාරී**
- **යෞවනෙවිෂයෙෙෂිනාම්** - යොවුන් වියේ කම් සැප විඳීම - **ගෘහස්ථ**
- **වාර්ධකෙ මුනිවෘත්තිනාම්** - වැඩිහිටිවියේ දී තාපස චර්යාව - **වානප්‍රස්ථ**
- **යෝගෙනාන්තේ තනුත්‍යජම්** - සැදෑ සමයේ දී ත්‍යාගය - **සන්‍යාසි**

වශයෙන් දක්වා තිබේ. මේ අනුව පුරාතන භාරතීය සමාජය බ්‍රාහ්මණ ඒකාධිකාරයක් ඔස්සේ සකස්ව පැවති බව පැහැදිලිය. බුදුරදුන්ගේ පහළවීමත් සමග මෙම තත්ත්වයෙහි පූර්ණ වෙනසක් සිදු වුණි. ඒ ජනතාව ආර්ය මාර්ගයට යොමු වීම නිසයි.

**අභ්‍යාසය**

01. බුද්ධකාලීනව වාසය කල බමුණන් පස්දෙනෙක් නම්කරන්න.
02. බ්‍රාහ්මණ සමාජය පිළිබඳ තොරතුරු රැස්කර වාර්තාවක් ලියන්න.

28
පාඩම

# බුදු ශාසනික ව්‍යාප්තිය

ජීවිතය, සංසාරය, ලෝකය, විමුක්තිය, මෝක්ෂය පිළිබඳ උද්‍යෝගයක් එකල පැවැතුණි. ඒ පිළිබඳ විවිධ දර්ශනවාද පිළිවෙත් ඉදිරිපත් වී තිබුණි. ඒවා කිසියම් අන්තයකට යොමු වූ දෘෂ්ටිවාදයන් විය. ශාස්වත - උච්ඡේද ආදි අන්තවාදවලට නොවැටී සසර දුක නැති කිරීම පිණිස දේශිත නැවුම් දහම් මග පිළිබඳ පළමු දේශනය ධම්මචක්ක පවත්තන සූත්‍රය නමින් හැඳින්වේ. ධම්චක්ක සූත්‍රය යනු අනන්ත සසර පුරා කරන ලද පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස අවබෝධකරගත් ජීවිතයේ යථාර්ථය පැහැදිලි කරන දහමයි. එකී දම්සක් පැවැතුම් දෙසුම අවසන කොණ්ඩඤ්ඤ භික්ෂූන් වහන්සේ ධර්මය අවබෝධ කරගත්තේය. අනෙක් භික්ෂූන් වහන්සේලාට එය අවබෝධ කරවීමට දින ගණනාවක් ගත වී තිබේ. පළමුව තුන් නමක් පිණ්ඩපාතයේ යවා දෙනමකට දහම් මග පැහැදිලි කළ සේක. තුන්නම රැගෙන පැමිණි පිණ්ඩපාතයෙන් බුදුරදුන් ප්‍රමුඛ හය නම ම යැපුණි. පසු දින දහම් ඇසූ දෙනම පිණ්ඩපාතයේ යවා අනෙක් තුන්නමට දහම් මග පැහැදිලි කළ සේක. බොහෝ දෙවි දේවතාවන්ට ද ධර්මාභිසමය වූයේ ය. තවදුරටත් බුදු දහමේ විශේෂත්වය පැහැදිලි කොට වදාළ බුදුරජාණෝ අනත්ත ලක්ඛණ සූත්‍රය දේශනා කළ හ. ඒ දෙසුම කෙළවර පස්වග භික්ෂුහු රහත් බව ලැබූහ. බුදු සසුනේ පැවිද්ද ඉල්ලා සිටි උන්වහන්සේලා එහි භික්ඛු භාවයෙන් පැවිද්ද ලැබූහ. එය නිර්මල බුදු සසුනේ අරඹුමයි.

එකල ලෞකික ජීවිතය හා භෞතික සැපසම්පත් පිළිබඳ කළකිරි සිටි බොහෝ පිරිසක් විමුක්තිය පිණිස උනන්දු වූහ. බරණැස සිටුවරයාගේ එකම පුත්‍රයා යස නම් විය. ඔහු ද එවැන්නෙකි. හෙතෙම ද බුදුරදුන්ගේ මග පෙන්වීම අනුව ධර්මාවබෝධය ලැබීය. තම එකම පුතු සොයමින් පැමිණි පිය සිටුතුමා බුදුරදුන් වෙත පැමිණියේය. එහි දී එතුමාට දෙසූ ධර්මය ශ්‍රවණය කොට යස කුමරු රහත් බව ලැබූ අතර යස තෙරණුවෝ එහි භික්ඛු භාවයෙන් මහණ උපසම්පදාව ලැබීය. තම අතිජාත මිත්‍රයා සියලු සැප සම්පත් අතහැර කෙස් රැවුළු කපාදමා සිවුරු හැඳ පොරවා මහණ වූ බව අසා ඔහුගේ ගිහිකල යහළුවන් වූ විමල, සුභාහු, පුණ්ණජි, ගවම්පති යන සිවුදෙනා ද උන්වහන්සේ සොයා ආහ. ඔවුහු බුදුරදුන් වෙත යොමු කරන ලදුව බුද්ධානුශාසනය අනුව හික්මී නොබෝ කලකින් පැවිදිවීමේ අරමුණ ඉටු කර ගත්හ. උන්වහන්සේලාගේ පැවිදි වීම දැනගත් ගිහිකල යහළුවන් පනස් දෙනෙක් එලෙසම ශාසනයට ඇතුළත් වූහ. මෙලෙස ලෝකයේ රහතන් වහන්සේලා හැට එක් නමක් වූහ.

### ධර්මදූත සේවාව

එම පළමු රහත් සැටනම ඇමතූ බුදුරජාණන් වහන්සේ "**චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය**" මහණෙනි, ලොවට අනුකම්පා පිණිස දෙවි මිනිසුන්ගේ හිත පිණිස සුව පිණිස සැප පිණිස චාරිකාවේ හැසිරෙන්න. දෙදෙනෙකු එක මගින් නොයන්න. මුල මැද අග යහපත් වූ අර්ථ සහිත වූ හාත්පසින් සම්පූර්ණ වූ පිරිසිදු ශාසන බ්‍රහ්ම චර්යාව ලොවට ප්‍රකාශ කරන්න යනුවෙන් අනුශාසනා කළ හ.

## පැවිද්ද උපසම්පදාව

පස්වග තවුසන්, යස කුලපුත්‍රයා සහ යහළුවෝ පනස් හතර දෙනා ඒහි භික්ඛු භාවයෙන් මහණ උපසම්පදාව ලබන ලද බව මහාවග්ග පාලියේ සඳහන් වේ. ඒහි භික්ඛු උපසම්පදාව ලබාදිය හැක්කේ බුදුරජාණන් වහන්සේට පමණි. මහවග්ග පාලියේ ම එය මෙසේ සඳහන් වේ. ''මහණෙනි, එන්න ධර්මය මැනවින් වදාරා තිබේ. මැනැවින් දුක් කෙළවර කිරීම පිණිස බ්‍රහ්ම චර්යාවේ හැසිරෙන්න'' යනුවෙනි. එම ප්‍රකාශයත් සමගම ගිහි ලකුණු අතුරුදහන් වී පැවිදි උපසම්පදාවට පැමිණ කසාවත් හැඳ පොරවා අෂ්ට පරිෂ්කාරයෙන් යුක්තව හැටවස් පිරූ මහ තෙර නමක් මෙන් ඉරියව් සම්පන්නව බුදුන් වඳිමින් සිටී යනුවෙන් එය විනය අටුවාවේ විස්තර කොට තිබේ.

පළමු රහත් හැට නම අමතා කළ අවවාදය අනුව දිශා අනු දිශාවන්හි දහම් චාරිකාවේ යෙදුණු භික්ෂූන් වහන්සේලාගේ අනුශාසනාවෙන් ඔදවැඩී ගිය සිත් ඇති අය මහණ උපසම්පදා කරවා ගැනීම සඳහා බුදුරදුන් වෙතම පැමිණ වීමට සිදුවිය. එය පැවිද්ද අපේක්ෂා කරන්නාගේත් දහම් චාරිකාවේ නිරත භික්ෂූන් වහන්සේගේත් වෙහෙස පිණිස හේතු විය. එබැවින් නව පැවිදි උපසම්පදා ක්‍රමයක් හඳුන්වා දීමට සිදු විය.

එහි දී බුදුරජාණන් වහන්සේ ''මහණෙනි, ඔබ දැන් ඒ ඒ දිශාවල ඒ ඒ ජනපදවල ම පැවිදි කරන්න. උපසම්පදා කරන්න'' යනුවෙන් බුදුරදුන් සතුව පැවැති බලය භික්ෂූන් වෙත පවරා දුන්හ. එහිදී ඊට අදාළ ක්‍රමවේදය පිළිබඳ පැහැදිලි කිරීමක් ද සිදු කොට තිබේ. එනම් පළමුව කෙසේ රැවුලු බහා කසාවත් හන්දවා තනිපට සිවුර ඒකාංශ කරවා භික්ෂූන් පා වන්දවා උක්කුටිකයෙන් සිඳුවා ඇඳිලි බන්දවා තිසරණය තුන්වරක් කියවීමෙන් මේ පැවිදි උපසම්පදාව සිද්ධ වේ යනුවෙන් දේශනා කොට තිසරණ ගමනයෙන් පැවිද්දත් උපසම්පදාවත් අනුදැන වදාළහ. රාධ බමුණා උපසම්පදා කරවීම සඳහා ඤත්ති චතුත්ථකම්ම උපසම්පදා ක්‍රමය අනුදැන වදාරණ තෙක්ම එම සරණාගමන උපසම්පදා ක්‍රමය භාවිත විය.

දායාද ඉල්ලමින් බුදුරදුන් වෙත පැමිණි රාහුල කුමරු පැවිදි කරන්නැයි සැරියුත් හිමියන්ට අනුදත් අවස්ථාවේ, ''ස්වාමීනි, රාහුල කුමරු පැවිදි කරන්නේ කෙසේදැයි'' විමසීය. එහි දී කෙස් රැවුල් බහා, කසාවත් හන්දවා, තනිපට සිවුර ඒකාංශ කරවා භික්ෂූන්ගේ පා වන්දවා උක්කුටිකයෙන් හිඳුවා ඇඳිලි බන්දවා තෙවරක් තිසරණය කියවන්නැයි වදාළහ. එය සාමණේර පැවිද්දේ ආරම්භය යි. පසුකාලීනව සාමණේර භික්ෂූන් හික්මවීමට සාමණේර දස සීලය, සේඛියා ආදී ශික්ෂා පද මෙන් ම ආචාර්ය උපාධ්‍යාය සම්මුතිය ආදී වත් පිළිවෙත් ද අනුදැන වදාරා තිබේ.

## භික්ෂුණී ශාසනය

භික්ෂු සංස්ථාව ආරම්භ කිරීමේදී පස්වග තවුසන් සොයා ගොස් ඔවුන්ට ධර්මයෙන් සංග්‍රහ කළ බුදුපියාණන් පැවිද්ද හා උපසම්පාව ඉල්ලූ ඔවුන්ට එක්වරම එය ලබාදුන්හ. එහෙත් හිසමුඩු කොට කසාවත් හැඳ පොරවාගෙන කාන්තා පැවිද්ද ඉල්ලා සිටි භික්ෂුණීන්ට එය ලබාගත හැකිවූයේ විශාල පරිශ්‍රමයකින් පසුවය. එහිදී ආනන්ද හිමියන්ගේ මැදිහත්වීම

ඉතා ඉහළ ය. අෂ්ට ගරුධර්මවලට යටත්ව භික්ෂුණී ශාසනය ආරම්භ කිරීමේදී සමකාලීන සමාජය තුළ කාන්තාව සම්බන්ධයෙන් පැවති ආකල්පය බලපාන්නට ඇත. (අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ පෙත්තමී සූත්‍රයේ භික්ෂුණී ශාසනයේ ආරම්භය පිළිබඳ තොරතුරු ඇතුළත් වේ).

## විහාරාරාම පිළිගැනීම

මුල් කාලයේ බෞද්ධ භික්ෂු සංඝයා අවවාදයෙන් ම පමණක් හික්මුණු පිරිසකි. බුදුරදුන් භික්ෂු ශාසනය ආරම්භ කිරීමේ දී සමකාලීන පැවිදි සම්ප්‍රදායයන් ද සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප නොකළහ. හිස මුඩු කිරීම, පිණ්ඩපාතයෙන් යැපීම, සංචාරක ජීවිතය, රුක්මුල් සෙනසුන් හි වාසය කිරීම වැනි අංග බෞද්ධ භික්ෂු සංඝයා විසින් ද අනුගමනය කිරීමෙන් ඒ බව සනාථ වේ.

බුද්ධ ශාසනයේ පළමු ආරාම පූජාව සිදුවූයේ බුදුරජාණන් වහන්සේ පළමුවරට රජගහනුවරට වැඩි අවස්ථාවේ දී ය. එදින බිම්බිසාර රජතුමා තම රජ උයන වූ වේළුවනය බුද්ධ ප්‍රමුඛ සංඝරත්නයට පූජා කළේ ය. එදිනම ''**අනුජාමි භික්ඛවෙ ආරාමං**'' යනුවෙන් භික්ෂූන් වහන්සේලාට ආරාම පූජාව අනුදන වදාළ බව මහාවග්ග පාලියේ මහා ඛන්ධකයේ සඳහන් වේ. බිම්බිසාර රජතුමා සිදුකළේ බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාගේ වාසය සඳහා භූමිය පූජා කිරීමයි. 'ආරාම' යන්නෙන් කියැවෙන්නේ ද එවැනි උද්‍යාන පිළිබඳ ව ය. විහාර ගොඩනැගිලි පූජා කිරීම සහ ඒ පිළිබඳ අනුමැතිය ලැබෙන්නේ තවත් කල් ගතවීමෙන් පසුවය. ඒ පිළිබඳ පළමු පුවත සඳහන් වන්නේ චුල්ලවග්ග පාලියේ සේනාසනක්ඛන්ධකයේ ය. එහි සඳහන් වන පරිදි, දිනක් රජගහ නුවර සිටුතුමා කිසියම් කටයුත්තක් සඳහා ගමන් කරන විට පිදුරු ගොඩවල්වලින්, කුඹල්හල්වලින්, රුක්මුල් සෙනසුන්වලින් බැහැරට වඩින භික්ෂුන් වහන්සේලා දුටුවේය. දැක ඔබවහන්සේලාට ස්ථිර ආරාම සාදා පූජා කළහොත් පිළිගන්නේ දැයි විමසීය. එවැන්නක් බුදුරජාණන් වහන්සේ අනුදැන නැති බව භික්ෂූන්ගේ පිළිතුර විය. එසේ නම් බුදුරදුන්ගෙන් විමසා කියන්නැයි කී සිටුතුමා තම කාර්යය සඳහා පිටත්වීය. වෙනත් දිනක බුදුරදුන් හමු වූ භික්ෂූන් වහන්සේලා ඒ පිළිබඳ විමසා සිටියහ. එහි දී බුදුරදුන් විසින් භික්ෂූන්ට නිවාස වර්ග පහක් කැපයැයි අනුදැන වදාළහ. එනම් විහාර, අඩ්ඪයෝග, පාසාද හම්මිය හා ගුහා යනුයි. මෙහි සඳහන් විහාර යනු දැව හා කොළ අතුවලින් සැකසුණු පර්ණශාලා හෙවත් පන්සල් නමින් හැඳින්වුණු කුටි විශේෂයකි. අඩ්ඪයෝග යනු ගුරුළු පක්ෂියෙකුගේ ආකාරයට තනන ලද විහාරයකට වඩා විශාල වූ ප්‍රාසාදයකට වඩා කුඩා ඉදි කිරීමකි. පසාද යනු විශාල මහල් ගොඩනැගිලිය.

හම්මිය යනු ඉහළ මහලේ කූටාගාරයක් සහිත ගොඩනැගිල්ලකි. ගුහා යනු ස්වභාවික ගුහා හෝ කෘතිම වශයෙන් තනන ලද ගුහාය.

## විනය නීති පැනවීම.

භික්ෂු ශාසනය ආරම්භ කළ යුගයේ එයට ඇතුළත් වූ බොහෝ දෙනා නිර්වාණාවබෝධය පිණිස ම මහණ උපසම්පදාව ලැබුවෝ වූහ. බුදුරදුන් විසින් එක් වේලක් වැළඳීමේ ආනිශංස පැහැදිලි කළ කල්හි භික්ෂූහු ද ඒ අනුව හික්මුණහ. මුල්

කාලයේ භික්ෂූන් වහන්සේ හික්මීම සඳහා ඕවාද ප්‍රාතිමෝක්ෂය මගින් උපදෙස් දුන්හ. එනම් ඛන්තී පරමං තපො ... යනා දී ලෙස කියැවෙන්නේ ''ඉවසීම උතුම් තපසයි. නිවන සියල්ලට වඩා උතුම් යැයි බුදුවරු වදාළහ යනුවෙනි. පර ඝාතනය, පර විහෙඨනය ඇති තැන මහණකමෙක් ද නැත. සියලු පව් නොකළ යුතු ය. කුසල් වැඩිදියුණු කළ යුතු ය. සිත පිරිසිදු කළ යුතු ය. අනුනට උපවාද නොකිරීම ද, අනුන් ගුණ නොනැසීම ද ප්‍රාතිමෝක්ෂ සංවරය ද භෝජනයේ පමණ දැනීම ද, විවේක සේනාසනයෙහි ඇලුම් කිරීම ද, සමාධිය වැඩීමද බුදුරදුන්ගේ අනුශාසනය වේ'' එවැනි අවවාද මාත්‍රයකින් හික්මුණු භික්ෂූන් වහන්සේලා ඉතා කුඩා වරදෙහි පවා බිය දක්නා සුළුව තිදොර සංවර කරගෙන සිව් පසයෙහි යථාලාභ සන්තුෂ්ටියෙන් කටයුතු කළ නිසා තත්කාලීන භික්ෂු සමාජය ඉතා ප්‍රසන්න වූ බව බුදුරදුන් විසින් පසු කලෙක දී "මුල් කාලීන භික්ෂූන් තමාගේ සිත් සතුටු කරවූයේ යැයි" ප්‍රකාශ කිරීමෙන් සනාථ වේ.

එසේ වුවත් එම තත්ත්වය දිගටම නොපැවතුණි. බුද්ධත්වයෙන් මුල් විසිවස ඉක්ම ගිය පසු විනය නීති පැනවීම ඇරඹිණ. එතැන් සිට සම්බුද්ධ පරිනිර්වාණය දක්වාම නීති පැනවීම, අනුනිති පැනවීම, නීති අහෝසි කිරීම, සංශෝධනය කිරීම සිදු වී තිබේ. සාරිපුත්ත හිමියන් විනය නීති පනවන්නයැයි ආරාධනා කළ අවස්ථාවේ ආසවට්ඨානිය ධර්ම ශාසනය තුළ පහළවන තෙක් විනය නීති නොපනවන බව දේශනා කොට ඇත. ඒ අනුව සනාථ වන්නේ ශාසනය තුළ අර්බුද පහළ වූ අවස්ථාවන්හිදී ඒවා නිරාකරණය කර ගැනීම උදෙසා විනය නීති පැනවූ බවයි. එලෙස නීති පැනවීමට හේතු වූ කරුණු පිළිබඳ ව ද විනය මූලාශ්‍රවල සඳහන් වී තිබේ. පාරාජික පාළියෙහි

1. **සසුනෙහි පැවිද්දෙන් බොහෝ කල්ගෙවූ භික්ෂූන් බහුලවීම.**
2. **සසුනෙහි භික්ෂු පිරිස බහුල වීම.**
3. **භික්ෂූන්ට ලැබෙන ලාබ සත්කාර බහුලවීම**
4. **භික්ෂූන් අතර උගතුන් බහුලවීම.**

යන හේතු සාධක නිසා විනය නීති පැනවූ බව සඳහන් වී තිබේ. බුදුරජාණන් වහන්සේගේ මෙබඳු දුරදක්නාසුලු ක්‍රියාමාර්ග සම්බුද්ධ ශාසනය වඩාත් ආලෝකමත් කිරීමට මෙන්ම බොහෝ කලක් පැවතීමට ද හේතු විය. මෙම කරුණු පරිශීලනය කිරීමෙන් එම ස්වභාවය මැනවින් වටහාගත හැකි ය.

**පැවරුම**

01. බුද්ධත්වයෙන් පසු සිදු වූ ශාසනික ව්‍යාප්තිය හා අදාළ සිදුවීම් පියවරෙන් පියවර ගොනුකොට පෙන්වා දෙන්න.

29 පාඩම

# සසුන් කෙත වපුරමු

**අනු පුනප්පුනං මොදියතෙ පමොදියතෙති අනුමොදනා** යනුවෙන් විනයාලංකාර ටීකාව අනුමෝදනා පාද විග්‍රහය සිදු කරයි. ඉන් අර්ථ ගැන්වෙන්නේ දානාදී පින්කමක් සිදුකර ඒ ගැන සිත සිතා නැවත නැවත සතුටුවීමයි. වඩවඩාත් සතුටුවීමයි. මෝදන (මොදති) මෙහි අනු යන උපසර්ගය යොදා ඇත්තේ නැවත නැවත සතුටු වෙයි, යන අදහස ලබා දීමට ය. එය එසේ නම් දානාදී පින්කම් කළ ඇත්තන්ගේ සතුට වඩවන පිණිස පවත්වන ධර්ම කතාවට ද අනුමෝදනා යැයි කියනු ලැබේ.

උපසපන් භික්ෂූන් වහන්සේලා විසින් උගත යුතු, පුරුදු පුහුණු කළ යුතු දහම් වශයෙන් දේශිත අනුමෝදනා දේශනා තුනක් ගැන අටුවා ටීකාවල සඳහන් වේ. ඉන් පළමුවැන්න සාංඝික දානාදියෙහි කළයුතු දානානිසංස දේශනාවයි. ඒ සඳහා ඛුද්දක පාඨයේ එන නිධිකණ්ඩ සූත්‍ර ආදිය උගත යුතු ය. දෙවැන්න ගෙට ගෙවැදීමේ ආදී මංගල කටයුතු අවස්ථාවන්හි දී කළයුතු දේශනාවන් ය. ඒ සඳහා මංගල සූත්‍ර ආදිය උගත යුතු ය. තෙවැන්න මරණයක් මතක බණක් හෝ මතක දානයක් අවස්ථාවක දී කළයුතු දේශනාවන් ය. ඒ සඳහා තිරොකුඩ්ඩ ආදී සූත්‍ර උගත යුතු යනු පුරාණාචාර්යයන්ගේ මතයයි. මේ අනුව පුරාණ කාලයේ පැවිද්දට පිවිසි නවකයන්ට ත්‍රිවිධ අනුමෝදනාව ඉගැන්වීම සිරිතක් ව පැවතුනි.

### අනුමෝදනා දේශනාවක කාර්යය සහ එහි අංග

1. අනුමෝදනා වචනයෙන්ම පැවසෙන පරිදි අනුමෝදනා ධර්මකතාවකින් පළමුකොටම සිදුවිය යුත්තේ දායකයන්ට කරන හෝ කළ පින්කම ගැන සිතා බලා සතුටු විය යුතු ආකාරය කියාදීමයි. මන්ද යත් ''**මනසා චෙ පසන්නෙනන භාසති වා කරොති වා**'' යනාදී දේශනාව අනුව කුසල කර්මයක් මහත්ඵල මහානිසංස වන්නේ එය කරන අවස්ථාවේ සිතේ පවතින පිරිසිදු භාවය මතය. අනෙක් අතට එසේ සතුටු වීමට කරුණු කියාදීමෙන් කිසියම් වූ අඩුපාඩුවක් නිසා දායකයාගේ සිතේ යම් කුකුසක් ඇති වී නම් එය දුරු වී යයි.

2. පින්කමෙහි නිමිත්ත පෙන්වාදීම ඊළඟ වැදගත් අවස්ථාවයි.

3. දායකයන්ගේ සිත් තුළ ශ්‍රද්ධාව මතු කිරීම හා තහවුරු කිරීම ඊළඟ වැදගත් අවස්ථාවයි. මන්ද යත්, සෑම පින්කමක්ම සිදුකරන්නේ තෙරුවන් සිහිකර ගෙන ය. තෙරුවන් ගුණ දැන පින්කම් කළ තරමට සිත සැදැහැයෙන් බරවෙයි. එමගින් නීවරණ තුනී වී යයි.

4. දායකයා ගුණ සම්ප්‍රයුක්ත කරවීම මීළඟ අවස්ථාව යි. ඒ සඳහා කර්ම ඵල පිළිබඳ අවබෝධය හා විශ්වාසය ඇතිවන අයුරින් ධර්මානුශාසනාවක් කළ යුතු ය.

5. යම් අයෙක් කිසියම් පින්කමක් සිදුකරන්නේ එයින් ලැබෙන ආනිසංස සලකාගෙන ය. එබැවින් අවසාන වශයෙන් ඒ පින්කමෙන් ලැබෙන විශේෂ ආනිසංස පිළිබඳ අවබෝධය ලබා දීම වැදගත් ය.

මේ අයුරින් පවත්වන අනුමෝදනා වත දායකයා තුළ තම පින්කම පිළිබඳ කුකුසක් හෝ අනවබෝධයක් වී නම් ඒ සියල්ල දුරුවී සෝමනස්ස සහගත කරුණු ඥාන සම්පයුත්ත අසංඛාරික යන අභිධර්මයේ සඳහන් අටමහා කුසල් සිත් හි බලවත්ම කුසල සිත උපදවාලීමට හැකි වන්නේය.

## අනුමෝදනා වත

චුල්ලවග්ග පාලියේ වත්තක්ඛන්ධකයේ දී බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට අනුමෝදනා වතක් ද අනුදැන වදාරා ඇත. එනම් දන්හලේ දී සිදුකරන අනුමෝදනා දේශනාව පිළිබඳ වත යි. එකළ ඇතැම් භික්ෂූන් වහන්සේලා දන්වළඳා දන් දුන් දායකයාට සිත් සතුටුවන කිසිවක් දේශනා නොකර නිහඬවම පිටත්ව යති. මේ පිළිබඳ මහජනයා දොස් පවරන්නට වූහ. එය නිමිතිකොටගෙන බුදුරජාණන් වහන්සේ **''අනුජානාමි භික්ඛවෙ භත්තගෙ අනුමොදිතුං''** යනුවෙන් ''මහණෙනි දන්හලේ දී අනුමෝදනා බණක් ද දේශනා කරන්නට අනුදනිමි'යි වදාළහ. එම අනුමෝදනා බණ දෙසීමේ වගකීම පැවරුණේ වැඩිහිටි මහතෙරුන් වහන්සේට ය. උන්වහන්සේට කිසියම් කටයුත්තක් හෝ අපහසුතාවයක් වේ නම් වෙනත් ධර්ම කථික භික්ෂූන් වහන්සේ නමකට එය පැවරිය හැකි බව ද වදාළහ. එහෙත් දේශනා කරන භික්ෂුවට එය පවරා සෙසු සියලු දෙනා එතැනින් බැහැරට වැඩමවීම නොකළ යුතු ය. අඩුතරමින් සතර පස් නමක්වත් එම දේශනාව අවසන් වනතුරු දන්හලේ වැඩ සිටිය යුතු බව අනුමෝදනා වත පිළිබඳ නියමයේ දී සඳහන් කර ඇත. මෙසේ විනය පිටකයේ වත්තක්ඛන්ධකයේ වත් දහහතර (14) අතරට අනුමෝදනා වත වශයෙන් භුක්තානුමෝදනාව අනුමතකර තිබීමෙන් පැහැදිලි වන්නේ එය සැදැහැතියන්ගේ දන් පිළිගත් භික්ෂූන් වහන්සේලාගේ අනිවාර්ය වගකීමක් ද වන බවයි.

## භුක්තානුමෝදනාවඃ-

දන්හලේ දී පවත්වන අනුමෝදනා දේශනාව භුක්තානුමෝදනාව නමින් ද හඳුන්වනු ලැබේ. ඒ අනුව මීළඟට ඉහත කී අංගයන්ගෙන් සමන්විත සාර්ථක භුක්තානුමෝදනාවන් පවත්වන ආකාරය සළකා බලමු.

> **පුබ්බෙව දානා සුමනො**
> **දදං චිත්තං පසාදයෙ**
> **දත්වා අත්තමනො හොති**
> **එසා යඤ්ඤස්ස සම්පදා**

දන් දීමෙහි සතුටුවිය යුතු අවස්ථා තුනකි. දන් දෙන්නට පෙර ඊට සූදානම් වන කාලය තුළ දී ඒ සඳහා කරන සෑම දෙයක් ම පිරිසිදු සතුටු සිතින් සිදු කළ යුතු ය. දන් පිළිගන්වන අවස්ථාවේ දී යම් අඩුපාඩුවක් වුවත් ඒ සියල්ල අමතක කොට තමාට දානය සංවිධානය කිරීමට ලැබුණු අවස්ථාවෙන් සතුටු වී සතුටු සිතින්ම දානය පිළිගැන්වීම ඉතා වැදගත් ය. පින්කමකදී වඩාත් සතුටුවිය හැකිවීම මෙහි ඇති විශේෂත්වයයි. එමඟින් පින් සිතිවිලි නැවත නැවත පහළ වන්නේ ය. මුදලකට වැල් පොලිය ලැබෙන්නා සේ ඒ කුසලය තව තවත් වැඩි දියුණු වන්නේ ය. එසේ නැවත නැවත සිහිපත් කිරීමෙන් ආචිණ්ණ කර්මයක් ලෙස මරණාසන්න මොහොතේ පවා සිහියට නැගේ.

මෙම අවස්ථාවන්ගෙන් පින්කම සිදුකිරීමට පෙර පහළවන සිතිවිලි පූර්ව චේතනාව නමින් ද, පින්කම කරන සිහිපත්වන හැම විට ම පහළවන සිතිවිලි අපර චේතනා ලෙස ද හැඳින් වේ. එම අවස්ථා තුනෙහි ම පහළවන චේතනා පිරිසිදුව තබා ගැනීමට ප්‍රවේසම් විය යුතු ය. ඇතිවන බාධක කරදර අමාරුකම් ආදී කිසිවක් නිසා ඒ පින් සිතිවිල්ලට හානියක් නොවන්නට තමන් විසින් ම වගබලා ගැනීම ඉතා වැදගත් ය.

ජාතක පාලියේ මහා ධර්මපාල ජාතකයේ දී ධර්මපාල බමුණා දිසාපාමොක් ඇදුරුතුමාට පවසන්නේ තමන් දානයක් දෙනවිටත් ඊට පෙරත් දෙන අවස්ථාවේදීත් එය සතුටින් කරන බවත්, දන් දී කිසිදිනක ඒ පිළිබඳ පසුතැවිලි නොවන බවත් ඒ නිසා ම ගමේ දරුවන් අකාලයේ මිය නොයන බවත් ය.

මේ අනුව තුන් සිත පහදවාගෙන දෙන දානයේ ආනිසංස එකක් දෙකක් නොව රාශියක් ඇතිබව පැහැදිලි වේ. දන් දී පසුතැවිලිවීමේ ආදීනව පිළිබඳ සිද්ධියක් කෝසල සංයුක්තයේ අපුත්තක සිටාණන්ගේ කතාවේ සඳහන් වේ. එතුමා මහා ධනවතෙකු බැවින් කොසොල් රජතුමා නිලලත් සිටුවරයෙකි. එහෙත් ඔහුට එම සම්පත් භුක්තිවිඳීමට සිත් නොදුනි. ඔහු ජීවත්වූයේ දුගියෙකු ලෙස ය. අවසානයේ දී දරුවන් හා නොසිටි ඔහුගේ ධනය රාජසන්තක විය. සිටුවරයෙකු වුවත් එම ධනය රිසි සේ භුක්ති විඳීමට නොහැකි වූයේ මන්දැයි කොසොල් රජු බුදුරදුන්ගෙන් විමසූ විට උන්වහන්සේ වදාළේ මොහු පෙර තගරසිඛී බුදුරජාණන් වහන්සේට දන් පිළිගන්වා පසුව වැය වූ ධනය තිබුණේ නම් අතවැසියන්ට කිහිප දවසකට භුක්ති විඳීමට තිබුණේ යැයි කියා පසුතැවිලිවීම නිසා ඔහුට එසේ සිදු වූ බවයි. මේ නිසා දන් දීමේ දී තුන්සිත පහදවා ගැනීමට හා පිරිසිදුව තබා ගැනීමට වෑයම් කළ යුතුයි.

### දන් දිය යුත්තේ කාට ද?

අංගුත්තර නිකායේ තික නිපාතයේ දී වච්චගොත්ත බමුණා අමතා බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ. වච්චය, කෙනෙක් ඉඳුල් බඳුන් හෝ හැලිවලං සෝදා ඉවත දමන ජලය කුණුවලට දමන විට එහි සිටින සතුනට එය ආහාරයක් වේවායි සිතා දමන්නේ නම් එයින් ද පිනක් සිදුවන්නේ යැයි කියමි. එහෙත් වච්චය, මනුෂ්‍යයෙකුට දෙන ආහාරය ඊට වඩා ආනිසංසදායක ය. එයින් ද සිල්වතුන්ට දෙන දානය මහත්ඵල මහානිසංසදායක යැයි කියමි.

මෙම දේශනාව අනුව දුගී මගී යාචකාදීන්ට, වැඩිහිටි නිවාස, ළමා නිවාස ආදියට දෙන දානයෙන් ද විශාල පිනක් ලැබෙන්නේ ය. එහෙත් සිතූ සේ භවභෝග සම්පත් ඇතිව සුගතිවල උපදින තරම් මහත්ඵල මහානිසංස ලබන්නට නම් ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට දන්දිය යුතු බව බුදුබණෙහි සඳහන් වෙයි. මෙහි ශ්‍රමණ බ්‍රාහ්මණ යන නම් දෙකෙන් ම අදහස් කරන්නේ ගිහි ගෙදර කම්සැප අතහැර බ්‍රහ්මචාරීව වසන කර්මය කර්මඵලය අදහන පිදිය යුතු උතුමන් ය. ශ්‍රමණයින් ලෙස භික්ෂූන් සැළකෙන අතර බ්‍රාහ්මණයින් ලෙස බ්‍රහ්මචාරී බමුණන් ද සලකන ලදී.

ලෝකයේ පූජනීය අය අතර අග්‍ර වන්නේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ය. උන්වහන්සේ සියලු පූජාවන්ට සුදුසුවන බව නවගුණ අතර අරහං ගුණයෙන් පැහැදිලි වේ. අරහං ගුණයට බුදුරජාණන් වහන්සේ පත්වන්නේ සාර අසංඛ කල්ප ලක්ෂයක් දාන පාරමිතාව පිරීමෙනි. ලෝකයේ කිසිම ආගමක දෙවියෙකු හෝ ශාස්තෘවරයෙකු එක දිනයකට බුදුරජාණන් වහන්සේට තරම් පුදපූජා ලබන්නේ නැත. උන්වහන්සේ ගේ අරහං ගුණය නිසාය. බුදුරජාණන් වහන්සේට කරන පූජාව පූජාවන් අතර අග්‍රතම පූජාව බව අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ අග්ගප්පසාද සූත්‍රයේ සඳහන් වේ.

පූජනීය උතුමන් අතර මීළඟට සිටින්නේ මහා සංඝරත්නය යි. මහාප්‍රජාපතී ගෝතමී දේවිය තමා සියතින් ම නූල්කොට සිවුරු සඳහා රෙදි දෙකක් වියාගෙන අවුත් පූජා කරන්නට සැරසුන මොහොතෙහි උන්වහන්සේ වදාළේ "**සංඝෙ ගොතමී දෙහි "සංඝෙ තෙ දින්නෙ අහමෙව පූජිතො භවිස්සාමි**" ගෞතමිය, මේ වස්ත්‍ර යුගලය සංඝයාට දෙන්න. ඔබ සංඝයාට එය දුන්විට මා වෙත පිදුවේ වන්නේ ය. සංඝයාටත් පිදුවේ වන්නේ ය. යනුවෙනි. එබැවින් බුදුරජාණන් වහන්සේ වඩා හිඳුවා දෙන දානය සෑම අතින් ම පරිපූර්ණ වූ උතුම් දානය වන්නේ ය.

සංඝ රත්නයේ ගුණ ප්‍රකාශ වන පාඨයෙහි ආර්ය සංඝරත්නය මහ ජනයාගේ පුද පූජාවලට අතිශයින් ම සුදුසු වන බව කියවෙන ගුණ පහක්ම අඩංගු වේ.

| | |
|---|---|
| **01. ආහුනෙය්‍යො** | ආගන්තුකයන් සඳහා වෙන් කරන ලද ආහාරපානාදිය පිළිගැන්වීම වන බැවින් ආහුනෙය්‍ය නම් වන සේක. |
| **02. පාහුනෙය්‍යො** | දුර බැහැර සිට සිහිකළ යුතු ගරු බුහුමන් කළයුතු අය සඳහා පුද පඬුරු එවීමේ සිරිතක් තිබේ. එසේ පුද පඬුරු එවීමට මහා සංඝරත්නය සුදුසු ය. |
| **03. දක්ඛිණෙය්‍යො** | දක්ෂිණාව යනු පෙර දඹදිව හින්දූන් අතර පැවති මිය පරලොව ගිය අය සඳහා පිළියෙල කළ දානය යි. ඔවුන් එය පිදුවේ මියගිය අයට පැමිණ භුක්තිවිඳීමට පෙරේත තටු ආකාරයටයි. එය නිෂ්ඵල ක්‍රියාවක් බව පෙන්වාදුන් බුදුරජාණන් වහන්සේ ඒ මියගිය අය වෙනුවෙන් පිළියෙල කළ දානය පිළිගැනීමට භික්ෂූන් වහන්සේ සුදුසු බවත් එයින් ලැබෙන පින මියගිය ඥාතීන්ට අනුමෝදන් කළ යුතු බවත් වදාළහ. |

| | |
|---|---|
| **04. අංජලිකරණීය** | පිදිය යුත්තන්ට ගරුකළ යුත්තන්ට වඳින පිණිස ආචාර කරන පිණිස දෑත එක්කොට කරන නමස්කාරය පිළිගැනීමට ද භික්ෂූන් වහන්සේ සුදුසු ය. |
| **05. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස** | කෙතක බීජ වැපිරූවිට කලක දී එහි අස්වැන්න ලැබේ. එසේම ආර්ය සංඝරත්නය විෂයෙහි කරන ලද පූජාවෙන් සසර ඉතා දිගු කාලයක් ආනිසංස ලැබෙන බැවින් සංඝරත්නය උතුම් වූ පින්කෙතක් බඳු ය. |

සංඝ රත්නය මෙසේ සැදැහැවතුන්ගේ පූජාවට සුදුසු වන්නේ සඟ ගුණ පාඨයේ මුලින් ම කියවන සුපටිපන්න ආදී ගුණ හතර නිසා ය. එම ගුණවලින් කියැවෙන්නේ මහා සංඝරත්නය බුදුරදුන් ගමන් කළ පිළිවෙතෙහි මැනවින් බැස සිටින බවත් නොමඟ නොගොස් ඍජුවම ඒ මග ගමන් කරන බවත් ය. එම උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ගමන් කරන උන්වහන්සේලා එකම පිය පුතු සහෝදර පිරිසක් ලෙස ගුණයෙන් සීලයෙන් වතින්, පිළිවෙතින් එක සමානව බැඳී සිටින බව ය. එබඳු සමූහයක් මහා සංඝරත්නය හැර ලොව කිසිදු ආගමක දක්නට නොමැත. උන්වහන්සේලාට කරන පූජාව විශේෂිත වන්නේ ද එබැවින් ය.

## දන් දීමෙහි අනුහස්

අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ දානුප්පත්ති සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරති. ''මහණෙනි මෙලොව කෙනෙක් ධනවත් පවුල්වල ඉපදීම පතා හෝ චතුර්මහාරාජිකය ආදී දෙව්ලොව සැප පතා හෝ දන්දෙති. ඔවුන්ගේ ඒ ප්‍රාර්ථනාව ඉටුවන්නේ ය. ඒ ඒ තැන්වල උපදින්නේ ය. එහෙත් එසේ උපදින්නේ දන් දී සිල්වත්ව සිටියහොත් පමණි. දුස්සීල අයෙකුට දන්දුන් පමණින් එබඳු සුගතියක ඉපදීමට ඉඩක් නොමැත. කෙනෙක් පින්කමක් කොට එබඳු ප්‍රාර්ථනාවක් කරන විට ඔහු අනිවාර්යයෙන් ම සිල්වත්වීම වැදගත් ය. සිල්වත් පුද්ගලයා පිරිසිදු නිසා ඔහුගේ පැතුම ඉටුවන්නේ ය. මේ අනුව කෙනෙක් සුගතියක ඉපදීම නම් දන්දීමෙන් පමණක් කළ නොහැකි බව අවබෝධ කරගත යුතු ය. කෙනෙකුගේ උපත තීරණය වන්නේ දානය නොව සීලය අනුව ය. බුදුදහමේ සියලු පින්කම්වල දී සැදැහැවතුන් පළමුකොට සිල් සමාදන් කරන්නේ එබැවිනි.

සාමාන්‍යයෙන් මනුෂ්‍යයෙකුට අවශ්‍ය මූලික අවශ්‍යතා තුනකි. එනම් අංගසම්පූර්ණ ශරීර සම්පත්තියක් ඇතිව මනුෂ්‍ය ලෝක දිව්‍ය ලෝක වැනි සුගතියක උපදින්නට ලැබීම, ජීවිතය සැපවත්ව ගත කිරීමට තරම් භවභෝග සම්පත් තිබීම, එම සම්පත් ප්‍රයෝජනයට ගනිමින් මෙලොව පරලොව දියුණුව සාදාගැනීමට තරම් නුවණක් තිබීම යනුවෙනි. ඉන් එකක් හෝ අඩුවුනහොත් ඔහුගේ ජීවිතය අංගසම්පූර්ණ නොවන්නේ ය. හොඳ උපතක් ලැබීමට සිල් පිරිය යුතු ය. භවභෝග සම්පත් ලැබීමට නම් දන්දිය යුතු ය. නුවණ ලැබීමට නම් බණ දහම් ඇසිය යුතු ය. භාවනා කළ යුතු ය. නුවණ වැඩෙන ඉගැන්වීම් ඉගැන්වීමෙහි යෙදිය යුතු ය.

මෙයින් පෙනී යන වැදගත් කරුණක් නම් දානයෙන් කළ හැක්කේ භවභෝග සම්පත් ලබාදීම පමණක් බව යි. අංගුත්තර නිකායේ දසක නිපාතයේ ජානුස්සොනි සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ වදාළේ කෙනෙකු සිල්නොපුරයි නම් දස අකුසල් කරයි නම් ඒ පාපය නිසා ඔහු තිරිසන් ලෝකයේ ඇතෙකු, අශ්වයෙකු, ගවයෙකු හෝ බල්ලෙකු වී ඉපදීමට ඉඩ තිබෙන බවයි. ඔහු දුස්සීල වුවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දන්දෙයි. ඒ පින නිසා ඇතාට අශ්වයාට හෝ බල්ලාට ඇතැම් මිනිසුන්ගේ වඩා සැප සම්පත් ගරු සැළකිලි සම්මාන ලැබේ. බුදුරජාණන් වහන්සේ මෙහි දී දේශනා කරන්නේ නිරය හැර කොතනක උපදින්නත් දානයේ ආනිසංස පිහිට වන බවය. තිරොකුඩ්ඩ සූත්‍රයේ දැක්වෙන පහත සඳහන් ගාථාවෙන් දානාදී පින්කමකින් ලැබෙන ප්‍රයෝජන හතරක් දක්වා ඇත.

**සො ඤාති ධම්මො ච අයං නිදස්සිතො**
**පෙතාන පූජා ච කතා උළාරා**
**බලඤ්ච භික්ඛූනමනුප්පදින්නං**
**තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පකං**

ශ්‍රද්ධාවන්ත පිරිස් දානාදී පින්කම් කරන්නේ කිසියම් කරුණක් මුල්කරගෙනය. වැඩි වශයෙන් දක්නට ඇත්තේ මියගිය ඥාතීන්ට පින්දීම සඳහා සිදුකරන පින්කම් ය. ජීවත්වන වැඩිහිටියන්ට හෝ මව්පියාදීන්ට සෙත්පතා සිදුකරන පින්කම් ද දැකිය හැකි ය. මේ සෑම ක්‍රියාවකින් ම සිදුකරන්නේ ඥාති ධර්මය ඉටුකිරීමකි. තමන් මියගිය පසු පින්කම් කර පින් අනුමෝදන් කරති යි යන විශ්වාසයක් බලාපොරොත්තුවක් මවුපියන් තුළ පවතින බව සිඟාලෝවාද සූත්‍රයේ දක්වා ඇත. ''**අථ ච පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුපදස්සති**'' මේ අනුව කුමන ආකාරයකින් හෝ ඒ පින්කම්වලින් සිදුවන්නේ ඥාතිධර්මයක් ඉටුකිරීමයි. එසේම තමන් ඒ පින්කම කිරීමෙන් සෙසු ඥාතීන්ට ද ඤාතිධර්මය ඉටු කරන්නේ මෙසේ යැයි ආදර්ශ දෙන බව ඉහත ගාථාවෙන් පැහැදිලි කරයි.

දානය පිරිනමන්නේ සංඝරත්නයටය. ආහාරයක් පුදන දායකයා ප්‍රතිග්‍රාහකයන්ට කරුණු පහක් පුදන බව භෝජන සූත්‍රයේ සඳහන් වේ. එනම් ආයුෂය, වර්ණය, සැපය, බලය, ප්‍රඥාව යි. ඒ අනුව දන්දෙන දායකයා උන්වහන්සේට මේ කරුණු පහෙන් භික්ෂූන් වහන්සේලාගේ ජීවිතය නිදුක්ව නීරෝගීව ශක්ති සම්පන්නව පවත්වාගෙන යාමට අවශ්‍ය ශක්තිය ලබා දෙයි.

**චිරප්පවාසිං පුරිසං**
**දූරතො සොත්ථි මාගතං**
**ඤාති මිත්තා සුහජ්ජා ච**
**අභිනන්දන්ති ආගතං**
**තථෙව කත පුඤ්ඤම්පි**
**අස්මා ලොකා පරංගතං**
**පුඤ්ඤානි පතිගණ්හන්ති**
**පියං ඤාතීව ආගතං**

මෙම ධම්මපද ගාථාවට අනුව බොහෝ කාලයක් පිටරටකට ගොස් සිටි ඤාතියෙක් සුවසේ මෙරටට පැමිණෙන විට නෑදෑ හිත මිතුරෝ පෙරමඟට ගොස් ඔහු ඉතා ආදරයෙන් පිළිගෙන සංග්‍රහ කරති. එසේම පින්දහම් කොට මෙලොවෙන් පරලොව ගිය ඇත්තන්ට ඒ පින ඉදිරියට පැමිණ පිළිගෙන සැප සහිත භාවයන්ට පත්කරයි. මල්කරුවෙක් මල් සමූහයකින් විසිතුරු මල් රැගෙන මල්දම් ගොතන සේ මෙලොව උපන් සත්ත්වයා විසින් බොහෝ පින්දහම් කරගත යුතු ය. මන්ද යත් ඔබ මේ මිනිස් ලොව ඉපදුනේ කළ මහා කුසලයක් නිසාය. නැවත අප විඳින සුවයවත් ලැබීමට නම් පින්දහම් කරගැනීම අවශ්‍යම වෙයි. කෙනෙකුට දෙව්ලොව ඉපදීමට හෝ මිනිස්ලොව ඉපදීමට හෝ තිරිසන් ආදී අපායකට යන්නට හෝ ඉඩ සැලසෙන එකම තැන මිනිස් ලෝකය යි. එහි උපන් අය විසින් ඉහත කී තැන්වලින් යන්නේ කොතනටද යි, තීරණය කරගෙන කටයුතු කළ යුතු ය.

### මංගල දේශනා

ගෙට ගෙවදීම් ආවාහ විවාහ උපන්දින සිහිකිරීම් වැනි මංගල අවස්ථාවන් හි දී ඊට ගැලපෙන අනුශාසනා හෝ අනුමෝදනා භික්ෂුව විසින් සිදුකළ යුතු ය. ඒ සඳහා මංගල, පරාභව, කාමභෝගී වැනි සූත්‍ර රාශියක් ඇති අතර පැරණි අධ්‍යාපන ක්‍රමයේ දී විශේෂයෙන් යොදාගෙන ඇත්තේ මංගල සූත්‍රය යි. මංගල යන්නෙහි ප්‍රකට අදහස නම් සුභ, ප්‍රීති සතුටුදායක අවස්ථාව යන්න යි. මේ පිළිබඳව වාද විවාද පවා තිබූ බව මංගල සූත්‍ර අටුවාවේ දක් වේ. එහි බුදුරජාණන් වහන්සේ මංගල යනුවෙන් අදහස් කළේ දෙලොව දියුණුවට හේතුවන කරුණුය. උදාහරණයක් ලෙස අනුවණයන් ඇසුරු නොකිරීමෙන් නුවණැත්තන් ඇසුරු කිරීමෙන්, පිදියයුත්තන් පිදීමෙන් මෙලොව දියුණුව මෙන්ම පරලොව දියුණුවත් සැලසේ. එහෙයින් ඒවා මංගල කරුණුය. මේ ආකාරයේ ප්‍රතිරූප දේශ වාසය, බහුශ්‍රැත බව ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමේ වැදගත්කම, මව්පියන්ට සංග්‍රහ කිරීම, ආවාහ විවාහ වූ පසු අඹුදරුවන්ට සංග්‍රහ කිරීම, පව්කම්වලින් වැලකී සිටීම මදයට හා ප්‍රමාදයට හේතුවන මත්ද්‍රව්‍යයන්ගෙන් වෙන්වීම ආදී මඟුල් කරුණුවලින් ඒ ඒ අවස්ථාවන්ට හා පුද්ගලයින්ට ගැලපෙන කරුණු තෝරාගෙන ආරම්භ කරන අලුත් ජීවිතය සාර්ථක කර ගැනීමට මග කියාදීම වැදගත් ය.

### අවමංගල දේශනා

මරණය නම් අප කාටත් ශෝක ජනක අත්දැකීමකි. කොතෙක් කරුණු දැනගෙන සිටියත් තමන්ගේ ඥාතියෙකුගේ හිතවතකුගේ මරණයේ දී ඕනම කෙනෙකු කම්පාවට පත් වේ.

ඒ අවස්ථාවෙහි ඔවුන්ගේ සිත් සනසන්නට භික්ෂූන් වහන්සේලාට සිදු වේ. අවමංගල දේශනාවකින් සිදුවිය යුත්තේ මරණ ධර්මය කාහටත් පොදු දෙයක් බව වටහා දී එයින් වැලපෙන අය සැනසීමයි. මරණය සම්බන්ධ අනුශාසනා කළයුතු අවස්ථා තුනක් යෙදෙයි. මෘත ශරීරය මිහිදන් කරන අවස්ථාවේ හෙවත් පාංශුකූල පිරිනමන මොහොතේ පවත්වන අනුශාසනාව ඉතා සැලකිල්ලෙන් කළ යුතු ය. මන්ද යත් එතැනට රැස්වන්නේ විවිධ තරාතිරමේ විවිධ ආගමික ජාතික ශ්‍රාවක පිරිසක් වන බැවිනි. ඔවුන් හැමදෙනාටම

පොදුවේ සිතට දැනෙන අනුශාසනා දැන ඉගෙන හුරුපුරුදුකම් ඇතිකර ගැනීම ද වැදගත් ය. එවැනි අවස්ථාවල නිතර භාවිත කරන දහම්පද කීපයක් පහත දැක් වේ.

**නහි සො උපක්කමො අත්ථි**
**යෙන ජාතා නමීයරෙ**
**ජරම්පි පත්වා මරණං**
**එවං ධම්මාහි පාණිනො**

උපන් සත්ත්වයාට නොමැරී සිටීමට කිසිදු උපක්‍රමයක් නැත. මෙය සත්ත්වයාගේ ස්වභාවය යි. මේ ලෝකයෙහි බොහෝ දේ ගැන අනාවැකි කිව හැකි ය. එහෙත් එසේ අනාවැකි කිව නොහැකි කීමට තබා සිතා ගැනීමට සලකුණක්වත් නොමැති කරුණු පහකි.

**ජීවිතං ව්‍යාධි කාලො ච**
**දෙහ නික්ඛෙපනං ගතිං**
**පංචෙ තෙ ජීවලොකස්මිං**
**අනිමිත්තා න ඤායරෙ**

ජීවිතය කොපමණ කල් ගත වේද, කුමන රෝගයකින් මියයන්නට සිදුවේ ද, කවර කාලයක මිය යන්නට සිදුවේ ද, සිරුර කොහි මිහිදන් කරන්නට සිදුවේ ද, මියගොස් කොහි උපදී ද යන මේ කරුණු පහම දැන ගැනීමට සලකුණක් හෝ නොමැති කරුණු ය.

ලෝකයේ බොහෝ දෙන තමන්ට එන අභියෝග පරාජය කොට ජයගැනීමට සටන් කරති. සමහරු ජය ගනිති. ඇතැම් දේ අල්ලසකින් වළක්වා ගත හැකිය. එහෙත් මාරයා සමඟ මේ කිසිවක් කළ නොහැකි ය.

**මච්චුනා සංගරො නත්ථි**
**මඤ්ඤවගාවො ච විජ්ජති**
**යුද්ධං අත්ථි ජයො නත්ථි**
**සබ්බෙ මච්චු පරායනා**

මරුවා සමඟ ගිවිසුම් නැත. අල්ලස් ගැනීම් නැත. මරුවා සමඟ යුද්ධ කළ නො හැකි ය. කොතෙක් සටන් කළත් දිනිය නො හැකි ය. සියලු ජීවිත මරණයෙන් අවසන් වෙතයි.

දහරා ච මහන්තා ච
යෙ බාලා යෙ ච පණ්ඩිතො
සබ්බෙ මච්චුවසං යන්ති
සබ්බෙ මච්චුපරායනා

ළමාවියේ සිටිය ද, වැඩිහිටිවියෙහි සිටිය ද, අනුවණයෝ ද, ඥානවන්තයෝ ද යන මේ සියල්ලෝම මරුවාගේ වසඟයට යන්නාහු ය. ජීවිතය මරණයෙන් කෙළවර වන්නේය.

අප මේ ආහාරපාන දෙමින් සනසමින් ඇති දැඩි කරන පෝෂණය කරන සිරුර එසේ කළ යුතු වැදගත් දෙයක් නොවේ.

අචිරං වතයං කායො
පඨවිං අධිසෙස්සති
ඡුද්දො අපෙතවිඤ්ඤාණො
නිරත්ථංව කලිංගරං

මේ සිරුර වැඩිකල් නොපවතින්නේ ය. ඉවත ලන දරකඩක් මෙන් පොළොවට ඇද වැටෙන්නේය.

මේ ජීවිතය අප සිතන තරම් දිගු එකක් ද නොවේ. සැප ඇති එකක් ද නොවේ. මෙය අප තවමත් හරිහැටි තේරුම් නොගෙන ඇත. එය වටහාගෙන අප කුමක් කළ යුතු ද?

අප්පකං ජීවිතං මනුස්සානං පරිත්තං ලහුකං
බහුදුක්ඛං බහුපායාසං මන්තාය බොධෙතබ්බං කත්තබ්බං
කුසලං චරිතබ්බං බ්‍රහ්මචරියං නත්ථි ජාතස්ස
අමරණං

මිනිසුන්ගේ ජීවිතය ඉතා අල්පය. ටිකය, කෙටිය, බොහෝ දුක් සහිත ය. බොහෝ වෙහෙසකර ය. මෙය නුවණින් තේරුම් ගත යුතු ය. තේරුම් ගෙන කුසල් කළ යුතු ය. හැකිනම් කම්සැප අතහැර බඹසර හැසිරිය යුතු ය.

අවමංගල දේශනාවේ දෙවන අවස්ථාව මතක බණ යි. එහි දී ද ඉහත කී කරුණු බොහොමයක් යොදා ගත හැකි ය. විශේෂයෙන් ඒ අවස්ථාවේ දී මරණය ගැන දිගින් දිගටම කරුණු කීම අවශ්‍ය නොවේ. එය ගැන කෙටියෙන් සඳහන් කර සිදු වූ මරණය සිහියේ තබාගෙන තමන්ගේ ඉදිරි ජීවිත මෙලොව පරලොව ජීවිත සකස් කර ගන්නා ආකාරය පැහැදිලි කර දිය යුතු ය.

තුන්වන අවමංගල දේශනාව නම් මතක දානය අවස්ථාවේ පවත්වන අනුමෝදනාව යි. ඒ සඳහා තිරෝකුඩ්ඩ සූත්‍රය ඉතා වැදගත් වේ. ඒ හැරුණුවිට සිගාලෝවාද සූත්‍රයේ එන යුතුකම් පිළිබඳ කරුණු නිධිකණ්ඩ සූත්‍රයේ එන පිං රැස්කිරීම පිළිබඳ කරුණු විස්තර කරදීම වැදගත් ය.

## බුද්ධ වන්දනා සහ බෝධිපූජා

බුද්ධ වන්දනා සහ බෝධි පූජා විශේෂ හේතු කාරණා ඇතිව හෝ නැතිව දිනපතා විහාරස්ථානවල සිදු වේ. එහි දී අවස්ථානුරූපීව කෙටියෙන් හෝ දීර්ඝව ඒවා පැවැත්වීමට ලොකු කුඩා භික්ෂූන් වහන්සේලාට සිදුවේ.

ඒ අතරින් පළමු ලෙස දිනපතා සලාක දානය ගෙන එන පින්වතුන් සඳහා බුද්ධ පූජාව පවත්වා කෙටි අනුමෝදනාවක් කළ යුතු ය. එහි දී ඒ කාර්යයෙහි යෙදෙන භික්ෂූන් වහන්සේ පත්කඩය ද රැගෙන සැදැහැතියන් සමඟම පූජාව අතගසා තමන් වහන්සේ විසින් ම බුදුරජාණන් වහන්සේට පූජා කළ යුතු ය. දායකයන් අතින් පූජාව තැන්පත් කිරීමට ඉඩ දීමෙහි ද වරදක් නැත. එහෙත් බුදුරජාණන් වහන්සේට වතාවත් කිරීමට ශාසනික වශයෙන් බලය පැවරෙන අනුපිළිවෙලක් ඇත. එය විහාරස්ථානයේ වැඩිහිටි භික්ෂූන් වහන්සේ අතින් සිදුවිය යුතු ය. එසේ නොවේ නම් බුද්ධෝපස්ථානය සඳහා නම්කරන ලද භික්ෂූන් වහන්සේ නමක අතින් සිදුවිය යුතු ය. එසේ නොමැති විට පූජාව පවත්වන භික්ෂූන් වහන්සේ වෙතින් සිදුවීම අවශ්‍යය. අතීතයේ සිට ශාසනයේ පැවතෙන චාරිත්‍රය එයයි. දළදා වහන්සේට ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට හා බොහෝ විහාරස්ථානවල බුදුරදුන්ට පූජාව පවත්වන්නේ ඒ පිළිවෙලටය. අනතුරුව තමන් වහන්සේ ද පත්කඩය එළා බිම හිඳ සැදැහැවතුන්ට හිඳගැනීමට සලස්වා පන්සිල් සමාදන් කරවා නමස්කාරයේ පටන් සියලුම ගාථාවන් තමනුත් දොහොත් මුදුන් තබා වැඳගෙන දේශනා කරවිය යුතු ය. පූජාව අවසානයේ දී දෙවියන්ට ඥාතීන්ට පින් අනුමෝදන් කරවිය හැකි ය. කෙටි අනුශාසනාවක් ද කිරීම වැදගත් ය. එසේ නොවේ නම් පින්වාක්‍යයකින් අනුමෝදනාව කළ යුතු ය.

## බෝධි පූජාව

වර්තමානයේ බුද්ධ පූජාවන් අතර බෝධි පූජාව ප්‍රධාන වෙයි. මේ හැරුණු විට අටවිසි බුද්ධ පූජා, දෙසැත්තෑ ඤාණපූජා ආදී විශේෂ පූජා රාශියක් ද තිබේ. මේ පූජා පැවැත්වීම ඒ සඳහා විශේෂ හැකියාවක් ඇති භික්ෂූන් වහන්සේ නමකට පැවරීම සිදුවෙයි. බුදුරජාණන් වහන්සේ උදෙසා කරන සෑම පූජාවක්ම මෙන්ම ධර්මදේශනා පැවැත්වීම, පිරිත් දේශනා කිරීම යන මේ සෑම කාර්යයක්ම මහජනයාගේ සිත් පහන්වන ආකාරයට සිදු කළ යුතු ය. කුසලයට නිවනට බාධා කරන්නේ කාමච්ඡන්දාදී නීවරණ ධර්මයන් ය. එම නිසා ඒ සෑම පූජාවක් ම දේශනාවක් ම පංචනීවරණ ඉස්මතුවන ආකාරයෙන් නොව මැඩ පැවැත්වෙන ආකාරයෙන් සිදු කළ යුතු ය. විශේෂයෙන් බෝධිපූජාවක් පැවැත්වීමේ දී එය වර්තමානයෙහි ජනප්‍රිය රටාවකට හැඩගැසී තිබේ. එහිදී විශේෂයෙන් දක්නට ලැබෙන කරුණක් නම් බෝධිපූජා කවි ගායනය යි. එය ද ගීත ස්වරයෙන් ගායනා කරනු දැකිය හැකි ය. ඇතැම් විට ගාථා පවා ගීත ස්වරයෙන් ගයනු අසනු ලැබේ.

**රූපණමිදං භික්ඛවේ අරියස්ස විනයෙ ගීතං** යනුවෙන් බුදුසසුනේ විනයට අනුව ගීත ගායනය යනු හැඬීමක් වැනි ය. ගායනයක් කරන සෑම අයෙක්ම තමන්ගේ පියවි හඬ විකෘති කර ගායනා කරයි. ඔහුගේ හෝ ඇයගේ පියවි හඬ අනුව බලන කල එය හැඬීමක් වැනි යැයි කීම සැබෑවකි. භික්ෂූන් වහන්සේ නමක් කිසි විටකත් එම ගීත ගායනා කරන තත්ත්වයට පත්විය යුතු නොවෙයි.

තව ද අංගුත්තර නිකායේ පංචක නිපාතයේ ගීතස්සර සූත්‍රයේ දී ගීත ආකාරයෙන් දේශනා කිරීමේ හෝ සජ්ඣායනය කිරීමේ ආදීනව හෙවත් දෝස 05 ක් දක්වා ඇත.

**අත්තනාපි තස්මිං සරෙ සාරජ්ජති**
තමාගේ ස්වරය පිළිබඳ තමා තුළම රාගය ඇතිවේ.

**පරම්පි තස්මිං සරෙ සාරජ්ජන්ති**
අනුන් ද එම ගායනා ස්වරයෙහි රාගයෙන් ඇලෙති.

**ගහපතිකාපි උජ්ඣායන්ති. යථෙව මයං ගායාම, එවමෙව ඉමෙ සමණා සක්‍යපුත්තියා ගායන්තීති.**
ගිහියන් වන අප ගායනා කරන ආකාරයට මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන් වහන්සේලා ගායනය කරනවා නොවේදැයි නින්දා කරති.

**සරකුත්තම්පි නිකාමයමානස්ස සමාධිස්ස භඞ්ගො හොති.**
ස්වර නොමැතිව අනුගමනය කිරීමට යාමෙන් තමාගේ සමාධිය බිඳ වැටේ.

**පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති.**
පසුවට එන භික්ෂූන් වහන්සේලා එය නිවැරදි ක්‍රමය යැයි අනුගමනය කිරීමට පෙළඹෙයි.

මේ අනුව ගීතස්වරයෙන් බුද්ධ පූජා බෝධි පූජා පවත්වන භික්ෂූන් වහන්සේ කරුණු කිහිපයකින් පිරිහීමට පත්වෙයි. එනම් ගිහියා හා පැවිද්දා අතර වෙනසක් නොමැති තත්ත්වයට පත්වීමයි. එසේම ගිහියන් ගීත ගයන්නේ ඒ ස්වරයට අනුව පුහුණුවීමෙනි. එය නුපුහුණු කෙනෙකු විසින් කරන්නට යාම අසන්නාගේ සිනහවට හේතුවන්නකි. ''නච්ච ගීත වාදිත'' යන නැටුම් ගැයුම් වැයුම් භික්ෂු සීලයට විරුද්ධය. එම නිසා එය මහජනයා මැද සිල් බිඳ ගැනීමකි.

ශාසනික පිළිවෙතෙහි නූතන ප්‍රවණතාවන් හඳුනාගෙන ශාසනික පැවැත්මට හානිකර ස්වභාවයන් දැන නිසි පිළියම් යෙදීම ශාසන භාරධාරී භික්ෂූන් වහන්සේගේ වගකීමකි.

**අභ්‍යාස**

01. ගුරුවරයාගේ උපදෙස් මත කෙටි අනුමෝදනා දේශනාවක් සකස්කර සියලු දෙනාට කාලය වෙන්කර දී එම දේශනාවන් පවත්වන්න.
02. නිවැරැදි දේශනා පිළිවෙල පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් සිදු කරන්න.
03. බෝධි පූජා අත්පොතක් පිළියෙල කරන්න.

30 පාඩම

# බුදු දහමයි සුව දිවියයි.

එදා ත්‍රිපිටක ධර්ම දිනයයි. ඒ වෙනුවෙන් විශේෂ වැඩ සටහනක් අප පිරිවෙනෙහි ක්‍රියාත්මක කෙරිණි. එහි දී ත්‍රිපිටක ධර්මය විෂය භාර පණ්ඩිත හාමුදුරුවෝ නීරෝග ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය හොඳ පුරුදු මොනවාදැයි බුදු දහම් ඇසුරින් කරුණු රැස් කිරීමට පැවරූහ. කණ්ඩායම් දෙකකට බෙදුණු අපි වෙන වෙනම කරුණු රැස්කෙළෙමු. මේ අපේ ඒ පැවරුම් ඉදිරිපත් කළ අවස්ථාවයි.

**පණ්ඩිත හාමුදුරුවෝ:-** පළමු කණ්ඩායමේ ආදර්ශ පාඨ කියමු බලන්න.

**සුදන්ත හිමි:-** දත් මදිමු, නිය පොතු - හිස කෙස් කපමු, දිනපතා ස්නානය කරමු.

**පණ්ඩිත හාමුදුරුවෝ:-** බොහොම හොඳයි, විශේෂයෙන් භික්ෂුවක් උනහම තමන්ගේ කටයුතු තමන්ම කරගැනීමට පුරුදු වෙන්න ඕනෑ. දින චරියාවේ අපි පාඩම් කළා දැහැටි වළඳා කියල, ඒ කීවේ දත් මැදීම ගැන තමයි. දවසකට දෙවරක්වත් දත් මැදීමට පුරුදු වෙන්න ඕනේ.

**සමන්ත:-** දැහැටි දඬු කියන්නේ මොනවද? හාමුදුරුවනේ.

**පණ්ඩිත හාමුදුරුවෝ:-** ලඳු කැලෑවල බෝඹු කියල ඖෂධ ගුණයෙන් යුක්ත ගස් වර්ගයක් තියෙනවා. ඒවායින් තමයි දැහැටි කූරු හදන්නේ, කරඳ කෝටුවලිනුත් දත් මදින්න පුළුවන්. අපි දවසක දැහැටි හදන හැටි බලමු. උදේ හවස දත් මැදීමට දැන් ඉතින් ඔබ වහන්සේලාට අලුත් උපකරණ තියෙනවානේ, ඒ උනාට අපේ ස්වභාවික දේවල් තමයි සෞඛ්‍යයට වඩාත් හිතකර. දැතේ දෙපයේ නියපොතු කපා සිටීමත් හරි වැදගත්. කුණු පිරුණු නියපොතු තිබීම ලෙඩ රෝග හැදෙන්න හේතුවක් වගේම මොන තරම් අප්‍රසන්න ද? සමහරු නිතරම නියපොතු හැපීම වගේ නරක පුරුදු හුරුවෙලා තියෙනවා. ඒවායෙන් අපි ඔවුන් වළකා ගන්න ඕනේ. පොඩි හාමුදුරුවරු සැදැහැවතුන් දකින විට ප්‍රසන්නව ඉන්න ඕනේ. කාට ද කියන්න පුළුවන් හිස බෑම සිදුකරන විට අනුගමනය කරන චාරිත්‍රය මොකක් ද කියල.

**කෝලිත හිමි:-** හාමුදුරුවනේ, මාසයකට වරක් හෝ දෙවරක් හිස බෑම සිදුකරනවා. හිස බෑමට කලියෙන් ගුරු හිමියන්ට වැඳ හිස රැවුල් බෑමට අවසර ගැනීම සිරිතක්. වැඩි හිටි හාමුදුරු නමකගේ හිස බාන්න උදව් වෙන කොටත් උන්වහන්සේට වැඳල අවසර ගැනීම සිරිතක්.

**පණ්ඩිත හාමුදුරුවෝ:** බොහොම හොඳයි, පළමු කණ්ඩායමේ අය කීවා දිනපතා ස්නානය කිරීමත් හොඳ පුරුද්දක් කියල. ඔව් ඒ විතරක් නෙවෙයි සිවුරු සෝදා පිරිසිදු කරගැනීමටත් පුරුදු වෙන්න ඕනේ. ගිහි ළමයෙකුගේ ඇඳුමකට වඩා සිවුරක් ප්‍රමාණයෙන් විශාල නිසා

එක වරක් හරි පාවිච්චි කළොත් වේලා, පිළිවෙලකට නවා තබන්න ඕනේ. නැත්නම් ගුලිකරලා තිබ්බොත් කිළිටි ගඳ දැනෙනවා.

**සමන්ත:-** තමන් පාවිච්චි කරන තුවාය, කොට්ට උරය, ඇඳ ඇතිරිලි ආදියත් නිතර පිරිසිදුව තියෙන්න ඕන නේද?

**පණ්ඩිත හාමුදුරුවෝ:-** ඔව්, ඔව්, ඒක තමයි මම කිව්වේ. තමන්ගේ වැඩ කරගන්න අපි පුරුදු වෙන්න ඕන කියල. ඒ විතරක් නෙවෙයි, මතකයි නේද වච්චකුටි වත. කැසිකිළි, වැසිකිළි පාවිච්චියෙන් පසු අත් පිරිසිදු කරගැනීම, එම ස්ථාන වතුර ගසා පිරිසිදු කිරීම, පරිහරණය කරන භාජනවල වතුර ඉතිරිකර නොයාම වගේ දේවල් පෞද්ගලික පිරිසිදුකම රැක ගැනීමට බෙහෙවින් හේතු වෙනවා. ඒ වගේම ඒවා හොඳ සිරිත් විරිත් බව දැනගන්න ඕන.

**සුමන හිමි:-** බුදුහාමුදුරුවන්ගේ කාලෙත් ඒවගේ ගැටළුවක් තිබුණ නේද හාමුදුරුවනේ.

**පණ්ඩිත හාමුදුරුවෝ:-** ඔව්.... ඔව්.... බුදුහාමුදුරුවෝ පාරිලෙය්‍ය වනයට යන්න තීරණය කළෙත් වැසිකිළිවත මුල්කරගෙන භික්ෂූන් දෙපිරිසක් අතර භේදයක් ඇතිවූ නිසා තමයි.

**සමන්ත:-** දානේ ගොඩක් වැළඳුවාමත් ලෙඩ වෙනව ද?

**පණ්ඩිත හාමුදුරුවෝ:-** හොඳ ප්‍රශ්නයක් ඒක. අපි ආහාර ගන්න කොට ශරීරයට ඔරොත්තු දෙන ප්‍රමාණයට ගන්න ඕන. බුදුහාමුදුරුවෝ ඒ නිසා තමයි ආහාරයේ පමණ දැන වළඳන්න අනු දැන වදාළේ. භෝජනයේ මත්තඤ්ඤුතාව යනුවෙන් සඳහන් වන්නේ එයයි. ආහාර වැළඳීමේ දී පමණ දැන වැළඳීම සම්බන්ධයෙන් ශික්ෂාපද ගණනාවක්ම සේඛියාවල සඳහන් වෙනවා. ඒ ගැන කියැවෙන ගාථාවකුත් මම කියල දෙන්නම්.

> **චත්තාරො පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ**
> **අලංඵාසු විහාරාය පහිතත්තස්ස භික්ඛුනො**

ආහාර වළඳාගෙන යන විට තවත් බත් පිඩු හතරකට පහකට ඉඩ තිබිය දී පැන් පානය කළ යුතු ය. එය භාවනානුයෝගී භික්ෂුවගේ පහසු විහරණය සඳහා හේතු වන්නේ ය.

කොසොල් රජ්ජුරුවන් මගධ නැලි දහසයක බත් අනුභව කළ කෙනෙක්. එතුමාට විශාල බඩගෙඩියක් තිබුණා. බුදුහාමුදුරුවෝ හමුවෙන්න ආවම හරිම අපහසුවෙන් තමයි බිම වාඩි වෙන්නේ. බුදුහාමුදුරුවෝ රජතුමාට කීවා ආහාර පාලනය කරගන්න හැටි. දවස ගානේ හැම කෑම වේලකින්ම අවසන් පිඩු නොවළඳා ඉතිරි කරන්න කියල. රජතුමා එය පිළිපැදල නීරෝගී ජීවිතයක් ගතකළා.

**දෙවනි කණ්ඩයමේ මාතෘකා පාඨ කියන්න බලන්න.**

**උදිත හිමි**:- පරිසරය පිරිසිදුව තබාගනිමු.
පිරිසිදු වතුර පානය කරමු.
දිනපතා ව්‍යායාම කරමු.

**පණ්ඩිත හාමුදුරුවෝ**:- දැන් පරිසර ගැටළු බොහොම ඇති වෙලා තියෙන කාලයක්. පන්සල, පිරිවෙණ වැනි පොදු ස්ථානවල වැඩි පිරිසක් ගැවසෙන නිසා අවට පරිසරය ගැන සැළකිලිමත් වෙන්න ඕන. පොහොය දවසට පස්සේ පන්සල් වත්තේ ඉවත දැමූ පොලිතින් ද්‍රව්‍ය, ඉඳුල් ද්‍රව්‍ය කොපමණ තියෙනවද? ඒ නිසා මැස්සන්, මදුරුවන් බෝවන තැන් බවට පත්වෙලා තියෙනවා. තමන්ගේ කාමරය පිරිසිදුව, පිළිවෙලකට තියා ගන්නව වගේ අවට පරිසරයත් පිරිසිදුව තියාගන්න ඕන. කැළි කසල නිවැරදි තැන්වලට දැමීමට අපි පුරුදු වෙනවා වගේ එන යන අයටත් එය පුරුදු කරවන්න ඕන.

**සුදන්ත හිමි**:- වතුර පෙරා බොන එකත් හොඳ පුරුද්දක් නේද?

**පණ්ඩිත හාමුදුරුවෝ**:- අන්න හරි. දින චරියාවේ කොහොමද කීවේ. පැන් පෙරහා තබා.... භික්ෂූන්වහන්සේ පැන් වළඳන්නේ පෙරළා. පෙරහන් කඩය පාවිච්චි කිරීම අනිවාර්ය අංගයක්. අට පිරිකරට පෙරහන් කඩයක් නියම කරල තියෙන්නෙත් ඒ නිසාමයි. ස්-වාභාවික උල්පත් ජලය නැත්නම් උණුකොට නිවාගත් ජලය පාවිච්චි කරන්න ඕන.

**බුද්ධික හිමි**:- එතකොට ව්‍යායාම කිරීම.

**පණ්ඩිත හාමුදුරුවෝ**:- ව්‍යායාම කිරීම ශරීර සෞඛ්‍යයට අවශ්‍ය අංගයක් තමයි. පිරිවෙනේ අපේ පොඩි හාමුදුරුවන්ට ගිහි ළමයින්ට වගේ දුවන්න පනින්න උපදෙස් දෙන්නේ නෑ. ඒ වෙනුවට සුදුසු ව්‍යායාමයක් තමයි උදය, සවස තම තමන්ට නියමිත වතාවත් කිරීම. මළු පෙත්මං ඇමදීම, පිණ්ඩපාතයේ වැඩම කරවීම, එයින් කායික මැලි ගතිය දුරුවී ක්‍රියාශීලී කෙනෙකු බවට පත්වෙනවා. ආබාධ අඩුවෙනවා. කය සුව පත් වෙනවා එවිට මනසත් ක්‍රියාශීලී වෙනවා, සුවපත් වෙනවා. උදේ, දවල්, සවස බුද්ධ වන්දනාව හරියට කරනවා නම් එතනත් හොඳ ව්‍යායාමයක් තියෙනවා ඔබ දන්නවාද ? දෑත් නළලේ තබා වැඳගෙන, තුන් විටක් පසඟ පිහිටුවා වන්දනා කිරීම තුළත් ව්‍යායාමයක් වෙනවා. සූර්ය නමස්කාරය කියල යෝග අභ්‍යාසයක් තියෙනවා ඒක යෝගීන් පුහුණු කරනවා. භාවනා කිරීමේ දී එරමිණියා ගොතාගෙන වාඩි වී පිටකොන්ද කෙළින් තබාගෙන හොඳින් හුස්ම ඉහළ පහළ දැමීම බොහොම හොඳ අභ්‍යාසයක්. සක්මන් කිරීමත් හාමුදුරුවරුන්ට අයිති ව්‍යායාමයක් තමයි. දවසක් ජීවක වෛද්‍යවරයා ශරීර සෞඛ්‍යය සඳහා ව්‍යායාමයක් නියම කරන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටි විට උන්වහන්සේ **''අනුජානාමි භික්ඛවෙ චංකමනං''** යනුවෙන් සක්මන් කිරීම ව්‍යායාමයක් ලෙස අනුදැන වදාරා තිබෙනවා.

එසේම අංගුත්තර නිකායේ චංකමානිසංස සූත්‍රයේ සක්මන් කිරීමේ ආනිසංස පහක් දේශනාකොට වදාළා.

පඤ්චිමෙ භික්ඛවෙ චංකමෙ ආනිසංසා කතමෙ පඤ්ච ?
අද්ධානක්ඛමො හොති, පධානක්ඛමො හොති, අප්පාබාධො හොති,
අසිතපීත ඛායිතසායිතං සම්මා පරිණාමං ගච්ඡති, චංකමාධිගතො
සමාධි චිරට්ඨිතිකො හොති.

**සක්මන් කිරීමේ ආනිසංස පසකි.**

දුර ගමන් යා හැකි වෙයි.
වීර්ය වැඩීමට ශක්තිය ලැබෙයි.
ආබාධ අඩුවෙයි.
අනුභව කළ, පානය කළ, අතුරුපසට ගත්, රසවිඳි දේ දිරවයි.
සක්මනින් උපදවා ගත් සමාධිය බොහෝ කල් පවතී.

බුදුරජාණන් වහන්සේත් එවකට වැඩසිටිය මහා සංඝයාවහන්සේත් දවසකට වැළඳුවේ එක් වේලක් පමණයි. ඒ පිඩුසිගා ගත් දවල් වේලයි. පිඩු පිණිස යාමට පෙර උදෑසන වැළඳුවේ කැඳ සහ අවුළුපත් පමණයි. අවුළුපත් කියන්නේ කැවිලි වර්ගයි. එසේ නැතිව උදෑසන ආහාර වේලක් වැළඳීමක් තිබුනේ නැහැ. ඒ කාලයේ ගිහියනුත් එහෙමයි. ඔවුනුත් උදේට කැඳ අවුළු වළඳා, දවල්ට සහ රෑට ආහාර ගත්තා. මේ නිසා උදෑසන කැඳ පානය කිරීම ගිහි පැවිදි කාගේත් සිරිතක් උනා. එයින් එදා ගිහි පැවිදි කවුරුත් ක්‍රියාශීලී උනා, නීරෝගී උනා. ඥාණවන්ත උනා. ඒ නිසාම බුදුරජාණන් වහන්සේ කැඳ වැළඳීමේ ආනිසංස පහක් අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ යාගු සූත්‍රයේ දී වදාරා තිබෙනවා.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා යාගුයා කතමෙ පඤ්ච
ඛුදං පටිහන්ති, පිපාසං පටිවිනෙති, වාතං අනුලොමෙති,
වත්ථිං සොධෙති, ආමාවසෙසං පාචෙති.

මහණෙනි,

**හුළුකැන් වැළඳීමේ අනුසස් පසෙකි.**

සාගිනි නසයි,
පිපාසය දුරු කෙරෙයි,
වාතය ක්‍රමවත්ව ගමන් කරයි,
වස්තිය (මළ මාර්ගය) පිරිසිදු කෙරෙයි,
නොපැසුණු ඉතිරි අහර පැසවයි.

සාගින්නට ආහාර ගත යුතු ය. පිපාසයට පාන වර්ග ගත යුතු ය. කැඳ පානය කිරීමෙන් සාගිනි නැසීමත්, පිපාසය දුරුවීමත් සිදුවෙයි.

උදරයෙහි වාතය ක්‍රමවත්ව ගමන් කිරීම සිදු නොවීම නිසා ශරීරය තුළ නොයෙකුත් අවහිරතා ඇති වේ. කැඳ පානය කිරීමෙන් වාතය මනාව තල්ලු වී යන නිසා ජීර්ණ

පද්ධතිය තුළ අවහිරතා දුරුව යයි. එය ශාරීරික වාතාබාධ වැළකීමට හේතු වේ. මළ බද්ධය හෙවත් මළ වියලීම බොහෝ රෝගවලට හේතුවකි. එය ප්‍රමාණවත් පරිදි ජලය පානය නොකිරීමෙන් සිදුවන්නකි. දිනපතා උදෑසන කැඳ පානය කිරීමෙන් වස්ති මාර්ගය ශුද්ධ වී මළ බද්ධය දුරුවේ. නීරෝගී වේ. ආමාශයේ නොපැසුණු ආහාර තිබිය දී නැවත ආහාර ගැනීම විවිධ රෝගවලට හේතුවන අහිතකර තත්ත්වයකි. උදෑසන කැඳ පානය කිරීමෙන් මෙම ආපදාව ද වළකා ගත හැකි ය.

අනුරාධපුර මහා විහාරයේ වැඩසිටි භික්ෂූන් වහන්සේ උදෙසා කැඳ බෙදා දුන් කැඳ ඔරුවක් නෂ්ටාවශේෂව තවමත් පවතිනවා. දැනටත් පන්සලේ, පිරිවෙනේ ඉන්න ඔය ඇත්තන්ටත් දායක දායිකාවන් උදේට කැඳ පූජා කරනවා. වැඩිහිටි හාමුදුරුවරු කැමැත්තෙන් වැළඳුවත්, ඇතැම් පොඩි හිමිවරු කැඳ වළඳන්න කැමැත්තක් දක්වන්නේ නැහැ නේද? බලන්න ඔය ඇත්තන් මේ ගැන අවබෝධයෙන් කටයුතු කරනවා නම් ශරීර සෞඛ්‍යයටත්, සනීපාරක්ෂාවටත් කොයි තරම් හොඳ ද?

ලස්සන පරිසරයක්, යහපත් පුරුදු සමූහයක්, දුටුවන් පහදින භික්ෂු ජීවිතයක් ගොඩනගා ගන්න බුදුහාමුදුරුවෝ මොන තරම් උපදෙස් දීලා තියෙනව ද ? තව තවත් අපි ඒවා හඳුනාගෙන යහපත් පැවිදි ජීවිතයක් ගතකරමු.

**අභ්‍යාස**

01. සනීපාරක්ෂාව සඳහා යහපත් පුරුදු ලැයිස්තුවක් පිළියෙල කරන්න.
02. පිරිවෙන් වත්තේ ඔසු උයනක් සකස් කරන්න.
03. "අරෝග්‍ය පරමා ලාභා" යන තේමාව යටතේ ශිෂ්‍ය සමිතියේ කතාවක් කරන්න.
04. ගුරු භවතාගේ උපදෙස් පරිදි සක්මන් භාවනා වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න.
05. ඔබ පන්තියේ සිසුන්ගේ අනුග්‍රහයෙන් දිනෙක උදෑසන කැඳ දන්සලක් දෙන්න.